# 13 ශ්‍රේණිය

# ක්‍රිස්තියානි ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

(2018 වසරේ සිට ක්‍රියාත්මක වේ.)




ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**ජාතික අධ්‍යාපන ආයතනය**

මහරගම, ශ්‍රී ලංකාව

**Web**| www.nie.lk **Email**| info@nie.lk

# ක්‍රිස්තියානි ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

## 13 ශ්‍රේණිය

(2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)

**ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**ජාතික අධ්‍යාපන ආයතනය**

**ශ්‍රී ලංකාව**

වෙබ් අඩවිය : www.nie.lk

විද්‍යුත් තැපෑල : info@nie.lk

ක්‍රිස්තියානි ධර්මය

13 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2018

C ජාතික අධ්‍යාපන ආයතනය

ISBN: ......................

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info@nie.lk

මුද්‍රණය :

මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශවයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩනැඟීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එකම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරතවීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායීවීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමීව භාවිතා කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද ආයතන සභාවේ ද රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත් දායකයින් හා වෙනත් පාර්ශවයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කරගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර,**
**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික අධ්‍යාපන ආයතනය,**
**මහරගම.**

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන් හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන , පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශය ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශය හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුවද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමඟ ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**ආචාර්ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

## විෂයමාලා කමිටුව

| | | |
|---|---|---|
| **උපදේශකත්වය හා අනුමතිය** | : | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය |
| **විෂය සම්බන්ධීකරණය** | : | ගරු ගාමිණී පෙරේරා පියතුමා<br>සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය<br><br>ශාස්ත්‍රපති ගරු එස්. අන්‍ද්‍රයාස් ඒ. ප්‍රනාන්දු නි.ම.නි. පියතුමා<br>සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය<br><br>ප්‍රදීප් කුමාර ප්‍රනාන්දු පියතුමා<br>සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය |
| **ලේඛක මණ්ඩලය** | : | අධ්‍යාපනපති හා සාමාජීයවිද්‍යාපති, ගරු ජුඩ්. දසනායක පියතුමා<br>බාහිර කථිකාචාර්ය , විද්‍යාපීඨය, බිංගිරිය<br><br>ශාස්ත්‍රපති ගරු මේරි නිමල්කා පැවිදි සොයුරිය - සහකාර විදුහල්පති<br>සාන්ත ජෝසප් පිරිමි විද්‍යාලය<br>වත්තල<br><br>ශාස්ත්‍රපති කේ. පද්මිණි එස්තර් පෙරේරා, ගුරු උපදේශක<br>කලාප අධ්‍යාපන කාර්යාලය<br>කැලණිය<br><br>ශාස්ත්‍රපති එස්.ජී.කේ.ඩී.එල්.සී. ප්‍රසාද්, නියෝජ්‍ය විදුහල්පති<br>බප/ කො සාන්ත ජෝසප් පිරිමි විද්‍යාලය<br>කොළඹ 14<br><br>ශාස්ත්‍රපති ඩබ්. ජේ. පි. ජේ. මරිනි ධම්මිකා පෙරේරා-ගුරු උපදේශක<br>කලාප අධ්‍යාපන කාර්යාලය<br>කොළඹ 02<br><br>ශාස්ත්‍රපති එල්. නිලන්ති ද සිල්වා<br>බප/ පිළි / මෙතොදිස්ත උසස් විදුහල<br>මොරටුව<br><br>ආචාර්ය (ක්‍රිස්තියානි අධ්‍යාපනය) එම්. රදීකා සමන්ති මෙන්ඩිස්<br>ශාන්ත තෝමස් විදුහල<br>ගල්කිස්ස |

**කතෝලික උපදේශක මණ්ඩලය**

- අති උතුම් දේවධර්මාචාර්ය මැක්ස්වෙල් සිල්වා රදගුරු හිමිපාණෝ
  සභාපති, අධ්‍යාපන ධර්මෝපදේශ හා බයිබල් අධ්‍යයනය පිළිබඳ රදගුරු කොමිසම

- අති උතුම් දේවධර්මාචාර්ය ජෝශප් පොන්නයියා රදගුරු හිමිපාණෝ
  උපසභාපති, අධ්‍යාපන ධර්මෝපදේශ හා බයිබල් අධ්‍යයනය පිළිබඳ රදගුරු කොමිසම

- අතිගරු අයිවන් පෙරේරා නාහිමිපාණෝ,
  කතෝලික පාසල් පිළිබඳ ජාතික අධ්‍යක්ෂ

- අතිගරු පියල් ජානක ප්‍රනාන්දු පියතුමා,
  ජාතික අධ්‍යක්ෂ, බයිබල් හා ධර්මෝපදේශ අපෝස්තලික සේවා

- ගරු. දයා ෂෙල්ටන් වැලිකඩආරච්චි පියතුමා.
  අධ්‍යාක්ෂ, සාන්ත ජුසේවාස් දේවධර්ම නිකේතනය, බොරැල්ල

- ආචාර්ය ෂර්ලි ලාල් විජේසිංහ,
  ක්‍රිස්තියානි සංස්කෘතික දෙපාර්තමේන්තුව, කැලණිය විශ්වවිද්‍යාලය.

- ගරු ග්‍රෙගරි එල්. ප්‍රනාන්දු පියතුමා, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, ආගමික හා සාරධර්ම ශාඛාව
  අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල

- ගරු එබනේෂර් ජෝශප් දේවගැතිතුමා,
  මහලේකම්, ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය, කොළඹ 07.

- ශාස්ත්‍රපති ගරු ක්‍රිස්ටෝපර් බාල්රාජ් දේවගැතිතුමා,
  විදුහල්පති, සාන්ත තෝමස් විදුහල,බණ්ඩාරවෙල.

**භාෂා සංස්කරණය**

- ශ්‍රීනාත් ගනේවත්ත මැතිතුමා.

**පරිගණක වදන් සැකසුම**

- ඒ. නියෝමි මහත්මිය

**විවිධ සහාය : කාර්යාලයීය කටයුතු**

- එස්. සී. ප්‍රියදර්ශනී මහත්මිය, ජාතික අධ්‍යාපන ආයතනය.
- ඩයස් අමරසිංහ මහතා, ජාතික අධ්‍යාපන ආයතනය.

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

කතෝලික ධර්මයට අනුව සාර්ථක ජීවිතයක් ගත කිරීමට අත්‍යවශ්‍ය නිපුණතා පාදක කොට ගනිමින් පාසල් අධ්‍යාපනය හරහා එම නිපුණතා සංවර්ධනය කර ගැනීමට ඉඩ ප්‍රස්තාව සලසමින් මෙම ගුරු මාර්ගෝපදේශය සකස් කර ඇත.

දැනුමින් පමණක් හිස පුරවා ගෙන දැනුම් කේන්ද්‍රීය විභාග ක්‍රමයක් යටතේ ඉහළ සාමර්ථ්‍ය ලබා ගැනීම පමණක් නොසෑහේ. දැනුම පමණක් ලබා දෙන අධ්‍යාපන ක්‍රමයක් සාර්ථක අධ්‍යාපන ක්‍රමයක් ලෙස සැලකිය නොහැකි ය. අධ්‍යාපනය මඟින් ආවේදන නොවැරදීම තීව්‍ර කර, කුසලතා අනිවාර්යයෙන් ම ඔපමට්ටම් කළ යුතු ය. මේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අදිටනින් මෙම ගුරු මාර්ගෝපදේශය සකස් කර ඇත.

මෙම ගුරු මාර්ගෝපදේශය විෂය නිර්දේශයට අනුරූප ව ලියා ඇති අතර පෙළ පොත මෙම ගුරු මාර්ගෝපදේශයට හා විෂය නිර්දේශයට අනුව ලියවීමට නියමිත ය. එබැවින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී මෙම සීමාවන් නොඉක්මවා කටයුතු සංවිධානය කර ගැනීමට වගබලා ගත යුතු ය. එහි දී :

- පාඩමට ප්‍රවේශය වඩාත් වැදගත් බැවින් ප්‍රබෝධාත්මක ආරම්භයක් ලබා දෙමින් එය හොඳින් සිදු කරන්න.
- පාඩමට ප්‍රවේශවීමට හා පාඩම සංවර්ධනය සඳහා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් පරිශීලනය කරන්න.
- සුදුසු පරිදි කණ්ඩායම් කර කණ්ඩායම් ක්‍රියාකාරකම්වල සිසුන් යොදවන්න.
- ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී වඩාත් සුදුසු ස්ථානය තෝරා ගැනීමට උනන්දු වන්න.
- මෙහි දක්වා ඇති ඉගෙනුම් පලවලින් සිසුන්ගේ ජීවිත පොහොණි කරලීමට කටයුතු කරන්න.
- සිසුන්ගේ විශ්වාසය වර්ධනය කිරීමට කටයුතු කරන්න.

මෙහි ඇතුළත් පාඩම්වලට යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය භාවිත කිරීම අනිවාර්ය නොවන අතර විකල්ප ඉගෙනුම් ක්‍රම, සුදුසු පරිදි භාවිත කළ හැකි ය. එහෙත් නිපුණතාව, නිපුණතා මට්ටම, ඉගෙනුම් පල හා විෂය අන්තර්ගතයෙන් බැහැර නොවිය යුතු ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී කතෝලික ආගමික ආකල්ප වර්ධනය කෙරෙහි ද ප්‍රායෝගික අවස්ථා යොදා ගැනීම කෙරෙහි ද වැඩි අවධානයක් යොමු කරන්න.

පාඩම ආරම්භයේ සිට අවසානය තෙක් තක්සේරුව සිදු කළ යුතු අතර හැකියා නොහැකියා අනුව ප්‍රතිපෝෂණය හා ඉදිරිපෝෂණය ලබා දිය යුතු ය. අදාළ පාඩමට අපේක්ෂිත ඇගයීම, තක්සේරුව හා ඇගයීම් නිර්ණායක අනුව සකස් කර ගන්න. ඇගයීම් සිදු කිරීමේ දී ලකුණු ලබා දෙන නිර්ණායක පිළිබඳ ව සිසුන් පෙරාතු ව දැනුවත් කරන්න. ඔබ විසින් සිසුන්ට ලබා දෙන ලද අභ්‍යාසවල නිරවද්‍යතාව පරීක්ෂා කොට සටහන් තබන්න.

සෑම පාඩම් සටහනක් අවසානයේ ම යොදා ඇති ගෙදර පරිසරයෙන් යන කොටස දෙමාපිය වැඩිහිටි සහභාගිත්වය යටතේ සිදු කිරීමට යෝජිත ය. ඒ සඳහා උපදෙස් විදුහල්පති මඟින් ද, විෂය භාර ගුරුභවතා පන්ති කවවල දී ද දෙමාපියන්ට හා වැඩිහිටියන්ට ලබා දීමට කටයුතු කළ යුතු ය.

**ව්‍යාපෘති නායක (කතෝලික ධර්මය)**
**ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

| පටුන | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය | iv |
| විෂයමාලා කමිටුව | v |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | vi |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | ix |
| ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1-99 |

# විෂය නිර්දේශයේ අන්තර්ගතය

## විෂය හැඳින්වීම

කවර සමාජයක වුවද අරමුණ වන්නේ යහපත් සදාචාරාත්මක හා ගුණගරුක පුරවැසියන් බිහි කිරීම යි. මේ සා වැදගත් අරමුණක් මුදුන් පමුණුවාලීම සඳහා දහම විශාල කාර්ය භාරයක් ඉටු කරයි. දහමට අනුගත ව දිවි ගෙවන මිනිසා සිය ජීවිතය තුළ යහපත් වටිනාකම් හා ගුණාංග චරිතායනයකරගත්තෙක් වේ. දහම මඟින් පෝෂණය වී දිවි ගෙවන මිනිස් පරපුරක් බිහි කරලීම සඳහා දහම් අධ්‍යාපනයට ඉතා වැදගත් වගකීම් සමූහයක් හිමි වේ.

පාසල් විෂයමාලාව මඟින් අධ්‍යයනය කරන විෂයයන්ගෙන් ජීවිතයෙන් වෙන් කළ නොහැකි විෂයයක් ඇත්නම් ඒ ආගම ධර්මය යි. එයට හේතුව වන්නේ, ආගම ධර්මයන් ඉගෙන ගනු ලබන්නේ ජීවිතය ජය ගැනීමට වඩා ජීවිතය ගොඩනගාගෙන දැහැමි දිවි පෙවෙතකට හුරු වන අයුරු වීමයි. එම දිවි පෙවෙතට හුරු වීමෙන් ලැබෙන ප්‍රයෝජන මෙලොවට වඩා මතු සදාතන දිවියට සුවිශේෂ වේ.

කිතුනු අපගේ දහම වනුයේ කිතු දහම යි. මෙම දහම වසර 11ක් පුරා අධ්‍යයනය කර, 12 ශ්‍රේණියේ දී ක්‍රිස්තියානි ධර්මය ඉගෙනීමට ප්‍රවිෂ්ට වන්නා වූ සිසුසිසුවියන්ට එම දහම පිළිබඳ ව තවත් සුවිශේෂී ආකාරයට අධ්‍යයනය කිරීම සඳහා අවස්ථාව හිමි වේ. එහි දී ක්‍රිස්තියානි ධර්මය පළමු වසර 11 දී අධ්‍යයනය කළාට වඩා ශාස්ත්‍රීය ව හා ගැඹුරින් අධ්‍යයනය කිරීමට අ.පො.ස. උසස් පෙළට පිවිසෙන සිසුන්ට අනඟි අවස්ථාවක් උදා වනු ඇත.

අ.පො.ස. උසස් පෙළ පන්තියට පිවිසෙන තරුණ සිසු දරුවන්ට සිය ජීවිතය තුළින් ක්‍රිස්තුන් වහන්සේට සාක්ෂ්‍ය දැරීමට හා සිය ජීවිත අභියෝග ජය ගනිමින් ක්‍රිස්තු කේන්ද්‍රීය දිවියක් ගත කිරීමට උසස් පෙළ ක්‍රිස්තියානි ධර්මය විෂය නිර්දේශය මඟින් මංපෙත් විවර කර ඇත.

එම අරමුණ සාක්ෂාත් කර ගැනීමේ අපේක්ෂාවෙන් මෙම විෂය නිර්දේශය සකස් කර තිබේ. මෙම විෂය නිර්දේශය තුළ නිපුණතා මට්ටම 15ක් නිපුණතා 5ක් යටතේ 12 ශ්‍රේණියේ දී ද, ඉතිරි නිපුණතා මට්ටම 15 ඉතිරි නිපුණතා 5 යටතේ 13 ශ්‍රේණියේ දී ද අධ්‍යයනය කිරීමට අපේක්ෂිත ය.

## ජාතික අධ්‍යාපන පද්ධතිය සඳහා අරමුණු

### ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතුය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

1. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පය මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම.
2. වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.
3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග වර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.
4. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.
5. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.
6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.
7. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.
8. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වු ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන් පත් කර ගැනීමට දායක වනු ඇත.

1. **සන්නිවේදන නිපුණතා**

   සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනු කාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

   **සාක්ෂරතාව** සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

   **සංඛ්‍යා පිළිබඳ දැනුම** භාණ්ඩ, අවකාශය සහ කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

   **රූපක භාවිතය** රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති හා වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

   **තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රයන් තුළ දී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

2. **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

   - නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලි හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
   - ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
   - චිත්තවේගී බුද්ධිය

3. **පරිසරයට අදාළ නිපුණතා**

   මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

   **සමාජ පරිසරය** ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

   **ජෛව පරිසරය** සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

   **භෞතික පරිසරය** අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් හා තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

**4. වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

ආර්ථික සංවර්ධනයට දායක වීම. තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම. හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම. යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

**5. ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

**6. ක්‍රීඩාව හා විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

**7. ඉගෙනීමට ඉගෙනුම් පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම.

ඉහත ජාතික අරමුණු හා මූලික නිපුණතා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවෙන් උපුටා ගැනිණ.

## නිපුණතා හා නිපුණතා මට්ටම්

1.0 ශුද්ධ බයිබලය අර්ථකථනය කිරීම සඳහා එහි පසුබිම භාවිත කරයි.

1.1 ශුද්ධ බයිබලයේ උත්තරීතර බව හඳුනාගෙන එයට නිසි ගෞරවය දක්වයි.

1.2 භූගෝලීය හා ඓතිහාසික පසුබිම ශුද්ධ බයිබලය අර්ථකථනය කිරීමට යොදා ගනියි.

2.0 දේව අනාවරණයට ප්‍රතිචාර දක්වයි.

2.1 දේව ධාර්මික සම්ප්‍රදායයන් පංච පුස්තකය අර්ථකථනය කිරීමට යොදා ගනියි.

2.2 ප්‍රාග් ඉතිහාසයේ අඩංගු දේව ධාර්මික ඉගැන්වීම් ජීවිතයට අදාළ කර ගනියි.

2.3 ආදිපිතෘවරුන්ගේ යහපත් ආදර්ශ චරිතායනය කරයි.

2.4 එදිනෙදා ජීවිතය තුළ දිව්‍ය සංරක්ෂණය අත්දැකීමට නික්මයාම සිද්ධිය පිටිවහලක් කර ගනියි.

2.5 සීනයි ගිවිසුමට අනුව දිවි ගෙවයි.

3.0 ප්‍රඥාවෙන් පූර්ණ ව දිවැසිවරයකු ලෙස සාක්ෂ්‍ය දරයි.

3.1 පුරාණ ගිවිසුමේ දිවැසිවර සංකල්පය මඟින් ජීවිතය ආලෝකවත් කර ගනියි.

3.2 දිවැසිවර කැඳවීමට නොපසුබට ව ප්‍රතිචාර දක්වයි.

3.3 ජීවිතය නිසි මඟ ගැන්වීම සඳහා ප්‍රඥා සාහිත්‍යයෙන් ආලෝකය ලබයි.

4.0 ක්‍රිස්තුන් වහන්සේ ලෝකයේ විමුක්තිදායකයාණන් බව අවබෝධ කර ගනිමින් උන් වහන්සේට සාක්ෂ්‍ය දරයි.

4.1 ශුභාරංචිය පිළිබඳ අවබෝධය ලබා ගැනීම සඳහා නව ගිවිසුමේ පසුබිම භාවිත කරයි.

4.2 ශුභාරංචි හා ක්‍රියා පොත පිළිබඳ අවබෝධය කිතුනු වටිනාකම් ප්‍රචලිත කිරීමට යොදා ගනියි.

4.3 ශු. පාවුලු තුමා අනුගමනය කරමින් ධර්මදූත සේවයේ නියැළෙයි.

5.0 කිතුනු ඉගැන්වීම්වලින් පරිපූර්ණ වී ස්වර්ග රාජ්‍යයේ පංගුකාරත්වය ලබයි.

5.1 ස්වර්ග රාජ්‍යයේ වටිනාකම් චරිතායනය කරයි.

5.2 ශු. පාවුලු තුමාගේ දේවධාර්මික ඉගැන්වීම් අනුව ජීවිතය ගොඩනගා ගනියි

6.0 සක්‍රමේන්තුමය ජීවිතයක් ගත කරයි.

6.1 ප්‍රසාද ස්නාපනීය කැඳවීම මඟින් තම කාර්යභාරයන් මැනවින් ඉටු කරයි.

6.2 දිව්‍ය සත්ප්‍රසාද භෝජනයෙන් පෝෂණය වී පරිත්‍යාගශීලී ජීවිතයක් ගත කරයි.

7.0 ජීවිත අභියෝග හමුවේ ශුද්ධාත්ම බලයෙන් පිරිපුන් වී විශ්වාසයට සාක්ෂ්‍ය දරයි.

7.1 ශුද්ධාත්ම බලයෙන් සන්නද්ධ වී පිරිපුන් දිවියක් ගත කරයි.

7.2 විශ්වාසය රැකගනිමින් අභියෝග ජය ගනියි.

7.3 විශ්වාසය පෝෂණය කර ගනිමින් ශුද්ධ වූ සභාවේ සත්‍යතා අනුව ජීවත් වෙයි.

7.4 දේව ධාර්මික සත්‍යතා නිවැරදි ව උගන්වයි.

8.0 ශුද්ධ වූ සභා ගමන් මඟ නිවැරදි කර ගැනීම සඳහා ශුද්ධාත්ම මඟ පෙන්වීමට විවෘත වෙයි.

8.1 ඵලදායී විවේචනවලට ශුභවාදී ප්‍රතිචාර දක්වමින් ගැටලු නිරාකරණය කර ගනියි.

8.2 කාලානුරූප ව ශුද්ධ වූ සභාව නිසි මඟ ගැන්වීම සඳහා දායක වෙයි.

9.0 ශ්‍රී ලංකාවේ කිතුනු අනන්‍යතාව තුළ සුබ අස්නේ පණිවිඩකරුවන් ලෙස සාක්ෂ්‍ය දරයි.

9.1 පූර්තුගීසීන් පැමිණීමට පෙර ශ්‍රී ලංකාව තුළ කිතු දහමේ ආරම්භය පිළිබඳ ව කරුණු සොයා බලයි.

9.2 ශ්‍රී ලාංකේය සන්දර්භයෙහිලා ධර්ම දූතයකු ලෙස කටයුතු කරයි.

9.3. බාධක හමුවේ විශ්වාසයට සාක්ෂ්‍ය දරයි.

9.4 කිතුනු ධර්මදූත ව්‍යාපාර මඟින් විවිධ ක්ෂේත්‍රයන්හි සිදු කළ සේවා ඉදිරියට ගෙන යාමට පියවර ගනියි.

9.5 දේශීය ශුද්ධ වූ සභාවක් ගොඩනැඟීමට දායක වෙයි.

10.0 මානව වටිනාකම් සුරකිමින් විවිධත්වය ඔස්සේ ඒකත්වයක් ගොඩනැඟීමට කැප වෙයි.

10.1 වත්මන් සමාජ ජීවිතයෙහිලා තුළ කිතුනු වගකීම් නොපිරිහෙළා ඉටු කරයි.

10.2 එක ම ශුද්ධ සභාවක් ගොඩනැඟීමට සහජීවනයෙන් කටයුතු කරයි.

## 3.1 - 12 ශ්‍රේණිය

නිපුණතා, නිපුණතා මට්ටම්, විෂය සන්ධාරය සහ කාලය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 1.ශුද්ධ බයිබලය අර්ථකථනය කිරීම සඳහා එහි පසුබිම භාවිත කරයි. | 1.1 ශුද්ධ බයිබලයේ උත්තරීතර බව හඳුනාගෙන එයට නිසි ගෞරවය දක්වයි. | හැඳින්වීම -<br>නාම විග්‍රහය, භාෂාවන්, පොත්,<br>වැදගත්කම<br>මැසරොටික්, සෙප්තුවාජින්ත,<br>වල්ගේට්,<br>දේව අනාවරණය<br>දේවානුභාවය<br>කර්තෘත්වය | 1 ශුද්ධ බයිබලය පිළිබඳ මූලික තොරතුරු ගොනු කරයි.<br>2 ශුද්ධ බයිබලය දේව වචනය බව විශ්වාස කරයි.<br>3 ශුද්ධ බයිබලය පිළිබඳ මූලික තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි<br>4 ශුද්ධ බයිබලය ගරුත්වයෙන් භාවිත කළ යුතු බව පිළිගනියි .<br>5 එකමුතුව දේව වචනය අධ්‍යයනය කරයි. | 15 |
| | 1.2 භූගෝලීය හා ඓතිහාසික පසුබිම ශුද්ධ බයිබලය අර්ථකථනය කිරීමට යොදා ගනියි. | භූගෝලීය පසුබිම (පලස්තීනය)<br>ඓතිහාසික පසුබිම<br>(නික්මයාමේ සිට රෝම අධිරාජ්‍යය තෙක්)<br>නික්මයාම<br>වීරවරු<br>රජවරු<br>රාජ්‍ය දෙකඩ වීම<br>අසිරියානු විප්‍රවාසය<br>බබිලෝනියානු විප්‍රවාසය<br>පර්සියානු යුගය<br>ග්‍රීක යුගය<br>රෝම යුගය | 1 ශුද්ධ බයිබලයේ භූගෝලීය හා ඓතිහාසික පසුබිම පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2 විශ්වාසයෙන් ශුද්ධ බයිබලය අධ්‍යයනය කළ යුතු බව පිළිගනියි.<br>3 ශුද්ධ බයිබලයේ භූගෝලීය හා ඓතිහාසික පසුබිම පිළිබඳ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4 ඉතිහාසයෙහි දී ක්‍රියාත්මක වූ දෙවියන් වහන්සේ වර්තමානයට හා අනාගතයට ද මැදිහත් වන බව විශ්වාස කරයි.<br>5 එකිනෙකාගේ ජීවිතවල දේව ක්‍රියාකාරිත්වය අත්දැකීමට අන් අය යොමු කරවයි. | 20 |
| 2. දේව අනාවරණයට ප්‍රතිචාර දක්වයි. | 2.1 දේව ධාර්මික සම්ප්‍රදායයන් පංච පුස්තකය අර්ථකථනය කිරීමට යොදා ගනියි. | J, E, D හා P සම්ප්‍රදායයයෝ<br>(එක් එක් සම්ප්‍රදායය හැඳින්වීම, පංච පුස්තකය තුළ විකාශය, විශේෂ ලක්ෂණ හා ඉදිරිපත් කරන ධර්මය) | 1 පංච පුස්තකය තුළ අඩංගු දේව ධාර්මික සම්ප්‍රදාය හතර පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2 දෙවියන් වහන්සේ විවිධාකාරයෙන් අත්දැකිය හැකි බව පිළිගනියි.<br>3 පංච පුස්තකය තුළ අඩංගු දේව ධාර්මික සම්ප්‍රදාය හතර පිළිබඳ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4 එදිනෙදා ජීවිතයෙහි තුළ දේව නීතිය පිළිපැදීමට යොමු වෙයි.<br>5 ධාර්මික දිවියක් ගත කිරීමට අන් අයට මඟ පෙන්වයි. | 15 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 2.2 ප්‍රාග් ඉතිහාසයේ අඩංගු දේව ධාර්මික ඉගැන්වීම් ජීවිතයට අදාළ කර ගනියි. | ප්‍රාග් ඉතිහාසය පිළිබඳ හැඳින්වීම<br>විශ්වය සහ මිනිසා මැවීම පිළිබඳ කථා දෙක.<br>(උත්පත්ති 1:1-2:4අ, 2:4ආ-25)<br>මිනිසාගේ වැටීම පිළිබඳ කථා 4<br>(උත්පත්ති 3, 4, 6:1-9:17, 11:1-9) | 1 ප්‍රාග් ඉතිහාසය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2 දුර්පරීක්ෂා ජය ගත යුතු බව පිළිගනියි.<br>3 ප්‍රාග් ඉතිහාසය පිළිබඳ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4 විශ්වයේ ආරම්භය හා එහි ක්‍රමානුකූල පැවැත්ම මගින් හෙළි වන දේව ආදරය අත්දකියි.<br>5 දුර්පරීක්ෂා ජය ගැනීමට අන් අයට මඟ පෙන්වයි. | 20 |
| | 2.3ආදිපිතෘවරුන්ගේ යහපත් ජීවිත ආදර්ශ චරිතායනය කරයි. | ආදිපිතෘ යුගය<br>ආබ්‍රහම්ගේ කැඳවීම<br>(උත්පත්ති 12:1-6)<br>ගිවිසුම<br>(උත්පත්ති 15:1-21, 17:1-14)<br>විශ්වාසය<br>(උත්පත්ති 12, 24)<br>ඊසාක් හැඳින්වීම<br>(උත්පත්ති 21:2-5)<br>ගිවිසුම අලුත් කිරීම<br>(උත්පත්ති 26:19-25)<br>ජාකොබ් හැඳින්වීම<br>ගිවිසුම අලුත් කිරීම<br>(උත්පත්ති 28:10-22)<br>ජීවිත වෙනස<br>(උත්පත්ති 32:22-30<br>උත්පත්ති 33:3) | 1 ආදිපිතෘ යුගය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2 ආදිපිතෘවරුන්ගේ ජීවිත ආදර්ශ අනුකරණය කළ යුතු බව පිළිගනියි.<br>3. ආදිපිතෘ යුගය පිළිබඳ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි<br>4 දේව කැඳවීමට නිසි ප්‍රතිචාර දක්වයි.<br>5 දෙවියන් වහන්සේ තුළ ජීවිත වෙනසක් අත්දැකීමට අන් අයට සහාය වෙයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 2.4 එදිනෙදා ජීවිතයේ දී දිව්‍ය සංරක්ෂණය අත්දැකීමට නික්මයාම සිද්ධිය පිටිවහලක් කර ගනියි. | ඊජිප්තුවේ වහල් මෙහෙවර හා මෝසෙස්ගේ උපත (නික්මයාම 1, 2 පරිච්ඡේද)<br>මෝසෙස්ගේ කැඳවීම (නික්මයාම 3:1-4:17)<br>වසංගත දසය (නික්මයාම 7:14-10:29, 12:29-36)<br>ජුදා පාස්කු මංගල්‍යය (නික්මයාම 12:1-28)<br>මුහුද තරණය (නික්මයාම 14:1-31)<br>වලා ටැඹ හා ගිනි ටැඹ (නික්මයාම 13:21-22)<br>පාළුකරයේ ගමන<br>මාරා - (නික්මයාම 15:22-25)<br>සීන් කාන්තාරය - (නික්මයාම 16 )<br>මස්සා හා මෙරිබා (නික්මයාම17:1-7, ගණන් 20:1-13)<br>ලෝකඩ සර්පයා (ගණන් 21:4-9)<br>ආක්‍රමණවලින් ආරක්ෂා වීම (නික්මයාම 17:8-13) | 1 නික්මයාම පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2 විශ්වාසය මඟින් දේව ආදරය හා රැකවරණය අත්දැකිය හැකි බව පිළිගනියි.<br>3 නික්මයාම පිළිබඳ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4 එදිනෙදා ජීවිතයේ දී දිව්‍ය සංරක්ෂණය අත්දකියි.<br>5 අන් අයගේ සුරක්ෂිත බව වෙනුවෙන් කැප වෙයි. | 30 |
| | 2.5 සීනයි ගිවිසුමට අනුව දිවි ගෙවයි. | සීනයි ගිවිසුම (නික්මයාම 20, 24 පරිච්ඡේද)<br>හැඳින්වීම<br>වැදගත්කම<br>ස්ථිර කිරීම<br>දස පනතෙහි ලක්ෂණ | 1 සීනයි ගිවිසුම පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2 එක ම දෙවියන් වහන්සේට පමණක් නමස්කාර කළ යුතු බව පිළිගනියි.<br>3 සීනයි ගිවිසුම පිළිබඳ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4 දස පනතට අනුව ජීවත් වෙයි.<br>5 දස පනතේ මඟ පෙන්වීම ඔස්සේ සහෝදර ප්‍රේමයෙන් ජීවත් වෙයි. | 15 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 3. ප්‍රඥාවෙන් පූර්ණ ව දිවැසිවරයකු ලෙස සාක්ෂ්‍ය දරයි. | 3.1 පුරාණ ගිවිසුමේ දිවැසිවර සංකල්පය මඟින් ජීවිතය ආලෝකවත් කර ගනියි. | හැඳින්වීම (දිවැසිවරයකු යනු)<br>වර්ගීකරණය<br>ප්‍රධාන තේමා තුන<br>ඒකදේවවාදය<br>සදාචාරය<br>මෙසියානු සංකල්පය<br>(2 සාමුවෙල් 7:10-17<br>යෙසායා 7:10-17, 9:1-7, 11:1-9<br>මීකා 5:1-4<br>සෙකරියා 9:9-16) | 1 දිවැසිවර සංකල්පය පිළිබඳ තොරතුරු ගොනු කරයි<br>2. දිවැසිවරයකු මෙන් කටයුතු කළ යුතු බව පිළිගනියි.<br>3. දිවැසිවර සංකල්පය පිළිබඳ ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි<br>4 දිවැසිවරුන්ගේ ප්‍රධාන තේමා තම ජීවිතයට අදාළ කර ගනියි.<br>5 සදාචාරාත්මක දිවියක් ගත කිරීමට ජීවිතාදර්ශයෙන් මඟ පෙන්වයි. | 10 |
| | 3.2 දිවැසිවර කැඳවීමට නොපසුබට ව ප්‍රතිචාර දක්වයි. | දිවැසිවර යෙසායා<br>හැඳින්වීම<br>කැඳවීම<br>ප්‍රධාන ඉගැන්වීම්<br>දිවැසිවර ජෙරමියා<br>හැඳින්වීම<br>කැඳවීම<br>ප්‍රධාන ඉගැන්වීම්<br>දිවැසිවර එසකියෙල්<br>හැඳින්වීම<br>කැඳවීම<br>ප්‍රධාන ඉගැන්වීම්<br>දිවැසිවර ආමොස් හා හොෂියා<br>හැඳින්වීම<br>ප්‍රධාන ඉගැන්වීම් | 1 දිවැසිවරුන් පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2 වර්තමාන සමාජය තුළ දිවැසිවරුන් ලෙස දේව පණිවිඩය ප්‍රකාශ කළ යුතු බව පිළිගනියි.<br>3 දිවැසිවරුන් පිළිබඳ ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4 දිවැසිවර පණිවිඩය මඟින් තම ජීවිතය හැඩගස්වා ගනියි.<br>5 දිවැසිවර ආදර්ශය අනුව අන් අය යහමග ට යොමු කරවයි. | 20 |
| | 3.3 ජීවිතය නිසි මග ගැන්වීම සඳහා ප්‍රඥා සාහිත්‍යයෙන් ආලෝකය ලබයි. | ප්‍රඥා සාහිත්‍යය පිළිබඳව හැඳින්වීම<br>ගීතාවලිය පොත පිළිබඳ ව හැඳින්වීම<br>ගීත වර්ගීකරණය<br>ජනවන්දනාව සඳහා භාවිතය | 1 ප්‍රඥා සාහිත්‍යය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2 යහපතින් අයහපත වෙන් කරගෙන යහපත පමණක් කළ යුතු බව පිළිගනියි.<br>3 ප්‍රඥා සාහිත්‍යය පිළිබඳ ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත්. කරයි.<br>4 ගීතාවලියෙහි ආභාසය මඟින් තම යාච්ඤා ජීවිතය පොහොණි කර ගනියි.<br>5 ප්‍රඥාවන්ත ව කටයුතු කරන සමාජයක් ගොඩනැගීමට දායක වෙයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 4. ක්‍රිස්තුන් වහන්සේ ලෝකයේ විමුක්තිදායකයාණන් බව අවබෝධ කර ගනිමින් උන්වහන්සේට සාක්ෂ්‍ය දරයි. | 4.1ශුභාරංචිය පිළිබඳ අවබෝධය ලබා ගැනීම සඳහා නව ගිවිසුමේ පසුබිම භාවිත කරයි. | නව ගිවිසුමේ දේශපාලන පසුබිම<br>නව ගිවිසුමේ සමාජීය පසුබිම<br>නව ගිවිසුමේ ආගමික පසුබිම | 1 නව ගිවිසුමේ දේශපාලන, සමාජීය හා ආගමික පසුබිම පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2 තම බලතල අයුතු ලෙස භාවිත නොකළ යුතු බව පිළිගනියි.<br>3 නව ගිවිසුමේ දේශපාලන, සමාජීය හා ආගමික පසුබිම පිළිබඳ ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4 නව ගිවිසුමේ දේශපාලන, සමාජීය හා ආගමික පසුබිම තුළ නව ගිවිසුම අර්ථකථනය කරයි.<br>5 තම තනතුරු අන් අයගේ සුබසෙත සඳහා යොදවයි. | 20 |
| | 4.2 ශුභාරංචි හා ක්‍රියා පොත පිළිබඳ අවබෝධය කිතුනු වටිනාකම් ප්‍රචලිත කිරීමට යොදා ගනියි. | ශුභාරංචි ලේඛන ගතවීමේ අවධි<br>ශුභාරංචි හැඳින්වීම (මතෙව්, මාක්, ලූක්, ජොහන්)<br>කර්තෘත්වය<br>කාලය හා ස්ථානය<br>පරමාර්ථ<br>ආවේණික ලක්ෂණ<br>සමාදර්ශක ගැටලුව<br>සමාදර්ශක හා ජොහන් ශුභාරංචිය අතර සමානතා හා අසමානතා<br>ක්‍රියා පොත හැඳින්වීම<br>කර්තෘත්වය<br>කාලය හා ස්ථානය<br>විශේෂ ලක්ෂණ | 1 ශුභාරංචි හා ක්‍රියා පොත පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2 ශුභාරංචිය ප්‍රචලිත කිරීමට ඇප කැප විය යුතු බව පිළිගනියි.<br>3 ශුභාරංචි හා ක්‍රියා පොත පිළිබඳ ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4. ශුභාරංචියේ ආලෝකය මඟින් තම ජීවිතය හැඩ ගස්වා ගනියි.<br>5. ජීවිත පැවැත්ම අන් අයට ශුභාරංචියක් වෙයි. | 25 |
| | 4.3 ශුද්ධ වූ පාවුලු තුමා අනුගමනය කරමින් ධර්මදූත සේවයේ නියැළෙයි. | ශුද්ධවූ පාවුලු තුමා පිළිබඳ හැඳින්වීම<br>ශුද්ධවූ පාවුලු තුමාගේ ධර්මදූත ගමන්<br>ශුද්ධවූ පාවුලු තුමාගේ ලිපි වර්ගීකරණය | 1 ශුද්ධ වූ පාවුලු තුමාගේ දූත සේවාව පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2 ශුද්ධ වූ පාවුලු තුමාගේ ජීවිතාදර්ශය ඔස්සේ ධර්මදූත සේවාව සඳහා ඇප කැප විය යුතු බව පිළිගනියි.<br>3 ශුද්ධ වූ පාවුලු තුමාගේ දූත සේවාව පිළිබඳ ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4 තම ජීවිත සාක්ෂ්‍යයෙන් ධර්ම දූතයෙක් වෙයි.<br>5 ධර්මදානය මඟින් අන් අය දේව රාජ්‍යය වෙත ළං කරවයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 5. කිතුනු ඉගැන්වීම්වලින් පරිපූර්ණ වී ස්වර්ග රාජ්‍යයේ පංගුකාරත්වය ලබයි. | 5.1 ස්වර්ග රාජ්‍යයේ වටිනාකම් චරිතායනය කරයි. | මතෙව් ශුභාරංචිය පිළිබඳ අධ්‍යයනය<br>ක්‍රිස්තූන් වහන්සේගේ දේශනා පහ<br>(මතෙව් 5-7, 10, 13, 18, 24-25)<br>සවිස්තරාත්මක ව (මතෙව් 13, 24-25)<br>ක්‍රිස්තූන් වහන්සේ සිදු කළ ප්‍රාතිහාර්ය ය වර්ගීකරණය<br>1. සුව කිරීම් (මතෙව් 8:14-17)<br>2. දුෂ්ට ආත්ම දුරු කිරීම් (මතෙව් 8:28-34)<br>3. ස්වභාව ධර්මය හා සම්බන්ධ මාරුත දමනය (මතෙව් 8:23-27)<br>4. මළවුන් උත්ථානය(මතෙව් 9:18-19,23-26)<br>ක්‍රිස්තූන් වහන්සේගේ දුක්ප්‍රාප්තිය, මරණය, උත්ථානය හා දර්ශනය වීම (මතෙව් 26-28) | 1 මතෙව් ශුභාරංචිය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2 දේව රාජ්‍ය වටිනාකම් අනුව ජීවත් විය යුතු බව පිළිගනියි.<br>3 මතෙව් ශුභාරංචිය පිළිබඳ ව ගොනු කළ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4 දේව රාජ්‍යයේ වටිනාකම් අත්පත් කර ගැනීමේ දී අත්දකින දුක් වේදනා සතුටින් දරා ගනියි.<br>5 දේව රාජ්‍යයේ වටිනාකම් අත්පත් කර ගැනීම සඳහා අන් අය සමඟ සහයෝගයෙන් කටයුතු කරයි. | 30 |
| | 5.2 ශුද්ධවූ පාවුලු තුමාගේ දේවධාර්මික ඉගැන්වීම් මත ජීවිතය ගොඩනගා ගනියි. | ශු.ද්ධවූ පාවුලු තුමාගේ ප්‍රධාන ඉගැන්වීම්<br>ප්‍රේමය (1 කොරින්ති 13)<br>බැහැපත්කම (පිලිප්පි 2:5-11)<br>පවුල් දිවිය (එපීස 5:22-6:4) | 1 ශුද්ධ වූ පාවුලු තුමාගේ ප්‍රධාන ඉගැන්වීම් පිළිබඳ කරුණු ගොනු කරයි.<br>2 බැහැපත් දිවියක් ගත කළ යුතු බව පිළිගනියි.<br>3 ශුද්ධ වූ පාවුලු තුමාගේ ප්‍රධාන ඉගැන්වීම් පිළිබඳ ගොනු කළ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4 ප්‍රේම පාරමිතාව අනුව ජීවිතය හැඩගස්වා ගනියි.<br>5 පවුල තුළ සහයෝගයෙන් හා ප්‍රේමයෙන් දිවි ගෙවයි. | 20 |
| 6. සක්‍රමේන්තුමය ජීවිතයක් ගත කරයි. | 6.1 ප්‍රසාද ස්නාපනීය කැඳවීම තුළ තම කාර්යභාරය මැනවින් ඉටු කරයි. | ක්‍රිස්තූන් වහන්සේගේ බෞතීස්ම ස්නාපනය (මාක් 1:11<br>ගීතාවලිය 2:7 යෙසායා 42:1)<br>ප්‍රසාද ස්නාපන කැඳවීමෙහිලා කිතුනු අපගේ කාර්යභාරය (පූජක, දිවැසි, එඬේර) | 1 ප්‍රසාද ස්නාපනීය කැඳවීමේ කාර්යභාරය පිළිබඳ කරුණු ගොනු කරයි.<br>2 ප්‍රසාද ස්නාපනය ලැබීම මඟින් පූජක, දිවැසි හා එඬේර කාර්යභාරය ඉටු කළ යුතු බව පිළිගනියි.<br>3 ප්‍රසාද ස්නාපනීය කැඳවීමේ කාර්යභාරය පිළිබඳ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4 ප්‍රසාද ස්නාපනීය කැඳවීමට සාක්ෂ්‍ය දරයි.<br>5 ප්‍රසාද ස්නාපනීය කැඳවීම මඟින් සමාජ සේවයේ නිරත වෙයි. | 15 |

12 හා 13 ශ්‍රේණි නිපුණතා, නිපුණතා මට්ටම්, විෂය සන්ධාරය සහ කාලය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 6.2 දිව්‍ය සත්ප්‍රසාද භෝජනයෙන් පෝෂණය වී පරිත්‍යාගශීලී ජීවිතයක් ගත කරයි. | ජීවනදායක භෝජනය (ජොහන් 6:51-58)<br>දිව්‍ය සත්ප්‍රසාදය ස්ථාපිත කිරීම (මතෙව් 26:26-28, මාක් 14:22-24 ලූක් 22:14-20, 1 කොරින්ති 11:23-25)<br>නිසි ලෙස දිව්‍ය සත්ප්‍රසාදය වැළඳීම. (1 කොරින්ති 11:27-32) | 1. ජීවනදායක භෝජනය පිළිබඳ ව කරුණු ගොනු කරයි.<br>2. දිව්‍ය සත්ප්‍රසාදය විශ්වාසයෙන් යුතුව පිළිගනියි.<br>3. ජීවනදායක භෝජනය පිළිබඳව රැස් කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4. නිසි ලෙස දිව්‍ය සත්ප්‍රසාදය වැළඳීමට යොමු වෙයි.<br>5. අන් අය හා එක් ව පරිත්‍යාගශීලී ව කටයුතු කරයි. | 15 |
| 7. ජීවිත අභියෝග හමුවේ ශුද්ධාත්ම බලයෙන් පිරිපුන් වී විශ්වාසයට සාක්ෂ්‍ය දරයි. | 7.1 ශුද්ධාත්ම බලයෙන් සන්නද්ධ වී පිරිපුන් දිවියක් ගත කරයි. | ශුද්ධාත්ම ආගමනය (ක්‍රියා 2:1-41)<br>මුල් සභාවේ ලක්ෂණ (ක්‍රියා 2:42-47, 4:32-37)<br>උපස්ථායකයන් පත් කිරීම (ක්‍රියා 6:1-7)<br>ප්‍රාණපරිත්‍යාගී සාක්ෂ්‍ය<br>ස්තේපන් (ක්‍රියා 7:54-60)<br>මහා ජාකොබ් (ක්‍රියා 12:1-2)<br>විජාතිකයන්ට සුබ අස්න (ක්‍රියා 8:4-17, 10:1-48, 8:26-40)<br>ජෙරුසලම් මන්ත්‍රණ සභාව (ක්‍රියා 15:1-21) | 1. පෙන්තකොස්තයේ සිට මුල් කිතුනු සභාව වර්ධනය වූ ආකාරය දක්වා කරුණු ගොනු කරයි.<br>2 ශුද්ධාත්ම බලයෙන් පූර්ණ වී තරුණ ජීවිතයට එල්ල වන අභියෝග ජය ගත යුතු බව පිළිගනියි.<br>3 පෙන්තකොස්තයේ සිට මුල් කිතුනු සභාව වර්ධනය වූ ආකාරය පිළිබඳ ව නිර්මාණාත්මකව ඉදිරිපත් කරයි.<br>4 ශුභාරංචිය පතළ කිරීමට නොපසුබට ව ක්‍රියා කරයි.<br>5 ශුද්ධ වූ සභාවට එල්ල වන අභියෝග ජය ගැනීම සඳහා සහයෝගය දක්වයි. | 25 |
| | 7.2 විශ්වාසය රැකගනිමින් අභියෝග ජය ගනියි. | පීඩන 10<br>මිලාන් ආඥාව | 1 කිතුනු සභාවේ පීඩන සමය පිළිබඳ ව තොරතුරු ගොනු කරයි.<br>2 අභියෝග හමුවේ විශ්වාසය සවිමත් කර ගත යුතු බව පිළිගනියි.<br>3 කිතුනු සභාවේ පීඩන සමය පිළිබඳ ව ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4 විශ්වාසයට එරෙහි අභියෝග ජය ගනියි.<br>5 අභියෝග ජය ගැනීම සඳහා අන් අය හා එකමුතු ව ක්‍රියා කරයි. | 25 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 7.3 විශ්වාසය පෝෂණය කර ගනිමින් ශුද්ධ වූ සභාවේ සත්‍යතා අනුව ජීවත් වෙයි. | සභා පියවරු හැඳින්වීම<br>ප්‍රාණපරිත්‍යාගී ශු. ජස්ටින් තුමා<br>ශු. අතනාසියුස් තුමා<br>ශු. ජෙරොම් තුමා<br>ඇලෙක්සැන්ඩ්‍රියාවේ ශු. සිරිල් තුමා<br>ශු. අගුස්තීනු තුමා<br>ඔරිජන් තුමා (ඔරිගන් තුමා)<br>ටර්ටූලියන් තුමා<br>(එක් එක් අය පිළිබඳ ව කෙටි හැඳින්වීමක් පමණි.) | 1. සභා පියවරුන් පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2. දේව විශ්වාසය වර්ධනය කර ගනිමින් ශුද්ධ වූ සභාවේ සත්‍යතා අනුව දිවි ගෙවිය යුතු බව පිළිගනියි.<br>3. සභා පියවරුන් පිළිබඳ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4. ශුද්ධ වූ සභාවේ දහම් සත්‍යතාවලට අනුව දිවි ගෙවයි.<br>5. අන් අයගේ විශ්වාසය වර්ධනය කිරීම සඳහා එක් ව කටයුතු කරයි. | 25 |
| | 7.4 දේව ධාර්මික සත්‍යතා නිවැරදි ව උගන්වයි. | වේදභේද හා ජගත් මන්ත්‍රණ සභා<br>නයිසීන<br>කොන්ස්තන්තිනෝපල්<br>එපීස<br>කැල්සිඩොන් | 1. පළමු ජගත් මන්ත්‍රණ සභා 4 පිළිබඳ තොරතුරු රැස් කරයි.<br>2 දේව ධාර්මික සත්‍යතා නිවැරදි ව ඉගැන්විය යුතු බව පිළිගනියි.<br>3. පළමු ජගත් මන්ත්‍රණ සභා 4 පිළිබඳ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4. ශුද්ධාත්ම බලයෙන් පූර්ණ වී දුර්මතවලට එරෙහි ව නැඟී සිටියි.<br>5. දේව ධාර්මික සත්‍යතා සුරැකීමට අන් අය හා එක් ව ක්‍රියා කරයි. | 20 |

12 හා 13 ශ්‍රේණි නිපුණතා, නිපුණතා මට්ටම්, විෂය සන්ධාරය සහ කාලය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 8. ශුද්ධ වූ සභා ගමන් මඟ නිවැරදි කර ගැනීම සඳහා ශුද්ධාත්ම මඟපෙන්වීමට විවෘත වෙයි. | 8.1 ඵලදායී විවේචනවලට ශුභවාදී ප්‍රතිචාර දක්වමින් ගැටලු නිරාකරණය කර ගනියි. | 4-16 සියවස තෙක් ශු.සභා ඉතිහාසය ඉතා කෙටියෙන්<br>(අධ්‍යාපනය හා පැවිදි නිකායයන් ඇතුළුව)<br>ශු. සභාව බෙදී යාමේ පසුබිම<br>මාටින් ලූතර්<br>කැල්වින් හා ස්වින්ග්ලි<br>8 වන හෙන්රි රජතුමා<br>ජෝන් වෙස්ලි හා චාල්ස් වෙස්ලි<br>විලියම් බූත් | 1 ක්‍රි.ව. 4-16 සියවස තෙක් විශ්ව ශුද්ධ සභා ඉතිහාසය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2 ඵලදායී විවේචනවලට ශුභවාදී ප්‍රතිචාර දැක්විය යුතු බව පිළිගනියි.<br>3. ක්‍රි.ව.4-16 සියවස තෙක් විශ්ව ශුද්ධ වූ සභා ඉතිහාසය පිළිබඳ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4 ජාතික සමඟිය හා ආගමික සහජීවනය ගොඩනැඟීමට දායක වෙයි.<br>5 පිළිගත් සභා අතර සභා එකමුතු ව ගොඩනැඟීමට දායක වෙයි. | 25 |
| | 8.2 කාලානුරූප ව ශුද්ධ වූ සභාව නිසි මඟ ගැන්වීම සඳහා දායක වෙයි. | 16-21 සියවස තෙක් ශුද්ධ වූ සභා ඉතිහාසය ඉතා කෙටියෙන්<br>(ප්‍රතිසංස්කරණය හා පුනරුදය)<br>තාපස නිකායයෝ<br>ත්‍රිදෙන්තීන මන්ත්‍රණ සභාව<br>නවීන යුගය<br>ප්‍රංශ විප්ලවය<br>ශුද්ධ වූ සභාවේ දායකත්වය<br>පළමු වන වතිකාන සභාව<br>විශේෂිත ශුද්ධෝත්තම පියවරු<br>දෙවන වතිකාන මන්ත්‍රණ සභාව | 1 16-21 සියවස තෙක් සභා ඉතිහාසය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2 කාලානුරූපී වෙනස්කම්වලට ශුභවාදී ව ප්‍රතිචාර දැක්විය යුතු බව පිළිගනියි.<br>3 ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4 කිතුනු සභා නායකයන් ඉදිරිපත් කරන ඉගැන්වීම් හා මඟ පෙන්වීම් තම කිතුනු ජීවිතයට අදාළ කර ගනියි<br>5 ශුද්ධ වූ සභා නවෝදය වෙනුවෙන් දියත් කරන වැඩසටහන් සාර්ථක කර ගැනීම සඳහා අන් අය සමඟ සහයෝගයෙන් ක්‍රියා කරයි. | 25 |

12 හා 13 ශ්‍රේණි නිපුණතා, නිපුණතා මට්ටම්, විෂය සන්ධාරය සහ කාලය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 9 ශ්‍රී ලංකාවේ කිතුනු අනන්‍යතාවෙහි ලා සුබ අස්නේ පණිවිඩකරුවන් ලෙස සාක්ෂි දරයි. | 9.1 පුර්තුගීසීන් පැමිණීමට පෙර ශ්‍රී ලංකාව තුළ කිතු දහමේ ආරම්භය පිළිබඳ ව කරුණු සොයා බලයි. | පුර්තුගීසීන් පැමිණීමට පෙර යුගයේ කිතු දහම<br>පුර්තුගීසීන් පැමිණීමට පෙර ශ්‍රී ලංකාවේ කිතුනුවන් සිටි බවට සාක්ෂ්‍ය<br>කොස්මස් ඉන්ඩිකොප්ලෙයුස්ටස් නමැති දේශ සංචාරකයාගේ සාක්ෂිය<br>අනුරාධපුරයෙන් හමුවූ ගලක කෙටූ කුරුසිය<br>සීගිරි සමයේ සිටි මිගාර සේනාපති<br>තෝමස් අපෝස්තුලුවරයාගේ අනුගාමිකයන් මෙරට සිටි බවට පවත්නා සාක්ෂ්‍ය<br>මුගලන් රජු සමයේ කිතුනු ලාංඡන සහිත රන් කාසි<br>අබුසයිද්ගේ සටහන් ක්‍රි.ව 911 "ලංකාවේ එවකට සිටි රජුගේ ඇමති මණ්ඩලයේ හතර දෙනෙක් කිතුනුවෝ වූහ"<br>බෙන්ජමින් රබායිගේ සටහන් (12 වන සියවසේ) ශ්‍රී ලංකාවේ ජුදෙව් ක්‍රිස්තියානීන් 2300ක් පමණ ද පූජකවරුන් ද සිටි අතර දේවස්ථාන ද තිබිණි | 1. ශ්‍රී ලාංකේය කිතු සසුනේ ආරම්භය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2. ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි අනන්‍යතාව සුරැකිය යුතු බව පිළිගනියි.<br>3. ශ්‍රී ලාංකේය කිතු සසුනේ ආරම්භය පිළිබඳ ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4. විවිධ අභියෝග හමුවේ ක්‍රිස්තියානි විශ්වාසය සුරකියි.<br>5. ජාතික හා ආගමික සහජීවනය ගොඩනැගීමට දායක වෙයි. | 10 |

12 හා 13 ශ්‍රේණි නිපුණතා, නිපුණතා මට්ටම්, විෂය සන්ධාරය සහ කාලය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 9.2 ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ ධර්ම දූතයකු ලෙස කටයුතු කරයි. | පුර්තුගීසි යුගයේ ශ්‍රී ලංකාවේ කිතු දහම<br>පුර්තුගීසීන් පෙරදිගට පැමිණීම<br>පුර්තුගීසි පෙරදිග ඉන්දීය වෙළඳ සමාගම<br>පද්‍රෝආදෝ හෙවත් යටත් විජිතයන්හි ආරක්‍ෂක භාරය<br>ලොරෙන්සෝ ද අල්මේදා ලක්දිවට ගොඩබැසීම<br>ධර්මදූතවරුන් ලක්දිවට පැමිණීම.<br>පුර්තුගීසි ධර්මදූතවරුන්ගේ ප්‍රයත්නය සාර්ථක වීමට බලපෑ හේතු<br>පුර්තුගීසි ධර්මදූත ප්‍රචාරයේ ඌනතා<br>පුර්තුගීසි යුගයේ දී ඇති වූ කතෝලික විරෝධී පීඩන<br>මන්නාරමේ ප්‍රාණපරිත්‍යාගීවරු<br>විදීය බණ්ඩාරගේ පීඩනය<br>කිතු දහම වැලඳගත් රජ දරුවෝ<br>ධර්මපාල කුමරා<br>ජයවීර බණ්ඩාර<br>කරලියද්දේ බණ්ඩාර<br>වීර සුන්දර බණ්ඩාර<br>දෝන කතරිනා (කුසුමාසන දේවී)<br>යාපනය රජ පවුලේ කුමර කුමරියන්<br>දොන් ජුවන් යමසිංහ<br>පුර්තුගීසි පාලනයේ ප්‍රතිඵල | 1. පුර්තුගීසි යුගයේ ශ්‍රී ලංකාවේ කිතු දහම පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2. පුර්තුගීසි යුගයේ ධර්මදූතයන් කළ සේවය අගය කරයි.<br>3. පුර්තුගීසි යුගයේ ශ්‍රී ලංකාවේ කිතු දහම පිළිබඳ ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4. කිතුනු අනන්‍යතාව සුරැකීමට දායක වෙයි.<br>5. ධර්මදූත සේවය සඳහා සහයෝගය දක්වයි. | 20 |

12 හා 13 ශ්‍රේණි නිපුණතා, නිපුණතා මට්ටම්, විෂය සන්ධාරය සහ කාලය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 9.3.බාධක හමුවේ විශ්වාසයට සාක්ෂ දරයි. | ලන්දේසි යුගයේ ශ්‍රී ලංකාවේ කිතු දහම<br>ලන්දේසීන් ශ්‍රී ලංකාවට පැමිණීම<br>පෘතුගීසීන් හා ලන්දේසීන් අතර පැවති භේදය<br>ලන්දේසීන්ගේ කතෝලික විරෝධී ප්‍රතිපත්ති<br>ලන්දේසීන් මෙරට කතෝලිකයන්ට පීඩා කිරීමට හේතු<br>ලන්දේසි පීඩන හමුවේ මෙරට කතෝලිකයන්ගේ ප්‍රතිචාර<br>ලන්දේසි යුගයේ අධ්‍යාපනය<br>ලන්දේසි පාලන සමයේ හිතකර ලක්ෂණ<br>ශුද්ධ වූ ජුසේ වාස් පියතුමාගෙන් ලක් සසුනට වූ සේවය හා එතුමාගේ ධර්මදූත ප්‍රතිපත්ති<br>ගෞරවාන්විත ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමාගෙන් ලක් සසුනට වූ සේවය<br>ඔරතෝරියානු නිකායික ධර්මදූතවරුන්ගෙන් ලද සේවය<br>ගරු පිලිප්පුස් බල්දේවුස් දේවගැතිතුමාගෙන් ලක් සසුනට වූ සේවය | 1. ලන්දේසි යුගයේ ශ්‍රී ලංකාවේ කිතු දහම පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2. ශුද්ධ වූ ජුසේ වාස් පියතුමන් ප්‍රමුඛ ඔරතෝරියානු නිකායික පියවරුන්ගෙන් මෙරට කිතුනු සභාවට වූ සේවය අගය කරයි.<br>3. ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4. සැබෑ ධර්මදූතයකු ලෙස කටයුතු කරයි.<br>5. කිතුනු සාහිත්‍යය පෝෂණය කිරීමට අන් අයට සහයෝගය දක්වයි. | 20 |

12 හා 13 ශ්‍රේණි නිපුණතා, නිපුණතා මට්ටම්, විෂය සන්ධාරය සහ කාලය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 9.4 කිතුනු ධර්මදූත ව්‍යාපාර මඟින් විවිධ ක්ෂේත්‍රයන්හි සිදු කළ සේවා ඉදිරියට ගෙන යාමට පියවර ගනියි. | බ්‍රිතාන්‍ය යුගයේ ශ්‍රී ලංකාවේ කිතු දහම<br>ආගමික නිදහස<br>කතෝලිකයන්ට පූර්ණ නිදහස ලබා දුන් මැග්නා කාර්ටා පනත<br>විදේශීය ධර්මදූත කණ්ඩායම් මෙරටට පැමිණීම හා සේවය<br>ලන්ඩන් ධර්මදූත කණ්ඩායම- 1805<br>බැප්ටිස්ට් ධර්මදූත කන්ඩායම-1812<br>වෙස්ලියන් ධර්මදූත කණ්ඩායම- 1814<br>ඇමෙරිකන් ධර්මදූත කණ්ඩායම - 1816<br>සභා ධර්මදූත සංගමය (C.M.S.) 1818<br>ගැලවීමේ හමුදාවේ ධර්මදූත කණ්ඩායම - 1883<br>බයිබල් සමාගම<br>බ්‍රිතාන්‍ය යුගයේ දී ශ්‍රී ලංකාවේ කතෝලික සභාව (අනුපදවි හා රදගුරු පදවි ආරම්භය)<br>පැවිදි නිකායයන්ගේ පැමිණීම හා සේවය<br>සිල්වෙස්ත්‍රීන බෙනදිකාන නිකාය - 1845<br>නිර්මල මරිය නිකාය - 1848<br>ශුද්ධ වූ පවුලේ පැවිදි නිකාය - 1862<br>ද ලා සාල් නිකාය - 1866<br>යහපත් එඬේරා පැවිදි නිකාය - 1869<br>මරිය තුමියගේ ප්‍රැන්සිස්කාන පැවිදි නිකාය - 1886<br>දිළිඳුන්ගේ කුඩා සොහොයුරියෝ පැවිදි නිකාය - 1888<br>දයාවේ සොහොයුරියන්ගේ පැවිදි නිකාය - 1896<br>සුරදූතික සොහොයුරියන්ගේ පැවිදි නිකාය - 1903<br>මාරිස්ට් සහෝදරතුමන්ලා - 1911<br>අපොස්තලික කර්මෙල් නිකාය - 1922<br>බ්‍රිතාන්‍ය යුගයේ දී ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය<br>ගරු ක්‍රිස්ටෝපර් බොන්ජන් පියතුමා හා ආධාර ලබන පාසල් (උපකෘත පාසල්)<br>ශ්‍රී ලංකාවේ නිදහස වෙනුවෙන් කිතුනු දායකත්වය | 1 බ්‍රිතාන්‍ය යුගයේ ශ්‍රී ලංකාවේ කිතු දහම පිළිබඳ තොරතුරු ගොනුකරයි.<br>2 කිතුනු ධර්මදූත ව්‍යාපාරය මඟින් ශ්‍රී ලංකාවේ ආගමික, අධ්‍යාපන හා සමාජීය ක්ෂේත්‍රයන්ට ලැබුණු දායකත්වය අගය කරයි.<br>3 ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4 සැබෑ කිතුනුවන් ලෙස කටයුතු කරයි.<br>5 ආගමික නිදහස සුරැකීමට දායක වෙයි. | 25 |

12 හා 13 ශ්‍රේණි නිපුණතා, නිපුණතා මට්ටම්, විෂය සන්ධාරය සහ කාලය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 9.5 දේශීය ශුද්ධ වූ සභාවක් ගොඩනැඟීමට දායක වෙයි. | නිදහස් යුගයේ ශ්‍රී ලංකාවේ කිතු දහම<br>නිදහසින් පසු ලාංකේය ශු. සභාව මුහුණ දුන් ගැටලු<br>පාසල් රජයට පවරා ගැනීම<br>පැවිදි සොහොයුරියන් රෝහල් සේවයෙන් ඉවත් කිරීම<br>පැවිදි අයගේ වීසා අවලංගු කිරීම<br>ක්‍රිස්තියානි ආගමිකයන් කෙරෙහි නිර්දය විවේචන<br>ජනවාර්ගික ගැටලුව සහ සාම ක්‍රියාදාමය<br>බෙදී ගිය කිතුනු ආගමික ව්‍යාපාර<br>දේශීයකරණය සඳහා දරන ලද ප්‍රයත්න<br>නිදහස් යුගයේ රදගුරු පදවි විකාශය | 1 නිදහසින් පසු යුගයේ ශ්‍රී ලංකාවේ කිතු දහම පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2 නිදහසින් පසු දේශීය කරණය සඳහා සභාව විසින් දරන ලද ප්‍රයත්න අගය කරයි.<br>3 ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි<br>4 ශ්‍රී ලාංකේය ශුද්ධ වූ සභාව දේශීයකරණය සඳහා ඇපකැප වෙයි.<br>5 දේශීය ශුද්ධ වූ සභාව පෝෂණය කිරීමට දායක වෙයි. | 20 |
| 10. මානව වටිනාකම් සුරකිමින් විවිධත්වය මඟින් ඒකත්වයක් ගොඩ නැඟීමට කැප වෙයි. | 10.1වත්මන් සමාජ ජීවිතය තුළ කිතුනු වගකීම් නොපිරිහෙළා ඉටු කරයි. | මිනිස් බවේ ගරුත්වය<br>කාන්තාව පිළිබඳ කිතුනු චින්තනය<br>මානව සංවර්ධනය සඳහා කිතුනු සහභාගිත්වය<br>මිනිසාගේ සමාජ ජීවිත (කිතුනු විවාහයේ ශුද්ධත්වය)<br>ගැටුම් නිරාකරණය හා සාමය නඟාලීම<br>පරිසර සුරැකීමේ කිතුනු වගකීම | 1 මිනිස් බවේ ගරුත්වය සුරැකීම සඳහා කිතුනුවා ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2 අන් අයට ගරු කළ යුතු බව පිළිගනියි.<br>3 මිනිස් බවේ ගරුත්වය සුරැකීම සඳහා කිතුනුවා ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4 මානව සංවර්ධනය සඳහා කටයුතු කරයි.<br>5 ගැටුම් නිරාකරණය කර ගනිමින් සාමකාමී ව දිවි ගෙවයි. | 15 |
| | 10.2එක ම ශුද්ධ සභාවක් ගොඩනැඟීමට සහජීවනයෙන් කටයුතු කරයි. | කිතුනු සභා සමඟිය<br>1.ශ්‍රී ලංකාවේ ප්‍රධාන කිතුනු සභා<br>2.කිතුනු සභා එකමුතුව සඳහා බයිබලීය පදනම<br>උත්තම පූජක යාච්ඤාව<br>(ජොහන් 17:19-26<br>1 කොරින්ති 1:10-13)<br>3. සභා එකමුතු කිරීම සඳහා ප්‍රයත්නය WCC, වතිකාන ප්‍රකාශන 2, BEM ARCIC 1 සහ 2<br>4. සභා එකමුතු කිරීම සඳහා ශ්‍රී ලාංකේය ප්‍රයත්න | 1 කිතුනු සභා සමඟිය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2 කිතුනු සභා එකමුතුව උදෙසා ක්‍රියා කළ යුතු බව පිළිගනියි.<br>3 කිතුනු සභා සමඟිය පිළිබඳ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4 කිතුනු සභා ඒකත්වය වෙනුවෙන් කටයුතු කරයි.<br>5 සියලු කිතුනු සභාවන්ට ගරු කරයි. | 15 |

**නිපුණතාව 6.0 : සක්‍රමේන්තුමය ජීවිතයක් ගත කරයි.**

**නිපුණතා මට්ටම 6.1 :** ප්‍රසාද ස්නාපනීය කැඳවීමෙහිලා තුළ තම කාර්යභාරය මැනවින් ඉටු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව:** 15

**ඉගෙනුම් පල**

- ප්‍රසාද ස්නාපනීය කැඳවීමේ කාර්යභාර්ය පිළිබඳ ව කරුණු ගොනු කරයි.
- ප්‍රසාද ස්නාපනය ලැබීම මගින් පූජක, දිවැසි හා එඬේර කාර්යභාර්ය ඉටු කළ යුතු බව පිළිගනියි.
- ප්‍රසාද ස්නාපනීය කැඳවීමේ කාර්යභාර්ය පිළිබඳ ව ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- ප්‍රසාද ස්නාපනීය කැඳවීමට සාක්ෂ්‍යය දරයි.
- ප්‍රසාද ස්නාපනීය කැඳවීම මගින් සමාජ සේවයේ නිරත වෙයි.

## 6.1.1 ක්‍රිස්තුන් වහන්සේගේ බෞතීස්ම ස්නාපනය

ක්‍රිස්තුන් වහන්සේගේ බෞතීස්ම ස්නාපනය කෙතරම් වැදගත් වන්නේ ද යත් ශුභාරංචි කතුවරුන් හතර දෙනා ම එම සිද්ධිය වාර්තා කරයි (මතෙව් 3:13-17, මාක් 1:9-11, ලූක් 3:21-22, ජොහන් 1:32-34) ස්නාවක ජොහන් තුමා මනස්ථාපනයේ බෞතීස්ම ස්නාපනයක් දේශනා කළ සේක: "පව් කමාව පිණිස පසුතැවී සිත් හරවා ගෙන බෞතීස්ම-ස්නාපනය ලබන්න" (ලූක් 3:3) මෙවැනි පසුබිමක් තුළ ක්‍රිස්තුන් වහන්සේ ද ස්නාවක ජොහන් තුමාගෙන් බෞතීස්ම-ස්නාපනය ලබන පිණිස පැමිණි සේක. ක්‍රිස්තුන් වහන්සේ තුළ කිසි ම පාප කිලුටක් නොමැති වූ බැවින් ස්නාවක ජොහන් තුමා ක්‍රිස්තුන් වහන්සේ බෞතීස්ම ස්නාපනය ලැබීමෙන් වැළැක්වීමට උත්සාහ කළේ ය (මතෙව් 3:14). එහෙත් ක්‍රිස්තුන් වහන්සේ විසින් ස්නාවක ජොහන් තුමාට දුන් උපදේශය වූයේ දේව කැමැත්ත ඉටු වන පිණිස එය සිදු කරන ලෙස ය (මතෙව් 3:15). මෙමගින් පෙන්නුම් කරන වැදගත් කරුණක් වන්නේ පාපයෙන් මිනිසා ගලවා ගැනීමට මෙලොවට පැමිණි කිසි ම පාපයක් නොදත් ජේසුස් වහන්සේ පව්කරුවන් සමඟ ප්‍රසාද ස්නාපනය ලබමින් පව්කරුවන්ගේ අනන්‍යතාව ලබා ගත් බව ය.

ක්‍රිස්තුන් වහන්සේ ස්නාවක ජොහන් තුමාගෙන් බෞතීස්ම ස්නාපනය ලබා දියෙන් ගොඩට පැමිණි විට ස්වර්ගය විවර විය. මෙයින් පෙන්නුම් කරන්නේ දෙවියන් වහන්සේගෙන් වෙන් ව සිටීම අවසන් කර ඇති බව ය. ස්වර්ගය හා පොළොව අතර සන්නිවේදනයක් සිදු වන බව ය. (යෙසායා 64:1-2). එම අවස්ථාවේ දී ශුද්ධාත්මයාණන් වහන්සේ පරෙවියකු මෙන් උන් වහන්සේ මත වැඩ සිටි සේක. එය කුඩා පෙන්තකොස්තයක් මෙන් විය. ලෝකාරම්භයේ ජලය මතු පිට දේවාත්මානුභාවය හැසිරීම මෙමගින් සිහිපත් කෙරෙයි (උත්පත්ති 1:2). උන් වහන්සේගේ මංගල ධර්ම දේශනාවේ දී යෙසායා ග්‍රන්ථය උපුටා දක්වමින් මෙසේ දන්වා සිටියේ එබැවිනි: "ස්වාමීන් වහන්සේගේ ආත්මය මා කෙරෙහි ඇත. මක් නිසා ද දිළිඳුන්හට සුබ ආරංචිය දේශනා කරනු වස්, උන් වහන්සේ මා ආලේප කළ සේක" (ලූක් 4:18).

ක්‍රිස්තුන් වහන්සේ ස්නාවක ජොහන් තුමාගෙන් ප්‍රසාද ස්නාපනය ලබා දියෙන් ගොඩට පැමිණෙත් ම ස්වර්ගයෙන් හඬක් නික්මෙයි. එම හඬ ක්‍රිස්තුන් වහන්සේගේ කැඳවීම මැනවින් පිළිබිඹු කරයි. එම හඬ ශුද්ධ වූ මාක් තුමා වාර්තා කරන්නේ මෙසේ ය: "ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝ ය; ඔබ කෙරෙහි ඉතා ප්‍රසන්න වී සිටිමි" (මාක් 1:11). මෙහි දී ක්‍රිස්තුන් ස්වාමීන් වහන්සේගේ කැඳවීම පුරාණ ගිවිසුමේ භාෂාවෙන් ඉදිරිපත් කර ඇත. මෙම හඬෙහි අර්ථය තේරුම් ගැනීමට හැකි වන්නේ පුරාණ ගිවිසුම ආශ්‍රයනි. "ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝ ය" යන්න ගීතාවලිය 2:7න් ද, "ඔබ කෙරෙහි ඉතා ප්‍රසන්න වී සිටිමි" යන්න යෙසායා 42:1න් ද උපුටා ගෙන ඇත.

ගීතාවලියේ දෙවන ගීතය රාජාභිෂේකයක දී ගයන ලද්දකි. ඒ අනුව, "ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝ ය" යන්නෙන් ක්‍රිස්තුන් වහන්සේ රජකු බව ප්‍රකාශ කරයි. එහෙත් ක්‍රිස්තුන් වහන්සේ ලෞකික රජවරුන් මෙන් නොවෙති. ඉශ්රායෙල් ජනතාව විනාශ මුඛය කරා ගෙන ගිය අතීතයේ සිටි ඉශ්රායෙල් රජවරුන්ට වඩා උන් වහන්සේ හාත්පසින් ම වෙනස් ය. ක්‍රිස්තුන් වහන්සේ කැඳවා ඇත්තේ, අසුන් අරා සිටින රජකු වීමට නොව සේවක-රජකු, දුක් විඳින-රජකු වීමට ය. යෙසයා 42හි දුක් විඳින සේවකයාගේ ගීතයේ අඩංගු "ඔබ කෙරෙහි ඉතා ප්‍රසන්න වී සිටිමි" යන්න ගීතාවලිය 2 ගීතය හා සම්බන්ධ කරමින් ක්‍රිස්තුන් වහන්සේගේ කැඳවීම ප්‍රකාශ කරන්නේ එබැවිනි.

සේවය හා දුක් විඳීම මගින් රජෙකු වීමට කැඳවීම ලැබූ ක්‍රිස්තුන් වහන්සේ බෞතීස්ම-ස්නාපනය ලබා පාළුකරයට ගිය සේක. පාළුකරයේ දී උන් වහන්සේ පරීක්ෂා තුනකට මුහුණ දෙයිඃ

1. ගල් පාන්වලට හරවා සිය බලය ප්‍රදර්ශනය කිරීමට (බලය)
2. දේව මාළිගාවේ කොත මුදුනෙන් පැන දේවදූතයන් සේවය ලබන තැනැත්තකු ලෙස කීර්තිය පැතිර වීමට (කීර්තිය)
3. යක්ෂයාට වන්දනා කර සියලු රට රාජ්‍යයන් හිමි කර ගැනීමට (ධනය)

ඉශ්රායෙල් රජවරු බලය, කීර්තිය හා ධනය මත සිය රජකම ගොඩනැගුව ද ක්‍රිස්තුන් වහන්සේගේ රජකමෙහි දී ඒවා ප්‍රතික්ෂේප වේ. ධනය, බලය හා කීර්තිය මත ගොඩනැගෙන ව්‍යුහ අනෙකා සූරාකමින් පීඩනයට පත් කරයි. එහෙත් සේවය හා අනෙකාගේ අභිවෘද්ධිය මත ගොඩනැගෙන ව්‍යුහ සහෝදරත්වයේ, සාමූහිකත්වයේ හා සහභාගිත්වයේ ව්‍යුහ වේ.

අපෝස්තුලුවරුන්ගේ පවා පැතුම වූයේ දුක් විඳින-රජෙක්, සේවක-රජෙක් නොවේ. එබැවින් ජාකොබ් හා ජොහන් යන අපෝස්තුලුවරුන් ක්‍රිස්තුන් වහන්සේගේ තේජශ්‍රියේ දී දකුණුපස හා වම්පස අසුන් ගැනීමට අයදින අතර (මාක් 10:35-40)මෙය ඇසූ සෙසු අපෝස්තුලුවරු ඒ පිළිබඳ ව කෝප වේ (මාක් 10:41). ඒ අවස්ථාවේ දී ක්‍රිස්තුන් වහන්සේගේ ඉගැන්වීම වන්නේ ද උන් වහන්සේ මෙන් ම උන් වහන්සේගේ ශ්‍රාවකයන් ද සේවක-රජවරුන් විය යුතු බව යි (මාක් 10:42-45). එසේනම් ප්‍රසාද ස්නාපනය ලබා සිටින අප සැමගේ කැඳවීම ද සේවක-රජවරුන් වීමට ය.

## 6.1.2 ප්‍රසාද ස්නාපනීය කැඳවීමෙහිලා කිතුනු අපගේ කාර්යභාරය

ප්‍රසාද ස්නාපනය දානය කිරීමේ දී සැම කිතුනුවෙක් ම පූජාප්‍රසාදීවරයකු, දිවැසිවරයකු හා රජ කෙනකු ලෙස ක්‍රිස්මා තෛලයෙන් ආලේප කරනු ලබයි. එය කරණ කොට ගෙන ප්‍රසාද ස්නාපනය ලැබූ සැම කෙනෙකුට ම පූජක, දිවැසිවර හා රාජකීය වගකීම් පැවරෙයි.

### 1. පූජක කාර්යභාරය

පූජකයෙක් යනු මිනිසා හා දෙවියන් වහන්සේ අතර මැදිහත්කරුවෙකි. දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා අතර අසහාය මැදිහත්කරුවාණන් ක්‍රිස්තුන් වහන්සේ බව හෙබ්‍රෙව්වරුන් වෙත ලියන ලද ලිපිය පෙන්වා දෙයි. ප්‍රසාද ස්නාපනය ලබා සිටින කිතුනුවා ද පොදු පූජකවරය ලබා ඇත. ඒ අනුව ඔහු ද දෙවියන් වහන්සේ හා මිනිසා අතර මැදිහත්කරුවෙකි. ඔහු මැදිහත්කරුවකු වන්නේ අන් අය වෙනුවෙන් යාච්ඤාවෙන් මැදිහත් වන තරමට ය. දිව්‍ය පූජාවේ කියවෙන "විශ්වාසකයන්ගේ යාච්ඤා" "මැදිහත්වීමේ යාච්ඤා" යනුවෙන් ද හැඳින්වේ. එහි දී විශේෂයෙන් අන් අයගේ අවශ්‍යතා වෙනුවෙන් යාච්ඤා කරමු. එහෙත් අපගේ මැදිහත් වීමේ කාර්යය විශ්වාසකයන්ගේ යාච්ඤාවලට පමණක් සීමා නොකළ යුතු වෙයි. දිනපතා පෞද්ගලික යාච්ඤාවේ දී අපගේ හා අපට සමීප අයගේ අවශ්‍යතා සඳහා පමණක් නොව අපට සමීප නැති අයගේ හා පොදු අවශ්‍යතා වෙනුවෙන් ද යාච්ඤා කරමින් සැබෑ පූජකයන් ලෙස අන් අය වෙනුවෙන් අපි සැවොම දෙවියන් වහන්සේ ඉදිරියෙහි මැදිහත් විය යුතු වෙමු.

## 2. එඬේරික (රාජකීය) කාර්යභාරය

එඬේරෙක් යනු නායකයෙකි. මඟ පෙන්නුම්කරුවෙකි. නායකයා සේවකයා විය යුතු බව ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රධාන ඉගැන්වීමක් විය. (ජොහන් 13:13-14). උන් වහන්සේ එසේ ඉගැන්වූවා පමණක් නොව අන්තිම රාත්‍රි භෝජනයේ දී එය ක්‍රියාවෙන් ම ඔප්පු කළ සේක. (ජොහන් 13:4-5) එසේ නම් අප ද සේවක-නායකයන් විය යුතු ය. ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රසාද ස්නාපනයේ දී ස්වර්ගයෙන් නික්මුණ හඬ ශබ්දයේ අරුත ද එය බව අපි ඉහත අධ්‍යයනය කර ඇත්තෙමු. අප ද ප්‍රසාද ස්නාපනය ලබන්නේ සේවක-නායකයන් වීමට බව අමතක නොකළ යුතු වෙයි.

ක්‍රිස්තුන් වහන්සේ යහපත් බැටළු එඬේරාණෝ ය (ජොහන් 10:11-16). උන් වහන්සේ වදාළ දෙය වචනයට පමණක් සීමා නොකර වදාළ ලෙස ම තම බැටළුවන් උදෙසා තම ජීවිතය පූජා කළ සේක. එසේ කරමින් මානව සංහතියට ම ගැලවීම උදා කළ සේක. අපි ද විවිධ ක්ෂේත්‍රවල දී එඬේරුන් ලෙස කටයුතු කරමු. එහි දී අපගේ වගකීම වන්නේ එම ක්ෂේත්‍රවල නායකයන් ලෙස වැජඹීම නොව අපගේ නායකත්වය මඟින් සේවය ලබන අය වෙනුවෙන් පූජා වීම ය. ජේසුස් වහන්සේ එලෙස තම ජීවිතය පූජා කළේ මනුෂ්‍ය සංහතියට දැක්වූ අපරිමිත ප්‍රේමය නිසා ය. එහෙයින් අප ද අපගේ බැටළුවන් උදෙසා පූජා විය යුත්තේ ඔවුනට දක්වන ප්‍රේමය කරණ කොට ගෙන ය.

## 3. දිවැසි කාර්යභාරය

දිවැසිවරයකු යනු දෙවියන් වහන්සේ වෙනුවෙන් කථා කරන්නෙකි. කාලයේ සලකුණු තේරුම් ගනිමින් පුද්ගලයකුගේ තත්ත්වය, තනතුර, තමාට ලැබෙන ප්‍රතිචාර පවා නොතකා දේව පණිවිඩය ප්‍රකාශ කරන්නෙකි (ජෙරමියා 11:2). පුරාණ ගිවිසුමේ දී පණිවිඩය හා පණිවිඩය ප්‍රකාශ කරන්නා යනු දෙදෙනෙකි. එහෙත් නව ගිවිසුමේ දී පණිවිඩය හා පණිවිඩය ප්‍රකාශ කරන්නා යනු දෙදෙනකු නොව එක් කෙනෙකි. ඒ ක්‍රිස්තුන් වහන්සේ ය. ක්‍රිස්තුන් වහන්සේ දේව වචනය මෙන් ම දේව වචනය ප්‍රකාශ කරන්නා ද වන සේක.

ප්‍රසාද ස්නාපනය ලැබූ කිතුනුවා ද දිවැසිවරයෙකි; දෙවියන් වහන්සේ වෙනුවෙන් කථා කරන්නෙකි; දේව වචනය ප්‍රකාශ කරන්නෙකි. දේව වචනය ප්‍රකාශ කිරීමට නම් අපි මැනවින් දේව වචනය දැන සිටිය යුතු වෙමු. අපි දේව වචනය දැන ගැනීමට නම් දින පතා දේව වචනය කියවන්නන් විය යුතු වෙමු. එසේ නම් දින පතා ශුද්ධ බයිබලයේ පරිච්ඡේදයක් හෝ ශුද්ධ බයිබල් පාඨයක් හෝ කියවා එය මෙනෙහි කිරීමට කාලය වෙන් කර ගත යුතු වෙයි. දින පතා කියවන දේව වචනය අනුව ජීවත් වී, තමාට ලැබෙන සෑම අවස්ථාවක් ම උපරිම ලෙස ප්‍රයෝජනයට ගනිමින් තම වචනයෙන්, ක්‍රියාවෙන් හා ජීවිතයෙන් දේව වචනය ප්‍රකාශ කළ යුතු වෙමු.

තව ද සත්‍යයට සාක්ෂ්‍ය දරමින් යුක්තිය වෙනුවෙන් පෙනී සිටිමින් සාධාරණත්වය අරබයා කටයුතු කරමින් දෙවියන් වහන්සේ වෙනුවෙන් කථා කරන්නකු විය යුතු ය.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :**

1. ප්‍රසාද ස්නාපනීය කැඳවීම අනුව කිතුනු අප ඉටු කළ යුතු කාර්යභාරයන් තුන නම් කර, ඒවා පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් කරන්න.

2. පාළුකරයේ දී ක්‍රිස්තුන් වහන්සේ මුහුණ දුන් පරීක්ෂා තුන ලියන්න.

3. ප්‍රසාද ස්නාපනය ලද කිතුනුවෙකු ලෙස ඔබ සමාජය තුළ ජීවත් විය යුතු ආකාරය කරුණු 5කින් දක්වන්න.

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. BROWN, R.E., FITZMYER, J.A. & MURPHY, R.E., **New Jerome Biblical Commentary,** Theological Publications in India, Bangalore, 2013.

2. දසනායක, ජූඩ් (පියතුමා), **ප්‍රසාද ස්නාපනය**, කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, 2011.

3. **ශුද්ධ බයිබලය අධ්‍යයන පිටපත (නව ගිවිසුම 1)**, ශ්‍රී ලංකා බයිබල් සමාගම, කොළඹ 3, 1995.

**නිපුණතාව 6.0 : සක්‍රමේන්තුමය ජීවිතයක් ගත කරයි.**

**නිපුණතා මට්ටම 6.2 :** දිව්‍ය සත්ප්‍රසාද භෝජනයෙන් පෝෂණය වී පරිත්‍යාගශීලී ජීවිතයක් ගත කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව:** 15

**ඉගෙනුම් පල :**

- ජීවන දායක භෝජනය පිළිබඳ ව කරුණු ගොනු කරයි.
- දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ විශ්වාසයෙන් යුතු ව පිළිගනියි.
- ජීවන දායක භෝජනය පිළිබඳ ව ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- නිසි ලෙස දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමට යොමු වෙයි.
- අන් අය හා එක් ව පරිත්‍යාගිශීලී ව කටයුතු කරයි.

## 6.2.1 ජීවන දායක භෝජනය (ජොහන් 6:51-58)

දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ ව ඉගැන්වීමේ දී ජොහන් සුබාරංචියේ "මාංසය" (ග්‍රීක බසින්, සාර්ක්ස්, Sarx ) යනුවෙන් ද සමදර්ශක ශුභාරංචිවල හා 1 කොරින්ති ලිපියේ "ශරීරය" (ග්‍රීක බසින්, සෝමා, Soma) යනුවෙන් ද භාවිත කරයි. ශුද්ධ ලියවිලි පිළිබඳ විශාරදයන් දක්වන පරිදි, ජොහන් ශුභාරංචියේ යොද ඇති "මාංසය" යන වචනය වඩා පැරණි වන අතර සමදර්ශක ශුභාරංචිවල හා 1 කොරින්ති ලිපියේ යොදා ඇති "ශරීරය" යන වචනය පසු කාලීන යෙදුමකි. ඔවුනට අනුව ක්‍රිස්තුන් වහන්සේ ද භාවිත කරන්නට ඇත්තේ මාංසය යන යෙදුම යි. "සාර්ක්ස්" යන යෙදුමෙන් මාංසය හා ජීවත් වන ශරීරය අදහස් කෙරෙයි.

මාංසය "අනුභව කිරීම" සඳහා යෙදී ඇති ග්‍රීක වචනය වන්නේ, "ත්‍රෝගයින්" ය. එහි අර්ථය වන්නේ, " විකා කෑම" ය. ඒ අනුව පැහැදිලි වන්නේ, අනුභව කිරීම යන්න යොදා ඇත්තේ, උපමා ආකාරයෙන් නොවන බව ය. එහෙයින් සදාතන ජීවිතය ලබා ගැනීම සඳහා උන් වහන්සේගේ ශ්‍රී ශරීරය සැබැවින් ම අනුභව කළ යුතු බව පෙන්වා දෙයි.

නිකදේමුස්ට "නැවත උපදීම" පිළිබඳ ව කථා කිරීමේ දී එය ශාරීරික ඉපදීමක් ලෙස ඔහු තේරුම් ගත්තේ ය. සමාරිය ස්ත්‍රියට "ජීවන ජලය" පිළිබඳ ව කථා කිරීමේ දී එය බීමට ගන්නා ස්වාභාවික ජලය ලෙස ඇය තේරුම් ගත්තා ය. එලෙස ම මෙහි දී ජුදෙව්වන් "මාංසය" යන්න තේරුම් ගන්නේ වචනාර්ථයෙන් භෞතික මාංසය ලෙස ය. සෙමතික් ව්‍යවහාරයෙහි ද ව්‍යංග්‍යයෙන් යමක් පැවසීමේ ලක්‍ෂණය ඇත (ගීතාවලිය 27:2). එයින් අදහස් කරන ලද්දේ, අපහාස කිරීම ය. මෙහි දී "මාංශය" යන්න ව්‍යංග්‍යාර්ථයෙන් "දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ" අදහස් කරන බව ජුදෙව්වෝ අවබෝධ කර ගැනීමට අපොහොසත් වෙති. මාංසය අනුභව කරනවාටත් වඩා රුධිරය පානය කිරීමට අවශ්‍ය බව කීම වඩාත් බරපතළ වේ. මන්ද යත්, රුධිරය තුළ ජීවිතය අන්තර්ගත ව ඇති බවත් ජීවිතය දෙවියන් වහන්සේට පමණක් අයිති බවත් ජුද විශ්වාසය වූ බැවින් රුධිරය හා සම්බන්ධ ආහාර-පාන ජුදෙව්වන්ට තහනම් වීමය (උත්පත්ති 9:4, ද්විතීය 12:16).

ජොහන් ශුභාරංචිය රචනා වූයේ ක්‍රි.ව. 100 දී පමණ ය. පූප වැඩි කිරීමේ ප්‍රාතිහාර්යයෙන් පසු ගලීලයන්ට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ ගැඹුරු දේව ධර්මයක් තේරුම් ගැනීමට නොහැකි වුවත් ක්‍රි.ව. 100 දී ජොහන් සංසයටත් ඉන් අනතුරු ව මෙම ශුභාරංචිය කියවූ හා අද මෙම ශුභාරංචිය කියවන අයටත් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ මෙම ගැඹුරු දේව ධාර්මික ඉගැන්වීම් ගැටලුවකින් තොර ව අවබෝධ කර ගත හැකි ය. ඒ අනුව දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමේ දී ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී ශරීරය අනුභව කිරීම හා ශ්‍රී රුධිරය පානය කිරීම අපට පහසුවෙන් අවබෝධ කර ගත හැකි ය.

### 6.2.2 දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කිරීම

සමදර්ශක ශුභාරංචි තුන (මතෙව් 26:26-28, මාක් 14:22-24, ලූක් 22:19-20) හා 1 කොරින්ති ලිපිය (1 කොරින්ති 11:23-26) ක්‍රිස්තුන් වහන්සේ විසින් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කිරීමේ සිද්ධිය වාර්තා කරයි. මෙම වාර්තා හතරෙහි සුළු සුළු වෙනස්කම් ඇත්තේ එම කතුවරුන් හතර දෙනා සම්ප්‍රදාය දෙකක් අනුගමනය කර ඇති නිසා ය. ශුද්ධ වූ ලූක් තුමා හා ශුද්ධ වූ පාවුලු තුමා අන්තියෝකියානු සම්ප්‍රදායයත් ශුද්ධ වූ මාක් තුමා හා ශුද්ධ වූ මතෙව් තුමා ජෙරුසලම් සම්ප්‍රදායයත් අනුගමනය කර ඇත. මුල් අන්තියෝකියානු හා ජෙරුසලම් කිතුනු සභා අන්තිම රාත්‍රි භෝජනය පැවැත්වූ ආකාර එම වාර්තාවලට පදනම් වී ඇත. එම සම්ප්‍රදායයන්ට අයත් වචනවල හා පාඨවල යම් යම් වෙනස්කම් දක්නට ඇතත්, ජනවන්දනා (දිව්‍ය පූජා) පිළිවෙතෙහි දක්නට ඇත්තේ පොදු ලක්ෂණ ය.

දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් නව ගිවිසුමෙහි ඇති වාර්තා අතරින් පැරණිතම වාර්තාව වන්නේ 1 කොරින්ති 11:23-26 වේ. ශුද්ධ වූ පාවුලු තුමා කොරින්තිවරුන්ට තම පළමු වන ලිපිය ලියන ලද්දේ ක්‍රි.ව. 56 දී පමණ ය. මෙම පාඨය තුළ අඩංගු "මා ඔබට ඉගැන්වූ මේ පිළිවෙත ම ස්වාමින් වහන්සේගෙන් ම ලැබුවෙමි" යන්න අවබෝධ කරගත යුත්තේ, ක්‍රිස්තුන් ස්වාමීන් වහන්සේගේ දර්ශනයකින් හෝ ස්වප්නයකින් හෝ කළ අනාවරණයක් ලෙස නොව, ක්‍රිස්තුන් වහන්සේගෙන් ඍජු ව මෙම පිළිවෙත ලැබූ අපෝස්තුලුවරුන් විසින් පිහිටුවන ලද සභාවක ජනවන්දනාව ඇසුරෙන් ලැබුවක් ලෙස ය. පාවුලු තුමාගේ සිත් හැරීමෙන් පසු ව එතුමා වැඩි වශයෙන් සම්බන්ධ වූයේ සිරියේ අන්තියෝකීය සභාවට ය. එබැවින් පාවුලු තුමා සිරියේ අන්තියෝකීය සභාවේ ජනවන්දනාව ඇසුරෙන් මෙම පිළිවෙත ලබන්නට ඇතැයි විශ්වාස කළ හැකි ය. ලූක් තුමා ද සම්බන්ධ ව සිටියේ සිරියේ අන්තියෝකීය සභාවට ය. එහෙයින් පාවුලු හා ලූක් තුමන්ලා අන්තියෝකීය සම්ප්‍රදායය අනුගමනය කිරීම තේරුම් ගත හැකි ය.

මාක් 14:22-24, මතෙව් 26:26-28, ලූක් 22:19-20 හා 1 කොරින්ති 11:23-26 පාඨ පහත සඳහන් වගුව ඇසුරෙන් අධ්‍යයනය කළ හැකි ය.

| | අන්තියෝකියානු සම්ප්‍රදායය | | ජෙරුසලම් සම්ප්‍රදායය | |
|---|---|---|---|---|
| | 1 කොරි 11:23-26 | ලූක් 22:19-20 | මාක් 14:22-24 | මතෙව් 26:26-28 |
| කාලය | ක්‍රිස්තුන් වහන්සේ පාවා දෙනු ලැබූ රාත්‍රියේ දී | නියම වේලාව පැමිණි කල | ඔවුන් ආහාර වළඳමින් සිටිය දී | ඔවුන් කෑම කමින් සිටිය දී |
| රොටී හා බැඳුණු ක්‍රියාව | රොටියක් රැගෙන, ස්තූති කොට, කඩා | උන් වහන්සේ රොටිගෙන තුති පුදා ඒවා කඩා ඔවුන්ට දී | උන් වහන්සේ රොටි ගෙන ආශීර්වාදය පවසා ඒවා කඩා ඔවුන්ට දී | ක්‍රිස්තුන් වහන්සේ රොටි ගෙන ආශීර්වාදය පවසා ඒවා කඩා ශ්‍රාවකයන්ට දී |
| රොටී මත වචන | මෙය ඔබ උදෙසා දෙන මාගේ ශරීරය ය. මා සිහි කිරීම පිණිස මෙය කරන්න | ඔබ උදෙසා දෙනු ලබන මාගේ ශරීරය මේ ය. මා සිහි කිරීම පිණිස මෙය කරන්න | ගන්න මේ මාගේ ශරීරය යි | රැගෙන වළඳන්න. මේ මාගේ ශරීරය යි |
| කාලය | රාත්‍රි කෑමෙන් පසු | භෝජනයෙන් පසු | | |
| කුසලානය හා බැඳුණු ක්‍රියාව | කුසලානය ද රැගෙන | කුසලාන දී | උන් වහන්සේ කුසලානක් ද ගෙන තුති පුදා ඔවුන්ට දුන් සේක | උන් වහන්සේ කුසලානක් ද ගෙන තුති පුදා ඔවුන්ට දී |
| කුසලාන මත වචන | මේ කුසලාන මාගේ රුධිරයෙන් පිහිටුවන නව ගිවිසුම ය. යම් පමණ වර ඔබ මෙයින් පානය කරන්නහු ද එපමණ වර මා සිහි කිරීම පිණිස මෙය සිදු කරන්න. | මේ කුසලාන ඔබ උදෙසා වගුරවනු ලබන මාගේ රුධිරයෙන් කළ නව ගිවිසුම ය. | මෙය බොහෝ දෙනා වෙනුවෙන් වගුරවනු ලබන මාගේ ගිවිසුම් රුධිරය වේ. සැබැවින් ම මම ඔබට කියමි දෙවියන් වහන්සේගේ රාජ්‍යයේ දී මම නැවත මිදියුසපානය කරන දිනය එන තෙක් මා මේ මිදි යුස යළිත් පානය නොකරන්නෙමි. | ඔබ සියල්ලන් ම මෙයින් ගෙන පානය කරන්න. මෙය පව් කමාව පිණිස බොහෝ දෙනා උදෙසා වගුරුවනු ලබන මාගේ ගිවිසුම් රුධිරය වේ. මාගේ පියාණන්ගේ රාජ්‍යයෙහි දී ඔබ සමඟ අලුත් මිදියුස පානය කරන දවස එන තුරු මෙතැන් පටන් මා මිදි යුස තවත් නොබොන්නෙමි ඔබට කියමි. |

### 6.2.3 අන්තියෝකීය හා ජෙරුසලම් සම්ප්‍රදායයෙහි ප්‍රධාන ලක්ෂණ

**අන්තියෝකීය සම්ප්‍රදායයෙහි ප්‍රධාන ලක්ෂණ**

- "මා සිහි කිරීම පිණිස මෙය සිදු කරන්න" යනුවෙන් පැවසීම
- ක්‍රිස්තුන් වහන්සේගේ "රුධිරයෙන් පිහිටුවන නව ගිවිසුම" යනුවෙන් පැවසීම
- "රාත්‍රි කෑමෙන් පසු" යන යෙදුම භාවිතය
- වචන යොමු වී ඇත්තේ භෝජනයට සහභාගි වන්නන්ට ය: "ඔබ උදෙසා"
- රොටිවලින් සංකේතවත් වන ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය අප වෙනුවෙන් යාගයක් වන බව "මෙය ඔබ උදෙසා දෙන මාගේ ශරීරයයි"

**ජෙරුසලම් සම්ප්‍රදායයෙහි ප්‍රධාන ලක්ෂණ**

- රොටි ගෙන "ආශීර්වාදය" පැවසීම
- කුසලාන ගෙන "තුති පිදීම" (අන්තියෝකීය සභාවේ තුති පිදීම සිදු වන්නේ රොටි ගෙන ය)
- රුධිරය වගුරුවන්නේ "බොහෝ දෙනා වෙනුවෙන් / උදෙසා" ය

## 6.2.4 නිසි ලෙස දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වැළඳීම (1 කොරින්ති 11:27-32)

දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනය වැළඳීමේ දී සිදු වන අක්‍රමිතා ශුද්ධ වූ පාවුලු තුමා දැඩි ලෙස දෝෂ දර්ශනයට ලක් කරයි. කොරින්ති සංසය තුළ දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනයට පෙර "එකමුතුකමේ / ප්‍රේමයේ (අගපේ) භෝජන සංග්‍රහයක්" පැවැත්වීම සම්ප්‍රදායය විය. එහෙත් එම ප්‍රේමයේ භෝජනය ප්‍රේමයේ භෝජනයක් කරගන්නවා වෙනුවට භේද ඉස්මතු කරන භෝජනයක් කරගෙන තිබිණි. ඇතැමකු කුසගින්නේ සිටින විට තව අයකු වෙරි වෙන තෙක් බී ඇත. එලෙස කරන අය දිළින්දන් ලජ්ජාවට පත්කරති (1 කොරින්ති 11:17-22).

එපමණක් නොව ඇතැම් අය දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගන්නේ නුසුදුසු අයුරිනි. එසේ කිරීමෙන් ස්වාමීන් වහන්සේ ගේ ශරීරයට හා රුධිරයට විරුද්ධ ව පව් කරති. තමා ම වරදකරුවෙක් කර ගෙන ඇත. එබැවින් සංසයේ ඇතැමකු ආත්මික ව හෝ රෝගී ව හෝ මරණයට පත් ව ඇත. එසේ වීම වළක්වා ගැනීමට කළ යුතු ව ඇත්තේ දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනයට පෙර එක් එක්කෙනා ආත්ම සෝදිසියක නිරත ව තම වැරදි හඳුනා ගෙන ඒවාට සමාව ලබා ගැනීම ය. මෙය කතෝලික සභාව තුළ "ආත්මික සූදානම" යනුවෙන් හැඳින්වේ. ආත්මික සූදානම යනු දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමට පෙර පාපවලින් තොර වීම ය. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමට ආත්මික සූදානමේ අවශ්‍යතාව ශුද්ධ වූ පාවුලු තුමා දැක්වූවාට අමතර ව ඩිඩාකේ නම් පොත් පිංචයෙහි අංක 14හි ද දක්වා ඇත: "ඔබගේ පූජාව නිර්මල පූජාවක් වන පිණිස පළමු ව ඔබේ පාපෝච්චාරණයකින් පසු ව එක් වී රොටී කඩා ස්තුති දෙන්න."

මරණීය පාප කරණ කොට ගෙන දිව්‍ය සත්ප්‍රසාදය ලබා ගැනීමට ආත්මිකාකාරයෙන් නුසුදුසු අය පාපෝච්චාරණයක් කර ගත යුතු අතර සුළු පාපයක් කර ඇති අය දිව්‍ය පූජාව ආරම්භයේ තම පාපවලට මනස්තාපනය වී සමාව ලබා ගනිමින් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමට සුදුස්සන් විය යුතු බව කතෝලික සභාවේ ඉගැන්වීම ය. මරණීය පාපයේ සිටින්නකුට දිව්‍ය පූජාවට පෙර සමඟි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය ලැබීමට අවස්ථාව නොමැති නම් තම පාපවලට දුක් මනස්තාප වී අවස්ථාවක් ලද විගසින් සමඟි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය ලැබීමට ඉටා ගෙන දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත හැකි ය (ශාසන නීතිය 916).

කතෝලික සභාව දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමට තිබිය යුතු ශාරීරික සූදානම පිළිබඳ ව ද කථා කරයි. ශාරීරික සූදානම යනුවෙන් අදහස් කරන්නේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමට පෙර අවම වශයෙන් පැයක කාලයක වත් සියලු ආහාර-පානවලින් වැළකී නිරාහාර ව සිටීම යි. එහෙත් කැමති අයට ඊට වැඩි කාලයක් වුව ද නිරාහාර ශීලය රැකිය හැකි ය. මෙම කාලය තුළ ජලය හා බෙහෙත් භාවිතයට තහනමක් නොමැත. මෙම පැයක නිරාහාර ශීලය රෝගීන්ට, මහලු අයට හා ඒ අයට උපස්ථාන කරන අයට අවශ්‍ය නොවේ. මෙම ශාරීරික නිරාහාර ශීලය එක් අතකින් ආධ්‍යාත්මික සූදානම ද අනෙක් අතින් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට ඇති ගෞරවය ද පිළිබිඹු කරයි. එබැවින් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමට පෙර පැයක උපවාසය පැවැත්වීම පිළිබඳ ව නීතියේ ලියවී ඇති දේ ඒ ආකාරයෙන් ම පිළිපැද තෘප්තිමත් වනවාට වඩා, නීතිය පිටුපස ඇති මූලික අදහස අවබෝධ කරගෙන අර්ථවත් ව එය අනුගමනය කිරීම වැදගත් වේ.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :**

1. "ජීවන දායක භෝජනය" යන මැයෙන් වචන 50 ක පැහැදිලි කිරීමක් කරන්න.

2. දිව්‍ය සත්ප්‍රසාදය ස්ථාපනය කිරීම පිළිබඳ අන්තියෝකියානු හා ජෙරුසලම් සම්ප්‍රදාය අනුව සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න.

3. දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනය නිසි ලෙස වැළඳිය යුතු ආකාරය කරුණු 5ක් ලියන්න.

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. BROWN, R.E., FITZMYER, J.A. & MURPHY, R.E., **New Jerome Biblical Commentary**, Theological Publications in India, Bangalore, 2013.

2. දසනායක, ජූඩ් (පියතුමා), **දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ**, කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, 2011.

3. ප්‍රනාන්දු, ක්වින්ටස් (පියතුමා), "නව ගිවිසුම තුළ දිව්‍ය සත්ප්‍රසාදය", **දහම් දියඹ**, පස් වන කලාපය, ජුනි වෙළුම, පුබුදු මුද්‍රණාලය, රාගම, 2005.

4. **ශුද්ධ බයිබලය අධ්‍යයන පිටපත (නව ගිවිසුම** 1), ශ්‍රී ලංකා බයිබල් සමාගම, කොළඹ 3, 1995.

| | | |
|---|---|---|
| **නිපුණතාව** | 7.0 | : **ජීවිත අභියෝග හමුවේ ශුද්ධාත්ම බලයෙන් පිරිපුන් විශ්වාසයට සාක්ෂි දරයි.** |
| **නිපුණතා මට්ටම** | 7.1 | : ශුද්ධාත්ම බලයෙන් සන්නද්ධ වී පිරිපුන් දිවියක් ගත කරයි. |

**කාලච්ඡේද සංඛ්‍යාව** : 25

**ඉගෙනුම් පල -**

- පෙන්තකොස්තයේ සිට මුල් කිතුනු සභාව වර්ධනය වූ ආකාරය පිළිබඳ ව කරුණු ගොනු කරයි
- ශුද්ධාත්ම බලයෙන් පූර්ණ වී තරුණ දිවියට එල්ල වන අභියෝග ජය ගත යුතු බව පිළිගනියි.
- පෙන්තකොස්තයේ සිට මුල් කිතුනු සභාව වර්ධනය වූ ආකාරය පිළිබඳ ව ගොනු කර ගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- ශුභාරංචිය පතළ කිරීමට නොපසුබට ව ක්‍රියා කරයි.
- ශුද්ධ වු සභාවට එල්ල වන අභියෝග ජය ගැනීම සඳහා සහයෝගය දක්වයි.

## 7.1.1 පෙන්තකොස්තයේ සිට මුල් කිතුනු සභාවේ වර්ධනය තෙක්

### හැඳින්වීම

- ක්‍රිස්තුන් වහන්සේ ගේ නාමයෙන් බෞතිස්ම ස්නාපනය ලබා උන්වහන්සේ දේව පුත්‍රයාණන් ලෙසත්, ගැලවුම්කරු ලෙසත් පිළිගෙන විශ්වාසයෙන් යුතු ව උන්වහන්සේගේ ඉගැන්වීම් අනුව ජිවත් වන, කණ්ඩායම ශුද්ධ වූ සභාව වේ.
- ශුද්ධ වු සභාවේ ආරම්භක යුගය යනු පළමු ශතවර්ෂ 3 හි දී ශුද්ධ වූ සභාවේ ඉතිහාසය යි. එනම් සභාව ස්ථාපිත වීම, ව්‍යාප්තිය, ඉටු කළ සේවය, ශුද්ධ වු සභාවට එල්ල වූ විරෝධතා, මුහුණ දුන් අභියෝග ආදිය වේ.
- මෙම යුගය ශුද්ධ වු සභාව තුළ ඇති වූ වැරදි මත නිවැරදි කළා වූ කාල පරිච්ඡේදයක් විය.
- ක්‍රිස්තුන් වහන්සේගේ සේවය ආරම්භයේ දී ම අපෝස්තුලුවරුන් 12 දෙනා තෝරා පත් කර ගනිමින් ඔවුන් සූදානම් කළ සේක. ඔවුනට ප්‍රායෝගික පුහුණුව ලබා දෙමින් ශුද්ධ වූ සභාවට අත්තිවාරම දැමූ සේක.
- අපෝස්තුලුවරුන් 12 දෙනාට අමතර ව තවත් සැත්තෑදෙනෙකු ක්‍රිස්තුන් වහන්සේ තම මෙහෙවර සඳහා සූදානම් කළ සේක.
- කණ්ඩායමේ නායකත්වය පේදුරුතුමා ට භාර විය.
- ශුද්ධාත්ම ආගමනය බලාපොරොත්තුවෙන් සිටින ලෙස පවසමින් ශ්‍රාවකයන්ට නව බලාපොරොත්තුවක් දෙමින් ක්‍රිස්තුන් වහන්සේ ස්වර්ගාරෝහණය වූ සේක.

## 7.1.2 ශුද්ධාත්ම ආගමනය - ක්‍රියා 2:1-41

- ක්‍රිස්තුන් වහන්සේගේ වදනට අනුව ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආගමනය අපේක්ෂාවෙන් ජෙරුසලමේ උඩුමහල් මැඳුරක මරිය තුමිය ද අපෝස්තුලුවරුන් 12 දෙනා ද ඇතුළු 120 දෙනෙක් පමණ යාච්ඤාවෙන් යුතු ව සිටියහ.
- ජුදෙව්වන් විසින් පවත්වන්නට යෙදුණු පෙන්තකොස්ත මංගල්‍යය දිනයේ දී ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආගමනය සිදු විය.

- සැඬ සුළඟක් හමන්නාක් මෙන් ශබ්දයක් අහසින් හදිසියෙන් නික්මිණි. එයින් ඔවුන් සිටි මුළු ගෙය පිරුණේ ය. ගිනි දළු වැනි දිව් බෙදී ගොස් ඔවුන් එක් එක්කෙනා මත පිහිටියේ ය.

- ශුද්ධාත්මයාණන් වහන්සේ ඔවුන්ට දුන් කථා ශක්තිය නිසා අන්‍ය භාෂා කථා කරන්නට පටන් ගත්තෝ ය.

- ජුදෙව් පෙන්තකොස්ත මංගල්‍යය සැමරීමට ජෙරුසලමට විවිධ දේශවලින් පැමිණි භක්තිවන්ත ජුදෙව්වරු එහි වූහ. අපෝස්තුලුවරුන් තම තමාගේ භාෂාවලින් කථා කරනු අසා විවිධ ජාතිකයෝ පුදුමයට පත් වූහ. මින් පැහැදිලි වන්නේ කිතු දහම ජාතියකට හෝ දේශයකට හෝ සීමා නොවන බව ය.

- විවිධ භාෂාවලින් කථා කළ ගෝල පිරිස ගලිලයන් වීම ඔවුන් පුදුමයට පත් කළ තවත් කරුණක් විය.

- ක්‍රිස්තුන් වහන්සේගේ ගෝලයෝ ශුද්ධාත්ම බලයෙන් පූර්ණ වූ කල පෙර තමන් සිටි බිය ඉවත ලා එඩිතර ව පෙන්තකොස්ත මංගල්‍යයට පැමිණි සියලු දෙනා ඉදිරියේ ජෙරුසලම් දේව මාලිගයේ දේශනා කළහ. එය ගෝලයන් මත ශුද්ධාත්ම ක්‍රියාකාරීත්වය සම්පූර්ණයෙන් ලද බව සනාථ කරන සාධකයක් විය.

- එය දුටු ඇතැමෙක් අපෝස්තුලුවරුන් අලුත් මුද්‍රික පානයෙන් මත් වී ඇතැයි සරදම් කළහ.

- මෙය ජෝවෙල් දිවැසිවරයාගේ දිවැස් වැකිය සම්පූර්ණ වීමක් ලෙස පේදුරු තුමා පෙන්වා දුන්නේ ය. ශුද්ධාත්ම ආගමනය ශුද්ධ වූ සභාවේ ආරම්භය ලෙසත් නව යුගයක ආරම්භය ලෙසත් හැඳින්විය හැකිය. ශුද්ධ වූ සභාවේ උපත් දිනය ද පෙන්තකොස්ත දිනය වේ.

- ක්‍රියා 2:14-21 අනුව පේදුරු තුමා නායකත්වය ගෙන කථා කරමින් නොබියව පැවසුවේ ක්‍රිස්තුන් වහන්සේ ජුදෙවුවන් බලාපොරොත්තුවෙන් සිටි මෙසියස් වහන්සේ බවයි.

- ජුදෙව්වන් විසින් ක්‍රිස්තුන් වහන්සේ මරා දමන බවත්, දෙවියන් වහන්සේ විසින් උන්වහන්සේ උත්ථාන කරන ලද බවත් ශ්‍රාවකයන් ඊට සාක්ෂි කාරයන් වන බවත් පේදුරු තුමා එඩිතර ව ප්‍රකාශ කළේ ය.

- පේදුරු තුමාගේ පළමු වන දේශනය කරණ කොට ගෙන තුන්දහසක් දෙන ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි විශ්වාසය තබා පසුතැවී බෞතිස්මය ලබමින් ශුද්ධ වූ සභාවට එක් වූහ.

- ශුද්ධාත්මයාණන් වහන්සේ ලොව පහළ වීමෙන් පසු ශුද්ධ වූ සභාව දිනෙන් දින ව්‍යාප්ත විය (ක්‍රියා 4:4).

### 7.1.3 මුල් සභාවේ ලක්ෂණ - ක්‍රියා 2:42-47, 4:32-37

- පෙන්තකොස්ත දින ශුද්ධාත්ම ආගමනයෙන් ශක්තිමත් වූ මුල් ශ්‍රාවක පිරිසගේ ඉගැන්වීම් පිළිගත් බොහෝ දෙනා ක්‍රිස්තුන් වහන්සේ අදහා ගත්හ.

- එසේ පිළිගත් ජනයා බෞතීස්ම ස්නාපනය ලබා එක ම විශ්වාසයෙන් බැඳුණු සමාජයක් ලෙස ප්‍රේමයෙන් ජීවත් වූහ.

- බහුතර ජුදෙව් ජනතාව අතර සුළුතර පිරිසක් ලෙස කිතුනුවන් ජීවත් වුව ද අනිකුත් ජුදෙව්වන්ගෙන් වෙන් කර හඳුනාගත හැකි විශේෂ ගුණාංග ඔවුන් සතු විය.

- ක්‍රියා 2:42 අනුව අපෝස්තුලුරුන්ගේ ඉගැන්වීමෙහි ද සහභාගිකමෙහි ද රොටි කැඩීමෙහි (දිව්‍ය පූජාවෙහි) ද යාච්ඤාවෙහි ද නිරත ව කල් ගත කළ හ.

- ඔවුහු ඇදහිල්ලේ වර්ධනය වෙමින් අන්‍යෝන්‍ය සහයෝගයෙන් හා වගකීමෙන් යුතු ව කටයුතු කළහ.

- මුල් කිතුනුවෝ ජෙරුසලමේ දේව මාලිගාවෙහි ද ධර්මශාලාවෙහි ද නමස්කාර කළහ. තම නිවෙස්වල එකතු වී රොටි (පූප) කැඩීමෙහි (දිව්‍ය පූජාවෙහි) ද නිරත වූහ.

- අදහා ගත් සමූහයා තමාට අයිති දේ පොදුවේ තබා ගත්හ.

- එක පවුලක් ලෙස එක් සමූහයක් ලෙස දෙවියන් වහන්සේට ප්‍රශංසා කරමින් අන් අයගේ අවශ්‍යතා උදෙසා කැපවීම මුල් කිතුනු සභාව තුළ කැපී පෙනිණි.

- ඔවුන්ගේ ජීවිත සැමට ආදර්ශයක් හා ආකර්ශනීය වීය.

- මුල් කිතුනු සභාව ලද දේව අනුග්‍රහය හා ආශීර්වාදය මත දිනෙන් දින ශුද්ධ වූ සභාව වර්ධනය විය.

### 7.1.4 උපස්ථායකයන් (තේවාචාර්යවරු) සත්දෙනා පත් කිරීම (ක්‍රියා 6:1-7)

- මුල් කිතුනුවෝ දයා සේවයට මුල් තැනක් ලබා දුන්හ; වැන්දඹුවන්, අනාථ වුවන්, වැඩිහිටියන් වැනි අය කෙරෙහි විශේෂ අවධානයක් හා සැලකිල්ලක් යොමු කළහ.

- කිතුනුවන් ගණනින් වැඩි වන විට සහනාධාර කටයුතුවල දී යම් යම් අඩුපාඩු හා දුර්වලතා ඉස්මතු විය.

- සහනාධාර බෙදීමේ දී ග්‍රීක බස කථා කරන වැන්දඹුවන්ට හෙබ්‍රෙව් බස කථා කරන ජුදෙව්වන්ගෙන් අසාධාරණයක් වන බවට ග්‍රීක බස කථා කරන ජුදෙව්වෝ පැමිණිලි කළහ. සුබ අස්න දේශනා කිරීම පසෙක තබා සහනාධාර බෙදීම අපෝස්තුලුවරුන් නොකළ යුතු නිසා ශුද්ධාත්මයෙන් හා ප්‍රඥාවෙන් පූර්ණ වූ යහපත් මිනිස්සු සත්දෙනෙක් පත් කරන ලදහ.

- ඒ අය නම් ස්තේපන්, පිලිප්, ප්‍රොකොරස්, නිකනෝර්, තීමොන්, පර්මෙනස් හා නිකොලොස් ය.

- තේවාචාර්යවරුන් සමාජ සේවාව සඳහා පත් ව සිටි නමුත් ස්තේපන් හා පිලිප් ශුභ අස්න දේශනා කිරීමට හා බෞතීස්ම ස්නාපනය කිරීමට යොමු වූහ.

### 7.1.5 ප්‍රාණපරිත්‍යාගී සාක්ෂි (ක්‍රියා 7:54-60)

**ස්තේපන් තුමා**

- ශුද්ධ වූ සභාව වර්ධනය වී සංඛ්‍යාත්මක ව වැඩි වීමත් සමඟ කිතුනුවන් කෙරෙහි ජුදෙව්වන්ට තිබූ වෛරය වැඩි විය. ක්‍රමයෙන් ජුදෙව් කිතුනු ගැටුම වර්ධනය විය.

- ජුදෙව්වන් විසින් මරණයට පත් කරන ලද ක්‍රිස්තුන් වහන්සේ මෙසියස් වහන්සේ මෙන් ම දේව පුත්‍රයා බවත්, වැඩීමට සිටි මෙසියස් වහන්සේ සම්බන්ධ ව පෙර කී දිවැස් වැකි ක්‍රිස්තුන් වහන්සේ මඟින් සම්පූර්ණ වූ බවත් තරයේ ප්‍රකාශ කිරීමට ස්තේපන් තුමා ද නොබිය ව ඉදිරිපත් විය.

- ස්තේපන් තුමා සැම විට ම ව්‍යවස්ථාව ගෙනහැර දක්වමින් කථා කළේ ය.

- ජුදෙව්වෝ මෝසෙස්තුමාගේ ව්‍යවස්ථාවටත් දේව මාලිගාවටත් මුල් තැන දුන් නමුත් කිතුනුවෝ ක්‍රිස්තුන් වහන්සේ ඉගැන්වූ පරිදි ව්‍යවස්ථාවට වඩා ප්‍රේමයෙන් කටයුතු කිරීමට මූලිකත්වය දුන්හ.

- මෙවැනි පසුබිමෙක දී ජුදෙව් නායකයෝ, සද්දුසිවරු, පරිසිවරු හා නායක පූජකවරු කිතු දහමේ ව්‍යාප්තිය පිළිබඳ ව බිය වූහ. එබැවින් ඔවුහු කිතුනුවන්ට පීඩා කළහ.

- ස්තේපන් තුමාගේ වචන ඇසූ විට ඔහුට විරුද්ධ ව ඔවුහු නැඟී සිටියහ. ස්තේපන් තුමා ශුද්ධාත්මානුභාවයෙන් පූර්ණ ව ස්වර්ගය දෙස බලා දෙවියන් වහන්සේගේ මහිමයත්, දෙවියන් වහන්සේගේ දකුණුපස ක්‍රිස්තුන් වහන්සේ වැඩ සිටිනවාත් දැක, "අන්න ස්වර්ගය විවර වී තිබෙනවාත් මනුෂ්‍ය පුත්‍රයා දෙවියන් වහන්සේගේ දකුණුපස සිටිනවාත් මට පෙනේ යයි" නොබිය ව ප්‍රකාශ කළේ ය.

- එම ප්‍රකාශ හේතුවෙන් ස්තේපන් තුමා ජෙරුසලම් නුවරින් පිටතට ගෙන ගොස් ඔහුට ගල් ගසනු ලැබිණි. ඔහු තමාගේ මරණය ඉදිරියේ පවා "ක්‍රිස්තුන් ස්වාමින් වහන්ස, මාගේ ආත්මය පිළිගත මැනව" කියා යාච්ඤා කළේය. තව ද "එම පාපයෙන් ඔවුන් නිදහස් කරන ලෙස ඉල්ලා යාච්ඤා කරමින් ගල් ගැසූ දැමූවන්ට සමාව දුන්නේ ය.

- ක්‍රිස්තුන් වහන්සේගේ නාමය වෙනුවෙන් දිවි පිදූ ප්‍රථම ප්‍රාණපරිත්‍යාගිවරයා එතුමා වේ.

- ස්තේපන් තුමාගේ මරණයෙන් පසු කිතුනුවන්ට විරුද්ධ ව ආරම්භ වූ පීඩනය හේතු කොට ගෙන කිතුනුවෝ බිය වී ආරක්ෂාව පතා ග්‍රාමීය ප්‍රදේශවලට දිව ගිය හ. ඒ අතරතුර තවත් සමහරු ශුද්ධ වූ සභාවට ඇතුළු වූහ. මෙසේ විසිරී ගිය කිතුනුවෝ ඔවුන් ගිය සැම ප්‍රදේශයක ම කිතුනු ශුභාරංචිය ප්‍රකාශ කළෝ ය.

**මහා ජාකොබ් තුමා (ක්‍රියා 12:1-2)**

- පළමු වන හෙරොද් අග්‍රිපා ශුද්ධ වූ සභාවේ සමහරුන්ට පීඩා කළේ ය.
- ඔහු ජොහන් අපෝස්තුලුතුමාගේ සහෝදර වූ මහා ජාකොබ් කඩුවෙන් මරා දැමූවේ ය. (ක්‍රියා 12:1-2)

## 7.1.6 විජාතීන්ට සුබ අස්න (ක්‍රියා 8:4-18, 8:26-40, 10:1-48)

**සමාරියේ දහම් දෙසීම (ක්‍රියා 8:4-17)**

- ශුභාරංචිය ප්‍රකාශ කිරීම, අශුද්ධාත්ම දුරු කිරීම, රෝගීන් සුව කිරීම, බෞතීස්ම ස්නාපනය ලබාදීම යනාදිය තේවාචාරී උපස්ථායක පිලිප් තුමා සමාරියේ සිදු කළේ ය.

- සමාරිය නුවර මායාකාර සීමොන් ද පිලිප් තුමා බෞතීස්ම ස්නාපනය කළේ ය.

- සමාරියයන් දෙවියන් වහන්සේගේ වචනය පිළිගත් බව අසා ජෙරුසලමේ සිටි පේදුරු තුමා හා ජොහන් තුමා ඔවුන් වෙතට යවන ලදහ.

- පේදුරු තුමා හා ජොහන් තුමා ඔවුන්ට ශුද්ධාත්මය ලැබෙන ලෙස යාච්ඤා කර ඔවුන් මත අත් තැබීමෙන් ඔවුන්ට ශුද්ධාත්ම වරම් ලැබිණි.

**පිලිප් තුමා සහ එතියෝපීය නපුංසකයා (ක්‍රියා 8:26-40)**

- ස්වාමින් වහන්සේගේ දූතයෙක් පිලිප් කථා කොට දකුණු දෙස ජෙරුසලමේ සිට ගාසාවට බසින පාරට ගොස් එහි දී හමු වන එතියෝපීය නපුංසකයාට ශුභාරංචිය ප්‍රකාශ කිරීමට නියම කළෝ ය. ස්වාමින් වහන්සේ කී පරිදි පිලිප්තුමාට එතියෝපීය ජාතිකයා හමුවූ අතර ඔහු කියවමින් සිටි යෙසායාගේ පොතෙහි සඳහන් ශුද්ධ ලියවිලි පාඨයෙන් පටන් ගෙන ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳ ව දේශනා කළේ ය.

- එතියෝපීය ජාතිකයා ස්වාමීන් වහන්සේ අදහාගත් අතර බෞතීස්ම ස්නාපනය ලැබී ය.

- මෙලෙස විජාතීන්ට සුබ අස්න ලබා දීමේ කාර්යයෙහි බොහෝ ශ්‍රාවකයන් නිරත වූ අතර අදහා ගත් අය බෞතිස්ම ස්නාපනය කරන ලදහ.

**පේදුරු තුමා හා කොර්නේලියස් (ක්‍රියා 10: 1-48)**

- ජුදෙවු සෙනගට බොහෝ සේ දන් දෙමින් නොකඩවා දෙවියන් වහන්සේට යාච්ඤා කිරීමේ නිරත වූ ඉතාලි භට හමුදාවේ ශතාධිපතියකු වූ කොර්නේලියස් කයිසාරියේ ජීවත් ව බැතිමතෙකි.

- පේදුරුතුමා ඔහුගේ නිවසට ගෙන්වා ගන්න යයි දූතයකු මඟින් දෙවියන් වහන්සේ කොර්නේලියස්ට උපදෙස් දුන් සේක.

- දෙවියන් වහන්සේගේ හඬට කීකරු වූ කොර්නේලියස් තම මෙහෙකරුවන් තිදෙනෙකු ජොප්පාවට යැවී ය.

- පේදුරුතුමා විශේෂ දර්ශනයක් මඟින් තමාගෙන් ඉටු විය යුතු මෙහෙවර පිළිබඳ අවබෝධය ලැබී ය.

- පේදුරු තුමා කොර්නේලියස්ගේ ඉල්ලීම මෙහෙකරුවන්ගෙන් දැන ගෙන එදින ඔවුන්ට නවාතැන් දී පසුදා කොර්නේලිස්ගේ නිවසට ඔවුන් සමඟ පිටත් විය.

- කොර්නේලියස් ඇතුළු පිරිස පේදුරු තුමාගේ පැමිණීම බලාපොරොත්තුවෙන් සිටියෝ ය.

- කොර්නේලියස්ගේ නිවසේ දී පේදුරු තුමා සුපුවත දේශනා කළේ ය.

- පේදුරු තුමා විසින් ක්‍රිස්තුන් වහන්සේගේ බලවත් ක්‍රියා, සේවය, දුක් විඳීම මරණය හා උත්ථානය පිළිබඳ ව බලවත් ලෙස කථා කරන ලදී.

- පේදුරු තුමා කථා කරද්දී ම එය ඇසූ සියල්ලන් කෙරෙහි ශුද්ධාත්මයාණන් වහන්සේ පහළ වූ බැවින් ඔවුන් බෞතීස්ම කිරීමට ද අණ කළේ ය.

- විජාතීන් කෙරෙහි ශුද්ධාත්මයාණන් වහන්සේ පහළ වීම පිළිබඳ ව චර්මච්ඡේදිත ජුදෙව්වෝ මවිත වූහ.

**ජෙරුසලම් මන්ත්‍රණ සභාව - ක්‍රියා 15 : 1-21**

- ස්වාමීන් වහන්සේ අදහාගන්නා විජාතිකයින් චර්මච්ඡේදනය කරන්නටත් මෝසෙස්ගේ ව්‍යවස්ථාව පිළිපදින්නටත් නියම කළ යුතු යැයි පරිසිවරුන්ගේ ඇදහිල්ලට අයත් සමහර කිතුනුවෝ තර්ක කළහ.

- අපෝස්තුලුවරු සහ සභා මූලිකයෝ මේ කාරණය පිළිබඳ දීර්ඝ විවාදයකට යොමු වූහ.

- පේදුරු තුමා ප්‍රබල ලෙස කථා කරමින් ගැලවීම ජේසුස් ස්වාමීන් වහන්සේගේ වරප්‍රසාදයෙන් බව පැහැදිලි කළේ ය.

- පාවුලු තුමාගේ හා බාර්නබස්ගේ සේවය පිළිබඳ ව ද සමූහයා ඇහුම්කන් දුන්හ.

- දෙවියන් වහන්සේ තමන් වහන්සේගේ නාමය දැරීමට විජාතීන් අතරින් සෙනඟක් තෝරා ගන්නා පිණිස මුල පටන් ම ක්‍රියා කළ සැටි පේදුරු තුමා කියා දුන් ආකාරයත් දිවැසිවරුන්ගේ වචනයත් කුඩා ජාකොබ් පැහැදිලි කළේ ය.

- එබැවින් විජාතීන් අතර දෙවියන් වහන්සේ වෙතට හැරෙන්නන්ට තවත් පීඩා නොකොට පහත කාරණ සම්බන්ධයෙන් පියවර ගැනීමට නියම විය.

- චර්මච්ඡේදනය අනවශ්‍ය බව ද රූප සම්බන්ධ දූෂ්‍යකම්වලින් ද, කාමමිථ්‍යාචාරයෙන් ද, බොටුව මිරිකා මැරූ සතුන් ගේ මස් කෑමෙහි ද ලේ අනුභවයෙන් ද වැළැකෙන ලෙස දැන්විය යුතු බව ද නිගමනය විය.

- චර්මච්ඡේදනය පිළිබඳ ගැටළුව විසඳිණි.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :**

1. ශුද්ධාත්ම ආගමනය සිදු වූ ආකාරය පැහැදිලි කරන්න.
2. මුල් කිතුනු සභාවේ ලක්ෂණ ලියන්න.
3. විජාතීන් වෙත ශුභාරංචිය පතළ වූ ආකාරය පැහැදිලි කරන්න.
4. ජෙරුසලම් මන්ත්‍රණ සභාවේ ගත් තීරණ ලියන්න.

**ආශ්‍රිත ග්‍රන්ථ**

1. **ශුද්ධ බයිබලය - සිංහල නව අනුවාදය තෙවන සංස්කරණය** 2006, ශ්‍රී ලංකා බයිබල් සමාගම

**නිපුණතාව 7.0 : ජීවිත අභියෝග හමුවේ ශුද්ධාත්ම බලයෙන් පිරිපුන් විශ්වාසයට සාක්ෂි දරයි.**

**නිපුණතා මට්ටම 7.2 :** විශ්වාසය රැකගනිමින් අභියෝග ජය ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව:** 15

**ඉගෙනුම් පල**

- කිතුනු සභාවේ පීඩන සමය පිළිබඳ ව තොරතුරු ගොනු කරයි.
- අභියෝග හමුවේ විශ්වාසය සවිමත් කර ගත යුතු බව පිළිගනියි.
- කිතුනු සභාවේ පීඩන සමය පිළිබඳ ව ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- විශ්වාසයට එරෙහි අභියෝග ජය ගනියි.
- අභියෝග ජය ගැනීම සඳහා අන් අය හා එකමුතු ව ක්‍රියා කරයි.

## 7.2.1 පළමු වන පීඩන යුගය : නීරෝ අධිරාජ්‍ය සමය (ක්‍රි.ව. 64 - 68)

- කිතුනුවන්ට එරෙහි ව පීඩාවක් ඇරඹූ ප්‍රථම රෝම අධිරාජයා නීරෝ ය.
- ප්‍රදේශ ගණනාවක් වනසාලමින් රෝමයේ ඇතිවූ ගින්නට කිතුනුවන් වගකිව යුත්තන් කරමින් ඔවුනට දරුණු ලෙස පීඩා කිරීමට අධිරාජයා ක්‍රියා කළේ ය.
- තමන් කිතුනුවන් යයි කියාගනිමින් සාක්ෂි දරූ අය මෙන් ම බොහෝ අයගේ ඔත්තුවලට අනුව අත්අඩංගුවට ගත් කිතුනුවන්ට මරණීය දණ්ඩනය හිමි කර දීමට නීරෝ කටයුතු කළේය.
- කිතුනුවන් වන මෘගයන්ගේ හම්වලින් ආවරණය කොට ජනතාවගේ හාස්‍යයට ලක්කරමින් සුනඛයන්ට ගොදුරු ලෙස දැමීම, කුරුසපත් කිරීම, පණ පිටින් පුලුස්සා දැමීම, කිතුනුවන්ට තෙල් හා තාර වත් කර පන්දම් ලෙස නීරෝගේ උද්‍යාන ආලෝකවත් කිරීමට යොදා ගැනීම වැනි දරුණු පීඩා කරන ලදි.
- පේදුරු තුමා හා පාවුලු තුමා ඝාතනය කිරීම නීරෝගේ දරුණු පීඩන යුගය තුළ සිදු විය.
- මෙම පීඩනයේ දී රෝමයේ කිතුනුවන් ප්‍රාණපරිත්‍යාගී වුව ද විශ්වාසය මඟින් කිතු දහම වඩාත් වර්ධනය විය.

## 7.2.2 දෙවන පීඩන යුගය : ඩොමීෂියන් අධිරාජ්‍ය සමය (ක්‍රි.ව. 81 - 96)

- නීරෝ මෙන් ම ඩොමීෂියන් ද කිතුනුවන්ට දරුණු ලෙස පීඩා කළ කෲර අධිරාජයෙකි.
- සිය සෙනෙට් මණ්ඩලය හා ගැටුම් ඇති කරගත් මොහු සිය අධිකාරීත්වයට බලපෑම් කළ සැම දෙනා ම මරා දැම්මේ ය.
- රහස් ඔත්තුකරුවන් මඟින් කිතුනුවන් පිළිබඳ තොරතුරු සොයාගත් මොහු කිසි දු නඩු විභාගයකින් තොර ව කිතුනුවන් රටින් නෙරපා දැමීම, අමානුෂික ලෙස මරා දැමීම, කෲර දඬුවම් ලබා දීම ආදිය සිදු කළේ ය.
- ශු. ජොහන් තුමා උතුරන තෙල් කටාරමක දමා එයින් අනතුරක් නොවූ නිසා පැට්මොස් නම් දූපතට පිටුවහල් කරන ලද්දේ මෙම අධිරාජ්‍යයාගේ සමයේ ය.
- කිතුනුවකුවූ සිය ඥාති කොන්සල්වරයකු වූ ෆ්ලේවියස් ක්ලෙමන්ස් මරා දමා ඔහුගේ බිරිඳ ෆ්ලේවියා ඩොමිටිල්ලා රටින් පිටුවහල් කිරීමට ඩොමීෂියන් ක්‍රියා කළේ ය.
- කිතුනු ජීවිතවලින් එළිදැක්වුණු සහෝදර ප්‍රේමය, සාමය හා දයාව මෙන් ම ශුද්ධත්වය මොහු විසින් හෙළා දකින ලදි.

- අධිරාජ්‍යයා දේවත්වයෙන් පිදීමට නියම කළ ඩොමිෂියන්, තමාට දේවත්වයෙන් නමස්කාර නොකළ අය අදේවවාදීන් ලෙස හඳුන්වා ඔවුනට දැඩි ලෙස දඬුවම් කළේය.

- සුළු ආසියාවේ කිතුනුවන්ට ද දරුණු වධ හිංසා පැමිණවීමට ඩොමීෂියන් ක්‍රියා කළේ ය.

- මෙම පීඩන දරා ගත නොහැකි වූ සමහර කිතුනුවෝ දෙවිවරුන්ට පුද පූජා ඔප්පු කිරීමට නැඹුරු වූහ.

- දරුණු අමානුෂික පීඩා සමයකට මුහුණ දීමට සිදු වුව ද කිතු දහම තවදුරටත් වර්ධනය විය.

## 7.2.3 තෙවන පීඩන යුගය - ට්‍රාජන් අධිරාජ්‍ය සමය (ක්‍රි.ව. 98 - 117)

- ට්‍රාජන් කිතුනුවන්ට පීඩා කළ අධිරාජයෙකි.

- මෙකල අල්ලාගත් කිතුනුවන්ට - ඔවුන් කිතුනුවන් නොවන බව ඔප්පු කිරීම සඳහා රෝම දෙවි දේවතාවන්ට නමස්කාර කිරීම අනිවාර්යය කරන ලදි.

- නිර්නාමික චෝදනා මත කිතුනුවන්ට පීඩා කිරීම ට්‍රාජන් විසින් සිදු කරනු නොලැබී ය.

- කිතුනුවන් හා ජුදෙව්වන් අතර වෙනස හඳුනා නොගත් ට්‍රාජන්, ජුදෙව්වන් කැරලි ඇති කළ අවස්ථාවල ද එම කැරලි මැඬ පැවැත්වීම සඳහා කිතුනුවන්ට අධික ලෙස පීඩා කිරීමට යොමු විය.

- කිතු බැතිමතකු වීම දඬුවම් ලැබිය යුතු වරදක් බව ආණ්ඩුකාර ප්ලීනි හා ට්‍රාජන් අධිරාජයා අතර හුවමාරුවූ ලිපි මඟින් පෙන්නුම් කෙරේ.

- අන්තියෝකියේ රදගුරු ධුරය දැරූ ඉග්නේෂස් තුමා වන මෘගයන්ට ගොදුරු කරන ලද්දේ මෙම පීඩන සමයේ ය.

- ප්‍රාණපරිත්‍යාගී මරණයකට පත් වූ ඉග්නේෂස් තුමා සිය මරණයට පෙර ස්මර්ණාවේ රදගුරු පොලිකාප් තුමා ඇතුළු බොහෝ අයට ලියූ ලිපි මඟින් පීඩනයේ සාහසික බව පෙන්නුම් කෙරේ.

- පීඩා පැමිණිය ද කිතුනුවන්ගේ විශ්වාසය මඟින් කිතු දහම අදහන්නන් සංඛ්‍යාත්මක වර්ධනය වීම මවිතයට කරුණක් විය.

- කිතුනුවන් තම ජීවිත තර්ජන නොතකා ඇඳහිල්ලෙන් පොළොව යට තිබූ සොහොන් ගෙවල හෙවත් කැටකුම්බ්වල ජනවන්දනාව සඳහා එක් වීම වැදගත් සිදුවීමකි.

## 7.2.4 සිවු වන පීඩන යුගය - මාකස් අවුරේලියස් අධිරාජ්‍ය සමය (ක්‍රි.ව. 161 - 180)

- මොහු අධිරාජ්‍යයේ සාමය ආරක්ෂා කරමින් කිතුනුවන් මර්දනය කිරීමට ක්‍රියා කළ අධිරාජයෙකි.

- මෙකල ඇති වූ ජල ගැලීම්, වසංගත වැනි ස්වාභාවික විපත්වලට මෙන් ම ම්ලේච්ඡ ගෝත්‍රිකයන්ගේ ආක්‍රමණවලට වගකිව යුත්තේ කිතුනුවන් බව අධිරාජයා ඇතුළු බලවතුන් විසින් තීරණය කරන ලදි.

- රෝම දෙවි - දේවතාවන්ට පුද පූජා ඔප්පු නොකරන කිතුනුවන් නිසා අධිරාජ්‍යයට විපත් ඇති වූ බව මොවුහු පැවසූහ.

- ඉතා අධික හා උග්‍රතම පීඩනයකට මුහුණ දීමට කිතුනුවන්ට සිදු වූ අතර එය ඉතා දිගු පීඩනයක් විය.

- මෙකල කිතු බැතියන්ට මරණීය දණ්ඩනය ලබා දීම ද පතල්වල වහල්වැඩ සඳහාද ඔවුන් යැවීම ද සිදු කරුනු ලැබීය.

- මේ සමයේදී ප්‍රාණ පරිත්‍යාගීන් වූයේ : ශු. ජස්ටින් තුමා, ශු. සිසිලියා තුමිය, ශු. පොලිකාප් තුමා වැනි අය ය.

- කෙතරම් පීඩා සිදු වුව ද කිතු දහමේ ව්‍යාප්තිය අඩපණ නොවීම විශේෂ කරුණකි.

### 7.2.5 පස් වන පීඩන යුගය : සෙප්ටිමස් සෙවරස් අධිරාජ්‍ය සමය (ක්‍රි.ව. 202 - 211)

- මෙම අධිරාජයා විසින් ක්‍රිස්තු ධර්මය වැලඳ ගැනීම සම්පූර්ණයෙන් ම තහනම් කරන ලදි.
- රජය විසින් කිතුනුවන් සොයා ගොස් දඬුවම් දීම සිදුවිය.
- සමූහ වශයෙන් කිතුනුවන් මරා දැමීමට උත්සුක වූ සමයකි.
- අතිදරුණු ප්‍රහාරවලට ලක් වීමට කිතුනුවන්ට සිදු විය.
  මෙකල ශු. අයිරේයස් තුමා, ශු. පර්පචුවා තුමිය වැනි අය ප්‍රාණ පරිත්‍යාගීහු වූහ.
- පීඩා මැද වර්ධනය වූ කිතු දහමේ ආලෝකය අධිරාජ්‍යයේ දසත පැතිරෙන්නට විය.

### 7.2.6 හය වන පීඩන යුගය : මැක්සිමිනස් අධිරාජ්‍ය සමය (ක්‍රි.ව. 235 - 238)

- මුල් වරට දරුණු ලෙස කිතුනු පූජකවරුන්ට හා රදගුරුවරුන්ට පීඩා කිරීම ආරම්භ කළේ මැක්සිමියස් අධිරාජයා ය
- පූජකවරුන්ගේ හා රදගුරුවරුන්ගේ විශ්වාසය බිඳහෙළීමෙන් කිතු දහමේ ව්‍යාප්තිය අඩපණ කිරීමට කරන ලදි.
- කිතුනුවන් මෙන් ම පූජකවරුන් හා රදගුරුවරුන් ද පිටුවහල් කර වහලුන් බවට පත් කිරීම සිදු විය.

**පීඩන ක්‍රම**

- පූජකවරුන්, රදගුරුවරුන් හා ශුද්ධෝත්තම පියතුමන්ලා සොයා පතල්වල වැඩට වහලුන් ලෙස පිටුවහල් කිරීම සිදු විය.
- මරණ දඬුවම ලබා දෙන ලදි.

**ප්‍රාණ පරිත්‍යාගීහු**

- පූජකවරු, රදගුරුවරු, ශුද්ධෝත්තම පියවරු මෙකල ප්‍රාණ පරිත්‍යාගීහු වූහ.
- ශු. අන්තේරුස් පාප්තුමා ඉන් කෙනෙකි.

### 7.2.7 හත් වන පීඩන යුගය : ඩෙසියස් අධිරාජ්‍ය සමය (ක්‍රි.ව. 249 - 251)

- පළමු වරට පීඩනය අධිරාජ්‍යය පුරා පැතිර ගියේ මේ සමයේ ය.
- මේ සමයේ දරුණු පීඩා යුගයකට කිතුනුවන්ට මුහුණ පෑමට සිදු විය.
- කිතු දහම මුළු අධිරාජ්‍යයෙන් ම තුරන් කරන බව ප්‍රකාශ කළ අධිරාජයා දරුණු හිංසාවලට ගොදුරු කිරීම මඟින් කිතුනුවන් වනසා දැමීමට සිය අනුමතිය ලබා දුන්නේ ය.
- අධිරාජයාගේ අරමුණ වූයේ කෙසේ හෝ බිය ගන්වා කිතුනුවන් රජයේ ආගමයට හරවා ගැනීම මිස ඔවුන් සහමුලින් වනසා දැමීම නොවන බව එව් සේබියස් වාර්තා කරයි.
- අධිරාජයා දේවත්වයෙන් පිදීමට බල කිරීම මෙහි දී දක්නට ලැබුණු වැදගත් ම ලක්ෂණයකි.
- අධිරාජ්‍යයේ සියලු ජනයා රෝම දෙවි-දේවතාවන්ට වන්දනාමාන කළ යුතු බවට අධිරාජයා විසින් ක්‍රි.ව. 250 දී නියෝගයක් නිකුත් කරන ලදි.
- අධිරාජයාගේ පිළිමවලට පුද පූජා ඔප්පු කිරීමට හා ඒ පිළිමවලින් නිරූපනය වන්නන් දේවත්වයෙන් පිදීමට කැමැත්ත පළ කරමින් ලිබෙලුස් (Libellus) නම් සහතිකයක් ලබා ගැනීමට අධිරාජ්‍යයේ සියලු වැසියන්ට අනිවාර්ය කරන ලදි.
- ලිබෙලුස් සහතික නොමැති අයට මරණ දඬුවම් දීමේ නියෝගය පනවන ලදි.

- සමහර අය ව්‍යාජ ලෙස ලිබෙලුස් සහතික මිල දී ගෙන ළඟ තබා ගැනීමට පෙලඹුණ හ.
- අධිරාජ්‍යයාගේ නියෝගයට අවනත වූ බව හඟවන එම සහතිකය සතු සියලු දෙනා මරණින් මුදනු ලැබූ අතර සෙසු අය මරා දමනු ලැබූහ.
- මෙම පීඩාවෙන් ගැලවීම සඳහා බොහෝ කිතුනුවෝ වනගත වී තාපස ජීවිතයකට යොමු වූහ.

**ප්‍රාණ පරිත්‍යාගීහු**

- ශු. ෆේබියන් තුමා • ශු. අගතා තුමිය • ශු. ඇලෙක්සැන්ඩර් තුමා
මෙකල ප්‍රාණ පරිත්‍යාගීහු වූහ.

- පීඩා නොතකා කිතුනුවන් සංකේතාත්මක ව වර්ධනය වූ බව දක්වේ.

## 7.2.8 අට වන පීඩන සමය : වැලේරියන් අධිරාජ සමය (ක්‍රි.ව. 254 - 260)

- මෙසමයේ ද පීඩනය අධිරාජ්‍යය පුරා ක්‍රියාත්මක විය.
- කිතුනුවන්ට මිථ්‍යා දෙවි-දේවතාවුන් වන්දනා කිරීමට බල කරන ලදි.
- දරුණු පීඩන සමයකට මුහුණ පෑමට මෙහි දී ද කිතුනුවන්ට සිදු විය.

**පීඩන ක්‍රම**

- පූජකවරුන්, රදගුරුවරුන් හා ශුද්ධෝත්තම පියතුමන්ලා සිරගත කිරීම සිදු විය.
- කිතුනු දෙව්මැඳුරු ගිනිබත් කරන ලදි.
- කිතුනු පොත්පත් වනසා දැමීම සිදුවිය.
- රෝම දෙවි-දේවතාවුන් පිදීමට කිතුනුවන්ට බල කරන ලදි.
- කිතුනුවන්ගේ අයිති වාසිකම් අහෝසි කෙරිණ.
- මරණ දඬුවම දෙන ලදි.

**ප්‍රාණ පරිත්‍යාගීහු**

- ශු. ලෝරන්ස් තුමා
- ශු. දෙවන සික්ස්ටස් පාප්තුමා
- මෙකල දරුණු පීඩා මැද කිතු දහම ශීඝ්‍ර වර්ධනයක් කරා යොමු වූ බවට ඉතිහාසය සාක්ෂය දරයි.

## 7.2.9 නව වන පීඩන සමය : අවුරේලියස් පීඩන සමය (ක්‍රි.ව. 274 - 280)

- මෙම පීඩාව දියත් කරන ලද්දේ රෝමයේ සෙනෙට් සභාවේ සාමාජිකයන්ගේ පක්ෂපාතිත්වය ලබා ගැනීම සඳහා ය.
- අධිරාජයා සිය බලය තහවුරු කරගැනීම සඳහා රෝම අධිරාජ්‍යයේ සහාය ලබා ගැනීමට කිතු දහම වැනසීමෙහි යෙදී සිටියේ ය.

**පීඩන ක්‍රම**

- පුලුස්සා මරා දැමීම
- වන මෘගයන්ට ගොදුරු කිරීම වැනි පීඩාවල මුහුණ පෑමට කිතුනුවන්ට සිදු විය.

**ප්‍රාණ පරිත්‍යාගීහු**

- ශු.ෆීලික්ස් පාප්තුමා

### 7.2.10 දහ වන පීඩන සමය : දියොක්ලේසියානු අධිරාජ සමය (ක්‍රි.ව. 284 - 305)

- කිතුනුවන්ට උදා වූ ඉතා ම බිහිසුණුව පීඩන යුගය මෙය වේ.
- දියොක්ලීසියානු අධිරාජයා අධිරාජ්‍යයේ පාලන ප්‍රතිපත්තිය ප්‍රතිසංවිධානය කිරීමට උත්සාහ ගත්තේ ය.
- මොහුගේ අරමුණ වූයේ කිතු දහම අධිරාජ්‍යයෙන් මුලිනුපුටා දැමීම ය.
- රෝම අධිරාජ්‍යයේ සිටි කිතුනු හමුදා නිලධාරීන් සේවයෙන් පහ කොට උසස් නිලධාරීන්ට රෝම දෙවි-දේවතාවුන්ට පුද පූජා කිරීමට අණ කිරීම ඔහු විසින් සිදු කරන ලදි.
- ක්‍රි.ව. 303 දී දරුණු ආඥා 4ක් නිකුත් කරමින් කිතුනු පීඩනය දෙගුණ තෙගුණ කරන ලද්දේ අධිරාජයා විසිනි.
- අධිරාජ්‍යය පුරා වෙසෙන සියල්ලන් රජය නියම කරන දෙවි-දේවතාවුන්ට පුදපූජා ඔප්පු කිරීම.
- කිතුනුවන් මරා නොදැමීමට අධිරාජයා කලින් ගෙන තිබූ තීරණය වෙනස් කොට කිතුනුවන් සමූල ඝාතනය කිරීමට පියවර ගන්නා ලදි.

**පීඩන ක්‍රම**

- ශුද්ධ ලියවිලි හා දෙව්මැදුරු පුලුස්සා දැමීම.
- කිතුනුවන්ට රෝම දෙවි-දේවතාවන් පිදීමට බල කිරීම.
- කිතුනුවන් රාජ්‍ය සේවයෙන් පහ කිරීම.
- කිතුනු වහලුන් නිදහස් කිරීමට එරෙහි ව නීති පැණ වීම.
- ප්‍රසිද්ධියේ කිතු දහම අත්හරින බවට පොරොන්දු වීමට සිදු වීම.
- ප්‍රාණපරිත්‍යාගීන්ගේ සොහොන් කොත් වනසා දැමීම.
- කිතුනුවන් කැබැලි කොට මරා දැමීම.
- ගස්වල හා කණුවල බැඳ පිලිස්සීම.
- බරපතළ වැඩ සහිතව සිර ගත කිරීම.
- රටින් පිටුවහල් කිරීම.
- දරුණු වන මෘගයන් මැදට වීසි කිරීම.
- හිස ගසා දැමීම.
- රත්වූ යකඩ පුටුවල බැඳ පිලිස්සීම.
- ඇස් උගුළුවා දැමීම.
- කුසගින්නේ තබා මැරෙන්නට ඉඩ හැරීම.
- ශරීරය ඉරා දෙපළු කිරීම.

**ප්‍රාණ පරිත්‍යාගීහු**

- ශු. සෙබස්තියන් තුමා • ශු. ඇග්නස් තුමිය • ශු. ලුසියා තුමිය
  මෙකල ප්‍රාණ පරිත්‍යාගීහු වූහ.

- පීඩා මධ්‍යයේ පවා තමා කිතුනුවන් යැයි කියාගනිමින් කිතු දහමේ අනන්‍යතාව හුවාදැක්වූ කිතුනුවන්ගේ සංඛ්‍යාවෙහි කිසි දු අඩුවක් නොවූ බව ඉතිහාසඥයකු වූ එව්.සේබියස් පවසයි.
- කිතු දහම මුලිනුපුටා දැමීමට අධිරාජයා ඇතුළු පිරිස් ක්‍රියා කළ ද, දේව අනුග්‍රහයෙන් ශුද්ධාත්ම බලය ඔස්සේ කිතුදහම වර්ධනය විය.

### 7.2.11 පීඩන සමය තුළ දිස්වූ විශේෂ ලක්ෂණ :

1. අභියෝගවලට නිර්භය ව මුහුණ දීම.
2. විශ්වාසය සුරැකීම සඳහා දැරූ ප්‍රයත්නය
3. අභියෝග හමුවේ විශ්වාසය සවිමත් වීම.
4. පීඩන හමුවේ ශුද්ධාත්ම බලය අත්දැකීම.
5. නිරතුරු ව ම විශ්වාසයට සාක්ෂි දැරීම.
6. පීඩා මධ්‍යයේ විශ්වාසය හා කිතු දහම වර්ධනය වීම.

**මිලාන් ආඥාව (ක්‍රි.ව. 313)**

- ක්‍රි.ව. 313 දී මිලාන් ආඥාව නිකුත් කිරීම මගින් කොන්ස්ටන්ටයින් අධිරාජයා විසින් පීඩන යුගය අවසන් කරන ලදි.
- කිතුනු සංකේත සහිත ධජ හා ආයුධ ඔසවාගෙන සටනට එළඹීමෙන් සතුරන් පරාජය කිරීමට හැකි වීම නිසා කොන්ස්ටයින් අධිරාජයා ආගමික නිදහස ලබා දෙමින් කිතුනුවන්ට නිදහසේ ආගමය ඇදහීමට අවස්ථාව ලබා දෙන ලදි.
- මිලාන් ආඥාව නිසා කිතුනුවන්ට නිදහස් යුගයක් උදා විය.

**ක්‍රි.ව. 313 මිලාන් ආඥාව මඟින්,**

- අධිරාජ්‍යයේ වාසය කරන සැමට තමන්ගේ ආගම ධර්මය හැදෑරීමට සම්පූර්ණ නිදහසක් ලබා දෙන ලදි.
- කිතුනුවන්ගෙන් පැහැරගත් සියලු ඉඩකඩම් දේපළ නැවත ඔවුනට ලබා දෙන ලදි.
- කිතුනුවන්ට විරුද්ධ ව පනවා තිබූ සියලු නීති අහෝසි කෙරිණ.

**පසුව දුන් වරප්‍රසාද**

- කිතුනුවන්ගේ සබත ලෙස හඳුන්වන ඉරුදින නිවාඩු දිනයක් බවට පත් කරන ලදි.
- කුමන අපරාධයකට අසු වුව ද කුරුසිපත් කිරීමේ දඬුවම අවලංගු කෙරිණ.
- රෝම ඇදහිලිවල තිබූ දූෂිත චාරිත්‍ර-වාරිත්‍ර තහනම් කෙරිණ.
- කිතුනු පූජකවරු අයබදුවලින් නිදහස් කරන ලදහ.
- අධිරාජ්‍යයේ පරිපාලන තනතුරු දැරීමට කිතුනුවන්ට අවස්ථාව දෙන ලදි.
- කුරුසියේ ලකුණ අධිරාජ්‍යයේ නිල ලාංඡනය බවට පත් විය.
- ලැටරන් මාලිගය ශුද්ධෝත්තම පියතුමාට ප්‍රදානය කෙරිණ.

මුල් සියවස් කීපය තුළ පීඩනයේ අභියෝගවලට මුහුණ දුන් ශු. සභාව විශ්වාසයෙන් සවිමත් වී පීඩන මාධ්‍යයේ විශ්වාසයට සාක්ෂි දැරුවේ ය. වත්මන් කිතුනුවන් ලෙස ජීවිත අභියෝගවලට මුහුණදීමේ දී දෙවියන් වහන්සේ කෙරෙහි ඇති විශ්වාසය සවිමත් කර ගැනීමට මුල් කිතුනුවෝ අපට මහත් ආදර්ශයක් සපයති.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :**

1 විවිධ සියවස්වල කිතුනුවන්ට පීඩා කළ අධිරාජ්‍යවරු හා ඔවුන් කිතුනුවන්ට පීඩා කළ ආකාරය ලියා දක්වන්න.

2 විවිධ සියවස්වල බිහි වු ප්‍රාණ පරිත්‍යාගීන්ගේ නම් ඇතුළත් ලැයිස්තුවක් පිළියෙළ කරන්න.

3 මිලාන් ආඥාව යනු කුමක් දැයි පැහැදිලි කරන්න.

4 පීඩා යුගය තුළ දක්නට ලැබුණු විශේෂ ලක්ෂණ ලියා දක්වන්න.

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. අතිගරු ප්‍රනාන්දු, ජේ. ඇලෙක්ස් (නාහිමි), **නූතන කතෝලික සභාව** 2008

2. මහාචාර්ය සෝමරත්න, ජී.පී.වී. **ක්‍රිස්තු ශාසනයේ ඉතිහාසය පළමු කාණ්ඩය**

3. Frend, W.H.C., Martyrdom Perception, **Early Church, 1981**

**නිපුණතාව 7.0 :** **ජීවිත අභියෝග හමුවේ ශුද්ධාත්ම බලයෙන් පිරිපුන් වී විශ්වාසයට සාක්ෂි දරයි.**

**නිපුණතා මට්ටම 7.3 :** විශ්වාසය පෝෂණය කර ගනිමින් ශුද්ධ වු සභාවේ සත්‍යතා අනුව ජීවත් වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාවඃ** 15

**ඉගෙනුම් පල :**

- සභා පියවරුන් පිළිබඳ ව තොරතුරු ගොනු කරයි.
- දේව විශ්වාසය වර්ධනය කර ගනිමින් ශුද්ධ වූ සභාවේ සත්‍යතා අනුව දිවි ගෙවිය යුතු බව පිළිගනියි.
- සභා පියවරුන් පිළිබඳ ව තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- ශුද්ධ වූ සභාවේ වේද සත්‍යතාවලට අනුව දිවි ගෙවයි.
- අන් අයගේ විශ්වාසය වර්ධනය කිරීම සඳහා එක් ව කටයුතු කරයි.

## 7.3.1 සභා පියවරු (The Church Fathers)

මුල් කිතුනු සභාවේ නිර්මල කිතු දහම හා විශ්වාසය ආරක්ෂා කිරීම සඳහා නිවැරදි හා බහුශ්‍රැත ඉගැන්වීමෙන්, දේශනාවෙන් මෙන් ම ලේඛනකරණයෙන් දායක වු මුල් උගත්තු පිරිස සභා පියවරුන් ලෙස හඳුන්වනු ලබති. මුල් යුගයේ කිතුනු ලේඛකයකු සභා පියකු වශයෙන් නම් කිරීමේ දී සලකා බැලූ කරුණු හතරකි.

1. ඉදිරිපත් කළ ධර්මයේ නිරවද්‍යතාවය (Orthodoxy)
2. ශුද්ධවත් ජීවිතය (Sanctity)
3. ශුද්ධ වූ සභාවේ අනුමතිය (Apostolicity)
4. ජීවත්වු කාල වකවානුව (Antiquity)

### සභා පිය කාර්ය

මුල් සභාවේ ඉගැන්වීම්වලට පටහැණි වේදභේදවලට පිළිතුරු සැපයීම මඟින් නිර්මල කිතු දහම ආරක්ෂා කිරීම සභා පියවරුන්ගේ ප්‍රධාන කාර්යයක් විය. එසේ ම ජුදා හා අන්‍ය ආගම් මඟින් පැන නැඟුණු ප්‍රශ්නවලට පිළිතුරු සවිස්තර ලෙස දැක්වීම ද ඔවුන් සතු තවත් වගකීමක් විය. නිර්මල කිතු දහම ආරක්ෂා කිරීම ඔවුන්ගේ පරම යුතුකම වු අතර ශු. සභාවේ නිල බලයෙන් පත් වූ රදගුරුවරුන් වූ මොවුන්ගේ දේශන හා ලියවිලි මඟින්, වේද සත්‍යතාවලට ඓතිහාසික පදනමක් දැමීමට ද හැකි විය. සභාපිය ඉගැන්වීම් මඟින් ක්‍රිස්තියානි සම්ප්‍රදායය ආරක්ෂා වූවා පමණක් නොව කිතු දහමේ වර්ධනයට ද එය බලපාන්නට විය.

සභා පියවරුන් පිළිබඳ අධ්‍යයනය යනු විශ්වාසය මත ගොඩනැගුණු දේව ධාර්මික විද්‍යාවකි. සභා පියවරුන්ගේ ලිපි ලේඛන මඟින් ඉදිරිපත් කළ ඉගැන්වීම් සභා පිය ධර්මය (Patrology) හෙවත් සභා පිය සාහිත්‍යය ලෙස හඳුන්වනු ලබයි.

**සභාපිය සාහිත්‍ය භාෂාව**

සභා පියවරුන් තම කෘතීන් ලේඛන ගත කිරීම සඳහා භාවිත කළ භාෂාව අනුව ඔවුහු ග්‍රීක හා ලතින් පියවරුන් ලෙස නම් කෙරෙති.

| **ග්‍රීක සභා පියවරු** | **ලතින් සභා පියවරු** |
|---|---|
| මහා බැසිල් තුමා | අම්බ්‍රෝස් තුමා |
| ජෝන් ක්‍රිසෝස්තම් තුමා | අගොස්තීනු තුමා |
| අතනාසියුස් තුමා | මහා ග්‍රෙගරි තුමා |
| නසියන්ස්හි ග්‍රෙගරි තුමා | ජෙරොම් තුමා |

VIII වන බොනිපස් ශුද්ධෝත්තම පියතුමන් විසින් අම්බ්‍රෝස් තුමා, ජෙරොම් තුමා, අගොස්තීනු තුමා හා ග්‍රෙගරි තුමා මහා සභා පියවරුන් ලෙස නම් කර ඇත.

### 7.3.2 අපෝස්තලික පියවරු (Apostolic Fathers)

අපෝස්තුලුවරුන්ට ඉතා කිට්ටුවෙන් නෑකම් කියන සභා පියවරු මේ නමින් හැඳින්වෙති. ඔවුන්ගෙන් පිරිසක් අපෝස්තුලුවරුන් ජීවත් වූ කාලයේ ජීවත් වූ අය වෙති. අනෙක් පිරිස අපෝස්තුලුවරුන්ගේ ඉගැන්වීම් ඔවුන්ගේ ගෝලයන් මඟින් ලබා ගත් අය වෙති. මේ පිරිස අපෝස්තුලුවරුන්ගේ යුගය අවසන් වීමත් සමඟ ම සභාවට එක් වූ ලේඛක පිරිස ලෙස ද හැඳින්විය හැකි ය. අපෝස්තලික පියවරුන්ගේ ලිපි-ලේඛනවල අඩංගු බොහෝ කරුණු නව ගිවිසුමේ ඉගැන්වීම්වලට සම්බන්ධ කර ඇති බව පැහැදිලි ව දැකිය හැකි ය. මෙම ලිපි විවිධ සංසයන්හි පැන නැඟුණු ප්‍රශ්නවලට පිළිතුරු ලෙස ලියවී ඇති ඒවා ය. එසේ ම සභාවේ කාලෝචිත තේමා ඔස්සේ ලියවුණු බැවින් ඒවා එඬේරක ලිපි (Pastoral Letters) වශයෙන්ද හඳුන්වනු ලබයි.

අපෝස්තලික පියවරුන් ලෙස රෝමයේ ක්ලෙමන්ට් තුමා, අන්තියෝකියේ ඉග්නේෂියස් තුමා, ස්මර්ණාහි පොලිකාප් තුමා, හර්මස් තුමා හා හයරාපොලිස්හි (Hierapolis) පපියාස් තුමා නම් කළ හැකි ය.

**අපොලොජිස්ත ලේඛකයෝ හෙවත් තර්කවේදීහු (ධර්මවේදීහු)**

'ඇපොලොජියා' යන ග්‍රීක පදයෙන් බෙදී එන්නකි. මෙහි අර්ථය නම් 'ආරක්‍ෂා කිරීම' යන්න යි. මේ අනුව කිතුනු ධර්මයට එරෙහි ව ඉදිරිපත් වූ චේදභේද, දුර්මත, චෝදනා හා අභියෝග ආදියට ප්‍රතිචාර දැක්වීමට හා කරුණු පහදා දීමට ඉදිරිපත් වූ සභා පියවරු අපොලොජිස්ත ලේඛකයන් වශයෙන් හඳුන්වනු ලදහ. ඔවුන් මේ සඳහා යොදාගත් ක්‍රම වේදය තර්ක කිරීමේ ස්වභාවයක් ගත් බැවින් මෙම ලේඛක තර්කවේදීන් ලෙස ද හඳුන්වනු ලැබෙති. මොවුන්ගේ කෘතීන්වල පොදු අරමුණු දෙකක් දැකිය හැකි ය.

1. අන්‍යාගමිකයන් හා ජුදා ආගමිකයන් විසින් කිතුනුවන් පීඩාවට ලක් කිරීමට හේතු නැති බව පෙන්වා දීම
2. අන්‍යාගමික උගතුන්ට ක්‍රිස්තියානි ධර්මය වටහා ගන්නට මඟ පහදා දීම

සොක්‍රටීස්, ප්ලේටෝ, ඇරිස්ටෝටල් ආදි මහා දාර්ශනිකයන්ගේ න්‍යාය ක්‍රම ක්‍රිස්තියානි ධර්මය මඟින් ස්ථිර වන බවත් ඒවායේ අඩු ලුහුඬුකම් ක්‍රිස්තියානි ධර්මයෙන් සම්පූර්ණ වන බවත් මොවුහු පොදුවේ පෙන්වා දුන්හ. මේ ප්‍රයත්නයේ ප්‍රතිඵලයක් වශයෙන් ක්‍රිස්තියානි ධර්මය පළමු වරට ශාස්ත්‍රීය වංග් මාලාවකින් මොවුන් අතින් සැරසිණි.
තර්කවේදීන් අතර දක්ෂතම තර්කවේදියා ලෙස පිළිගනු ලබන්නේ ප්‍රාණපරිත්‍යාගී ශු. ජස්ටින් තුමා ය.

## ප්‍රාණපරිත්‍යාගී ශු. ජස්ටින් තුමා (ක්‍රි.ව. 100 - 165)

පලස්තීනයේ උපන් ජස්ටින් තුමා දාර්ශනිකයෙකි. අධිරාජ්‍යයේ නොයෙක් තැන ඇවිද ස්ටොයික්, ඇරිස්ටෝටල්, පයිතගරස් සහ ප්ලේටෝ යන දාර්ශනිකයන්ගේ ආභාසය ලත් ගුරුවරුන්ගෙන් එම දර්ශන හැදෑරුව ද ඔහු සෙවූ සත්‍යය ඒවායෙහි හමු නොවී ය. තිස්වන වියේ දී පමණ කිතු දහම වැළඳගත් ජස්ටින් තුමා දාර්ශනික ව ද තර්කානුකූල ව ද කිතු දහම හැදෑරී ය. කිතු දහම අන් කිසි ම දහමකට ම වඩා උසස් බවත්, ඔහු සෙවූ සත්‍යය කිතු දහමේ පමණක් ඇති බවත් වටහා ගත්තේ ය. ක්‍රිස්තුන් වහන්සේ ඉගැන්වීම් වෙනුවෙන් මිනිසුන් ජීවිත පරිත්‍යාගය කළ ද සොක්‍රටීස් වැනි මහා දාර්ශනිකයන්ගේ ඉගැන්වීම් වෙනුවෙන් කිසිවකු ජීවිත පරිත්‍යාග නොකරන බව එතුමා ප්‍රකාශ කළේ ය. දෙවන ශතවර්ෂයේ ප්‍රසිද්ධ ම සභා පියා ලෙස සැලකෙන්නේ ජස්ටින් තුමා ය.

ක්‍රි. ව. 165 දී පමණ මාකස් අවුරේලියස් අධිරාජ්‍යයා යටතේ වූ පීඩනයේ දී රෝම දෙවි-දේවතාවන්ට යාග පිදීම ප්‍රතික්ෂේප කළ බැවින් තවත් ක්‍රිස්තු භක්තිකයන් සය දෙනෙකු සමග ජස්ටින් තුමා ද හිස ගසා මරා දමනු ලැබිණි. ශුද්ධ වූ සභා මාතාව ජූනි මස පළමු වැනි දා ජස්ටින් තුමාගේ මංගල්‍යය පවත්වන්නී ය.

### සභාවට දැක්වූ දායකත්වය

ජුදා ජාතිකයන්ගෙන් කිතු දහමට විවිධ චෝදනා එල්ල විය. එමෙන් ම ජුදා පරිසරයෙන් හෙලනිස්ත සමාජයට (ග්‍රීක සමාජයට) පිවිසීමේ දී ඔවුන්ට දර්ශනවාදීන්ගේ අභියෝගවලට ද මුහුණ දීමට සිදු විය. මෙවන් පසුබිමක් තුළ ජස්ටින් තුමාගේ කාර්යය වූයේ කිතු දහමේ සත්‍යතා සොයා ඉදිරිපත් කිරීම යි. මිනිසා ගලවා ගත හැකි පරිපූර්ණ හා සත්‍ය වූ දර්ශනය කිතු දහම බව අවබෝධ කොට ගෙන, ක්‍රිස්තියානීන් දැනුම්වත් කිරීම සඳහා රෝමයේ දර්ශන පීඨ කිහිපයක් ම ආරම්භ කළ මෙතුමා එපීසියේ උසස් අධ්‍යාපන ආයතනයක ද ඉගැන්වීමෙහි නිරත විය.

අන්තෝනියුස් පියුස් හා රෝම සෙනෙට් සභාවට ලියන ලද ‘ඇපොලොජියා’ යන කෘති දෙකක් ද ‘ට්‍රයිපෝ සමග සංවාදය’ (Dialogue with Trypho) යන කෘතිය ද ඔහුගේ ලේඛක අතර වැදගත් වේ.

## ඇලෙක්සැන්ඩ්‍රියාවේ ශු. අතනාසියුස් තුමා (ක්‍රි. ව. 295 - 373)

### ජීවිත පසුබිම

ඇලෙක්සැන්ඩ්‍රියාවේ උපත ලද මෙතුමා කුඩා කල සිට ම තපස් ජීවිතයකට ඇල්මක් දැක්වී ය. අපෝස්තලික ධර්මය ආරක්ෂා කිරීමට උත්සාහ ගත් නිසා පීඩනවලට හා පිටුවහල් කිරීම්වලට ලක් විය. එහෙත් ධර්ම ශාස්ත්‍ර න්‍යායයන් මඟින් ධර්මය ආරක්ෂා කිරීමෙහි ලා අතනාසියුස් තුමා ප්‍රමුඛත්වය ගෙන කටයුතු කළේ ය. ශුද්ධ වූ සභා මාතාව මැයි මස දෙවෙනි දා මෙතුමාගේ මංගල්‍යය පවත්වන්නී ය.

### සභාවට දැක්වූ දායකත්වය

අතනාසියුස් තුමා තේවාචාර්යවරයකු ව සිටිය දී ඇලෙක්සැන්ඩ්‍රියාවේ රදගුරුතුමන්ගේ ලේකම්වරයා බවට පත්විය. එහෙයින් ක්‍රි.ව. 325 දී නිසියාන ජගත් මන්ත්‍රණ සභාවට සහභාගීවීමට ද අවස්ථාව උදා විය. එහි දී ඒරියන්වාදයට විරුද්ධ ව ප්‍රබල හඬක් නැගීමට මෙතුමාට අවස්ථාව ලැබිණි. ඒරියන් වේදභේදය (ඒරියන්වාදය) ශු. සභාව තුළින් තුරන් කිරීමට මූලිකත්වය ගත්තේ අතනාසියුස් තුමා ය. ක්‍රිස්තුන් වහන්සේ පියාණන් වහන්සේගෙන් ජනිත වූ නමුත් මවනු නොලැබ එක ම භවත්වය ඇති ව වැඩ සිටීම (Begotten , not made, consubstantial with the father) යන නිසියාන විශ්වාස ලක්ෂණයෙහි ප්‍රධාන දේව ධාර්මික සංකල්පය ශු. සභාවට දායාද කරන ලද්දේ ද අතනාසියුස් තුමන් විසිනි. පසු ව ඇලෙක්සැන්ඩ්‍රියාවේ රදගුරුතුමන් බවට පත් වූ අතනාසියුස් තුමා නිසියාන විශ්වාසය තහවුරු කිරීමට මහත් වෙහෙසක් දැරී ය. මෙතුමා ශුද්ධ බයිබලයට ගැටපද විවරණයක් මෙන් ම මරිය තුමියගේ කන්‍යා භාවය පිළිබඳ ව ග්‍රන්ථ කිහිපයක් ද ලියා ඇත. මෙතුමාගේ බොහෝ කෘති ඒරියන්වාදයට විරුද්ධ ව ලියන ලද ඒවා ය. ව්‍යංගාර්ථයෙන් ලිවීම

මෙතුමාගේ කෘතිවල දක්නට ලැබෙන විශේෂත්වයකි. අතනාසියුස් තුමා ශුද්ධ බයිබලය හැඳින්වූයේ ද ක්‍රිස්තු කේන්ද්‍රීය තේමාව ඔස්සේ ය. එසේ ම ශුද්ධාත්මයාණන් වහන්සේ පියාණන් හා පුත්‍රයාණන් වහන්සේ වෙතින් නික්මෙන වන බව ද එතුමාගේ අදහස විය. දේව ධර්මාචාර්යවරයකු වූ අතනාසියුස් තුමා කතෝලික සභාවේ සාම්ප්‍රදායික ඇදහිල්ලේ පියා වශයෙන් හඳුන්වනු ලබයි.

### ශු. ජෙරෝම් තුමා (ක්‍රි.ව. 347 - 420)

#### ජීවිත පසුබිම

ස්ට්‍රයිඩන් නුවර උපත ලැබූ මෙතුමා අධ්‍යාපනය ලැබුයේ රෝමයේ දී ය. පූජකවරය ලැබූ පසු ක්‍රි.ව. 380 දී පමණ කොන්ස්තන්තිනෝපලයට පැමිණ නසියන්ස්හි ශු. ග්‍රෙගරි තුමා යටතේ ශුද්ධ ලියවිල්ල හැදෑරුවේ ය. ක්‍රි.ව. 385 දී පමණ ශුද්ධ වූ දේශයට ගොස් බෙත්ලෙහෙමෙහි තාපසාරාමයක දැඩි තපස් ජීවිතයක් ගත කළ මෙතුමා ක්‍රි.ව. 420 දී ස්වර්ගස්ථ විය.

ශුද්ධ වූ සභා මාතාව සැප්තැම්බර් මස තිස් වෙනි දා මෙතුමාගේ මංගල්‍යය පවත්වන්නී ය.

#### ශු. සභාවට දැක්වූ දායකත්වය

ශු. ඩැමසස් (Damasus) ශුද්ධෝත්තම පියතුමාගේ ලේකම්වරයා ලෙස සේවය කිරීමට අවස්ථාව ලත් නිසා ශුද්ධ ලියවිලි වශයෙන් පිළිගත යුතු සම්මත ග්‍රන්ථ (Cannonical Books) තීරණය කිරීම සඳහා ක්‍රි.ව. 397 දී තෙවන කාර්තේජ් රදගුරු සංසදයට සහයෝගය ලබා දීමට එතුමාට හැකියාව ලැබිණි. හෙබ්‍රෙව්, ලතින් හා ග්‍රීක භාෂාවන් පිළිබඳ ව මනා දැනුමක් තිබූ බැවින් ශු.ඩැමසස් ශුද්ධෝත්තම පියතුමා විසින් ශුද්ධ වූ ලියවිල්ල හෙබ්‍රෙව් බසින් ලතින් භාෂාවට පරිවර්තනය කිරීමේ භාරදූර වගකීම ද මෙතුමාට පවරනු ලැබී ය. වල්ගේට් (Vulgate - පොදු ජනතාවගේ පිටපත) නමින් ප්‍රසිද්ධ මෙම පරිවර්තනය ජෙරෝම් තුමාගේ කුසලතාව විදහා දක්වන්නකි. මෙතුමාගේ කෘතීන් අතර 'විශිෂ්ට පුද්ගලයන්ගේ ජීවිත චරිත'Lives of Illustrious Men) නමැති ග්‍රන්ථයෙහි පේදුරු තුමාගේ පටන් ශු. සභාවේ දියුණුවට දායක වූ ජීවන චරිත 135 විස්තර මෙහි අඩංගු ය. පසුකාලීන ව සාන්තුවරයන්ගේ චරිත කතා ලිවීමට මෙම කෘතිය පූර්වාදර්ශයක් වී ඇත. 'ද්විතීය සම්මත ග්‍රන්ථ හා ජුදා ලියවිලි' නම් කෘතිය මඟින් ද්විතීය සම්මත ග්‍රන්ථ හා ජුදා ලියවිලි අතර සම්බන්ධතාව පැහැදිලි කර ඇත. ඔරිජන් තුමාගේ මූලික සිද්ධාන්ත වැනි කෘති ලතින් භාෂාවට පරිවර්තනය කරනු ලැබ ඇත්තේ ද ජෙරොම් තුමා විසිනි. ධර්මධර උගතකු මෙන් ම සභා පඩිවරයකු හා බයිබල් විශාරදයකු ලෙස ද වත්මන් ශු. සභාව විසින් ජෙරෝම් තුමාව පිළිගනු ලබන්නේ එතුමාගෙන් ඉටු වී ඇති සේවාව නිසා ම ය.

### ඇලෙක්සැන්ඩ්‍රියාවේ ශු. සිරිල් තුමා (ක්‍රි.ව. 376-444)

#### ජීවිත පසුබිම

ඇලෙක්සැන්ඩ්‍රියාවේ උපත ලැබූ මෙතුමා දේව භක්තිය ඇති ව හැදී වැඩුණු පාරම්පරික කිතුනුවෙකි.

ශු. සභා මාතාව ජූනි මස විසිහත් වෙනිදා මෙතුමාගේ මංගල්‍යය පවත්වන්නී ය.

#### ශු. සභාවට දැක්වූ දායකත්වය

ක්‍රි.ව. 412 දී ඇලෙක්සැන්ඩ්‍රියාවේ රදගුරු ධුරයට පත්වූ මෙතුමා මිථ්‍යා ඇදහිලිවලට ද වැරදි ප්‍රතිපත්තිවලට ද විරුද්ධ ව සටන් කළේ ය. විශේෂයෙන් කොන්ස්තන්තිනෝපලයේ රදගුරු වූ නෙස්ටෝරියස් හා ඔහු ආරම්භ කළ නෙස්ටෝරියානුවාදයට විරුද්ධ ව ප්‍රබල හඬක් නැගුවේ ය. නෙස්ටෝරියානු වේදභේදය පිළිබඳ ව තීරණයක් ගැනීමට ක්‍රි.ව. 431 දී පළමු වන සෙලස්තියන් ශුද්ධෝත්තම පියතුමා විසින් රැස් කරන ලද එපීස ජගත් මන්ත්‍රණ සභාවේ ශ්‍රේෂ්ඨ ධර්මාචාර්යවරයා ලෙස කටයුතු කළේ ය.

මෙතුමාගේ කෘති අතර ශුද්ධ බයිබලීය විවරණය, ශුද්ධ ත්‍රිත්වය පිළිබඳ ලියූ කෘතිය (ඒරියස්ගේ වේදභේදය විමර්ශණය කර එය වැරදි බව තහවුරු කරයි), පරිච්ඡේද පහ (නෙස්ටෝරියස්ගේ දේශනාවල සමස්තය විමර්ශනය කර එහි ඇති වැරදි පෙන්වා දෙයි), ශුද්ධාත්මයාණන් හා සංඝය තුළ වන්දනාව (මෙහි පංච පුස්තකය පිළිබඳ විවරණයක් කර ඇත) දැක්විය හැකි ය.

### ශු. අගොස්තීනු තුමා (ක්‍රි.ව. 354-430 )

### ජීවිත පසුබිම

උතුරු අප්‍රිකාවේ තගස්තේ නමැති ග්‍රාමයේ උපත ලැබී ය. තගස්තේ (වර්තමානයේ ඇල්ජීරියාව) රෝම ප්‍රාන්තයක් වූ බැවින් මවුබස, අධ්‍යාපන මාධ්‍යය මෙන් ම රාජ්‍ය භාෂාව ද ලතින් වූයෙන් ඒ පිළිබඳ ව මනා දැනුමක් මෙතුමාට විය. ක්‍රි.ව. 410 පමණ විසිගොත් ගෝත්‍ර නායකයා විසින් රෝමය විනාශ කළ පසු උදා වූ අඳුරු යුගයේ අත්දැකීම් ද එතුමාට විය. රෝමයෙහි ලද උසස් අධ්‍යාපනයෙන් පසු කාර්තේජ් අධ්‍යාපන ආයතනයේ ආචාර්යවරයකු ව ඉගැන්වීමෙහි කටයුතුවල නිරත විය. මෙතුමාගේ මව බැතිමත් කිතුනුවකු වුව ද පියා අන්‍යාගමිකයකු වූයෙන් ආගමික හැදියාවක් කෙරෙහි අත්දැකීමක් නොවී ය. එහෙත් සිය මව මොනිකා තුමියගේ නිරන්තර යාච්ඤාවෙන් මෙන් ම මිලානයේ රදගුරු වූ අම්බ්‍රෝස් තුමාගේ දේශනයකට සවන් දී එතුමාගෙන් බෞතීස්මය ලැබීම නිසා ජීවිත පරිවර්තනයකට අඩිතාලම දැමී ය. මෙතුමාගේ ජීවිතයේ සැඳෑ සමය ක්‍රි.ව. 430 දී පමණ උතුරු අප්‍රිකාවේ හිප්පෝ ප්‍රදේශ වැන්ඩල් ගෝත්‍රකයින්ට යටත් ව තිබීමෙන් ඒ අත්දැකීම්වලටට ද මුහුණ දෙන්නට සිදු විය. එතුමා ගේ ජීවිතයේ අවසන් කාලය පැවිදි ආරාමයක ගත කොට දේව ආදරයකට සාක්ෂි දරමින් ස්වර්ගස්ත විය.

ශුද්ධ වූ සභා මාතාව අගෝස්තු මස විසිඅටවැනි දා මෙතුමාගේ මංගල්‍යය පවත්වන්නී ය.

### ශු. සභාවට දැක්වූ දායකත්වය

අගොස්තීනු තුමා පූජකවරයකු ලෙස ද පසු ව හිප්පෝහි රදගුරුතුමා ලෙස ද ශු. සභාවට මහත් සේවයක් කළේ ය. ජන්ම පාපය (Original Sin) හා සාධාරණ යුද්ධය (Just war) වැනි සංකල්ප පිළිබඳ ව අදහස් ඉදිරිපත් කළේ ය. වරෙක මැනිකියන්වාදයට (Manichaeism) ඇදී ගියත් එතුමා සෙවූ සත්‍යය එහි නොවූයෙන්, එය ප්‍රතික්ෂේප කර අවසානයේ දෙවියන් වහන්සේ තුළ පමණක් සැබෑ සත්‍යය ඇති බව පිළිගත් මෙතුමා දේව ආදරය ගැඹුරින් අත්දැකීමට වාසනාව ලැබී ය. කිතුනු සභා ඉතිහාසයේ විශිෂ්ටතම සභා පියා ලෙස හඳුන්වනු ලබන මෙතුමා ලතින් සභා පියවරුන් අතර ශ්‍රේෂ්ඨතම තැනැත්තා ලෙස ද නම් කරනු ලබයි. එතුමාගේ ලේඛන අතර වන පාපෝච්චාරණය (The Confession) කෘතියේ එතුමාගේ ළමා හා තරුණ විය පිළිබඳ බොහෝ කරුණු ඇතුළත් ය. මෙම ග්‍රන්ථය අපරදිග පළමු චරිතාපදානය ලෙස ද පිළිගනු ලබයි. දේව නගරය (The City of God) ශු. සභාව අධ්‍යාත්මික නගරයක් ලෙස දක්වයි. අන්‍යාගමික චෝදනාවලින් කිතු දහම මුදවා ගැනීමට කටයුතු කරයි, ශුද්ධ ත්‍රිත්වය පිළිබඳ දේව ධාර්මික ග්‍රන්ථය, තාපස ජීවිතය හා භාවනා ක්‍රම (පොත් 113), අනුශාසනා ලිපි (218) හා දේශනා (500) ද මෙතුමා ගේ කෘති අතර වේ.

### ඔරිජන් තුමා (ඔරිගන් තුමා) (ක්‍රි.ව. 185-254)

### ජීවිත පසුබිම

ඊජිප්තුවේ ඇලෙක්සැන්ඩ්‍රියාවේ උපත ලද මෙතුමා ඇලෙක්සැන්ඩ්‍රියාවේ ක්ලෙමන්ට් තුමාගේ ගෝලයෙකි. ඔරිජන් තුමා වැදගත් වනුයේ චින්තකයකු, උගතකු, දේව ධර්මාචාර්යවරයකු මෙන් ම දක්ෂ ලේඛකයකු ද වශයෙනි. කතෝලික චින්තනය ග්‍රීක දාර්ශනික ආභාසයකට ඉදිරිපත් කිරීමට මුල පිරුවේ ඔරිජන් තුමා ය.

### ශු. සභාවට දැක්වූ දායකත්වය

ඇලෙක්සැන්ඩ්‍රියානු ගුරුකුලයේ ප්‍රධානයා වශයෙන් ඉතිහාසය ඔහු නම් කර ඇත. ශුද්ධ බයිබලය පිළිබඳ තිබූ විශාරද දැනුම නිසා ම පැරණි ගිවිසුමේ පොත් කිහිපයකට අටුවා හා විවරණ සැපයීම නිසා මෙතුමාගෙන් පසු ව බයිබල් විවරණ සම්ප්‍රදායයක් බිහි විය. බයිබලීය විවරණයේ දී ක්‍රමවේද තුනක් භාවිත කිරීමට මඟ පෙන්වනු ලැබුයේ ඔරිජන් තුමා විසිනි. ඒවා නම්

1. Literal - වචනාර්ථයෙන් බයිබලය විවරණය කිරීම

2. Psychological - මනෝවිද්‍යාත්මක ක්‍රමයට බයිබලය විවරණය කිරීම

3. Spiritual (Allegorical) - ආධ්‍යාත්මිකව(ඇලගොරිකල්) ක්‍රමයට බයිබලය විවරණය කිරීම

ඔරිජන් තුමා ශු. සභාවට දැක්වූ දායකත්වය එතුමාගේ කෘතිවලින් මනා ව පැහැදිලි වේ. මෙතුමාගේ 'හෙක්සප්ලා' (Hexapla - එකට බැඳුණු හය) කෘතිය හෙබ්‍රෙව් හා ග්‍රීක වශයෙන් සමාන්තර කොටස් හයකින් ඉදිරිපත් කොට ඇත. කයිසාරියේ ඔරිජන් පුස්තකාලයයේ තැන්පත් කර ඇති මෙම ග්‍රන්ථය ශු. ජෙරොම් තුමා විසින් භාවිත කරනු ලැබ ඇති බවට සාක්ෂි ඇත. මෙම කෘතිය ශුද්ධ ලියවිල්ලේ විවරණය හා විචාරය පිළිබඳ , bj k( qmØck ; u . %kah o fjh§fi , ùbiq a(Celsus) නමැති කිතුනු විරෝධී චින්තකයාගේ The True Discourse නමැති ග්‍රන්ථයට විරුද්ධ ව ලියන ලද කෘතිය මෙන් ම මූලික සිද්ධාන්ත (De Principiis) ආගමික සිද්ධාන්ත පිළිබඳ අත්පොතකි. දෙවියන් වහන්සේ, විශ්වය, මිනිස් නිදහස හා දේව අනාවරණය වැනි කිතුනු ආගමික සිද්ධාන්ත පිළිබඳ ගැඹුරු දර්ශනයක් මෙමගින් ලබා දෙයි. එමෙන් ම යාච්ඤාව හා ප්‍රාණපරිත්‍යාගී වීම පිළිබඳ අනුශාසනා සහිත ලියවිල්ලක් ද එතුමාගේ කුසලතාව විදහා දක්වන ග්‍රන්ථ අතර වේ.

## ටර්ටුලියන් තුමා (ක්‍රි.ව. 160-220)

### ජීවිත පසුබිම

උතුරු අප්‍රිකාවේ කාතේජ් නගරයේ රෝම ශතාධිපතියකුගේ පුතකු ලෙස උපත ලැබුවේය. අන්‍යාගමිකයකු වු මෙතුමා පසු කලකදී කිතු දහම වැළඳ ගත්තෙකි. ග්‍රීක හා ලතින් භාෂාවන් පිළිබදව මනා දැනුමක් ලැබූ ඔහු වෘත්තියෙන් නීතිඥයෙක්ද විය.

### ශු. සභාවට දැක්වූ දායකත්වය

එවකට උතුරු අප්‍රිකාවට බලපෑ කිතුනු ආගම් පීඩනය නිසා කිතුනුවන්ට විඳීමට සිදු වූ නොයෙක් හිරිහැර සියැසින් ම දුටු ටර්ටුලියන් තුමා අහිංසක කිතුනුවන්ට පීඩා කිරීම ගැන රෝම පාලකයන්ට දොස් නැගුවේ ය. "ප්‍රාණ පරිත්‍යාගින්ගේ රුධිරය කිතුනුවන් බිහි වන බීජ වේ" යන වටිනා කියමන එතුමන්ගේ අත්දැකීම් ආශ්‍රයෙන් ප්‍රකාශ කරන ලද්දකි.

"වේදභේද විවේචනය" එතුමාගේ කෘති අතර ප්‍රධාන ය. කිතුනු විරෝධීන් වෙත ලියන ලද ඉතා වටිනා 'අපොලොජියා' ලේඛනය හා තපස් ජීවිතය පිළිබඳ ව ලියා ඇති කෘති ද ශු. සභාවට කළ සේවාව මැනවින් විදහා දක්වයි.

මුල් යුගයේ සභා ලේඛකයන් අතර විශිෂ්ට තැනක් ටර්ටුලියන් තුමාට හිමි වන අතර කිතු දහම පහදා දීම සඳහා දර්ශනවාදය දේව ධර්මය හා තර්කවේදය යන විෂයයන් මුල් කර ගෙන ලිපි ලේඛන සකස් කර තිබීම එතුමාගේ ලේඛන කාර්යයේ විශේෂ ලක්ෂණයකි.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :**

1. මුල් සභාවේ විශ්වාසය ආරක්ෂා කර ගැනීම සඳහා උරදුන් සභා පියවරුන් පිළිබඳ ව විස්තර කරන්න.

2. සභා පියවරුන්ගේ ආකල්ප හා ශුද්ධවන්ත ජීවිතය ආදර්ශයට ගනිමින් අභියෝගවලට මුහුණ දෙන්නේ කෙසේ ද?

3. කිතුනු දහමේ සත්‍යතා පිළිබඳ ව අවබෝධය මඟින් විශ්වාසය වර්ධනය කර ගන්නා ආකාරය ලියන්න.

4. ශු. සභාවේ දහම් සත්‍යතාවලට එරෙහි ව පැන නඟින අභියෝගවලට එඩිතර ව මුහුණ දීමට සූදානම් ආකාරය ලැයිස්තු ගත කරන්න.

**ආශ්‍රිත ග්‍රන්ථ :**


Mckenzie, L. John., ***Dictionary of the Bible,*** Geoffrey Chapman Ltd, London, 1968

Schreck, Alan., ***The Compact History of the Catholic Church,*** St. Paul Press, Bangalore, India, 1987

Comby, Jean., ***How to Read Church History (Volume 1),*** SCM Press Ltd, London, 1985

Childs, S. Brevard., ***Biblical Theology of the Old and New Testaments,*** SCM Press Ltd, 1992

ගරු ජයසූරිය., ජෝශප් (පියතුමා) (නි.ම.නි.)., ***සාන්ත සභා ඉතිහාසය,*** මලලසේකර මුද්‍රණාලය, පාණදුර, 1968

ඩයස්, ඔස්ටින්., ***ක්‍රිස්තු ධර්මය විභාග අත්වැල,*** ප්‍රසාන්ත් ප්‍රින්ටස්, වත්තල, 1998

**නිපුණතාවය 7. 0 : ජීවිත අභියෝග හමුවේ ශුද්ධාත්ම බලයෙන් පිරිපුන් වී විශ්වාසයට සාක්ෂි දරයි.**

**නිපුණතා මට්ටම 7.4** : දේව ධාර්මික සත්‍යතා නිවැරදි ව උගන්වයි

**කාලච්ඡේද සංඛ්‍යාව : 20**

**ඉගෙනුම් පල :**

- පළමු ජගත් මන්ත්‍රණ සභා හතර පිළිබද තොරතුරු රැස් කරයි
- දේව ධාර්මික සත්‍යතා නිවැරදි ව ඉගැන්විය යුතු බව පිළිගනියි
- පළමුවන ජගත් මන්ත්‍රණ සභා හතර පිළිබද තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි
- ශුද්ධාත්ම බලයෙන් යුතු ව වේදභේදවලට එරෙහි ව නැගී සිටියි
- දේව ධාර්මික සත්‍යතා සුරැකීමට අන් අය හා එක් ව ක්‍රියා කරයි

## 7.4.1 පසුබිම

මුල් කිතුනු සභා ඉතිහාසය දෙස බලන කල රෝම අධිරාජ්‍යය තුළ පළමු වන සියවස් තුනේ දී කිතුනුවෝ දරුණු පීඩාවලට ලක් වූහ. එහෙත් ශු. සභාවට එල්ල වු මෙවැනි බාහිර පීඩාවලට හා බලපෑම්වලට වඩා දරුණු බලපෑම් ශු. සභාව තුළින් ම හට ගැනීම අවාසනාවන්ත සිදුවීමක් විය. ධර්මය හා විනය නීති රීති පිළිබඳ ව ඇතිවූ නොයෙක් ගැටළු හා මතභේද විශේෂයෙන් ම ධර්මය පිළිබඳ වු වේදභේදික මත නැතහොත් දූර්මත ශු. සභාව තුළ වියවුල් තත්ත්වයක් ඇති කිරීමට හේතු විය. මෙම පසුබිම ශු. සභාවේ ඒකත්වයට පමණක් නොව අධිරාජ්‍යයේ ඒකත්වයට හා සාමයට තර්ජනයක් විය. මෙවැනි අවස්ථාවල කිතුනු සභාවේ වේද සත්‍යතා පහදා දීමටත් වේදභේදික මතවල වැරදි බව පෙන්වා දීමටත් ඒවා හෙළා දැකීමටත් ජගත් මන්ත්‍රණ සභා කැදවීමට සිදු විය.

### ජගත් මන්ත්‍රණ සභා (Ecumenical Councils)

ජගත් මන්ත්‍රණ සභාවක් යනු රෝමයේ රදගුරුතුමන්ගේ හෝ එතුමාගේ නියෝජිතයකුගේ හෝ නායකත්වයෙන් ලෝක රදගුරුවරුන් එක් ව ශු. සභාවේ උන්නතියට හා සභා ජීවිතයට එල්ල වන අවදානම් සහිත ප්‍රශ්නවල දී ධර්මය හා විනය පිළිබඳ නිල වශයෙන් නිවේදන හෝ ප්‍රකාශන නිකුත් කිරීමට එකමුතු වන්නාවූ සමුළුවකි. ජගත් මන්ත්‍රණ සභාවක් කැදවීම, මෙහෙයවීම හා අනුමත කිරීම ශුද්ධෝත්තම පියතුමාගේ මූලික කාර්යයක් විය. එතුමාගේ අනුමතිය නොමැති ව ජගත් මන්ත්‍රණ සභාවක් පැවැත්විය නොහැකි ය. ශු. සභා ඉතිහාසය තුළ මෙවැනි ජගත් මන්ත්‍රණ සභා 21ක් පවත්වා තිබේ. මෙයින් පළමු වැන්න ක්‍රි.ව. 325 දී පවත්වන්නට යෙදුණු නිසියානු මන්ත්‍රණ සභාව වේ. විසිඑක් වන මන්ත්‍රණ සභාව දෙවන වතිනාන මන්ත්‍රණ සභාව යි. එය පවත්වන ලද්දේ 1962-1965 අතර කාලයේ දී ය.

### වේදභේද (Heresies)

ශු. සභාවේ ඉගැන්වීම්වලට, අනුකූල නොවන ඉගැන්වීම් වේදභේද වේ. මෙම දූර්මත පැන නැගුණේ ශු. සභාව තුළින් ම වීම විශේෂත්වයකි.

### මුල් යුගයේ මන්ත්‍රණ සභා

ක්‍රි.ව. 325-451 තෙක් ජගත් මන්ත්‍රණ සභා හතරක් පවත්වා ඇත. මේවා 'ක්‍රිස්තුවේදීය මන්ත්‍රණ සභා' ලෙස ද හඳුන්වනු ලැබේ. එසේ නම් කිරීමට හේතු වී ඇත්තේ ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳ මතභේද සමතයකට පත් කිරීම ඒවායේ මූලික අරමුණ වීම යි. ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳ දුර්මතවාදීන් ඉදිරිපත් කළ ශු. සභාවේ ඉගැන්වීම්වලට පටහැණි මත හා ඉගැන්වීම් ප්‍රතික්ෂේප කිරීම හා ශු. සභාවේ සම්මත නිවැරදි දහම පෙන්වා දීම මෙම මුල් මන්ත්‍රණ සභාවල මූලික කාර්ය විය. මෙම මන්ත්‍රණ සභා පවත්වන ලද නගරවල නම්වලින් ඒවා හඳුන්වා ඇත. පසු කාලවල දී පවත්වන්නට යෙදුණු මන්ත්‍රණ සභා නම් කිරීමේ දී ද එම සම්ප්‍රදායය අනුගමනය කරමින් ඒවා පැවැත්වූ ස්ථානවල නමින් ප්‍රසිද්ධ කොට ඇත. මුල් යුගයේ පවත්වන ලද මන්ත්‍රණ සභා හතරකි. මෙම මන්ත්‍රණ සභා හතර ම පවත්වන ලද්දේ අධිරාජ්‍යයේ පෙරදිග ප්‍රදේශයට අයත් නගරවල ය. ආරම්භක යුගයේ දී ශු. සභාව වැඩි වශයෙන් මෙම ප්‍රදේශවල ව්‍යාප්ත වීමත් අධිරාජයා ඔහුගේ නව අගනුවර වන කොන්ස්තන්තිනෝපලයේ වාසය කිරීමට යැමත් එම මන්ත්‍රණ සභා පෙරදිග නගරවල පැවැත්වීමට ප්‍රධාන හේතු ලෙස පෙන්වා දිය හැකි ය.

| | |
|---|---|
| 1. නිසියානු මන්ත්‍රණ සභාව | (ක්‍රි.ව. 325) |
| 2. කොන්ස්තන්තිනෝපලයේ මන්ත්‍රණ සභාව | (ක්‍රි.ව. 381) |
| 3. එපීස මන්ත්‍රණ සභාව | (ක්‍රි.ව. 431) |
| 4. කැල්සිඩොන් මන්ත්‍රණ සභාව | (ක්‍රි.ව. 451) |

### නිසියානු මන්ත්‍රණ සභාව (ක්‍රි.ව. 325)

මෙම මන්ත්‍රණ සභාව පැවැත්වීමට මූලික පසුබිම වූයේ ඒරියන්වාදයයි. කිතුනු පූජකවරයකු වූ ඒරියස් ක්‍රි.ව. 323 දී පමණ වේදභේදික ඉගැන්වීම් ඉදිරිපත් කළේ ය. ඔහුගේ ප්‍රධාන තර්කය වූයේ ක්‍රිස්තුන් වහන්සේ සර්වබලධාරී දෙවියන් වහන්සේ හා සම තත්වයේ නොවෙන බවයි. එහෙයින් ක්‍රිස්තුස් වහන්සේ දෙවියන් වහන්සේගේ ප්‍රථම මැවිල්ල බව ඔහු ප්‍රකාශ කළේ ය. මේ නිසා ක්‍රිස්තුන් වහන්සේට සැබෑ දිව්‍යමය ස්වරූපයක් නොමැති බවත් පියාණන් වහන්සේගේ දේවත්වය වෙන අයකුට පැවරිය නොහැකි බවත් ඔහු තව දුරටත් තර්ක කළේ ය. පුත්‍රයාණන් මැවිල්ලේ ප්‍රථමයා බැවින් ඔහු දේව දූතයන්ට වඩා උසස් වුව ද දෙවියන් වහන්සේට වඩා පහත් බව ඔහුගේ මතය විය (subordinationism). දුක් විඳීම හා මරණය මඟින් වේදනා විඳින මිදුම්කරු වන ක්‍රිස්තුන් වහන්සේ දෙවියන් වහන්සේ විය නොහැකි ය. ක්‍රිස්තුන් වහන්සේ දෙවියන් වහන්සේ හා මිනිසා අතර සම්බන්ධතාව ඇති කරන මැදිහත්කරුවකු පමණක් බව ඔහුගේ අදහස විය.

ශුද්ධ ත්‍රිත්වය පිළිබඳ ව ද ඔහු වැරදි මත ඉදිරිපත් කළේ ය. ඔහුට අනුව ශුද්ධ ත්‍රිත්වය බුද්ධිමය සංකල්පයක් පමණි. එක ම සදාතන දෙවි කෙනෙක් පමණක් ඇත. ක්‍රිස්තුන් වහන්සේ උන් වහන්සේගේ පුත්‍රයා වුවත් එතුමා මවන ලද කෙනෙකි. මැවිල්ලේ විශිෂ්ඨතම මැවිල්ල ක්‍රිස්තුන් වහන්සේ වුවත් එතුමාණන් තුළ දේවත්වයක් නොමැත. එබැවින් එතුමා ට දේව පුත්‍රයා යැයි කිව නොහැකි ය. ශුද්ධාත්මයාණන් වහන්සේ ද දෙවි කෙනෙක් නොවෙති. එතුමාණන් ද මවන ලද්දකු බව ඔහුගේ අදහස විය.

ඒරියස් තම මතය දේශනා කළා මිස ඒවා ලේඛන ගත කළේ නැත. එහෙත් පසු කලෙක ඒවා ලේඛන ගත කර ඇති නමුත් එයින් අද ඉතිරි ව ඇත්තේ 'තලෙයියා' (Thaleia) නමින් හැඳින්වෙන ගීත කිහිපයක කොටස් පමණකි. එම ගීතවලින් ද කියවෙන්නේ පුත්‍රයාණන්ගේ ධර්මිෂ්ඨ භාවය නිසා දේව පුත්‍රයා යන නාමය ඔහුට දුන් බවත් එතුමා ශුද්ධ ත්‍රිත්වයේ දෙවෙනි තැනැන් වහන්සේ වුවත් පියාණන් වහන්සේ මෙන් සදාතන නොවන බවත්ය මෙවැනි මත කිතුනු වේද සත්‍යතා විකෘත කිරීමක් විය. ක්‍රිස්තුන් වහන්සේගේ දේවත්වය ප්‍රතික්ෂේප කිරීම උන් වහන්සේ ලොවට උරුම කර දුන් විමුක්තිය අර්ථ විරහිත කිරීමක් විය. මෙම ඉගැන්වීම්

පිළිබඳ ව ජනයා අතර විවිධ මතභේද ඇති විය. එහෙයින් අධිරාජ්‍යයේ එක්සත්කම හා සාමය ආරක්ෂා කර ගැනීම අරමුණු කොට ගෙන කොන්ස්තන්තීනු අධිරාජ්‍යයා අතිඋතුම් පළමු වන සිල්වෙස්ටර් ශුද්ධෝත්තම පියතුමාගේ අනුමතිය ලබා ක්‍රි.ව. 325 නිසියාවේ දී මන්ත්‍රණ සභාවක් කැඳවන ලදි. ඊජිප්තුව, පලස්තීනය, සිරියාව, සුළු ආසියාව, අප්‍රිකාව, ස්පාඤ්ඤය, ගෝල් (ප්‍රංශය) හා ඉතාලිය යන අධිරාජ්‍යයේ විවිධ රටවල් නියෝජනය කරමින් රදගුරුවරු 314 දෙනකු පමණ පිරිසක් එයට සහභාගි වී ඇත.

එහි දී ඒරියස්ගේ මත එකහෙළා ම මන්ත්‍රණ සභාව විසින් ප්‍රතික්ෂේප කරන ලදි. එම මතවල වැරදි නිවැරදි කරමින් ශු. සභාවේ වේද සත්‍යතා ඉදිරිපත් කරන ලදි. 'දෙවියන්ගේ ඒක ජනිත පුත්‍රයාණන් ද වන ජේසු ක්‍රිස්තුන් වහන්සේ දෙවියන්ගෙන් දෙවියන් ද සැබෑ දෙවියන්ගෙන් සැබෑ දෙවියන් ද වන බවත් ජනිත වූ නමුත් මවනු නොලැබ පියාණන් වහන්සේ සමඟ එක ම හවත්වය (of the same substance) ඇති ව වැඩ සිටින බවත් විශ්වාස කරමු'යි ප්‍රකාශයට පත් විය. මේ කරුණු කිතුනු දේව ධර්මයේ ඉගැන්වීම් අනුව සකස් කිරීමට විශේෂයෙන් ම සහාය වූයේ ශුද්ධ වූ අතනාසියුස් තුමා ය. ක්‍රිස්තුන් වහන්සේගේ දේව ස්වභාවය පිළිබඳව එතුමා ඉදිරිපත් කළ 'පියාණන් සමඟ එක ම හවත්වය ඇති ව' යන සංකල්පය ශු. සභාවේ වේද සත්‍යතාවක් බවට පත් විය.

මෙම ජගත් මන්ත්‍රණ සභාව ඒරියස් හා ඔහුගේ ප්‍රධාන අනුගාමිකයෝ ශු. සභාවෙන් නෙරපා දමනු ලැබූහ. එමෙන් ම හවත්වය යන්න බයිබලීය වචනයක් නොවන නිසා ශු. සභාවේ වේද සත්‍යතා පිළිගැනීමට අකමැති වූ රදගුරුවරුන් පිරිසක් ද ශු. සභාවෙන් නෙරපන ලදහ. එහෙත් නිකෝමේඩියාවේ රදගුරු ව සිටි එව්සේබියස් විසින් අනුගාමිකයන්ගේ සහාය ද ඇති ව මෙම වේද භේදික මත අධිරාජ්‍යයේ පෙරදිග ප්‍රදේශවල ව්‍යාප්ත කරන ලදී.

## කොන්ස්තන්තිනෝපලයේ මන්ත්‍රණ සභාව (ක්‍රි.ව. 381)

ඒරියානු වේද භේදයත් සමඟ පැන නැඟුණ තවත් දුර්මතයකි 'අප්‍රධානතාවාදය' (Subordinationism). ශුද්ධ ත්‍රිත්වයේ වැඩ වසන ක්‍රිස්තුන් වහන්සේ දෙවියන් වහන්සේ සමඟ සමාන නොවන බවත් ශුද්ධාත්මයාණන් වහන්සේ මේ දෙදෙනා වහන්සේට ම වඩා පහත් බවත් මින් අදහස් කරයි. ශුද්ධ ත්‍රිත්වයේ තුන් දෙනා වහන්සේලා අතර අසමානකම වේදභේදික දුර්මතයක් සේ සැලකයි. මෙම වේදභේදය ශු. සභාවේ ඒකත්වයට හා සාමයට බාධාවක් විය.

මෙම තත්ත්වය අවබෝධ කරගත් තියෝඩෝසියස් අධිරාජ්‍ය යා ක්‍රි.ව. 381 දී කොන්ස්තන්තිනෝපලයේ මන්ත්‍රණ සභාවක් පැවැත්වීමට ශුද්ධෝත්තම පියතුමාගේ අවසරය ලබා ගත්තේ ය. පෙරදිග රදගුරුවරු 150 දෙදෙනෙකුගේ සහභාගිත්වයෙන් මෙම මන්ත්‍රණ සභාව පැවැත්වී ය. මෙහි දී නිසියාන මන්ත්‍රණ සභාව විසින් ඉදිරිපත් කරන ලද ධර්මය නැවත ස්ථිර කරන ලදි. විශේෂයෙන් ම එහි දී සම්මත වූ පියාණන් වහන්සේ සමඟ ක්‍රිස්තුන් වහන්සේ එක ම හවත්වය ඇති ව වැඩ සිටී යන දේව ධාර්මික සංකල්පය නැවත ස්ථිර විය. දැනට දිව්‍ය පූජාවේ උච්චාරණය කරනු ලබන නිසියානු විශ්වාස ලක්ෂණය භාවිත කිරීමට නියෝග කරන ලද්දේ ද මෙම මන්ත්‍රණ සභාවේ දී ය. වේදභේදික අදහස් බැහැර කොට ශු. සභාවේ වේද සත්‍යතා තහවුරු කිරීම සඳහා බැසිල් තුමා, නසිසන්ස්හි ග්‍රෙගරි තුමා හා නිස්සාවේ ග්‍රෙගරි තුමා දායක වී ඇත.

ශු. සභාවේ විනය හා පාලනය පිළිබඳ ව මෙහි දී ගත් තීරණයක් වන කොන්ස්තන්තිනෝපලයේ රදගුරුතුමාගේ තනතුර රෝමයේ රදගුරුතුමාගේ තනතුරට පමණක් දෙවෙනි තැන ගැනීම යන ප්‍රකාශනය පසු කලෙක පෙරදිග හා අපරදිග සභා අර්බුදයකට මඟ පෑදූ තවත් කරුණක් විය. මෙම තීරණය ගැනීමට හේතු වූයේ අපරදිග (රෝම) ප්‍රදේශවල රදගුරුවරුන් මෙම මන්ත්‍රණ සභාවට සහභාගි නොවීම නිසා බව සඳහන් වේ. එම නිසා කොන්ස්තන්තිනෝපලයේ මන්ත්‍රණ සභාව ජගත් මන්ත්‍රණ සභාවක් ලෙස අපරදිග ප්‍රදේශවල පිළිගැනීම සයවන සියවස තෙක් ප්‍රමාද විය.

## එපීස මන්ත්‍රණ සභාව (ක්‍රි.ව. 431)

කොන්ස්තන්තිනෝපලයේ රදගුරුතුමා වූ නෙස්ටෝරියස් ක්‍රිස්තුන් වහන්සේගේ දේවත්වය ගැනත් උන් වහන්සේ තුළ මනුෂ්‍යත්වය හා දේවත්වය සම්බන්ධ වීම ගැනත් වැරදි මත ඉදිරිපත් කළේ ය. එනම්, ක්‍රිස්තුන් වහන්සේ තුළ දේව ස්වභාවයත් මනුෂ්‍ය ස්වභාවයත් වෙන් වෙන් ව පවතී. එම නිසා උන් වහන්සේ පුද්ගලයෝ දෙදෙනෙකි; දේවත්වයෙන් හා මනුෂ්‍යත්වයෙන් යුත් පුද්ගලයන් දෙදෙනෙකි. දිව්‍ය සත්ප්‍රසාදය මඟින් අප ලබා ගන්නේ ජේසු යන මිනිසා පමණක් බව නෙස්ටෝරියස්ගේ මතය විය.

එසේ ම මරිය තුමියගේ කුස තුළ පිළිසිඳ ගත්තේ මනුෂ්‍යත්වයෙන් යුත් ක්‍රිස්තුන් වහන්සේ ය. එබැවින් මරිය තුමිය දේව මාතාවන් ලෙස හැඳින්විය නොහැකිය ඇය ක්‍රිස්තුන් වහන්සේ යන මිනිසාගේ මව පමණි.

මෙම දුර්මතය දුරු කිරීමට අති උතුම් සෙලෙස්ටියන් ශුද්ධෝත්තම පියතුමාගේ අනුමතිය ඇති ව තියෝඩෝසියස් අධිරාජයාගේ අනුග්‍රහය යටතේ ක්‍රි.ව. 431 දී මන්ත්‍රණ සභාවක් පැවැත්විණි. ඇලෙක්සැන්ඩ්‍රියාවේ රදගුරු ශුද්ධ වූ සිරිල් තුමා සභාවේ වේද සත්‍යතාවක් සනාථ කිරීම සඳහා පියවර ගත්තේ ය. ඒ අනුව ක්‍රිස්තුන් වහන්සේ එක් පුද්ගලයකු පමණි. උන් වහන්සේ තුළ දේවත්වය හා මනුෂ්‍යත්වය යන ස්වභාව දෙක ම ඒකාබද්ධ ව පවතී. එම නිසා ක්‍රිස්තුන් වහන්සේ සැබෑ දෙවියන් ද සැබෑ මනුෂ්‍යයා ද වන සේක. එලෙස ම මරිය තුමියගේ කුසයෙහි මනු කය ගෙන පිළිසිඳ ගත්තේ දේව පුත්‍රයා වන ජේසු ක්‍රිස්තුන් වහන්සේ නිසා එතුමියට දේව මෑණියන් (Theotokos) යන ගෞරව නාමය දිය හැකි ය යන්න සභාවේ වේද සත්‍යතාවක් බවට පත් විය.

මරිය තුමිය දෙවි මව ලෙස පිළිගැනීම ශු. සභාවේ මරියවේදය (Mariology) තව දුරටත් තහවුරු කිරීම සඳහා හේතු විය. එපීස මන්ත්‍රණ සභාවේ තීරණ නෙස්ටෝරියන් ඇතුළු පිරිස නොපිළිගත් නිසා ඔවුන් ව ශු. සභාවෙන් නෙරපනු ලැබූ අතර අධිරාජ්‍යයෙන් ද පිටුවහල් කරනු ලැබිණි.

## කැල්සිඩොන් මන්ත්‍රණ සභාව (ක්‍රි.ව. 451)

කොන්ස්තන්තිනෝපලයේ තාපසයකු වූ එව්ටිකස් (Eutyches) විසින් ක්‍රිස්තුන් වහන්සේගේ ස්වභාවය පිළිබඳ දුර්මතයක් ප්‍රචාරය කරන ලදි. ක්‍රිස්තුන් වහන්සේ තුළ ඇත්තේ එක ම දේව ස්වභාවයක් පමණක් වන අතර මනුෂ්‍ය ස්වභාවයේ මාත්‍රයක් පමණක් බව ඔහුගේ අදහස විය. මෙම මතය එව්ටිකියන්වාදය (Eutychianism) ලෙස ප්‍රසිද්ධ විය. මෙම අදහස ක්‍රිස්තුන් වහන්සේ තුළ ඒකාබද්ධ ව තිබූ මනුෂ්‍ය ස්වභාවය ප්‍රතික්ෂේප කිරීමකි. මාංශගත වීමෙන් පසු ක්‍රිස්තුන් වහන්සේට වූයේ ඒක ස්වභාවයක් පමණි (mono-physic). ඒ දේව ස්වභාවය ය යන්න ඔහුගේ අදහස විය. මෙය ක්‍රිස්තුන් වහන්සේගේ මනුෂ්‍ය ස්වභාවය ප්‍රතික්ෂේප කිරීමක් නිසා එක්තරා අන්දමක ඒක ස්වරූපීවාදයකි. එහෙයින් මෙම මතය මොනිපිටියානුවාදය (Monophysitism) ලෙස ද හැඳින්වේ.

කොන්ස්තන්තිනෝපලයේ රදගුරු ප්ලේවියන් තුමා එව්ටිකස්ගේ ප්‍රකාශන වේදභේදික බවට පෙන්වා දුන්නේ ය. එහෙත් එව්ටිකස් තම මතය නිවැරදි බව ප්‍රකාශ කරමින් අධිරාජයාගේ සහාය පැතී ය. එහෙයින් දෙවන තියෝඩෝසියුස් අධිරාජයා ක්‍රි.ව. 451 දී සුළු ආසියාවේ කැල්සිඩොන් නගරයේ දී මන්ත්‍රණ සභාවක් කැඳවූ අතර මහා ලියෝ ශුද්ධෝත්තම පියතුමන්ගේ අනුමතිය සමඟ එතුමාගේ නියෝජිතයකුගේ හා රදගුරුවරුන් 550 දෙනෙකුගේ පමණ සහභාගිත්වයෙන් මෙම මන්ත්‍රණ සභාව පවත්වන ලදි. ක්‍රිස්තුන් වහන්සේගේ දේවත්වයෙන් උන් වහන්සේගේ මනුෂ්‍යත්වය වෙන් කළ නොහැකි බවත් එම නිසා උන් වහන්සේ සැබෑ දෙවියන් ද සැබෑ මනුෂ්‍යයා ද වන බවත් කැල්සිඩොන් මන්ත්‍රණ සභාවේ දී ස්ථිර විය. මෙය 'කැල්සිඩොන් නිර්වචනය' ලෙස ද හැඳින්වේ. මෙහි දී වූයේ ද නිසියානු ප්‍රකාශන තව දුරටත් සම්මත කිරීමකි. ඊට අමතර ව පැවිදි පූජක කණ්ඩායම් වෙනුවෙන් විනය නීති මාලාවක් ද සම්මත විය.

| වේද භේදය | ඉදිරිපත් කළේ | වේද සත්‍යතාව තහවුරු කළ මන්ත්‍රණ සභාව | වේද සත්‍යතාවය තහවුරු කල සභා පියවරු | සභාව පිළිගත් වේද සත්‍යතාව |
|---|---|---|---|---|
| ඒරියන් වේද භේදය (ආරියුස් වේදභේදය) | ඒරියස් | නිසියානු මන්ත්‍රණ සභාව (ක්‍රි. ව. 325) | ඇලෙක්සැන්ඩ්‍රියාවේ ශුද්ධ වූ අතනාසියුස් තුමා | ක්‍රිස්තුන් වහන්සේ දෙවියන් වහන්සේ සමග එක ම භවත්වය ඇතිව වැඩ සිටින සේක. ජනිත වූ නමුත් මවනු නොලැබූ සේක. |
| අප්‍රධානතාවාදය | - | කොන්ස්තන්තිනෝපලයේ මන්ත්‍රණ සභාව (ක්‍රි. ව. 381) | බැසිල් තුමා, නසියන්ස්හි ග්‍රෙගරි තුමා හා නිස්සාවෙහි ග්‍රෙගරි තුමා | නිසියානු වේද සත්‍යතා නැවත තහවුරු විය. නිසියානු විශ්වාස ලක්ෂණය භාවිතා කිරීමට නියම විය. |
| නෙස්ටෝරියානු වේද භේදය | නෙස්ටෝරියස් | එපීස මන්ත්‍රණ සභාව (ක්‍රි. ව. 431) | ඇලෙක්සැන්ඩ්‍රියාවේ රදගුරු ශුද්ධ වූ සිරිල් තුමා | ක්‍රිස්තුන් වහන්සේ එක පුද්ගලයෙකි. උන් වහන්සේ තුළ දේවත්වය හා මනුෂ්‍යත්වය ඒකාබද්ධ ව පවතී. මරිය තුමිය දේව මාතාව වන්නී ය. |
| එව්ටිකියන් වේද භේදය (මොනිපිටියානුවාදය) | එව්ටිකස් | කැල්සිඩොන් මන්ත්‍රණ සභාව (ක්‍රි. ව. 451) | කොන්ස්තන්තිනෝපලයේ රදගුරු ප්ලේවියන් තුමා | ක්‍රිස්තුන් වහන්සේ සැබෑ දෙවියන් ද සැබෑ මනුෂ්‍යයා ද වන සේක. කැල්සිඩොන් නිර්වචනය සකස්වීම. |

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- වේදභේද මඟින් ශු. සභාවට වූ බලපෑම් පැහැදිලි කරන්න.
- ක්‍රිස්තුවේදීය මන්ත්‍රණ සභා නම් කර ඒවායින් වූ සේවාව ඇගයීමකට ලක් කරන්න.
- ශු. සභාවේ වේද සත්‍යතා තුළ ජීවත් වීමට උනන්දු වීම හා පියවර ගැනීම ඔබ සතු යුතුකමක් සේ සලකා ඒ පිළිබඳ ව යෝජනා ඉදිරිපත් කරන්න
- අපට දායාද කොට ඇති විශ්වාසය ආරක්ෂා වන ලෙස කටයුතු කිරීමට තරුණ ඔබ කටයුතු කරන ආකාරය පෙන්වා දෙන්න.

**ආශ්‍රිත ග්‍රන්ථ :**


Mckenzie, L. John., ***Dictionary of the Bible,*** Geoffrey Chapman Ltd, London, 1968

Schreck, Alan., ***The Compact History of the Catholic Church,*** St. Paul Press, Bangalore, India, 1987

Comby, Jean., ***How to Read Church History (Volume 1),*** SCM Press Ltd, London, 1985

Childs, S. Brevard., ***Biblical Theology of the Old and New Testaments,*** SCM Press Ltd, 1992

ගරු ජයසූරිය., ජෝශප් (පියතුමා) (නි.ම.නි.)., ***සාන්ත සභා ඉතිහාසය,*** මලලසේකර මුද්‍රණාලය, පාණදුර, 1968

ඩයස්, ඔස්ටින්., ***ක්‍රිස්තු ධර්මය විභාග අත්වැල,*** ප්‍රසාන්ත් ප්‍රින්ටස්, වත්තල, 1998

**නිපුණතාවය 8.0. : ශුද්ධ වූ සභා ගමන් මඟ නිවැරදි කර ගැනීම සඳහා ශුද්ධාත්ම මඟපෙන්වීමට විවෘත වෙයි.**

**නිපුණතා මට්ටම 8.1 :** එලදායී විවේචනවලට සුභවාදී ප්‍රතිචාර දක්වමින් ගැටලු නිරාකරණය කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 25

**ඉගෙනුම් පල :**

- ක්‍රි.ව. 4-16 සියවස තෙක් විශ්ව ශුද්ධ සභා ඉතිහාසය පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- එලදායී විවේචනවලට ශුභවාදී ප්‍රතිචාර දැක්විය යුතු බව පිළිගනියි.
- ක්‍රි.ව. 4-16 සියවස තෙක් විශ්ව ශුද්ධ වූ සභා ඉතිහාසය පිළිබඳ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- ජාතික සමගිය හා ආගමික සහජීවනය ගොඩනැගීමට දායක වෙයි.
- පිළිගත් සභා අතර සභා එකමුතු ව ගොඩනැගීමට දායක වෙයි.

## 8.1.1. ශු. සභා ඉතිහාසය

### 4-16 වන සියවස තෙක් ශු. සභා ඉතිහාසය

★ මෙම සියවස තුළ විශාල වෙනස්කම් රැසක් ශු. සභාව තුළ හා සමාජය තුළ සිදු විය.

★ සියවස ආරම්භයේ දී අධිරාජයා විසින් ශුද්ධ වූ සභාව පීඩාවට ලක්කිරීම සිදු විය.

★ කොන්ස්තන්තීනු අධිරාජයා මිලාන් ආඥාව නිකුත් කිරීමෙන් පසු ශු. සභාවට ආගමික නිදහස හිමි විය.

★ ඔහු ලතින් සංස්කෘතියේ හදවත බඳු වූ රෝමය අතහැර දමා අධිරාජ්‍යයේ අගනුවර වශයෙන් ග්‍රීක් සංස්කෘතියේ වැදගත් මධ්‍යස්ථානයක් වූ කොන්ස්තන්තිනෝපලයේ පදිංචියට ගියේය.

★ ග්‍රීක් සංස්කෘතිය එහි වර්ධනය විය.

★ කිතුනු ජනගහනය ක්‍රමයෙන් වර්ධනය වීය.

★ ග්‍රීක රෝම සම්භාව්‍ය ආයතන කිහිපයක් බිහි වූ අතර ඒවායේ අධ්‍යාපනය ලැබීමට කිතුනුවෝ ක්‍රමයෙන් ඇදී ගිය හ.

★ ශු. සභාවකට එරෙහි ව පැනනැඟුණු දුර්මත හා වේදභේද නිරාකරණය කිරීමට සභා පියවරු නොපසුබට ඉදිරිපත් විය.

### යුරෝපයේ කිතුනු සභා ව්‍යාප්තිය

### පස්වන සියවසේ දී කිතුනු සභාව

★ පස් වන සියවසේ දී අධිරාජ්‍යයේ පාලන කටයුතු දේශපාලන වශයෙන් නැගෙනහිර හා බටහිර වශයෙන් දෙකඩ වීම ආරම්භ විය.

★ අධිරාජ්‍යයේ නැගෙනහිර කොටස ග්‍රීක භාෂාවට ද බටහිර කොටස ලතින් භාෂාවට ද මුල් තැන් ලබා දිනි.

★ ක්‍රි.ව. 410 දී 'ඇලරික්ගේ' නායකත්වය යටතේ විසිගෝත් නම් ගෝත්‍රිකයන් රෝමය විනාශ කිරීම බටහිර අධිරාජ්‍යයාට තදින් බලපෑම.

★ මෙම යුගයේ දී ශාන්ත අගුස්තීනු තුමාගේ මෙහෙය වඩා වැදගත් ය. ක්‍රි.ව. 410 දී 'විසිගෝත්'නමින්හැඳින්වුණු ම්ලේච්ඡ ගෝත්‍රිකයෝ රෝමය සුනුවිසුනු කළහ. අධිරාජ්‍යයේ හැම ප්‍රධාන නගරයක් ම අනුක්‍රමයෙන් එක් එක් ම්ලේච්ඡ ගෝත්‍රවල ග්‍රහණයට හසු විය. එහෙත් ඒ කිසි දු සිදුවීමක් නිසා ශාන්ත අගුස්තීනු තුමා කලකිරීමට පත් වූයේ නැත. 'දේව නගරය' නමැති ඔහුගේ විශිෂ්ට කෘතිය මඟින් මිනිසාගේ නියම මාතෘභූමිය කිසියම් හතුරෙකුට ආක්‍රමණය කළ නොහැකි බව ඔහු පෙන්වා දුන්නේ ය. ක්‍රි.ව. 430 දී 'වැන්ඩල්' ගෝත්‍රිකය විසින් රෝමයට පහර දෙන ලදී. එහෙත් අවසානය තෙක් ම ඔහු තම ආදර්ශයෙන් හා අනුශාසනාවෙන් තම ජනතාව ධෛර්යවත් කළේය.

★ ඊට අමතර ව 'වැන්ඩල්' හා 'හන්ස' යන ගෝත්‍ර විසින් ද බටහිර අධිරාජ්‍යයේ විවිධ ප්‍රදේශවල බලය අල්ලා ගන්නා ලදි.

★ ක්‍රි.ව. 476 පමණ වන විට මුළු බටහිර අධිරාජ්‍යය ම ගෝත්‍රිකයන්ගේ පාලන බලයට යටත් විය.

★ රෝමයේ ඇතිවූ දේශපාලන අස්ථාවරය හේතු කොට ගෙන පීඩාවට පත්වූ කිතුනු ජනතාව ශාරීරික ව හා ආධ්‍යාත්මික ව පෝෂණය කිරීමට, ඔවුනට මඟ පෙන්වීමට හා ඔවුන් ආරක්ෂා කිරීමට ශු. සභා නායකයන් විසින් සිදු කරන ලදි.

උදාහරණ :- පළමු වන ලියෝ ශුද්ධෝත්තම පියතුමා (ක්‍රි.ව. 440 - 461)

'ඇට්ටිල්ලා' නමැති 'හන්'ගෝත්‍රිකයන්ගේ නායකයාගේ පහර දීම්වලින් රෝමය ආරක්ෂා කිරීම.

## පෙලාජියානුවාදය

★ පෙලාජියානුවාදය හෙවත් පෙලාජියස් නම් බ්‍රිතාන්‍ය ජාතික තාපසයාගේ ඉගැන්වීම :-මිනිසාගේ මනුෂ්‍ය ස්වභාවය ජන්ම පාපය මඟින් විනාශ වී ඇතැයි යන මතය තරයේ ප්‍රතික්ෂේප කළේ ය. පාපයෙන් මිදී තමාට ම තමා ගේ ගැලවීම අත් කර ගැනීමට හැකි බවත් ඒ සඳහා දේව වරප්‍රසාදය හා අනුග්‍රහය අවශ්‍ය නොවන බවත් ප්‍රකාශ කළේය. මනුෂ්‍යයාට ක්‍රිස්තුන් වහන්සේ මෙන් යහපත් ජීවිතයක් ගත කර ගැලවීම අත්කර ගැනීමට හැකියාව ඇති බවත් පෙන්වා දුන්නේ ය.

★ පෙලාජියස්ගේ මතයට විරුද්ධ ව ශුද්ධ වූ අගෝස්තීනු තුමා අදහස් දැක්වූවේ ය. ඔහුගේ අදහස වූයේ ගැලවීම බොහෝ සේ රඳා පවත්නේ දේව වරප්‍රසාදය අනුව බවත්, මනුෂ්‍යයාට ඒ සඳහා කළ හැකි දේ ඉතා ස්වල්ප ය.

★ ක්‍රි.ව. 529 දී පැවැති දෙවන ඔරේන්ජ් මන්ත්‍රණ සභාව මඟින් පෙලාජියස්ගේ මතයට විරුද්ධ ව ඉදිරිපත් කරන ලද මතය සංශෝධනයට ලක් කොට ගැලවීම සඳහා දේව වරප්‍රසාදය අනිවාර්ය වන නමුත් දේව වරප්‍රසාදය පිළිගැනීමේ දි මනුෂ්‍යයා අනුග්‍රහය දැක්විය යුතු බවට පෙන්වා දුන්නේ ය.

## පෙරදිග සභාව

★ නැඟෙනහිර ප්‍රදේශයේ ගිහි පැවිදි වශයෙන් වැඩි පරතරයක් නොවූ අතර ශු. සභාව හා රජය අතර ද, එතරම් දූරස්තභාවයක් නොපැවතිණි. මෙම සබැඳියාව මුස්ලිම්වරුන්ගේ ආක්‍රමණ තෙක් ම නැඟෙනහිර අධිරාජ්‍යය තුළ පැවතිණි.

★ බොහෝ අධිරාජ්‍යවාදීන් දේව ධර්මවේදීන් හා සභා පාලකයන් ලෙස ක්‍රියා කළ අතර ඔවුහු රදගුරුවරුන් නම් කිරීම හා නෙරපා දැමීම පවා සිදු කළ හ.

★ නැඟෙනහිර සභාවේ නැතහොත් 'බිසන්තීන සභාවේ' තත්ත්වයෙන් උසස් හා තේරුම් සහිත නමස්කාර පිළිවෙත් ක්‍රම වැඩිදියුණු කර ගැනීම සිදු විය. (එම පිළිවෙත් ක්‍රම අද වන තෙක් ම පවතියි.)

★ එම පිළිවෙත්වල දේව අභිරහස්වල ශුද්ධ වූ භාවය පිළිබඳ වැඩි අවධානයක් යොමු විය.

★ ජනවන්දනා උත්සව හා වත්පිළිවෙත් දැකුම්කලු හා නාට්‍යමය ස්වරූපයක් ගත්තේ ය.

★ ඔවුන් තමන්ට ආවේණික ජනවන්දනා වත්පිළිවෙත් හඳුන්වා දුන්නේ ය. ඒවා බටහිර (ලතින්) සභාවේ එවකට පැවති ජනවන්දනා ක්‍රමවලට වඩාත් වෙනස් ස්වරූපයක් ගත්තේ ය.

★ නැගෙනහිර සභාව ද දේව මාතාවන්ට, ශාන්තුවරයන්ට හා ශුද්ධ වූ ධාතුන්ට වැඩි භක්තියක් හා වන්දනා පූර්වක ගෞරවයක් දැක්වී ය.

★ විවිධ දිශා වලින් පැමිණි ගෝත්‍රික ආක්‍රමණය රෝම ශිෂ්ටාචාරය බිඳ දැමුවේය. එම ආක්‍රමණ යුගය යුරෝපීය ඉතිහාසයේ දැක්වෙන්නේ 'අඳුරු යුගය' වශයෙනි. රෝම අධිරාජ්‍යයේ අවසානයට මඟ පෑදුණේ එයිනි.

★ ක්‍රි.ව. 452 දී කුරිරු ගෝත්‍රියක් ලෙස සැලකෙන 'හන්ස්වරුන්ගෙන්' ක්‍රි.ව. 452 දී රෝම නගරයට තර්ජනයක් එල්ල විය. 'ඇට්ටිල්ලා' මෙම ගෝත්‍රයේ නායකයා විය. එකල රෝමයේ රදගුරුතුමා වූ 'පළමු ලියෝ පාප්තුමා' ඔහු වෙත නිර්භීත ව ගොස් එම නගරයට කරුණාව දක්වන මෙන් ඉල්ලා සිටියේ ය. ම්ලේච්ඡ නායකයා මෙම ශාන්ත වයසක මිනිසා ගැන කෙතරම් පැහැදුණා ද කිවහොත් වන්දියක් වශයෙන් සුළු මුදලක් පමණක් ලබාගෙන නගරයට අත නොගසා පැමිණි පාරෙන් ම හැරී යන්නට ගියේ ය. එතැන් සිට පාප්තුමා රෝම පුරයේ ඒකීය නායකයා බවට පත් විය.

★ අයර්ලන්තවාසී ගෝත්‍රිකයන් ශිෂ්ට කරවීමට සමත්වූ ශාන්ත පැට්රික් හා ශාන්ත බෙනඩික් යන කිතුනු තාපස දෙපළ ක්‍රිස්තියානි තාපස සම්ප්‍රදායය ක්‍රමවත් කරවීමට බොහෝ උත්සාහ දැරූහ.

**සයවන සියවසේ දී තුළ කිතුනු සභාව**

★ රෝම අධිරාජ්‍ය හා ශු. සභාව විවිධ අස්ථාවරතාවන්ට මුහුණ දුන්නේ ය. මෙම යුගයේ මුල් භාගයේ දී විවිධ හේතු නිසා සභාව තුළ පැවති දේව ධාර්මික හා ආධ්‍යාත්මික නවෝදයේ යුගයට (සභා පියවරුන්ගේ යුගයට) නැවතීමේ තිත වැටෙන්නට විය.

★ අධිරාජ්‍යයේ නැගෙනහිර කොටස මුස්ලිම් ආක්‍රමණ නිසා අස්ථාවර භාවයට මුහුණ දුන්නේ ය.

★ ඒරියන්වාදී ඇදහිලිකරුවන් කතෝලික ඇදහිල්ල කරා ගෙන ඒමට ශු. සභාවට හැකි විය.

★ විවිධ ගෝත්‍රිකයන් යටත් කරගෙන සිටි බටහිර රාජ්‍යය ඔවුන්ගෙන් ගිලිහෙන්නට විය.

★ ක්‍රි.ව. 532 දී බර්ගුන්ඩියන් ගෝත්‍රික රාජධානිය ද ක්‍රි.ව. 533 දී 'වැන්ඩල්' ගෝත්‍රික රාජධානිය ද ක්‍රි.ව. 553 දී ඔස්ත්‍රොගොත් ගෝත්‍රික රාජධානිය ද බිඳවැටිණි.

★ ක්‍රි.ව. 496 දී 'ක්ලොවිස්' නමැති 'ෆ්‍රැන්ක් ගෝත්‍රික රජු කිතුනු දහමට හැරුණු අතර ඔහු එවකට පැවති බටහිර සභාවට බොහෝ සේ සහාය දැක්විමය.

★ ශුද්ධ වූ පැට්රික්තුමා (ක්‍රි.ව. 461) අයර්ලන්තය තුළ කිතුනු ධර්මය ප්‍රචාරය කළ අතර දැඩි තාපස ජීවිතයක් ද හඳුන්වා දුන්නේ ය.

★ පැවිදි ජීවිතය ක්‍රමවත් කිරීමට 'නූර්සියාවේ' ශාන්ත බෙනඩික් තුමා විසින් ක්‍රි.ව. 529 මොන්ටිකසීනෝ නම් ස්ථානයේ දී දරනු ලැබූ ප්‍රයත්නය ක්‍රිස්තියානි තාපස ඉතිහාසයේ සංන්ධිස්ථානයක් ලෙස සැලකිය යුතු වන්නේ ය.

★ සිත හා කය වෙහෙසා වැඩ කිරීම යන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වූ තාපසාරාම රෝම හා බටහිර සංස්කෘතිය රැක ගැනීමේ හා සුබ අස්න පැතිරවීමේ මූලික මධ්‍යස්ථාන බවට පත් වීය.

★ ක්‍රි.ව. 590 දී මහා (පළමු වන) ග්‍රෙගරි පාප්තුමා රෝමයේ රදගුරුතුමා වශයෙන් තෝරාපත් කරගන්නා ලදි.

★ පළමු වන ග්‍රෙගරි ශුද්ධෝත්තම පියතුමා යටතේ බෙන්දිකාන නිකායේ තාපසවරු ඉතා ප්‍රබල ධර්මදූතවරු වූහ.

★ අධ්‍යාපනය සඳහා බෙනදිකාන නිකාය විසින් ඉතා අගනා සුවිශේෂ මෙහෙයක් ඉටු කරන ලදි.

★ බෙනදිකාන තාපසවරු කිතුනු විශ්වාසයේ පණිවිඩකරුවෝ ද බටහිර සංස්කෘතියේ ආරක්ෂකවරු ද ශිෂ්ටාචාර ජීවිත ක්‍රම හඳුන්වා දෙන්නෝ ද වූහ.

★ ශාන්ත බෙනඩික් තුමා තාපසාරාමය තුළ සකස් කළ දේව වන්දනා ක්‍රමය සමස්ත සභාවට ගැළපෙන විලාසයකට සකස් කරන ලද්දේ මහා ග්‍රෙගරි පාප්තුමන් විසිනි. (ක්‍රි.ව.540 - 604). දිව්‍ය පූජාව තුළට ග්‍රෙගෝරියානු සජ්ඣායනා ක්‍රමය (Gregorian chant) නමින් පසු ව හැඳින්වෙන්නට වූ නව සංගීත ක්‍රමය ඇතුළත් කරනු ලැබුවේ ද ඔහු විසින් ය.

★ ශුද්ධ වූ 'කොලුම්බා' නමැති 'අයර්ලන්ත' ජාතික තාපසතුමා විසින් 'සෙල්ටික්' තාපසාරාමය 'ස්කොට්ලන්තයේ' ඉයොනා යන ස්ථානයේ දී ක්‍රි.ව. 563 දී ආරම්භ කරන ලදි.

★ මේවායේ ප්‍රතිඵලයක් ලෙස සවන සියවසේ දී බ්‍රිතාන්‍ය දූපත් තුළ බොහෝ දෙනා කිතු දහම වැලඳ ගත් හ.

★ මෙම සියවස අවසානයේ සහා ඉතිහාසයේ මධ්‍යතන යුග ආරම්භ විය.

### හත් වන සියවසේ දී කිතුනු සභාව

### රජය සහ ශු. සභාව

★ හත් වන සියවස සිත් හැරීම් නිසා කිතුනුවන් ශු. සභාවට විශාල වශයෙන් එකතු වූ යුගයකි.

★ මෙම කාලයේ දී ශු. සභාව හා රජය අතර අරගල ඇති වීම.

★ ශු. සභාව හා අධිරාජ්‍යයා අතර පැවති කිට්ටු සම්බන්ධතාවේ ප්‍රතිඵලයක් ලෙස කිතුනු රාජ්‍යයක් ඇති වන්නට වීම හා සභාව හා රජය අතර සම්මුති ඇති වීය.

★ යම් යම් අනිසි බලපෑම් නිසා පාප්තුමන්ලා හා අධිරාජවරුන් අතර ගැටුම් ද ඇති වීම.

★ අධිරාජ්‍යවාදීන් සභා පරිපාලනයට ඇති කළ අනිසි බලපෑම් මෙම ගැටුම්.

★ කතෝලික සභාව සහ නැගෙනහිර ඕතඩොක්ස් සභාව අතර ගැටුම් ඇති වීම.

### අට වන සියවසේ දී කිතුනු සභාව

### ධර්මදූත සේවාව

★ අටවන සියවස තුළ ද විවිධ ගෝත්‍රික ජනතාවගේ සිත් හැරීමේ කාර්යය තව දුරටත් ක්‍රියාත්මක වීම.

★ ක්‍රි.ව. 723 - 739 යන කාලයේ දී බෙනදිකාන නිකායයට අයත් ඉංග්‍රීසි ජාතික පැවිදිවරයකු වූ විනිෆ්‍රිඩ් නැතහොත් පසුකලෙක ජර්මනියේ අපෝස්තුලුවරයා ලෙස නම් ලත් ශුද්ධ වූ බොනිෆස් තුමාගෙන් සිදුවූ ප්‍රාතිහාර්යාත්මක ක්‍රියා බොහෝ දෙනෙකුගේ සිත් හැරීමට හේතු විය. එතුමා යුරෝපයේ කිතුනු ඇදහිල්ල පාප්තුමාගේ මඟ පෙන්වීම යටතේ ගොඩනගාමිය ගියේ ය.

### අධ්‍යාපන සේවාව

★ ෆ්‍රැන්ක්වරුන්ගේ රජතුමා ක්‍රි.ව. 768 දී අභාවප්‍රාප්ත වූ පසු ඔහුගේ පුත්‍ර චාල්ස්ට (ක්‍රි.ව. 768-814) ඔටුන්න හිමි විය. ඔහුගේ පාලන යුගය යුරෝපයේ දීර්ඝතම හා මහිමාන්විත ම යුගය විය.

★ මහා චාල්ස් රජතුමා අධ්‍යාපන තත්ත්වය දියුණු කිරීමට වෙහෙස විය. මේ සඳහා ඔහු තම ලේකම්වරයා වූ ඉංග්‍රීසි ජාතික තාපස අල්ක්වින්ගේ නායකත්වය යටතේ බුද්ධිවාදීන් පිරිසක් රජමාලිගාවට එක්රැස් කළේ ය.

★ සෑම ආසන දෙව්මැඳුරට යාබද ව පාසලක් ආරම්භ කරන ලෙස සෑම රදගුරුවරයකුට ම රජතුමා අණ කළේ ය.

★ මහා චාල්ස් රජතුමාගේ මරණින් පසු අධිරාජ්‍යය දෙකඩ වීම නිසා අධ්‍යාපනය නංවාලීමට ඔහු ගත් පියවර බිඳ වැටීම.

★ තාපසාරාමවල හැර යුරෝපය පුරා බුද්ධිමය පරිහානියක් හා ආත්මික පරිහානියක් ඇති වීම.

**නවවන සියවස තුළ කිතුනු සභාව**

**බටහිර අධිරාජ්‍යයේ කඩා වැටීම.**

★ අභ්‍යන්තර බලපෑම් හා නැගෙනහිරින් පැමිණි විකින්ග්ස් ගෝත්‍රිකයන්ගේ හංගේරියානු ආක්‍රමණය හා නැගෙනහිරෙන් මෙන් ම දකුණු දිශාවන්ගෙන් පැමිණි මුස්ලිම් ආක්‍රමණ නිසා අධිරාජ්‍යයේ බලය හීන වීම.

★ මේ නිසා මහා චාල්ස් රජතුමාගේ සමයේ අධිරාජ්‍යය තුළ පැවති සාමය හා එකමුතුකම බිඳ වැටීම.

★ බටහිර අධිරාජ්‍යයේ බිඳවැටීම බටහිර කතෝලික සභාවේ බිඳ වැටීමට ද හේතු වීම.

★ පළමු නිකලස් පාප්තුමාගෙන් පසු ව සභාව හොඳින් හා ප්‍රබල ව මෙහෙය විය හා ශුද්ධොත්තම පියතුමෙකු බිහි නොවීම.

★ ක්‍රි.ව. 858-879 කාලය තුළ රෝමයේ පාප්වරුන් හා කොන්ස්තන්තිනෝපලයේ ආදිපිතෘවරුන්අතර, භේද ඇති වීම.

★ පළමු නිකලස් පාප්තුමාගේ බල තණ්හාව ද මෙම බෙදීමට හේතු වීම.

★ පිලියෝක්වේ වගන්තිය නයිසීන විශ්වාස ප්‍රකාශනයට එකතු කිරීම, ශුද්ධිකස්ථානය පිළිබඳසභා ඉගැන්වීම හා තවත් කරුණු සම්බන්ධයෙන් කොන්ස්තන්තිනෝපලයේ ආදිපිතෘවරයා වූ ෆෝටියුස් විසින් කතෝලික සභාවට චෝදනා ඉදිරිපත් කරන ලදි.

★ නව වන සියවස අග භාගයේ දී පමණ ඉස්ලාම් ආගම නැගෙනහිර සභාව යටපත් කිරීම.

★ දේශපාලන අස්ථාවරකම් හා පාප්වරුන්ගේ දුර්වලකම් බටහිර සභාවේ බිඳවැටිමට මඟ පෑදී ම.

★ පූජකවරුන් හා පැවිදිවරුන් ව ලෞකික නායකයන් විසින් පාලනය කරන ලද අතර, ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් නූගත් වූ ද බඹසර ජිවිතයක් ගත නොකරන්නා වූ ද අය වූහ. ඔවුහු තාපසා ජිවන රටාවෙන් බැහැර වී ලෞකිකත්වයක් වෙත නැඹුරු වී පරිහානිය කරා යොමු වීම.

★ මෙම සියවසේ අගභාගයේ දී තාපසයන් දෙදෙනෙකු වූ මෙතෝඩියස් සහ සිරිල් නැගෙනහිර යුරෝපයේ කාෂාර්ස් හා ස්ලැවික් ගෝත්‍රික ජනතාව අතර, කිතු දහම පැතිරවීමේ දූත කාර්යයට දායක වීම.

★ ස්ලැවික් ගෝත්‍රික ජනතාවට සිරිල් තුමා නව අක්ෂර මාලාවක් හඳුන්වා දුන්නේ ය. එම අක්ෂරමාලාව හා භාෂාව තම සංස්කෘතිය ගොඩනැගීමට දායක විය

මධ්‍යතන යුගය (10 සිට 12 ශතවර්ෂ)

10 වන සියවසේ දී කිතුනු සභාව

පළමු වන ඔට්ටෝ රජතුමා

- ★ මෙය ශු. සභාවේ ආධ්‍යාත්මිකත්වය පිරිහෙමින් පැවති සමයකි. ශුද්ධෝත්තම පියතුමා සතු නිල බලය රෝම අධිරාජ්‍යයේ ප්‍රධාන නිලතලවලට පත් ව සිටි නුසුදුසු රෝම රදලවරයන් විසින් පාලනය කරනු ලැබී ම.
- ★ 12 වන ජෝන් ශුද්ධෝත්තම පියතුමා (ක්‍රි.ව. 955-964) බොහෝ සේ පිරිහුණු පාප්තුමෙක් වීම.
- ★ කතෝලික සභාවේ පාලනයට පළමු වන ඔට්ටෝ නමැති ජර්මානු ජාතික අධිරාජ්‍යයා පත්වීම.
- ★ ඔට්ටෝ ඇතුළු ඔහුගෙන් පසු ව පැමිණි අධිරාජ්‍යවරු කතෝලික සභාව තම අධිරාජ්‍ය පාලනයට අවියක් කොට ගැනීම.
- ★ අධිරාජ්‍යවරු තමන්ට කැමති ගිහි ජනතාව ශු. සභාවේ නිලතලවලට පත් කළ අතර, ශු. සභාවේ රදගුරුවරුන් හා පාප්වරුන් පත් කිරීම ද තමන්ට කැමති ආකාරයෙන් සිදු කිරීම.
- ★ ජර්මානු අධිරාජ්‍යවරුන් විසින් පත් කරන ලද ශුද්ධෝත්තම පියවරු ඉතා යහපත් හා චරිතවත් අය වූහ.

උදා : 2 වන සිල්වෙස්ටර් ශුද්ධෝත්තම පියතුමා (ක්‍රි.ව. 999 - 1003).

තාපස ජීවිතයේ ප්‍රතිසංස්කරණ

- ★ තාපස ජීවිත ක්‍රමයෙහි ඇතිවූ නව ප්‍රතිසංස්කරණ මෙකල ශු. සභාවේ ඇතිවූ පුනරුදයට ම හ ත් සේ දායක විය. ප්‍රංශයේ ක්ලුනි යන ස්ථානයේ ක්‍රි.ව. 910 දී ආරම්භ වූ තාපසාරාමය මෙහි දී සුවිශේෂ තැනක් ගත්තේ ය. ක්ලුනි තාපස නිකායය අනෙකුත් බෙනදිකාන නිකායන්ගෙන් වෙනස් විය. බෙනදිකාන තාපසාරාම ඉතා නිදහස් ලෙස කටයුතු කළ අතර, ක්ලුනි තාපසාරාමය ප්‍රධාන තාපසාරාමය හා ඉතා දැඩි ව බැඳී පැවතිණි. එක් එක් තාපාසාරාම හෝ බාර ව සිටි ප්‍රධාන නායකතුමා ක්ලුනිහි තාපසාරාමාධිපතිට යටහත් පහත් ව සේවය කළෝ ය. මෙම කුඩා තාපසාරාමවල නායක තපස්වරු වසරක් පාසා ක්ලුනිහි තාපාසාරාධිපතිතුමා හා එක් ව සාකච්ඡා පැවැත්වූහ. ක්‍රි.ව. 1016 දී එවකට සිටි ශුද්ධෝත්තම පියතුමා වූ අට වන බෙනඩික්ට් හිමිපාණන් සින් ක්ලුනි තාපස නිකාය තව දුරටත් ව්‍යාප්ත වන්නට ඉඩකඩ සලසා දෙන ලදි. පසු කලක දී මොවුහු ද යාච්ඤාවට මෙන් ම කය වෙහෙසා වැඩ කිරීමට ද වැඩි තැනක් දුන්හ. ක්ලූනි තාපසාරාමය පසු ව යුරෝපයේ ධනවත් ම තාපසාරාමය බවට පත් විය. තාපසවරුන් පත් කර ගත් තම ඇබට්වරයා හෙවත් නිකායේ ප්‍රධාන නායකයා පාප්තුමාට පමණක් දෙවැනි විය. ගිහියන්ට එහි කිසි ම බලයක් නොවී ය. ක්ලූනි තාපසාරාමයේ යහපත් ක්‍රියාකාරිත්වය නිසා ම බොහෝ රදගුරුවරු සහ කාදිනල්වරු තම තමන්ගේ රදගුරු පදවිවල ඔවුන්ගේ තාපසාරාම පිහිටුවන ලෙස ඉල්ලා සිටියහ. නෙදර්ලන්තය, ඉතාලිය, ස්පාඤ්ඤය, එංගලන්තය හා ජර්මනිය යන රටවලින් ක්ලුනිවරුන්ට ආරාධනා ලැබිණි.
- ★ ක්ලුනිවරුන්ගේ ප්‍රතිසංස්කරණ අන් තාපසාරාමවල ද ප්‍රතිසංස්කරණ ඇති කිරීමට හේතු වූ අතර, නව තාපස ජීවිත ක්‍රම ඇති වීම කෙරෙහිද බලපෑවේ ය. එහි ප්‍රතිඵලයක් ලෙස ශුද්ධ වූ රොමෝල්ඩ් මුනිතුමන් විසින් ආරම්භ කරන ලද කැමල්ඩොලේස් තාපස ක්‍රමය හා ශුද්ධ වූ බ්‍රූ මුනිතුමන් විසින් ආරම්භ කරන ලද කාර්තුෂියන් තාපස ක්‍රමය විශේෂ තැනක් ගත්තේ ය.
- ★ සිස්ටර්සියන් තාපස නිකාය, මොලෙස්මාහි රොබට් තාපසතුමා විසින් ක්‍රි.ව. 1098 දී ආරම්භ කරන ලදි. මේ හේතුවෙන් ශු. සභාව තුළ ආත්මික නවෝදයක් ඇති විය.

★ වැල්දේසියන්වරු ශු. සභාවේ සුඛෝපභෝගී ජීවිතය විවේචනය කර ශු. සභාවට දිළිඳුකම හඳුන්වා දුන්හ.

## 11 වන සියවසේ දී කිතුනු සභාව

★ 11 වන සියවසේ දී ඔට්ටෝනියන් අධිරාජ්‍යයේ සිටි ජර්මන් අධිරාජ්‍යයවරු බොහෝ විට බටහිර ශු. සභාව පාලනය කළහ. සභාවේ ඉඩකඩම්වල අයිතිය ඔවුන් තමන් යටතේ පවත්වා ගෙන ගිය අතර ශුද්ධෝත්තම පියවරුන් හා රදගුරුවරුන් පත් කිරීම ද ඔවුන්ගේ සිතැඟි පරිදි මේ යුගයේ දී සිදු විය.

★ මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ලෞකික බලවේග නිසා ශු. සභාවට නිදහස අහිමි වන බව එවකට සිටි පාප්වරු හා රදගුරුවරු තේරුම් ගත්හ.

## අති උතුම් හත් වන ග්‍රෙගරි පාප්තුමාගේ ප්‍රතිසංස්කරණ

★ ක්‍රි.ව. 1073 දී කාදිනල් හිල්ඩේබ්රුන්ඩ්, හත් වන ග්‍රෙගරි නමින් පාප්තුමා ලෙස පත් වීම ලැබීමත් සමඟ ම මේ තත්ත්වය මදකට වෙනස් විය. ක්‍රි.ව. 1075 දී එතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලද "Dictus Papae" යන ලේඛනයෙන් පාප්වරුන් තම අධිකාරී බලය අපෝස්තුලුවරුන් මාර්ගයෙන් ක්‍රිස්තුන් වහන්සේගෙන් ලබා ඇති බවත්, එම නිසා ඔවුන් සතු බලය ඉතා උසස් බවත් ප්‍රකාශ කළේ ය.

★ අති උතුම් හත් වන ග්‍රෙගරි පාප්තුමා සතු මෙම බලය උපයෝගී කරගෙන එතුමා පාප්වරුන්ට ශු.සභාව තුළ විශාල බලයක් ඇති බවත්, ඒ අනුව අධිරාජවරුන් පවා බලයෙන් පහකිරීමට හා දෙවියන් වහන්සේගේ නීතියට හා සභා නීතියට අනුකූල නොවන නීති වෙනස් කිරීමට හැකියාවත් ඇති බවත් ඔවුනට ප්‍රකාශ කළේ ය.

★ පාප්තුමා සතු මෙම බලය උපයෝගී කරගෙන අති උතුම් ග්‍රෙගරි පාප්තුමා ශු. සභාවේ සියලු ම අංශවල නව ප්‍රතිසංස්කරණ ඇති කිරීමට උත්සාහ ගත්තේ ය.

★ එතුමා බඹසර රැකීමේ පොරොන්දුවට විශ්වාසවන්ත ව සිටින ලෙසත් හා කිසි ම ලෙසකින් සක්‍රමේන්තු දානය කිරීමේ දී මුදල් අය නොකරන ලෙසත් පූජකවරුන්ගෙන් ඉල්ලා සිටියේ ය.

## පෙරදිග හා අපරදිග සභා අතර ඇති වූ සභා භේදය

★ එකොළොස්වන සියවස තුළ සභා ඉතිහාසය තුළ සිදු වූ අවසානාවන්ත සිදුවීම වන්නේ ක්‍රි.ව. 1054 දී පෙරදිගි හා අපරදිග සභා අතර ඇති වූ සභා භේදයයි. *(The schism between the Eastern Church and the Western Church)* මෙම සභා භේදය ජේසු සමිඳුන් මගින් එකම ජනතාවක් හා එකම සභාවක් ඇති කිරීමේ දේව අභිමතයට පිටුපෑමක් විය.

★ කිතුනු සභාව, කතෝලික සභාව හා ඕර්තඩොක්ස් සභාව වශයෙන් දෙකඩ වූ අතර කතෝලික සභාවේ මෙලොව නායකයා රෝමයේ පාප්තුමාවූ අතර ඕර්තඩොක්ස් සභාවේ මෙලොව නායකයා කොන්ස්තන්තිනෝපලයේ ආදිපිතෘ තුමා *(Patriarch)* විය. මෙම සභා භේදයට ප්‍රධාන හේතු දෙකකි. ඒක හේතුවක් නම් සභා නායකත්වය *(dealing with the primacy of the Pope)* වන අතර අනෙක් හේතුව දේව වේදයයි. *(dealing with the filioque).*

★ රෝමයේ පාප්තුමාගේ නායකත්වය මුළු ශුද්ධ වූ සභාවට ම පොදු බව අපරදිග සභාව පිළිගත් අතර රෝමයේ රදගුරුවරයා හා කොන්ස්තන්තිනෝපලයේ ආදීපිතෘ තුමා යන දෙදෙනා ම ශුද්ධ වූ සභාව තුළ සම නායකත්වයට දරණ බව පෙරදිග සභාවේ මතය වීම මෙම සභා භේදයට එක හේතුවක් විය. නයිසීන විශ්වාස ප්‍රකාශනයට කොන්ස්තන්තිනෝපලයේ ආදිපිතෘ තුමා විසින් "පිලියෝක්වේ" *(filioque)* යන වගන්තිය එක් කිරීම අනෙක් හේතුව විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස මෙම සභා දෙක අතර අන්‍යොන්‍යය ලෙස යම් යම් පුද්ගලයන්ව සභාවෙන් නෙරපා දැමීම සිදුවිය.

★ මෙම ගැටුම ක්‍රි.ව. 1965 දී හයවන පාවුලු පාප්තුමා එවකට සිටි ඇතනගොරස් ආදිපිතෘ තුමා හමු වී සුහද ලෙස සාකච්ඡා පැවැත්වීම දක්වා පැවතුණි. එහි ප්‍රතිඵලයක් ලෙස වත්මනේ මෙම සභා දෙක අතර එකඟතාවක් පවතියි.

## 12 වන සියවසේ දී කිතුනු සභාව

### කුරුස යුද්ධ

★ ශු. සභාවේ ආධ්‍යාත්මික නිදහස බාහිර බලවේගවලින් රැකගැනීම සඳහා පාප්වරුන්ට යුද වැදීමට සිදුවීම මෙම සියවසේ සිදුවූ අවාසනාවන්ත සිදුවීමකි. කෙසේ හෝ ශු. සභාව රැක ගැනීමේ පරමාර්ථයෙන් පාප්වරු අවිආයුධ අතට ගනිමින් මුස්ලිම්වරුන්ට එරෙහිව සටන් කළහ.

★ ශුද්ධ වු දේශය මුස්ලිම්වරුන්ගෙන් නැවත අත්පත් කරගැනීම සඳහා ඔවුන් සමග විශාල යුද්ධවලට මුහුණ දීමට පාප්වරු ඉදිරිපත් වූහ. කිතුනුවන්ගේ ඇදහිල්ල හා කිතුනු අනන්‍යතාවය රැකගැනීම සඳහා මෙම යුද්ධ ආරම්භ විය. මෙහි දී සියලු හේවායින්ගේ උරහිසේ කුරුසයේ සංකේතය සලකුණු කර යුද වැදුණු හෙයින්, මේවා කුරුස යුද්ධ ලෙස හැඳින්වේ. යුද්ධ කිරීමෙන් හෝ ශු.සභාව රැකගැනීම කළ යුතු ම කාර්යයක් බව පිළිගත් හෙයින්, දීර්ඝ කාලයක් මුළුල්ලේ මෙම යුද්ධ ක්‍රියාත්මක විය.

★ අති උතුම් දෙවන උර්බාන් පාප්තුමා විසින් පළමු කුරුස යුද්ධයට නායකත්වය ලබා දෙන ලදී. ආධ්‍යාත්මික අරමුණක් පෙරදැරි කරගෙන යුද වැදුණ ද ලෞකික සැපසම්පත් රැස් කළ බවට චෝදනා ඉදිරිපත් වේ.

★ පළමු කුරුස යුද්ධයේ දී ජෙරුසලම අත්පත් කරගැනීමට ශු. සභාවට හැකි විය.විශාල ජීවිත ගණනක් අහිමි විය. ග්‍රීක් ආදීපිතෘවරයා සිටි ස්ථානයෙන් ඉවත් කිරීම නිසා සභා භේදය වර්ධනය විය.

★ දෙවන කුරුස යුද්ධය ක්‍රි.ව. 1146 දී ආරම්භ විය. එහි දී ද විශාල ජීවිත ගණනක් සභාවට අහිමි විය. යුද්ධය ද අසාර්ථක විය.

★ තුන් වන කුරුස යුද්ධය ක්‍රි.ව. 1189 ඇරඹුණු වූ අතර ජෙරුසලම අත්පත් කර ගැනීමටත් ශුද්ධ දේශය බලා යන සැම දෙනාගේ ආරක්ෂාව තහවුරු කිරීමටත් එමඟින් හැකි විය. එහෙත් සභා භේදය වඩ වඩා උත්සන්න විය.

## කිතුනු දේව වේදයේ වර්ධනය

★ මෙම සියවසේ දී තාපසාරාම තුළ ඇතිවූ උන්නතිය ඉමහත් ය. තාපාසාරාමවලින් ආලෝකය ලබමින් ආසන දෙව්මැඳුරු ආශ්‍රිත ව ගොඩනැගුණු පාසල් ශු.සභාවට විශාල සේවාවක් ඉටුකළේ ය. ශාස්ත්‍රීයවාදී දේවවේදය පණ ගැන්වුණේ මෙම සියවසේ දී ය. එය උගන්වන පාසල් මෙම සියවසේ දී ආරම්භ විය. ශුද්ධ බයිබලය සහා පිය ඉගැන්වීම් දර්ශනවාදය, පිළිබඳ මිශ්‍ර දැනුමක් ලබා දීම සඳහා ශාස්ත්‍රීයවාදී දේවවේදීහු මහත් පරිශ්‍රමයක් දැරූ හ. ඇදහිල්ල හා විචාර බුද්ධිය අතර පවතින සම්බන්ධතාව ගෙනහැර දැක්වීමට ඔවුහු ක්‍රියා කළහ. දේව ධර්මය හා දර්ශනවාදය අතර සමීප සබඳතාවක් ඇති විය. ශාස්ත්‍රීයවාදී දේවවේදයේ පියා ලෙස හඳුන්වනු ලබන්නේ කැන්ටබරියෙහි ශුද්ධ වූ ඇන්ස්ලම් තුමා ය. එතුමාට අනුව දේව ධර්මය යනු අවබෝධය සොයා යන ඇදහිල්ලකි. එතුමාට පසු පීටර් අබෙලාර්ඩ් හා පීටර් ලොම්බාර්ඩ් ශාස්ත්‍රීයවාදී දේවධර්මය වර්ධනය සඳහා දායකත්වයක් දැක්වූහ. විවිධ පොත්පත් රචනා කරමින් ඔවුහු මේ සඳහා දිරි දැරූහ. මේ මඟින් ශු. සභාව පණ ගැන්වුණ අතර, කුරුස යුද්ධ මඟින් ඇති වූ අහිතකර ප්‍රතිඵල මදකට අමතක කර ආධ්‍යාත්මික වර්ධනයේ සිදුවූ ප්‍රගතිය පිළිබඳ ව සතුටු වීමට ශු. සභා මාතාවට හැකි විය.

## 13 වන සියවසේ දී කිතුනු සභාව

★ 13 වන සියවසේ දි ශාන්ත ෆ්රැන්සිස්ගේ අනුගාමිකයන්ට අමතර ව තවත් පැවිදි කණ්ඩායම් කිහිපයක් 13 වන සියවසේ දී බිහි වන්නට වූහ.

★ දේව ධර්ම ශාස්ත්‍රය හා කලා ශිල්ප සම්බන්ධයෙන් සේම ආධ්‍යාත්මික ජීවන රටාව සම්බන්ධයෙන් ද මෙම යුගයේ දී විශාල ප්‍රගතියක් දක්නට ලැබුණි. ඊට මුල් වූයේ අසීසයේ ෆ්රැන්සිස්තුමාගේ (ක්‍රි.ව. 1182-1226) මිහි මත මෙහෙය යි.

★ ෆ්රැන්සිස් තුමාට කිසි දු සංවිධානයක් බිහි කිරීමේ අදහසක් නොතිබුණත් ඔහු හා එක් වීමට අවසර ඉල්ලූ අය ප්‍රතික්ෂේප කර ඔහුට නොහැකි විය. ක්‍රි.ව. 1226 දී ඔහු ස්වර්ගස්ථ වන වන විට දිළිඳු ජීවිතයක් මඟින් ධර්මය දේශනා කිරීමට ඇපකැප වූ අනුගාමිකයෝ දහදහස් සංඛ්‍යාවක් විවිධ රටවල වූහ. ෆ්රැන්සිස්කාන පැවිදි ක්‍රමය බිහි විය.

★ ෆ්රැන්සිකාන නිකායයට අමතර ව අගෝස්තීනු, කර්මෙල් හා ඩොමිනිකාන පැවිදි නිකාය සංවිධාන විය. ඩොමිනිකාන සංවිධානය පිහිටවනු ලැබුවේ ශාන්ත ඩොමිනික් ගුස්මාන් තුමා ය. ධර්ම දේශක පැවිදි නිකාය යනුවෙන් හැඳින්වුණු මෙහි සාමාජිකයෝ ක්‍රිස්තු ධර්මය දේශනා කිරීමට සේ ම ඒ පිළිබඳ ව පොත්පත් ලිවීමට ද උද්යෝගය දක්වූ පිරිසක් වූහ. ශාන්ත තෝමස් ඇක්වයිනාස් නැමැති දේව ධර්මාචාරවරයා බිහි වූයේ ද මෙම නිකායයෙනි.

★ විශ්වවිද්‍යාල ලෙස පසු ව හැඳින්වෙන්නට වූ අධ්‍යාපන ආයතන යුරෝපයේ බිහි වන්නට පටන් ගැනුණේ ද මෙම යුගයේ ය. ඒවා ද බිහි වූයේ ආසන දෙව්මැඳුරු ආශ්‍රිතව ය.

★ ශාන්ත තෝමස් ඇක්වයිනාස් තුමා උපත ලැබුවේ 1225 ඉතාලියේ දී ය. ඔහු දර්ශනය, දේව ධර්මය, වාග් විද්‍යාව, නීතිය වැනි හැම අංශයක් ගැන ම උද්යෝගයක් දක්වූයේ ය. ක්‍රි.ව. 1274 දී ඔහු ස්වර්ගස්ථ විය. ඔහුගේ විශිෂ්ටතම කෘතිය වන්නේ, "සුම්මා තියොලෝජිකා" වේ.

## ශු. සභාව බෙදීයාමේ පසුබිම

### මාටින් ලූතර් තුමා (1483 - 1546)

★ අගෝස්තිනු නිකායයේ පූජකවරයෙක්.

★ විටෙන්බරග් විශ්වවිද්‍යාලයයේ මහාචාර්යවරයෙක්.

★ ශු. සභාවේ සිදු වෙමින් තිබූ විවිධ ක්‍රියාකාරකම් පිළිබඳ ව කලකිරීමට පත් වීම.

★ ශු. පේදුරු තුමාගේ බැසිලිකාව ගොඩනැංවීමට අවශ්‍ය මුදල් සපයා ගැනීමට පාප් තුමා කළ පූර්ණඵල වෙළෙඳාමට විරුද්ධ වීම.

★ පූර්ණඵල වෙළෙඳාම ඇතුළු කරුණු 95 කට විරෝධය දක්වා 1517.10.31 විටන්බර්ග් දෙව්මැඳුරේ චෝදනා පත්‍රයක් ප්‍රදර්ශනය කිරීම.

★ ලූතර් තුමාට තම චෝදනා ඉල්ලා අස් කර ගැනීමට 1520 දින 60ක කාලයක් ලබා දීම.

★ එම චෝදනා ඉල්ලා අස් කර නොගත් නිසා 1521 දී ඔහු ශු. සභාවෙන් නෙරපා දැමීම.

★ ඔහු ලුතරානු සභාව පිහිටුවීම.

### ලූතර් තුමාගේ ප්‍රධාන ඉගැන්වීම්

- ★ කිතුනුවන්ට විමුක්තිය අත් වන්නේ ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි දක්වන ඇදහිල්ලෙන් පමණි.
- ★ ක්‍රිස්තුන් වහන්සේ විසින් ම ස්ථාපිත කරන ලද ප්‍රසාද නිධාන දෙකකි. (ප්‍රසාද ස්නාපනය හා දිව්‍ය සත්ප්‍රසාදය)
- ★ කිතු සසුන සියලු ඇදහිලිවතුන්ගේ සහභාගිත්වයෙන්.
- ★ ක්‍රිස්තුන් වහන්සේට හැර කිසිවකුට වහල් නොවිය යුතු ය.
- ★ කිතුනු ජීවිතයේ කේන්ද්‍රස්ථානය දිව්‍යමය ඉගැන්වීම් සහිත ශුද්ධ බයිබලය යි.
- ★ ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයකට ම පූජකවරය සඳහා කැඳවීම ලැබිය හැකි අතර දේවගැතිවරුනට විවාහවීමේ අයිතිය ඇත.

### ජෝන් කැල්වින් තුමා (1509 - 1564)

- ★ ප්‍රංශයේ උපත ලද කැල්වින් තුමා පැරිස් විශ්වවිද්‍යාල යේ දේව ධර්මය හා නීතිය හැදෑරී ය.
- ★ පූජකත්වයේ වගකීම් හා ගැඹුරු ඇදහිල්ල පිළිබඳ ව හැදෑරූ ඔහු 1533 දී රෝම සභාවෙන් ඉවත් විය.
- ★ ශු. සභාව තුළ නිර්මල භාවය ඇති කිරීම තම ප්‍රධාන කාර්ය වශයෙන් ඔහු විසින් අවබෝධ කරගන්නා ලදි.
- ★ 1536 දී ස්විස්ටර්ලන්තයට ගිය කැල්වින් තුමා "ක්‍රිස්තියානි ධර්මායතනය" නමැති ග්‍රන්ථය ප්‍රකාශයට පත් කළේ ය.
- ★ එම ග්‍රන්ථය මඟින් ජිනීවා වැසියන්ට පිළිගැන්වීමට ඔහු උත්සාහ දැරුවේ ප්‍රජාතන්ත්‍රවාදය මත පදනම් වූ නව ආගමික සමාජයක සැලැස්මකි.
- ★ එම සභාවේ ප්‍රධාන කාර්යය වූයේ ජනතා විනය සුරැකීම යි. කැල්වින් ශුද්ධ බයිබලයේ නොඑන සැම ඇදහිල්ලක් ම ප්‍රතික්ෂේප කළේ ය. සියල්ල ශුද්ධ ලියවිල්ල මත පදනම් වියයුතු බව ඔහු පැවසී ය.
- ★ ලෝකාරම්භයේ පටන් ගැලවීම ලබන අය හා නොලබන අය දෙවියන් වහන්සේ තීරණය කර ඇති බව ඔහු විසින් ඉදිරිපත් කරන ලදි. සියලු ඉගැන්වීම් ශුද්ධ බයිබලය මත පදනම් කරගත් කැල්වින් ශුද්ධ ලියවිල්ල දේවානුභාවයෙන් ලියැවුණු විශිෂ්ට දායාදයක් බව ප්‍රකාශ කළේ ය.
- ★ ජන්ම පාපය හේතුවෙන් දේව අනාවරණ නිසි ලෙස අවබෝධ කරගැනීමට මිනිසාට නොහැකි වී ඇති බවත් , ඒ සඳහා ක්‍රිස්තුන් වහන්සේගේ හා අපෝස්තුලුවරුන්ගේ දේශනා ඉවහල් වන බවත් ඔහු පැවසී ය.
- ★ සාම්ප්‍රදායික ත්‍රිත්වය පිළිබඳ සංකල්පය පිළිගත් කැල්වින් දෙවියන් වහන්සේ ශුද්ධත්වයේ හා ධර්මිෂ්ඨ කමේ දෙවිඳුන් වශයෙන් මූලාරම්භයේ පටන් වැඩසිටින බව ප්‍රකාශ කළෝ ය.
- ★ සිය අකීකරුකම නිසා පාපයට වැටුණු මිනිසාට නැවත දෙවියන් වහන්සේ සමග සම්බන්ධතාව මඟින් ගැලවීම ලබා ගැනීමේ එක ම මඟ ඇදහිල්ල බව ඉදිරිපත් කළේ ය. ශුද්ධ වූ සහභාගිකම ක්‍රිස්තුන් වහන්සේගේ කුරුසි පූජාව සිහි කිරීමක් වන බවත් රොටි හා මිදි යුෂ ඇදහිල්ලෙන් පිළිගන්නා සැමට දේව ආශීර්වාදය ලැබෙන බවත් ඉගැන්නුවේ ය.
- ★ සභා පාලනයට වඩාත් සුදුස්සන් වනුයේ වැඩිහිටියන් (ධර්මෝපදේශයෙන්) පමණක් බව ඔහු සිය ප්‍රතිසංස්කරණවලින් කියා සිටියේ ය.

### උල්රිච් ස්වින්ග්ලි තුමා (ක්‍රි.ව. 1484 - 1531)

- ★ ස්විට්සර්ලන්තයට රෙපරමාදු ප්‍රගමනය හඳුන්වා දුන්නේ ය.
- ★ ක්‍රි.ව. 1519 දී ඔහු ස්විට්සර්ලන්තයේ පූජකවරයෙකු ලෙස කටයුතු කරන සමයේ කතෝලික සභාව තුළ ප්‍රතිසංස්කරණයක් ඇති විය යුතු බව විශ්වාස කළේ ය. ඒ පිළිබඳ ව දේශනා කළේ ය.
- ★ එවකට කතෝලික සභාවේ බොහෝ වත්පිළිවෙත්වල පැවති අක්‍රමිකතා හා ශු. සභාව තුළ පැවති මූල්‍යමය දූෂණ ඔහු හෙළා දැක ඒ පිළිබඳ ව සිය ග්‍රන්ථ මඟින් ද විවේචනය කළේ ය.
- ★ කතෝලික සභාව තුළ සිටිමින් ප්‍රතිසංස්කරණවාදී සන්ධානයක් බිහි කළ ඔහු එමඟින් සභාවට බලපෑමක් එල්ල කිරීමට උත්සාහ දැරුවේය.
- ★ ක්‍රි.ව. 1529 දී මාටින් ලූතර් තුමා මුණගැසී සිය ධර්මතා හා මත පිළිබඳ ව දීර්ඝ ලෙස සාකච්ඡා කිරීමට ස්වින්ග්ලිට අවස්ථාව උදා විය. එහි දී ස්වින්ග්ලි ඉදිරිපත් කළ දිව්‍ය සත්ප්‍රසාදයෙහි දී සැබැවින්ම ස්වාමින් වහන්සේගේ වැඩසිටීම පිළිබඳ මතය දීර්ඝ සාකච්ඡාවට බඳුන් වූ අතර, මාටින් ලූතර් තුමා ඒ පිළිබඳ එකඟ නොවී ය.
- ★ උල්රිච් ස්වින්ග්ලි තුමා සිය ප්‍රතිසංස්කරණ ඉදිරියට ගෙනයමින් ස්විට්සර්ලන්තයේ රෙපරමාදු ප්‍රගමනයේ පුරෝගාමියා ලෙස කටයුතු කිරීමට මහත් පරිශ්‍රමයකින් ක්‍රියා කළේ ය.

### එංගලන්ත සභාව නැතහොත් ඇන්ග්ලිකන් සභාව

- ★ රෙපරමාදු සභා අතර බොහෝ සෙයින් කතෝලික සභාවේ බාහිර ලක්ෂණ උසුලන සභාව එංගලන්ත සභාව නැතහොත් ඇන්ග්ලිකන් සභාව බව සඳහන් වේ. එංගලන්ත සභාව යනු එංගලන්තයේ අටවන හෙන්රි රජතුමා (ක්‍රි. ව. 1507 - 1547) සදාචාරාත්මක හා දේශපාලනමය හේතුවක් මත පිහිට වූ සභාවක් ලෙස සැළකේ.
- ★ අටවන හෙන්රි රජතුමා යනු පෙර සිටි පාප්තුමකු විසින් විශ්වාසයේ ආරක්ෂකයා *(Defender of Faith)* යන විරුදාවලිය ලත් රජ කෙනෙකි. තම රජකමට උරුමක්කාරයෙක් මෙලොවට බිහි කිරීමට නොහැකි වූ වරදට තම බිරිඳ වූ ඇරගොන්හී කැතරින්ව *(Catherine of Aragon)* දික්කසාද කිරීමට ගත් තීරණය ඔහුට කතෝලික සභාවෙන් ඉවත් ව යෑමට හේතුවක් විය.
- ★ එවකට සිටි හත්වන ක්ලෙමන්ට් නමැති පාප්තුමා රජු දික්කසාදය සඳහා අවසර ඉල්ලා කළ ඉල්ලීම ප්‍රතික්ෂේප කළේය. එවකට කැන්ටබරියේ අගරදගුරුතුමාව සිටි කාර්දිනල් වොල්සේ *(Cardinal Wolsey)* මාර්ගයෙන් කළ ඉල්ලීමෙන් ද ප්‍රතිඵලයක් නොවූ නිසා හෙන්රි රජු ක්‍රි.ව. 1529 දී කාර්දිනල් වොල්සේ ව තනතුරින් පහකර දමා තමාගේ හිතවතකු ව සර් තෝමස් මුවර් *(Sir Thomas More)* යන කතෝලික නීතිඥයා එංගලන්තයේ කුලපති ලෙස *(Chancellor of England)* පත් කර ගන්නා ලදී.
- ★ නමුත් සර් තෝමස් මුවර් පාප්තුමාට යටහත් පහත් කතෝලිකයකු වශයෙන් තම මිතුරු හෙන්රි රජතුමා තමන්ට දුන් තනතුර බාරගැනීමට පෙර තමාට රජුගේ දික්කසාදය පිළිබඳ ප්‍රශ්නයට මැදිහත්වන්නට නොහැකි බව රජුට ප්‍රකාශ කර සිටියේ ය.
- ★ අවසානයේදී ක්‍රි.ව. 1534 දී අටවන හෙන්රි රජතුමා එංගලන්ත සභාව පිහිටුවා එහි නායකත්වය ඔහුට ම පවරා ගත්තේ ය. ඔහු කතෝලික සභාව හා විශේෂයෙන් රෝමය සමඟ ඉතා අමනාපයෙන් කටයුතු කළේ ය. සර් තෝමස් මූවර් ද තම තනතුර පිළිගැනීමේ දී එංගලන්තයේ රජු ඉදිරිපිට කළ යුතු ව තිබූ පොරොන්දු ගැනීම පවා ප්‍රතික්ෂේප කළේය. ඔහු කළ දේ නීතයානුකූල නොවුණ ද එංගලන්ත නීති ක්‍රමයේ පැවැති නිශ්ශබ්දභාවය නිසා සර් තෝමස් මූවර් එරෙහිව කිසිදු නීතිමය පියවරයක් නොගත්තේය.

එහෙත් හෙන්රි රජතුමා ඔහුට සමාව නොදුන් අතර පසුව ක්‍රි.ව. 1535 දී තෝමස් මූවර්ගේ හිසගසා දැම්මේ ය. මෙලෙස සර් තෝමස් මූවර් කතෝලික විශ්වාසය ආරක්ෂා කිරීමෙහි ලා දිවිපිදූ ප්‍රාණපරිත්‍යාගිවරයකු බවට පත්විය. පසු කලෙක රොචෙස්ටර්හි රදගුරුවරයාව *(Bishop of Rochester)* සිටි ජෝන් ෆිෂර්ව *(John Fisher)* ද හිසගසා මැරුවේ ය. සර් තෝමස් මූවර් තුමා හා ජෝන් ෆිෂර් තුමා පසු කලෙක කතෝලික සභාව විසින් තම සාන්තුවර භාවයට ඔසවන ලදී.

- ★ එංගලන්ත සභාව මුල් කාලයේ දී පාප්තුමාගේ අධිකාරී බලය ප්‍රතික්ෂේප කරමින් කතෝලික සභාවෙන් ඉවත් ව ගිය ද පසුව කැල්වින්වාදයට හසු වී බොහෝ ලෙස ප්‍රොතෙස්තන්ත්‍ර ස්වභාවයක් ගත්තේ ය. ක්‍රි.ව. දහසය හා දහහත්වන සියවස්වලදී එංගලන්තය තුළ කතෝලිකයෝ ඉතා දැඩි ලෙස පීඩාවට පත් කරනු ලැබූ හ. පාප්තුමාට යටහත් පහත් අය දේශපාලන වශයෙන් රජයට විරුද්ධ පිරිසක් ලෙස ඔවුහු හංවඩු ගැසූ හ. නමුත් පසුව කාලයාගේ ඇවෑමෙන් එංගලන්ත සභාවෙන් වැඩි කොටසක් නැවතත් කතෝලික ස්වරූපයක් ගත්තේ ය. මේ අතර විශේෂයෙන් ම එංගලන්ත සභාවේ උසස් සභාවට අයත් ඇන්ග්ලිකන්වරු *(High Church Anglicans)* ප්‍රොතෙස්තන්ත්‍ර ලක්ෂණ වලට වඩා කතෝලික ලක්ෂණ උසුලන ඇදහිලිවන්තයන් පිරිසක් ලෙස පෙනේ.

**ජෝන් වෙස්ලි තුමා සහ චාල්ස් වෙස්ලි තුමා**

- ★ 18වන සියවසේදී මෙතෝදිස්ත සභාව අරඹන ලද්දේ මෙම සොහොයුරන් දෙදෙනා විසිනි.
- ★ ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ ඉගෙනුම ලබන කාලයේ දී මෙතෝදිස්ත නමින් හඳුන්වනු ලැබූ සුළු ශිෂ්‍ය පිරිසක් එක් කර ගනිමින් ශුද්ධ බයිබලය පදනම් කරගනිමින් ක්‍රියාකාරී වීමට විය.
- ★ 1728 දී ජෝන් වෙස්ලි තුමා පූජකවරයෙකු ලෙස පත් විය. පත්වූ අතර මාටින් ලූතර් තුමාගේ ලිපියක් ඔහුගේ ජීවිතය වෙනස් කළේ ය. එය හදවත උණුසුම් වීමේ සිද්ධියයි.
- ★ සංචාරක දේශකයකු වශයෙන් එංගලන්තයේ නගරබද මෙන් ම ගම්බද පළාත්වල ද සේවය කළ අතර ඔවුන්ගේ විශේෂත්වය වූයේ එළිමහන් දේශන පැවැත්වීම යි. එහිදී ගැලවීම ඇදහිල්ලෙන් ලැබෙන බවත්, එය කිතුනු ජීවිතයේ මූලික ධර්මතාවයක් බවත් පෙන්වා දුනි.
- ★ විශාල ජනතාවක් ඔවුන් වටා එක්වූ අතර ගීත ප්‍රබන්ධ කරමින් එමගින් ජනතාවගේ ආත්මික වර්ධනය උදෙසා ක්‍රියා කිරීමට ඔවුහු උත්සුක වූහ.
- ★ 18 වන සියවසේ එංගලන්තයේ ඇති වූ ආර්ථික අවපාතයට ගොදුරු වූ පතල් කම්කරුවන් හා ගැමි ජනතාව ආධ්‍යාත්මික ව පෝෂණය කිරීමට ජෝන් වෙස්ලි හා චාල්ස් වෙස්ලි මහත් වෙහෙසක් දැරූහ. සිය ප්‍රශ්න ගැටලු හේතුවෙන් මත්පැන්වලට ඇබ්බැහි වූ මෙම පතල් කම්කරුවන් හා ජනතාව වෙත සුබාරංචිය ගෙන යමින් ඔවුන් එම තත්ත්වයෙන් මුදාගෙන ඔවුන්ට ආධ්‍යාත්මික සුවයක් ගෙන දීමට මෙම සොහොයුරෝ දෙදෙනා ක්‍රියා කළ හ.
- ★ ධර්මදූත සේවා සඳහා ගිහි නායකයන් පුහුණු කරමින් 1744 දී පළමු වතාවට සමුළුවක් පැවැත්වීමට ඔවුනට හැකි විය. පූජකවරුන් කිහිප දෙනෙකු ද ඇතුළු ව සාමාජිකයන් සිය දෙනෙකුගෙන් පමණ සමන්විත වූ සමුළුව මඟින් මෙතෝදිස්ත සභාව නීත්‍යානුකූල ස්ථාපනය කිරීමට ඔවුන් විසින් ක්‍රියාකරන ලදි.

**විලියම් බූත් තුමා**

- ★ 1865 දී ගැලවීමේ හමුදාව අරඹන ලද්දේ විලියම් බූත් තුමා විසිනි. ගැලවීමේ හමුදාව ධර්ම දූත හා සමාජ සේවාවන් පිළිබඳ ව විශේෂ උනන්දුවකින් කටයුතු කළේ ය. ධර්ම දූත ප්‍රතිපත්ති මත ගොඩනගන ලද සභාවක් වූ මෙය ශුද්ධ බයිබලයෙන් ප්‍රකාශයට පත් වන දේව ධර්මය ඇදහිලිවතුන්ට ලබා දීම සඳහා මහත් පරිශ්‍රමයක් දරයි.

★ එංගලන්ත සමාජයේ ජීවත් වූ දිළිඳු ජනකොටස් වෙත සුබාරංචිය ගෙන ගිය විලියම් බූත්ම ජනතාවගේ කුසගින්න නිවීමටත් පිරිසිදුකම ඇති කිරීමටත් ගැලවීමේ පණිවිඩය ලබා දීමටත් මහත් උනන්දුවකින් කටයුතු කළ හෙයින්, මෙම සභාව 3S (Soup , soap , salvation) මත ගොඩනැගි ඇති බව විචාරකයෝ පවසති.

★ විලියම් බූත් තුමා විසින් ගැලවීමේ හමුදාව ආරම්භ කරන ලද්දේ යුද හමුදාවකට සමාන සංවිධාන සැලැස්මකට ය.

★ සාමාජිකයන් සියලු දෙනා ම සභාව තුළ නිලතල දරන අයට සම්පූර්ණයෙන් කීකරු විය යුතු බව ඔහුගේ අවවාදය විය.

★ ගැලවීමේ හමුදාව තුළ නිලතල සඳහා ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයට ම සහභාගි වීමට අවකාශ සැලසූ අතර නිලධාරියකුට විවාහ විය හැක්කේ නිලධාරිනියක සමඟ පමණි.

★ කිසිම දේව ප්‍රසාද නිධානයක් නැත.

★ ගැලවීමේ හමුදාවට බඳවා ගැනීමේ දී කොඩියට ආචාර කිරීම හා දිවුරුමක් ලබා දීම සිදුකළ යුතුය.

★ තූර්ය භාණ්ඩ යොදා ගනිමින් බොහෝ විට එළිමහන් මෙහෙයන් පැවැත්වීමට විලියම් බූත් උත්සුක වූයේ සැමට මේ සඳහා සහභාගි වීමට ඉඩකඩ ලබා දෙමිනි.

★ ගැලවීමේ හමුදාවට අයත් සැම දෙනාගෙන් විලියම් බූත් තුමා අයැද සිටියේ කිතු බැතියන් ලෙස ධර්මදූත හා සමාජ සේවාවල යෙදෙමින් සමාජයේ ඉතා පහත් තත්ත්වයකට වැටී සිටි අසරණ දනට පිහිට වීමට ඉදිරිපත් වන ලෙස යි.

★ චාම් ජීවන ශෛලියක් අනුගමනය කිරීමට බූත් තුමා විසින් ගැලවීමේ හමුදාවේ කිතු බැතිමතුන් යොමු කරවන ලදහ.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :**

1. ක්‍රි.ව. 4 - 16 වන සියවස දක්වා වූ කාලයේ ශු. සභා ඉතිහාසය පිළිබඳ කරුණු 5ක් ලියන්න.

2. 10 වන සියවසේදී ඇති වූ තාපස ජීවිතයේ ප්‍රතිසංස්කරණ 5ක් ලියන්න.

3. ජාතික සමඟිය හා ආගමික සහජීවනය ගොඩ නැඟීමට ඔබ දායකවන ආකාරය කරුණු 10 කින් පෙන්වන්න.

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. මහාචාර්ය සෝමරත්න, ජී.පී.වී., **ක්‍රිස්තු ශාසනයේ ඉතිහාසය** - 2011

2. මහාචාර්ය සෝමරත්න, ජී.පී.වී., **ක්‍රිස්තු සසුනේ සංශෝධනය**

3. HUBERT. JEDIN., History of the Chrisitian Church - 1989

4. Dannel, Kevino., A Pocket Guide to Christian History

**නිපුණතාවය 8.0** : **ශුද්ධ වූ සභා ගමන් මඟ නිවැරදි කර ගැනීම සඳහා ශුද්ධාත්ම මඟපෙන්වීමට විවෘත වෙයි.**

**නිපුණතා මට්ටම 8.2** : ශුද්ධ වූ සභාව කාලානුරූපී කර ගැනීමට නිසි මඟ ගැන්වීම සඳහා දායක වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 25

**ඉගෙනුම් පල**

- 16-21 සියවස තෙක් සභා ඉතිහාසය පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- කාලානුරූපී වෙනස්කම්වලට ශුභවාදී ව ප්‍රතිචාර දක්වයි.
- ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- ශුද්ධ වූ සභා නායකයන් ඉදිරිපත් කරන ඉගැන්වීම් හා මඟ පෙන්වීම් තම ජීවිතයට අදාළ කර ගනියි.
- ශුද්ධ වූ සභා නවෝදය වෙනුවෙන් දියත් කරන වැඩසටහන් සාර්ථක කර ගැනීම සඳහා අන් අය සමඟ සහයෝගයෙන් ක්‍රියා කරයි.

## 8.2.1. 16 - 21 සියවස තෙක් ශුද්ධ වූ සභා ඉතිහාසය

**තාපස හා පැවිදි නිකායයන් ප්‍රතිසංස්කරණය වීම හා නව තාපස නිකායයන් බිහි වීම.**

රෙපරමාදු විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස 16වන සියවසේ කතෝලික සභාව තුළ ප්‍රතිසංස්කරණයක් පිළිබඳ ව අවධානය යොමු කරමින් නව තාපස නිකායයෝ බිහි වූහ. පැවති තාපස නිකායයන්හි ද ප්‍රතිසංස්කරණය විය. ශුද්ධ වූ සභාවේ ප්‍රතිසංස්කරණ කාර්ය ඉදිරියට ගෙන යාමට ශුද්ධවන්ත, ක්‍රියාශීලි පූජකවරුන්ගේ නායකත්වය අවශ්‍ය විය. මෙම යුගයේ බිහි වූ ද ප්‍රතිසංස්කරණයට ලක් වූ ද තාපස හා පැවිදි නිකායයන් ලෙස කාර්මෙල් නිකායය, කැපුචින් නිකාය, වින්සෙන්තියානු නිකායය හා ජේසු නිකායය දැක්විය හැකි ය.

**කාර්මෙල් නිකායය**

- පලස්තීනයේ කාර්මෙල් කන්දෙහි 12 වන සියවසෙහි ආරම්භ වී ඇත.
- මෙම නිකායට අයත් තාපසයන් කාර්මෙල් කන්දෙහි හුදෙකලා ව ජීවත් වූ අතර දැඩි තාපස ජීවිතයක් ගත කළහ.
- ශු. සයිමන් ස්ටොක් මෙම පැවිදි ජීවිත ක්‍රමය එංගලන්තයට හඳුන්වා දුන්නේය.
- විශ්ව විද්‍යාලය ආශ්‍රිත නගරවල කාර්මෙල් නිකායේ තාපසාරාම බිහි කිරීමට කටයුතු කළේ තාපසවරුන් විශ්ව විද්‍යාලයවල දේශනා කරමින් ධර්මදූත සේවයේ යෙදුණු බැවිනි.
- කාර්මෙල් නිකායයේ පැවිදිවරියක වූ අවිලාහි තෙරේසා තුමිය (1515-1582) තම පැවිදි නිකායය තුළ නවෝදයක් ඇති කිරීමට උත්සාහ කළා ය.

- කාර්මෙල් නිකායයේ තිබූ තාපස දිවියේ භාවනායෝගී ජීවිතය නැවත ඇති කරලීමට අවිලාහි තෙරේසා තුමියගේ උත්සාහය නිසා හැකි විය. ඇයට කුරුසියේ ජුවාම් තුමාගේ සහයෝගය ලැබිණි.

- “පූර්ණ දිවියකට මඟ” (The Way of Perfection), “ඇතුළාන්ත මන්දිරය” (The interior Castle) ආදිය ආධ්‍යාත්මික කෘති අවිලාහි තෙරේසා තුමිය විසින් රචිත විශිෂ්ට ආධ්‍යාත්මික කෘති ය.

- අවිලාහි තෙරේසා තුමියගේ යොමු කිරීම හා මඟ පෙන්වීම මඟින් කුරුසියේ ජුවාම් තුමා (1542 - 1591) පුනරුදයට දායක විය. මෙතුමා විසින් ආධ්‍යාත්මික ජීවිතය පිළිබඳ පහත ග්‍රන්ථ ලියනු ලැබ ඇත.

  - ★ කාර්මෙල් පර්වතය නැඟීම - The Ascent of Mount Carmel
  - ★ ආත්මයේ අඳුරු රාත්‍රිය - Dark Night of the Soul
  - ★ ආධ්‍යාත්මික ගීතය - The Spiritual Canticle
  - ★ ප්‍රේමයේ ජීවන දැල්ල - The Living Flame of Love

- මොවුන් දෙදෙනා විසින් රචිත ආධ්‍යාත්මික කෘති බොහෝ දෙනාගේ ජීවිතවලට ඉමහත් සහනයක් විය.

- ආධ්‍යාත්මික ජීවිතය හා භාවනායෝගී යැදුම් පිළිබඳ මොවුන්ගේ ආධ්‍යාත්මික නිර්මාණ බොහෝ වැදගත් ය.

- ආධ්‍යාත්මික ජීවිතයේ දේව සබඳතාව අත්දැකීමට බැහැපත්කම නැති ව ම බැරි ය යන උපදේශය අනුව කාර්මෙල් නිකායික ජේසුගේ කුඩා මල වන තෙරේසා තුමිය ජීවිතයෙන් සාක්ෂ්‍ය දරා ඇත.

### කැපුචින් නිකාය

- 16 වන සියවසේ ඉතාලියේ බිහි වූ පැවිදි නිකායයන් අතරින් කැපුචින් නිකාය ප්‍රධාන වේ. 1525 දී මෙය 13 වන සියවසේ ආරම්භ වූ ෆ්‍රැන්සිස්කානු නිකායයෙන් බිහි වූවකි.

- අසිසියේ ශුද්ධ වූ ෆ්‍රැන්සිස් තුමා නීතිය ඉතා සූක්ෂ්ම ලෙස පිළිපැදිය යුතු යැයි කළ ප්‍රකාශය හා ශුද්ධ ලියවිලි අනුව ජීවිත ක්‍රමය නැවත ඇති කරලීමේ අදහසින් කැපුචින් නිකායය බිහි කරන ලදි.

- මොවුනට නායකත්වය ලබාදෙමින් ෆ්‍රැන්සිස්කානු නිකායේ මතේඕ ද බස්සිකෝගේ දායකත්වය තුළ බිහිවූවකි.

- නිකාය ආරම්භයේ දී ඉමහත් බාධක ශු. සභාවෙන් ම මතු වුව ද මෙම නවෝදය සෙමෙන් සෙමෙන් ඉදිරියට ඇදිණි. මොවුහු තම ධර්මෝපදේශ සේවයත්, ආශ්‍රමික ජීවිතයත් එකට එක් කර දිවි ගෙවූහ, ලෙඩුනට උපස්ථාන කරමින් හා ඉතා දුෂ්කර ලෙස වැඩ කිරීමෙන් ලබා ගත් ආදායමෙන් ජීවත් වූහ, ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණවාදීන්ට විරුද්ධ ව දේශනා කළහ, දිළිඳු ජීවිතයක් ගත කළහ.

## වින්සෙන්තියානු නිකාය

- ශුද්ධ වූ වින්සෙන්ති ද පාවුලු තුමා සහා ප්‍රතිසංස්කරණය සඳහා පුරෝගාමී ව කටයුතු කළ කෙනෙකි.
- මෙතුමා දිළිඳුන් ද කෙරෙහි ගැඹුරු ආදරයක් හා කරුණාවක් දැක්වූ කෙනෙකි.
- ක්‍රි.ව. 1625 වින්සන්ට් ද පාවුලු තුමා විසින් වින්සෙන්තියානු නිකාය ප්‍රංශයේ ආරම්භ කළේ ය. මෙහි අරමුණ වූයේ දුගීන්ට ධර්ම දානය හා පූජක පුහුණුව ය.
- කතෝලික ධර්මය දේශනා කර ප්‍රතිසංස්කරණවාදී ඉගැන්වීම්වලට ප්‍රතිචාර දැක්වීම මොවුන්ගේ සේවාව විය.
- ශු.සභාව තුළ ප්‍රතිසංස්කරණ ඇති කරලීමට ක්‍රම දෙකක් වින්සෙන්තියානු නිකායය විසින් අනුගමනය කරන ලදි.

  1. පැවිදි නිකායයන් සංවිධානය කර ආදර්ශවත් පූජකවරුන් බිහි කිරීම.
  2. ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාවේ ඉගැන්වීම් අනුව පූජකවරුන් බිහි කිරීමේ වගකීම පැවිදි නිකායයන්ට ලබා දීම.

- ශුද්ධ වූ වින්සෙන්ති පාවුලා තුමා විසින් 1633 වින්සන්ට් ද පාවුලු මුනිතුමාගේ දයාවේ සොහොයුරියන්ගේ නිකාය (Sister of Charity St. Vincent Paul) ද ආරම්භ කරන ලදි.

## ජේසු නිකාය

- සභා ප්‍රතිසංස්කරණවාදී පසුබිමක බිහි විය.
- ලොයලාහි ශුද්ධ වූ ඉග්නාසියුස් තුමන් විසින් ක්‍රි.ව. 1533 ආරම්භ කරන ලදී.
- එතුමා යුද වැදී තුවාල ලැබ ප්‍රතිකාර ලබමින් සිටි කාලය තුළ කියවීමට ලද ශුද්ධ ලියවිල්ල හා ශුද්ධවන්තයන්ගේ ජීවිත කථා තම ජීවිත පරිවර්තනයට හේතු විය.
- නූගත් ජනතාවට හා දිළිඳුනට අධ්‍යාපනය ලබා දීමේ අරමුණින් බිහිවූ මෙම නිකාය පසු ව රාජ කුමාරවරුන්ට හා රජවරුන්ට ද අධ්‍යාපනය ලබා දීමට යොමු විය.
- වෛදහාර රකිමින් කැප වූ ජීවිතයක් ගත කිරීමත් ශුද්ධෝත්තම පියතුමාගේ නියෝගවලට කීකරු වීමට පොරොන්දු වීමත් මෙම නිකායයේ විශේෂ ලක්ෂණයකි.
- කතෝලික සභාවේ ධර්මවේදය උගන්වා ආරක්ෂා කර ගැනීම ජේසු නිකායික ධර්මදූතවරුන්ගේ කාර්යය විය.
- ප්‍රතිසංස්කරණ සභා බිහි වූ යුගයේ කතෝලික සභාවේ නවෝදය ජේසු නිකායික පූජාප්‍රසාදීන් වහන්සේලා විසින් ඉදිරියට යන යන ලදි.
- ආධ්‍යාත්මිකත්වයෙන් හා දේව ධාර්මිකත්වයෙන් පූර්ණ වූ මොවුන් අතරින් ශු. ඉග්නාසියුස් තුමා විසින් රචිත "ආධ්‍යාත්මික පුහුණුව" (Spiritual Exercise) ග්‍රන්ථය ද ශු. පීටර් කැනිෂියස් තුමන් විසින් රචිත ධර්මෝපදේශ ග්‍රන්ථ තුන ද කතෝලික ධර්මෝපදේශයේ වර්ධනයට ඉවහල් වූ අතර ප්‍රතිසංස්කරණවාදී සභා තුළ පවා ප්‍රශංසාවට ලක් වූ මෙය ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාවේ ඉමහත් පිළිගැනීමට ලක් විය.
- ජේසු නිකායික පියතුමකු වන ශු. රොබට් බෙලාමියන් වැනි අය ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාවේ දේවධර්මාචාර්යකු ලෙස කටයුතු කළේ ය.

### 8.2.3 ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාව (1545-1563)

ප්‍රතිසංස්කරණවාදී සභාවල ඉගැන්වීම්වලට පිළිතුරු දීම සඳහාත් කතෝලික සභාවේ ස්ථාවරය යළි ශක්තිමත් කර ගැනීම සඳහාත්, ශු.සභාවේ උන්නතිය සඳහා ක්‍රියා කළ යුත්තේ කෙසේ ද කියා සාකච්ඡා කිරීමටත් මන්ත්‍රණ සභාවක් කැඳවී ය. 1545 දෙසැම්බර් 13 දින 3 වන පාවුලු ශුද්ධෝත්තම පියතුමා ආරම්භ කළ මෙම මන්ත්‍රණ සභාව අවුරුදු 18ත් මුළුල්ලේ විවිධ බාධා මැද කඩින්කඩ පැවැත්විණි. කතෝලික සභාවේ ස්ථාවරය ප්‍රසිද්ධ කිරීම මෙම මන්ත්‍රණ සභාවේ අරමුණ විය.

- එහි දී ගත් තීරණ

  ★ ශුද්ධ බයිබලය හා ජීවන සහා සම්ප්‍රදායය යන දෙක ම ධාර්මික සත්‍යතාවන්හි උල්පත වන බව

  ★ දේව ප්‍රසාද නිධාන හත ම ක්‍රිස්තුන් වහන්සේ විසින් ස්ථාපිත කරනු ලැබූ බව.

  ★ ශු. ජෙරොම් තුමා විසින් සම්පාදිත වල්ගේට් පිටපත නම් ශු. බයිබලයට සභාවේ අනුමතිය ලැබීම.

  ★ පැරණි ගිවිසුමේ හා නව ගිවිසුමේ ග්‍රන්ථ සියල්ල ම දේවානුභාවයෙන් ලියන ලද ඒවා බව. ශුද්ධ ලියවිලි පාඨ දෙවියන් වහන්සේ වෙතින් නික්මුණු නිසා ඒවායේ අර්ථය ගෙනහැර දැක්වීමේ බලය ශුද්ධ වූ සභාවේ ඉගැන්වීමේ අධිකාරියට පමණක් ඇති බව.

  ★ දේශනා කිරීමේ බලය හා ඉගැන්වීමේ බලය ශුද්ධ වූ සභාවට ක්‍රිස්තුන් වහන්සේ විසින් දානය කරනු ලැබූ බව.

  ★ ශුද්ධ වූ පේදුරු තුමා ද එතුමාට පසු ව අඛණ්ඩ ව පැමිණෙන ශුද්ධෝත්තම පියවරුද ශු. සභාවේ නායකත්වය දරති. විශ්වාසය හා සදාචාරය පිළිබඳ ව ඉගැන්වීමේ දී ශුද්ධෝත්තම පියතුමා නොවරදින සුලුභාවයෙන් යුතු වේ.

  ★ දිව්‍ය යාගය, කල්වාරි යාගය, නිරය, සාන්තුවර බැතිය, ශුද්ධ වූ ප්‍රතිමා තැබීම, පූර්ණඵල ආදිය ශුද්ධ වූ සභාව විසින් පිළිගනු ලබන බව .

  ★ විවාහය සක්‍රමේන්තුවක්

  ★ විවාහ බන්ධනයේ අඛණ්ඩ බව.

  ★ ගැලවීමේ ක්‍රියාවලියේ දී දෙවියන් වහන්සේ සමඟ මිනිසා ද සහයෝගය දැක්විය යුතු බව.

  ★ විශ්වාසය පමණක් නොව එහි ඵල වන යහපත් ක්‍රියා ද අත්‍යවශ්‍ය බව.

**ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාව විසින් ඉදිරිපත් කරන ලද නවෝදයේ ව්‍යාපෘති**

- පූර්ණඵල පිළිබඳ දේශනා කිරීම අත්හිටුවීම.
- මරිය තුමියට හා ශුද්ධවන්තයන්ට නියමිත පරිදි ගෞරව දැක්වීමට උනන්දු කරවීම.
- පූජක පුහුණුව සඳහා සෑම පදවියක ම දෙව්සත්හලක් ආරම්භ කිරීම.
- දිව්‍ය සත්ප්‍රසාදය ලබා ගැනීමට උනන්දු කිරීම.
- නිතර නිතර සමඟි සන්ධානයේ ප්‍රසාද නිධානය ලබා ගැනීමට උනන්දු කරවීම.
- දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව හා දිව්‍ය සත්ප්‍රසාද ආශීර්වාදය ලබා ගැනීමට උනන්දු කරවීම.

ශුද්ධ වූ සභාවේ ධර්මෝපදේශකයන් සඳහා "ත්‍රිදෙන්තීනු ධර්මෝපදේශය" නමැති කෘතිය 5වන පියුස් ශුද්ධෝත්තම පියතුමා විසින් 1566 දී ප්‍රකාශයට පත් කරන ලදි.

### 8.2.4 නවීන යුගය (1750 සිට)

**ප්‍රංශ විප්ලවය (1789 - 1795)**

- දහහතරවන ලුවී රජ දවසේ පටන් ම ප්‍රංශය තුළ පැවති පාලනය අත්තනෝමතික ඒකාධිකාරීයකින් යුක්ත විය. ස්ටේටස් ජෙනරල් නමැති ව්‍යවස්ථාදායක නියෝජිත සභාව 1614න් පසු කැඳවා තිබුණේ නැත.

- ශාසනය රාජකීය ප්‍රතිපත්තියේ අතකොළුවක් බවට පත් කර ගනු ලැබ තිබිණ. 1789 දී ප්‍රංශයේ උද්ගත වී තිබුණේ එවැනි දුර්වල තත්ත්වයකි. එහි සිටි පාලකයෝ අකාර්යක්ෂම අය වූහ.

- කාලයක පටන් ම ප්‍රංශය යුද්ධ කිහිපයකට අසු වීම නිසා හටගත් පිරිහීම පසු ව පැමිණි රජවරුන්ට මැඬ පවත්වා ගැනීමට නුපුළුවන් විය.

- දිගු කලක් තිස්සේ රජ ගෙදර තිබූ අනිසි වියදම් හා නාස්තිය මැඬ පවත්වා ගැනීමට නුපුළුවන් විය. පිරිහුණු ආර්ථික තත්ත්වය යළි ගොඩගැනීමට අපහසු විය.

- 1788 දී මහත් ආර්ථික දුෂ්කරතා ඇති විය. ගොවියන් පිට පැවරුණ බදු බර ඉහළ ගොස් තිබිණි. බදු අය කිරීමේ දී ඒකීය ක්‍රමයක් නොවී ය. මෙම තත්ත්වය දුගී ජනතාවට ඉතා අහිතකර විය. මෙලෙස දුප්පත් ගොවියන්ගෙන් අයකර ගත් බදු මුදලින් සැහෙන කොටසක් බැර වූයේ රජයේ භාණ්ඩාගාරයට නොව එය අය කළ නිලධාරීන්ට ය.

- විශාල වතුපිටි හිමි රදල වංශාධිපතිහු හා උසස් පූජකයෝ ද බදු බරින් නිදහස් ව විශේෂ වරප්‍රසාද ලද කණ්ඩායමක් වශයෙන් ජීවත් වූහ. වැඩවසම් ක්‍රමය නිසා දිළිඳු ගොවි පන්තිය පීඩාවට පත් විය. මෙම යුගයේ බිහිවූ මධ්‍යම පන්තිය රදල වංශාධිපතීන්ට අභියෝගයක් විය.

- 1788 ඇති වූ මහත් ආර්ථික දුෂ්කරතා හා ගොයම් පාළු වීම නිසා ඇති වූ සාගතය හේතු කොට ගෙන බොහෝ ජනතාව කුසගින්නේ මියගිය හ. ජීවන බර දැරිය නොහැකි දිළිඳු ජනතාව හා කම්කරුවෝ රටේ නීති ක්‍රමය සංශෝධනය කළ යුතු යැයි පවසමින් විප්ලව කළහ. සමහර පහළ ස්තරයේ පූජකවරු හා ප්‍රභූවරු ඔවුන් සමඟ එක් වූහ.

- රටේ පාලනය ජනතාවගේ කැමැත්ත අනුව කළ යුතු ය යන රූසෝගේ අදහස් මෙයට හේතු විය.

- හිස් භාණ්ඩාගාරයෙන් රට ගෙනයා නොහැකි විය. බදු බර තවත් වැඩි කිරීමට ද නොහැකි විය. උද්ගත වී ඇති තත්ත්වය සමතයකට පත් කිරීමට හා විසඳුම් සෙවීමට ප්‍රංශ රටේ නීති සභාව වන "ස්ටේටස් ජෙනරල් සභාව" (States General) කැඳවීමට තීරණය විය. ඒ අනුව 1789.05.05 දින වර්සයිල්ස් නගරයේ රැස් විය. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගොඩනඟන ලදි.

- මෙම නීතිය නොපිළිගත් රදගුරුවරුන්ට හා සිය ගණන් පූජකවරුනට බලපෑම් කළහ. එකල රට පාලනය කළ XVI ලුවී රජතුමන් (1793.1.21 දින) හිස ගසා මරා දැමූහ. ජනරජ ක්‍රමයට විරෝධය පෑ දහස් ගණන ප්‍රභූවරු, පූජකවරු හා පැවිදි අය මරනු ලැබූහ. ප්‍රභූවරු හා ඉඩම් හිමි විශාල පිරිසක් රටින් පිටුවහල් කළහ. අනෙකුත් අය තම පාරම්පරික උරුමය අත් හැරියෝ ය. 1793 දී ප්‍රංශයෙන් කිතු දහම

තුරන් කළ යුතු යැයි වෘත්තීය උත්සව දනුම මංගල්‍ය, යහගුණ මංගල්‍ය යැයි උත්සව සමරමින් කිතුනු මංගල්‍ය දින හා ඉරුදින වන්දනාවට බාධා පැමිණවූහ. ප්‍රසිද්ධ දේවස්ථානයක් වන පැරිසියේ අප ස්වාමිදූගේ (නොත්‍රදාමයේ ආසන දෙව් මැඳුරේ) තැන්පත් කර තිබූ ප්‍රධාන ප්‍රතිමාව අයින් කර අල්තාරය මත ගණිකාව සිටුවා " සාමාන්‍ය දූනුමේ දෙවියා" යැයි වන්දනා කළහ.

- ප්‍රංශයේ ක්‍රිස්තියානි අතීතය වළලා දමනු වස් කතෝලික දින දර්ශනය අවලංගු කර ඒ වෙනුවට සමූහාණ්ඩුව පිහිටුවන ලද 1792 සැප්තැම්බර් මස 22 දිනෙන් පටන් ගන්නා දින දර්ශනයක් හා ලිතක් ඇති කරන ලදි. ඉරුදින නිවාඩුව වූයේ දින 10කින් සකස් වූ සතියේ අන්තිම දිනය යි.

- 1796 දී නැපෝලියන් බොනපාට් අධිරාජ්‍යයා ලෙස පත්වීමෙන් පසු ඉතාලිය ආක්‍රමණය කර අති උතුම් 6 වන පියුස් ශුද්ධෝත්තම පියතුමා සමඟ ගිවිසුමකින් බැඳී ශු. සභාව සතු රටවල් හා ඉඩකඩම් ද අතින් ලියන ලද මිල අධික ග්‍රන්ථ පිටපත් හා කලා වස්තූන් ද ලබා ගත්තේ ය. 1798 දී ශුද්ධෝත්තම පියතුමා සතු වස්තුව පැහැරගෙන ප්‍රංශයට ගෙන යමින් සිටිය දී 1799 දී එතුමා ස්වර්ගස්ථ විය.

- මීළඟට ශු. සභාවේ පාලකයා ලෙස 1800.03.14 දින අති උතුම් 7 පියුස් පාප්තුමා පත් විය. රාජ්‍ය ශාසනික භේදයන්ගෙන් ද විවිධ මතවාදී විප්ලවකාරීන්ගෙන් ද විඩාවට පත් ව සිටි ප්‍රංශයට හා යුරෝපයට අවශ්‍ය වූයේ ආගමික ස්ථාවරත්වයක් බව වටහා ගත් නැපෝලියන් - 7වන පියුස් ශුද්ධෝත්තම පියතුමා සමඟ 1801.07.15 දින සුහද ගිවිසුමකට එළැඹී ම ශුද්ධ වූ සභාවේ අයිතිය නැවත ලබා ගත්තේ ය. දේවස්ථාන විවෘත කරනු ලැබී ය. පැවිදි නිකායයෝ තම සේවා ආරම්භ කළෝ ය. කතෝලික දහම ප්‍රසිද්ධියේ පිළිගනු ලැබී ය. පූජක පුහුණුව සඳහා දෙව්සත්හල් විවෘත වූ අතර බොහෝ ආයතන නඩත්තුව සඳහා රජය මුදල් වැය කළේ ය.

- නැපෝලියන් ඒකාධිපති පාලකයකු ලෙස වෙනස් වී ශුද්ධ වූ සභාවට නැවත බලපෑම් කිරීමට පටන් ගත්තේය. එයත් අති උතුම් 7 වන පියුස් ශුද්ධෝත්තම පියතුමා නොබිය ව නැපෝලියන්ට විරුද්ධ ව ශුද්ධ වූ සභාව ආරක්ෂා කර ගැනීමට ක්‍රියා කළේ ය. එල්බා දූපතෙහි සිරගත ව සිටි නැපෝලියන් එයින් නිදහස් ප්‍රංශයට පිවිසියේ ය. ඉංග්‍රීසි හා ප්‍රංශ හමුදා සමඟ 1815.06.18 පැවති යුද්ධයෙන් නැපෝලියන් පරාජය වූයෙන් ශාන්ත හෙලේනා දූපතට යවන ලදි. ශුද්ධ වූ සභාවට නිදහසේ ප්‍රංශය තුළ ව්‍යාප්ත වීමට හැකි විය.

## 8.2.5 ප්‍රංශ විප්ලවයෙන් පසු ශුද්ධ වූ සභාවේ දායකත්වය

### පළමු වන වතිකාන මන්ත්‍රණ සභාව (1869 - 1870)

ලිබරල්වාදය හා ජාතිවාදය උත්සන්න ව තිබිණි. විප්ලවකාරී අදහස් යුරෝපය තුළ පැතිර තිබිණ. ශුද්ධාසනය හා රාජ්‍යයන් අතර සුහදතාව ය බිඳවැටෙමින් තිබිණි. රෝමය ඉතාලි හමුදාව විසින් ආකමණය කිරීමට සූදනම් ව තිබිණි. රෝමය තුළ මෙවැනි පසුබිමක අතිඋතුම් 9 වන පියුස් ශුද්ධෝත්තම පියතුමා විසින් 1868.06.29 පළමු වන වතිකාන මන්ත්‍රණ සභාව කැඳවා එතුමාගේ නායකත්වයෙන් 1869.12.08 දින රෝමයේ වතිකාන නුවර ශා. පීතර බැසිලිකා දේවස්ථානයේ මන්ත්‍රණ සභාව ආරම්භ කළේ ය.

**මෙම මෙම මන්ත්‍රණ සභාවේ ප්‍රධාන අරමුණු**

- විශ්වාසයට හා ශීලධර්මයට විරුද්ධ ව පැන නැඟී ඇති දුර්මත දුරු කිරීම.

- පරිවර්තන යුගයකට ගැළපෙන ලෙස විනය කරුණු සකස් කිරීම.

- කතෝලික සභාවේ තත්ත්වය හා ස්වභාව සවිස්තර ව විග්‍රහ කිරීම.
- රාජ්‍යයන් සමඟ ශුද්ධ වූ සභාවේ සම්බන්ධතා පහදා දීම.

**මන්ත්‍රණ සභාවේ තීරණ**

- විඥාන වාදය, අදේව දෘෂ්ටිය, සර්ව දේව දෘෂ්ටිය, ස්වභාව ධර්ම වාදය වැරදි මත බවත් කතෝලික ධර්මයේ විශේෂත්වය හා අත්‍යුත්තරීතර භාවයත් ඩෙයි ෆීලියුස් නැමැති නිර්දේශයෙන් ප්‍රකාශ කරන ලදි.

- පාප්තුමා මුළු සභාවේ නායකයා බව මෙන් ම ශු. සභාව විසින් පිළිගත යුතු විශ්වාසය හා ශීල ධර්මය පිළිබඳ සත්‍යතා උගන්වන විට එතුමාට නොවරදින සුලුභාවයක් ඇති බවත් පිළිගන්නා ලදි.

1870-09- 20 ඉතාලි හමුදාව රෝමය ආක්‍රමණය කිරිම නිසා සම්මේලනය සාකච්ඡාවට කෙටුම්පත් පත් 51 භාජනය විය යුතු ව තිබුණ ද කෙටුම්පත් 2ක් පමණක් සාකච්ඡාවට ගෙන අතරමග නතර කිරීමට සිදු විය.

**විශේෂිත ශුද්ධෝත්තම පියවරු (1878 - 1963)**

**අති උතුම් 13 වන ලියෝ ශුද්ධෝත්තම පියතුමා (1878 - 1903)**

19 වන සියවසට අයත් අවසාන පාප්තුමා වන අතර අවුරු 25ක් ශු.සභාව පාලනය කළේ ය.

- සෑම ඉරු දිනක ම දිව්‍ය පූජා යාගයේ දී දේශනා කිරීමට පියතුමන්ලාව නියම කරන ලදි.

- ළමයින් සඳහා නව ධර්මෝපදේශයක් සම්පාදනය කළේ ය.

- පූජකවරුන් සඳහා ප්‍රායෝගික නීති මාලාවක් සකස් කළ අතර එහි දින පතා යාච්ඤා හා භාවනාව පිළිබඳ ව විශේයෙන් සඳහන් කළේ ය.

- මීසම තුළ ඥානකාන්ති හා මහා ධර්ම විවේකයන් පවත්වීමට පූජකවරුන් උනන්දු කළේ ය.

- එතුමා රදගුරුවරයා ලෙස සිටි කාලයේ දී නව දෙව් මැඳුරු 36 ඉදි කළේ ය.

- රුසියාවේ හා ස්විට්සර්ලන්තයේ සාමය උදා කළේ ය.

- ඉන්දියාවේ නව රදගුරු පදවි 03ක් ස්ථාපිත කළේ ය.

- වතිකාන පුස්තකාලයය මහජනය, වෙත විවෘත කොට අභිනවයෙන් වතිකාන කාලගුණ විද්‍යාගාරය ඉදි කළේ ය.

- ක්‍රි.ව 1892 බයිබල් කොමිසම පත් කළේ ය.

- එතුමා ලියූ විශ්ව ලේඛන අතරින් සමාජ සාධාරණත්වය අලළා ලියවුණු "රේරුම් නොවාරුම්" (Rerum Novarum) විශ්ව ලේඛනය කැපී පෙනෙයි.

- ඉතාලිය තුළ කතෝලික ක්‍රියාකාරිත්වය ආරම්භ කළේ ය.

- ශ්‍රී ලංකාවේ කොළඹ, යාපනය, මහනුවර, තිරිකුණාමලයේ හා ගාල්ල යන රදගුරු පදවි පහ ස්ථාපිත කළ අතර කොළඹ අගරදගුරු පදවියක් බවට උසස් කළේ ය.

- නැගෙනහිර ඉන්දිය රටවල් සඳහා දේශීය පදවි පූජකයන් බිහි කිරීමට දෙව්සත්හලක් 1893.05.03 දින අම්පිටියේ ආරම්භ කළේ ය.

- ශ්‍රී ලංකාව හා ඉන්දියාව වෙනුවෙන් තානාපති සේවයක් ක්‍රි.ව. 1894.09.23 ආරම්භ කළේ ය.

## ශු. X වන පියුස් ශුද්ධෝත්තම පියතුමා (ක්‍රි.ව. 1903 - 1914)

- උගත් සිල්වත් පාප්තුමෙක් වූ මෙතුමාගේ විශේෂ අවධානය යොමු වූයේ ළමා හා තරුණ අය වෙත ය.
- වයස අවුරුදු හතේ දී විට ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාදය ලැබීමට දරුවන් සූදානම් කරන ලෙස දැන් වීය.
- නිතර නිතර හා දිනපතා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට විශ්වාසිකයන් යොමු කළේ ය.
- ජනවන්දනාව කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ මෙතුමා ජනවන්දනාවෙහි විවිධ ප්‍රතිසංස්කරණ ඇති කළේ ය.
- පූජක පුහුණුව පිළිබඳ වැඩි අවධානයක් ලබා දුන්නේ ය.

## XI වන පියුස් ශුද්ධෝත්තම පියතුමා (ක්‍රි.ව. 1922 - 1939)

- මෙතුමාගේ පාලන සමයේ ඉතාලියේ පාලකයා බෙනිටෝ මුසලෝනි විය.
- ඉතාලිය තුළ පැවති පැසිස්ට්වාදයෙන් ශුද්ධ වූ සභාව ආරක්ෂා කර ගැනීමට කටයුතු කළේ ය.
- ශුද්ධ වූ සභාවේ පාරම්පරික උරුමය රජයට පවරා දීමට අකමැති වූ මෙතුමා නිදහස් සීමාවක නිදහසේ පාලනය කිරීම ශුද්ධ වූ සභාවේ සැබෑ නිදහස යැයි ප්‍රකාශ කර සිටියේ ය.
- ඉතාලි රජය හා ශුද්ධෝත්තම පියතුමා අතර 1922.02.11 දින ලතරානු ගිවිසුම අස්සන් කරන ලදි.
- ලතරානු ගිවිසුමට අනුව වතිකානය ස්වාධීන රටක් හා මධ්‍යස්ථ රටක් ලෙසත් එහි පාලකයා ශුද්ධෝත්තම පියතුමා ලෙසත් පිළිගනු ලැබිණි.
- ගිහි ධර්මදූත සේවාව නඟාසිටුවීමට කටයුතු කරමින් ගිහියා පිළිබඳ විවිධ අනුශාසනා පත්‍ර ලිවී ය.
- “රේරුම් නොවාරුම්” 40 වසර සැමරීමට “ක්වඩ්‍රිජෙස්සිමෝ” නම් විශ්ව ලේඛනය ප්‍රකාශයට පත් කළේ ය.
- ඉතාලි පාසල්වල ධර්මෝපදේශය ඉගැන්විය යුතු බවට දැන්වී ය.
- තරුණ පරපුරට අධ්‍යාපනය ලබාදීම සභාවේ අයිතිය මෙන් ම යුතුකම බව පෙන්වා දුන් මෙතුමා එමඟින් හොඳ කතෝලිකයන්, හොඳ පුරවැසියන් බිහි කළ හැකි බැවින් කතෝලික පාසල් මඟින් අධ්‍යාපනය ලබාදීමේ වැදගත්කම තමා ලියූ “කිතුනු අධ්‍යාපනය” (1929.12.31) නමැති විශ්ව ලේඛනය දක්වා ඇත.
- 1933 හිට්ලර් සමඟ ගිවිසුමින් බැඳුණු මෙතුමා ජර්මනිය තුළ කතෝලිකයන්ට ජීවත් වීමේ අයිතිය පෙන්වා දිනි.
- කිතුනු ඒකත්වය සඳහා ක්‍රියාකාරී වීමට සැමට ආරාධනා කළේ ය.
- ක්‍රිස්තු රජාණන්ගේ මංගල්‍යය 1925 ප්‍රකාශයට පත් කළේ ය.

**අතිඋතුම් XII වන පියුස් ශුද්ධෝත්තම පියතුමා (ක්‍රි.ව. 1939 - 1958)**

- භාෂා විශාරදයකු මෙන් ම උසස් පඬිවරයකු වූ මෙතුමා උසස් ආධ්‍යාත්මිකත්වයෙන් හෙබි පුද්ගලයෙක්.
- දෙවන ලෝක මහා සංග්‍රාමය සමයේ ලෝක සාමය නඟාලීමට කටයුතු කළේ ය.
- "අතීන්ද්‍රිය ක්‍රිස්තු දේහය" නමැති විශ්ව ලේඛනය 1943 ප්‍රකාශයට පත් කළේ ය.
- දෙව් මවු ආත්ම ශරීර පිටින් ස්වර්ගාරෝහණය වීම පිළිගත යුතු සත්‍යතාවක් බව 1950 ප්‍රකාශ කළේ ය.
- ගිහි ධර්මදූත සේවාව පිළිබඳ වඩාත් උනන්දුවෙන් කටයුතු කළේ ය.
- 1943 නිකුත් කළ "ඩිවිනෝ අප්පලාන්ටේ ස්පිරිටු" විශ්ව ලේඛනය මඟින් බයිබල් පණිවිඩය දෙස විද්‍යාත්මක ව බැලීමට අවධානය යොමු කරවීය.

**23 වන ශු. ජුවාම් ශුද්ධෝත්තම පියතුමා (1958 - 1963)**

- කිතුනු ඒකත්වය සඳහා ස්වාධීන ලේකම් කාර්යාලයයක් ඇති කළේ ය.
- කිතුනු ඒකත්වය නමැති සංගමයේ පෙරමුණ ගෙන කටයුතු කළේ ය.
- කිතුනු ඒකත්වයට ස්වාධීන ලේකම් කාර්යාලයයක් ඇති කළේ ය.
- ලෝක සාමය වෙනුවෙන් කටයුතු කළේ ය.
- සාකච්ඡා ප්‍රතිපත්ති මඟින් ප්‍රතිසංස්කරණ සභා හා ශුද්ධ වූ සභාව අතරේ පැවති අර්බුද සමථයකට පත් කළේ ය.
- මව හා ගුරුවරිය, (Mater Et Magistra) ලෝක සාමය (Pacem in Terris) යන විශ්ව ලේඛන ලිවී ය.
    - මව හා ගුරුවරිය → මිනිස්කමට ගරු කළ යුතු ය. දිළින්දන් හා ධනවතුන් අතර උස් පහත් භේදය තුරන් විය යුතු ය.
    - ලෝක සාමය → ඒක පුද්ගල චරිතාකමක්, නිදහසක්, අවධාරණය කර යහපත් මිනිසුන් එක් වුවහොත්, සාමයෙන් පිරි යහපත් සමාජයක් ගොඩනැගිය හැකිය.

**දෙවන ජගත් වතිකාන මන්ත්‍රණ සභාව**

විසි වන සියවසේ ලෝකයේ විද්‍යාත්මක හා තාක්‍ෂණික ප්‍රගතිය හේතු කොට ගෙන විශාල සංවර්ධනයක් මෙන් ම ප්‍රගතියක් ද ඇති විය. ලෝකය ශීඝ්‍රයෙන් ඉදිරියට යාමක් දක්නට ලැබිණි. එහෙත් ශුද්ධ වූ සභාව සාම්ප්‍රදායික රටාව තුළ ම කොටු වී සිටීම දක්නට ලැබුණි. ඉදිරියට ඇදෙන ලෝකයට සරිලන පරිදි ශුද්ධ වූ සභාවේ ද නවතාවක්, යාවත්කාලීන වීමක් අවශ්‍ය බව අති උතුම් විසිතුන් වන ජුවාම් ශුද්ධෝත්තම පියතුමාගේ තියුණු ඇසට ලක් වූවකි.

ශුද්ධෝත්තම වහන්සේගේ මග පෙන්වීම ඔස්සේ ශු. සභාව නව මාවතකට ගෙන යාම අරමුණු කර ගෙන දෙවන වතිකාන මන්ත්‍රණ සභාව කැඳවනු ලැබී ය.

විවිධ ක්‍රිස්තියානි සභා අතර මේ තාක් පැවති සැකය, අවිශ්වාසය දුරුකොට සභා එකමුතුකමක් ඇති කරලීමට අවැසි බව එතුමා පිළිගත්තේ ය. එක ම දෙවියන් වහන්සේ එක ම ක්‍රිස්තුන් වහන්සේ පිළිගන්නා ජනතාවක් බැවින් ඔවුන්ට එකට යැදීමටත් සමාජ දියුණුව සඳහා එකට වෙහෙසීමටත් අනුබල දීම අවශ්‍යතාවක් බව අවබෝධ කර ගත්තේ ය.

මෙම කරුණු මුළු ශු. සභවේ සාකච්ඡා හා අවධානයට භාජනය කර ඒවායේ අනුහස දසත පතුරුවා හැරීමට දෙවන වතිකාන මන්ත්‍රණ සභාව අතිඋතුම් 23වන ජුවාම් ශුද්ධෝත්තම පියතුමාගේ නායකත්වය යටතේ 1962.10.11 වන දින රැස් විය. වෙනත් ක්‍රිස්තියානි සභා නියෝජිතයෝ ද නිරීක්ෂණයන් ලෙස සහභාගි වූහ. අතිඋතුම් 23 වන ජුවාම් ශුද්ධෝත්තම පියතුමා ආරම්භ කළ අතර දෙවන වතිකාන මන්ත්‍රණ සභාව අතිඋතුම් 6 වන පාවුලු ශුද්ධෝත්තම පියතුමා විසින් 1965.12.08 දින සමාප්ත කරන ලදි.

දෙවන වතිකාන කතිකාවෙන් ගත් තීරණ ඇසුරෙන් ප්‍රකාශන 16ක් නිකුත් කෙරිණි. ඒවා වර්ග තුනකට බෙදිය හැකිය. එනම්,

- ව්‍යවස්ථා
- නියෝග (ආඥා)
- ප්‍රකාශන

**ව්‍යවස්ථා හතරකි.**

1. ජනවන්දනාව පිළිබඳ ව්‍යවස්ථාව
2. ශුද්ධ වූ සභාව පිළිබඳ ධර්ම ව්‍යවස්ථාව
3. දේව ප්‍රකාශන පිළිබඳ ධර්ම ව්‍යවස්ථාව
4. නූතන ලෝකයේ ශුද්ධ වූ සභාව පිළිබඳ උපදේශාත්මක ව්‍යවස්ථාව

**නියෝග (ආඥා) නවයකි.**

1. ජනසන්නිවේදන මාධ්‍ය පිළිබඳ නියෝගය
2. පෙරදිග කතෝලික සභා පිළිබඳ නියෝගය
3. කිතුනු සභා එකමුතුව නඟාලීම පිළිබඳ නියෝගය
4. රාජගුරුප්‍රසාදිවරුන්ගේ මෙහෙය පිළිබඳ නියෝගය
5. පැවිදි දිවිය කාලානුරූප කිරීම පිළිබඳ නියෝගය
6. පූජක පුහුණුව පිළිබඳ නියෝගය
7. ගිහි ධර්මදූත සේවාවන් පිළිබඳ නියෝගය
8. ශුද්ධ වූ සභාවේ ධර්මදූත සේවාවන් පිළිබඳ නියෝගය
9. පූජක ජීවිතය හා සේවාවන් පිළිබඳ නියෝගය

**ප්‍රකාශන තුනකි.**

1. ක්‍රිස්තියානි අධ්‍යාපනය පිළිබඳ ප්‍රකාශනය
2. ක්‍රිස්තියානි නොවූ ආගම් කෙරෙහි ශුද්ධ වූ සභාවේ සබඳකම් පිළිබඳ ප්‍රකාශනය
3. ආගමික නිදහස පිළිබඳ ප්‍රකාශනය

දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ තීරණ හා නියෝග ප්‍රබල ව හා ප්‍රථමයෙන් ම බලපෑම් කළේ ජනවන්දනාව කෙරෙහි ය.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :**

1. 16 වන සියවස තුළ කතෝලික සභාව තුළ ඇති වූ ප්‍රතිසංස්කරණය තුළින් බිහි වූ තාපස පැවිදි නිකා 04 ක් නම් කරන්න.

2. ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාවේ දී ගත් තීරණ 05ක් සහ නවෝදයේ ව්‍යාපෘති 05ක් ලියන්න.

3. දෙවන ජගත් වතිකාන මන්ත්‍රණ සභා තීරණ ඇසුරෙන් නිකුත් වූ ප්‍රකාශන 16 නිර්මාණාත්මකව ඉදිරිපත් කරන්න.

**ආශ්‍රිත ග්‍රන්ථ :**


1. ප්‍රනාන්දු, ජේ.ඒ. ***නූතන කතෝලික සභාව,*** සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ 11, 1970.

2. දසනායක, ජුඩ් (පියතුමා), **ශ්‍රී ලංකා කතෝලික සභා ඉතිහාසය හා බැඳුණු රදගුරු පදවි *හා පැවිදි නිකායන් (1505 - 2013)*,** *කොළඹ කතෝලික මුද්‍රණාලය,කොළඹ 8, 2013*

*3.* *තෝමස් ජී.ඩී.* (පියතුමා), **ශුද්ධෝත්තම පියවරුන් පිළිබඳ සංක්ෂිප්ත ඉතිහාස** පරිව*ර්තනය*, ඩී. ජේ. ෆ්‍රීල් මුතුකුඩආරච්චි සහෝදරතුමා, පුබුදු *මුද්‍රණාලය*, *රාගම* , *1997*

**නිපුණතාව 9.0** : **ශ්‍රී ලංකාවේ කිතුනු අනන්‍යතාවෙහි ලා සුබ අස්නේ පණිවිඩකරුවන් ලෙස සාක්ෂි දරයි.**

**නිපුණතා මට්ටම 9.1** : පෘතුගීසින් පැමිණීමට පෙර ශ්‍රී ලංකාව තුළ කිතු දහමේ ආරම්භය පිළිබඳ ව කරුණු සොයා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 10

**ඉගෙනුම් පල**

- ශ්‍රී ලාංකේය කිතු සසුනේ ආරම්භය පිළිබඳ ව තොරතුරු ගොනු කරයි.
- ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි අනන්‍යතාව සුරැකිය යුතු බව පිළිගනියි.
- ශ්‍රී ලාංකේය කිතු සසුනේ ආරම්භය පිළිබඳ ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- විවිධ අභියෝග හමුවේ ක්‍රිස්තියානි විශ්වාසය සුරකියි.
- ජාතික හා ආගමික සමඟිය ගොඩනැඟීමට දායක වෙයි.

## 9.1.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ශු. සභා ඉතිහාසය යනු කිතුනු ශාසනය ලංකාව තුළ ආරම්භ වී, වර්ධනය වෙමින් අද වන තෙක් ආ ගමන පිළිබඳ ඓතිහාසික විස්තරය යි. මෙරට දේශපාලන, ආගමික, සමාජීය හා සංස්කෘතික මංපෙත් ඔස්සේ බාධක හා අභියෝග පසු කරමින් කිතු සසුන ගමන් කළ ආකාරය එම ඉතිහාසය මඟින් අපට හඳුනාගත හැකි ය.

**ශ්‍රී ලංකා සභා ඉතිහාසය හැදෑරීමේ වැදගත්කම**

- ශ්‍රී ලංකාව තුළ කිතු දහමේ ආරම්භය හා විකාශනය පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබාගැනීම
- ශු. සභා ඉතිහාසය තුළ දෙවියන් වහන්සේගේ මැදිහත් වීම හා ක්‍රියාකාරීත්වය අවබෝධ කර ගනිමින් අපගේ විශ්වාසයේ ජීවිතය ශක්තිමත් කර ගැනීම
- මෙරට කිතු සසුන ගොඩනඟන්නට දායක වූවන් අගයමින් ඔවුන්ගේ ආදර්ශය අනුව යමින් ශු. සභාවේ වර්ධනය සඳහා ඇප කැප වී සේවය කිරීමට දිරි ගැන්වීම
- ශ්‍රී ලාංකික ශු. සභාවේ අතීතය දෙස බලා එහි වර්තමානය හා අනාගතය නිසි ලෙස හැඩගස්වා ගැනීම

යන කරුණු මෙමඟින් ඉටු කරගත හැකි වේ.

**ශ්‍රී ලංකාවේ ශු. සභා ඉතිහාසයේ ප්‍රධාන යුග**

1. පෘතුගීසින් පැමිණීමට පෙර යුගය ක්‍රි.ව. 1505ට පෙර
2. පෘතුගීසි යුගය ක්‍රි.ව. 1505-1658
3. ලන්දේසි යුගය ක්‍රි.ව. 1658-1796
4. බ්‍රිතාන්‍ය යුගය ක්‍රි.ව. 1796-1948
5. නිදහස් යුගය ක්‍රි.ව. 1948න් පසු ව

## පෘතුගීසින් පැමිණීමට පෙර යුගයේ කිතු දහම

ශ්‍රී ලංකාවේ ශු. සභාව පිළිබඳ ලේඛනගත ඉතිහාසය ඇරඹෙන්නේ ක්‍රි.ව. 16 වන සියවසේ සිට ය. ඒ ක්‍රි.ව. 1505 දී පෘතුගීසින් මෙරටට පැමිණීමත් සමඟ ය. එහෙත් මෙරට කිතුනු විශ්වාසයේ උරුමය ඊට සියවස් ගණනකට පෙර සිට පැවත එන බව කිව යුතු ය. පෘතුගීසි ආගමනයට පෙර පවා ශ්‍රී ලංකාවේ කිතුනුවන් සිටි බවට සාක්ෂි පවතී.

## පෘතුගීසින් පැමිණීමට පෙර ශ්‍රී ලංකාවේ කිතුනුවන් සිටි බවට සාක්ෂි

### 1. කොස්මස් ඉන්ඩිකොප්ලෙයුස්ටස් නමැති දේශ සංචාරකයාගේ සාක්ෂය

සයවන සියවසේ, ඇලෙක්සැන්ඩ්‍රියාවේ වෙළෙන්දකු වූ ග්‍රීක ජාතික කොස්මස් ඉන්ඩිකොප්ලෙයුස්ටස් නමැත්තා ඉන්දීය සාගරයේ රටවල වෙළඳාමේ යෙදී සිටිය දී ඒ රටවල කිතු දහම කෙතරම් දුරට ප්‍රචාරය වී තිබුණේ ද යන්න ගැන දැන ගත් තොරතුරු, තමා පසු ව තාපසයකු ව සිටි කාලයේ දී පොතක ලිවී ය. එම පොත ඉංග්‍රීසියෙන් “The Christian Topography” වේ. එම පොත අනුව එකල ලක්දිව පර්සියාවෙන් පැමිණි ක්‍රිස්තු භක්තික පිරිසක් සිටිය හ. ඔවුන්ට සේවය කිරීමට පූජකවරයෙක් හා තේවාචාර්යවරයෙක් සිටිය හ. දේව වන්දනාව පැවැත්වීමට අවශ්‍ය දේ තිබිණි.

### 2. අනුරාධපුරයෙන් හමු වූ ගල් කණුවක කෙටූ කුරුසිය

ක්‍රි.ව. 1912 දී පුරාවිද්‍යා කැණීම්වල දී E. R. අයර්ටන් නමැති පුරාවිද්‍යාඥයා විසින් ගල් කණුවක කොටන ලද විශේෂ හැඩයකින් යුතු කුරුසියක් සොයා ගන්නා ලදි. එය පර්සියානු ජාතික කිතුනුවන්ට අයත් බව පැරණි මතය යි. එසේ නම් ඒ කොස්මස් සඳහන් කළ කිතුනුවන් විය හැකිය. එහෙත් නූතන මතය වනුයේ ශුද්ධ වූ තෝමස් අපෝස්තුලුතුමාගේ ශ්‍රාවකයන්ට අයත් බව ය.

අනුරාධපුර යුගයේ විසූ කිතුනුවන් හමුදා සේවය හා වෙළඳාම සඳහා ලංකාවට පැමිණි අය මිස ධර්ම ප්‍රචාරය සඳහා පැමිණි අය නොවිය හැකි ය. ඔවුන් ලංකාවට වෙළඳාම සඳහා පැමිණි පර්සියා ජාතික නෙස්ටෝරියානු කිතුනුවන් විය හැකිය.

මෙවැනි ම හැඩයෙන් යුත් කුරුස දකුණු ඉන්දියානු දේවස්ථානවල ඇත. කුරුසියේ හතර කෙළවර මලක ආකාරයට සකසා ඇත.

දකුණු ඉන්දියාවේ ශු. තෝමස් තුමාගේ කිතුනුවන් භාවිත කළ කුරුසිය ද මෙවැනි හැඩයක් ගනී. කොළඹ ජින්තුපිටියේ මෙවැනි ම කුරුසියක් සහිත කුලුනක් හමු වී ඇත.

### 3. සීගිරි සමයේ සිටි මිගාර සෙන්පති

ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා කොමසාරිස්වරයකු වූ සෙනරත් පරණවිතාන මහතා “සීගිරිය” නම් කෘතියේ මෙසේ සඳහන් කර ඇත. කාශ්‍යප (ක්‍රි.ව. 473 - 491) හා මොග්ගල්ලාන (ක්‍රි.ව. 491 - 508) යන රජවරුනට සේවය කිරීමට 5 වන සියවසේ දකුණු ඉන්දියාවෙන් පැමිණි සෙබළුන් අතර ඉන්දීය කිතුනු භේවා භටයන් සිටින්නට ඇත. මිගාර නම් සෙන්පතියාගේ නායකත්වය යටතේ පැමිණි මෙම පිරිස කිතුනුවන් බව සඳහන් වේ.

තව ද මිගාර විසින් “අභිෂේක ජින” වෙනුවෙන් දෙව්මැදුරක් තනා එය කැප කිරීමේ උළෙළක් පැවැත්වූ බව චූලවංශයේ සඳහන් වේ. මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතාගේ මතය අනුව මෙහි “අභිෂේක ජින” ලෙස හඳුන්වන්නේ “ක්‍රිස්තුන් වහන්සේ” ය. එය සීගිරි සමයේ මෙරට ක්‍රිස්තු භක්තිකයන් සිටි බවට වැදගත් සාක්ෂියකි. මුගලන් රජ සමයේ භාවිත කළ කිතුනු ලාංඡන සහිත රන් කාසි හමු වී ඇත.

4. **තෝමස් අපෝස්තුලුවරයාගේ අනුගාමිකයන් මෙරට සිටි බවට පවතින සාක්ෂි**

ශාන්ත තෝමස් තුමා ඉන්දියාවේ මලබාරයේ සිට ලංකාවටත් මලක්කාවටත් ගිය බව මලබාර් ජනප්‍රවාදයේ පවතියි. කෙසේ වෙතත් ක්‍රි.ව. 52 දී තෝමස් අපෝස්තුලුතුමා ඉන්දියාවට පැමිණ දහම් ප්‍රචාරය කළ බවට සාක්ෂි පවතියි. එතුමාගේ අනුගාමිකයන් ලෙස සැලකෙන ක්‍රිස්තු භක්තිකයෝ කණ්ඩායමක් පෘතුගීසින් පැමිණීමටත් පෙර පටන් දකුණු ඉන්දියාවේ සිටි අතර ඔවුන්ගෙන් සමහර දෙනෙකු ඇතැම් අවශ්‍යතා සඳහා ලංකාවට පැමිණෙන්නට ඇත. පෘතුගීසින්ට පෙර ලංකාවට කිතුනුවන් පැමිණි බවට එය ද සාක්ෂියකි.

5. අබුසයිද්ගේ සටහන්වල (ක්‍රි.ව. 911) "ලංකාවේ එවකට සිටි රජුගේ ඇමති මණ්ඩලයේ කිතුනුවන් හතර දෙනකු සේවය කළ බව" දැක් වේ.

6. බෙන්ජමින් රබායිගේ සටහන් අනුව 12 වන සියවසේ ලංකාවේ ජුදෙවු ක්‍රිස්තියානින් 2300 වු දෙනෙකු පමණ ද, පූජකවරුන් සිටි අතර දේවස්ථාන ද තිබිණි.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :**

1. ශ්‍රී ලංකාවේ ශු. සභාවේ ප්‍රධාන යුග 5 නම් කර, ඒවාට අදාළ වර්ෂයන් ලියන්න.
2. පෘතුගීසීන් පැමිණීමට පෙර ශ්‍රී ලංකාවේ කිතුනුවන් සිටි බවට ඇති සාක්ෂි 06 ලියන්න.
3. තුරුණු වියේ පසුවන ඔබට පැමිණෙන විවිධ අභියෝග හමු වේ කිතුනු විශ්වාසය සුරකින ආකාරය බිත්ති පුවත්පතිකින් දක්වන්න.

**ආශ්‍රිත ග්‍රන්ථ**


- දොන් පීටර් ඩබ්.එල්.ඒ. (පියතුමා) - **දේව ධර්ම නිකේතන ප්‍රකාශන,** අංක 10, පුබුදු මුද්‍රණාලය, තේවත්ත, රාගම (1995)
- කොළමුන්නේ තිමති (පියතුමා) - **සවිස්තර සිරිලක් කිතු සසුන (පළමුවන කාණ්ඩය) ,** ලෙට්‍රා ග්‍රැෆික්ස් - වැලිසර.
- සෝමරත්න, ජී. පී. වී., **ශ්‍රී ලංකාවේ ක්‍රිස්තු ශාසන ඉතිහාසය, පළමුවන කාණ්ඩය 1800 දක්වා,** කොළඹ දේව ධර්ම ශාස්ත්‍රාලය 2007.

**නිපුණතාව 9.0** : ශ්‍රී ලංකාවේ කිතුනු අනන්‍යතාවෙහි ලා සුබ අස්නේ පණිවිඩකරුවකු ලෙස සාක්ෂි දරයි.

**නිපුණතා මට්ටම 9.2** : ශ්‍රී ලාංකේය සන්දර්භයෙහි ලා තුළ ධර්මදූතයකු ලෙස කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 20

**ඉගෙනුම් පල**

- පෘතුගීසි යුගයේ ශ්‍රී ලංකාවේ කිතු දහම පිළිබඳ ව තොරතුරු ගොනු කරයි.
- පෘතුගීසි යුගයේ ධර්මදූතවරුන් කළ සේවය අගය කරයි.
- පෘතුගීසි යුගයේ ශ්‍රී ලංකාවේ කිතු දහම පිළිබඳ ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- කිතුනු අනන්‍යතාව සුරැකීමට දායක වෙයි.
- ධර්මදූත සේවය සඳහා සහයෝගය දක්වයි.

## හැඳින්වීම

## 9.2.1 පෘතුගීසි යුගයේ ශ්‍රී ලංකාවේ කිතු දහම (ක්‍රි.ව. 1505-1657)

### 9.2.1.1පෘතුගීසින් පෙරදිගට පැමිණීම

- 15-16 සියවස්වල යුරෝපයේ ඇති වූ පුනරුදයේ එක් අංගයක් වූයේ නව රටවල් සොයා යාම ය. පෘතුගීසිහු මහත් වෙහෙසක් දරා අප්‍රිකාවේ කේප් තුඩුව පසු කර නැඟෙනහිර අප්‍රිකානු වෙරළබඩ තොටුපළවල් කරා සේන්දු වූහ. එම උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස වස්කෝ ද ගාමා ඉන්දියාවට යන මුහුදු මාර්ග සොයා ගැනීමත් සමග පෘතුගීසින්ගේ වෙළඳ කටයුතු ආරම්භ විය. පෘතුගීසිහු ඉන්දියාවේ ගෝව නගරය තම පෙරදිග වෙළඳ මධ්‍යස්ථානය කර ගත්හ.

- පෘතුගීසීන් පෙරදිගට පැමිණීමට තවත් හේතුවක් වූයේ මුස්ලිම්වරුන් සතු ව තිබූ වෙළඳ අධිකාරිය සියතට ගැනීමේ අභිලාෂය යි.

- පෘතුගීසිහු පෙරදිගට පැමිණීමට තවත් අරමුණක් වූයේ ධර්ම ප්‍රචාරයයි. එම කාර්යයට ඔවුන් උනන්දු වූයේ **"පද්‍රොආද්‍රෝ"** සැලසුම නිසා ය.

**"පද්‍රොආඩෝ" හෙවත් යටත් විජිතවල කිතු සසුනේ ආරක්ෂක භාරය**

පෘතුගාලය හා ස්පාඤ්ඤය යන කතෝලික රටවල් දෙක පෙරදිග හා අපරදිග ප්‍රදේශවල දේශ ගවේෂණය කරමින් වෙළඳාම් කරන බවත්, එම රටවල් යටත් කර ගන්නා බවත් දුටු අතිඋතුම් සයවන ඇලෙක්සැන්ඩර් ශුද්ධෝත්තම පියතුමා ක්‍රි.ව. 1493.05.04 දින යුරෝපයෙන් බටහිර රටවල ධර්ම ප්‍රචාරය කිරීමේ වගකීම ස්පාඤ්ඤයට ද යුරෝපයෙන් නැඟෙනහිර රටවල කතෝලික ධර්මය ප්‍රචාරය කිරීමේ වගකීම පෘතුගාලයට ද පැවරීය. මෙය ''පද්‍රොආඩෝ'' හෙවත් ''යටත් විජිතවල ආරක්ෂක භාරය'' යනුවෙන් හඳුන්වනු ලැබේ.

පෘතුගීසිහු ඉන්දියානු සාගරයට සේන්දු වීමට පෙර පටන් තම යටත් විජිතවල ආගම පැතිරවීමේ අයිතිය රෝමය විසින් පුර්තුගීසින්ට පවරා තිබිණි.

### පඳ්‍රොආඩෝ සැලසුම යටතේ පැවරුණු වගකීම්

- යටත් විජිතවලට ධර්මදූතවරුන් ප්‍රවාහණය
- ඔවුන් ආරක්ෂා කිරීම
- මිල මුදලින් ආධාර දීම
- දෙව්මැඳුරු හා තාපසාරාම ඉදි කිරීම හා නඩත්තු කිරීම.
- ධර්මදූත සේවය, අධ්‍යාපනය හා දයා සේවා සඳහා මූල්‍යාධාර සැපයීම.

### ලොරෙන්සෝද අල්මේදා ලක්දිවට ගොඩබැසීම

එවකට පෘතුගාලයෙන් පත් කළ පෙරදිග ආණ්ඩුකාරයා වූයේ ෆ්‍රැන්සිස්කෝ ද අල්මේදා ය. ඔහුගේ පුත් ලොරෙන්සෝ ද අල්මේදා ඇතුළු නැව් කණ්ඩායමක් කොචින් නගරයෙන් ගමන් ඇරඹුවේ ඉන්දියන් සාගරයේ මාලදිවයින ප්‍රදේශයට ගමන් ගත් මුස්ලිම් වෙළඳ නැව් අල්ලා ගැනීමට ය. ඔවුන්ගේ ආගමික කටයුතු සඳහා ෆ්‍රැන්සිස්කාන නිකායික "විසෙන්ති" නම් පියතුමා ද විය. මාලදිවයින දෙසට යාමට අදහස් කළ ද කුණාටුවකට හසුවීම නිසා අහම්බෙන් ගාලු වරායට සේන්දු විය. තමන් ළඟා වූ රට ලංකාව බව දැනගත් ඔවුහු උතුරු දෙසට යාත්‍රා කර කොළඹ වරායට 1505.11.15 දින පැමිණියහ.

පසු ව එවකට කෝට්ටේ රජු වූ 9 වන ධර්මපරාක්‍රමබාහු රජු සමඟ සබඳකම් පවත්වා ගත් අතර පසු ව රජ වූ 6 විජයබාහු රජුගේ අවසරය ලබා වෙළඳ ගබඩාවක් කොළඹ ඉදි කළහ (1518). ඒ අසල කුඩා දෙව්මැඳුරක් තනා එය ලොරෙන්සෝ ද අල්මේදාගේ නාම සාන්තුවරයා වූ ශු. ලෝරන්ස් මුනිතුමාට කැප කරන ලදි. නැවියන් සමඟ සිටි ගරු විසෙන්ති පියතුමා විසින් එම දෙව්මැඳුරේ දිව්‍ය පූජාව සිදු කරන ලදී. පෘතුගීසින් පැමිණීමෙන් පසු ලක් දෙරණේ පැවැත්වූ ප්‍රථම දිව්‍ය පූජාව එය විය. එය පවත්වන ලද්දේ ලතින් භාෂාවෙනි.

### ධර්මදූතවරුන් ලක්දිවට පැමිණීම

1521 ඇති වූ විජයබා කොල්ලයෙන් පසු කෝට්ටේ රාජ්‍යය 6 වන විජයබාහු රජුගේ පුතුන් තිදෙනා අතර බෙදී ගියේ ය.

1. වැඩිමලා, 7 වන බුවනෙකබාහු - කෝට්ටේ
2. දෙවැන්නා, රයිගම් බණ්ඩාර - රයිගම
3. බාලයා, මායාදුන්නේ - සීතාවක

කෝට්ටේ පාලනය කළ 7 වන බුවනෙකබාහුගේ රාජ්‍යය වෙත සීතාවක පාලනය කළ මායාදුන්නේගෙන් තර්ජන එල්ල වූයෙන් තම රාජ්‍යය ආරක්ෂා කරගැනීමට හෙතෙම පෘතුගීසින්ගේ සහාය පැතී ය. සලප්පු ආරච්චි නම් රාජදූතයා පෘතුගාලයේ ලිස්බන් නුවරට යවා ඉල්ලීම් 4ක් ඉදිරිපත් කළේ ය.

1. මුනුබුරා වූ ධර්මපාල කුමරු තමන්ගෙන් පසු ව රජු වශයෙන් පත් කරන ලෙස
2. එය සංකේතවත් කරමින් තමා එවන ධර්මපාල කුමරුගේ පිළිරුවට ඔටුනු පලඳවන ලෙස
3. තමාට මෙන් ම ධර්මපාල කුමාරයාට කෝට්ටේ රාජධානිය තුළ ආරක්ෂාව සලසන ලෙස
4. ක්‍රිස්තියානි ධර්මය ප්‍රචාරය කිරීමට ධර්මදූතවරුන් එවන ලෙස.

ධර්මපාල කුමාරයා කෝට්ටේ රජකමට පත් කරන බවට පෘතුගාලයේ 3 වන ජුවන් රජතුමා සහතික කරමින් ධර්මපාල කුමරුගේ පිළිරුවට ඔටුනු පැලඳවී ය. බුවනෙකබාහු රජුගේ ඉල්ලීම පරිදි ක්‍රිස්තියානි ධර්මය ප්‍රචාරය සඳහා ක්‍රි.ව. 1543 ජෝන් විලා ද කොන්දේ පියතුමාගේ නායකත්වය යටතේ ෆ්‍රැන්සිස්කාන ධර්මදූතවරුන් පස්දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් ලංකාවට පැමිණිය හ.

- ගරු ජුවන් ද විලා ද කොන්දේ පියතුමා
- ගරු අන්තෝනියෝ පද්‍රාම් පියතුමා
- ගරු ෆ්‍රැන්සිස්කෝ ද මොන්තෙප්‍රන්දෝනේ පියතුමා
- ගරු සීමන් ද කොයිම්බ්‍රා පියතුමා
- ගරු ගොන්සාලෝ පියතුමා

භුවනෙකබාහු රජතුමා තම වැසියන් කතෝලික දහම වැලඳගන්නවාට අකමැති විය. එහෙත් දේශපාලන වාසි තකා ෆ්‍රැන්සිස්කාන ධර්මදූතවරුන්ගේ ආර්ථික අවශ්‍යතා සපුරා ලීමට රජතුමා ඉදිරිපත් විය. ලංකාවේ උතුරු හා බටහිර ප්‍රදේශ තම සේවයට යොමු කර ගනිමින් ධර්මදූතවරු ඉතා උද්යෝගවත් ව දහම් ප්‍රචාර කටයුතුවල නිරත වූහ. තමනට අයත් ප්‍රදේශවල තැනින් තැන දෙව්මැඳුරු තනා ජනයාට ආගම ධර්මය උගන්වා කුඩා කණ්ඩායම් බව්තීස්ම කර කිතුනු සංඝ ආරම්භ කළහ. 1551 පමණ වන විට මීගමුව, පාණදුර, කළුතර, මග්ගොන, බේරුවල, ගාල්ල හා වැලිගම යන මුහුදුබඩ ප්‍රදේශවල දෙව්මැඳුරු විශාල සංඛ්‍යාවක් ඉදි වී තිබිණි. එමෙන් ම පාඨශාලා ආරම්භ කරමින් කිතුනු අධ්‍යාපනයක් ද ලබා දීමට කටයුතු කෙරිණි.

1551 භුවනෙකබාහු රජුගේ මරණින් පසු ධර්මපාල කුමරු රජ විය. 1557 ධර්මපාල රජු “දොන් ජුවන් ධර්මපාල” ලෙස කතෝලික දහම වැලඳ ගත්තේ ය. ගරු ජුවාන් ද විලා ද කොන්දේ පියතුමා අතින් බවුතීස්මය ලැබී ය. ප්‍රථම සිංහල කතෝලික රජතුමා මොහු ය. රජ පවුලේ බොහෝ දෙනෙක් ද කතෝලික දහම වැළඳ ගත්හ.

දරුවන් නොසිටි හෙයින් පෘතුගීසින් හට තෑගි ඔප්පුවකින් තමන්ගෙන් පසු කෝට්ටේ රාජධානියේ පාලනය පෘතුගාලයට පවරා තිබූ හෙයින් 1597 ධර්මපාල රජුගේ මරණින් පසු කෝට්ටේ රාජ්‍යය පුර්තුගීසි යටත් විජිතයක් බවට පත් විය. එම නිසා ධර්ම ප්‍රචාරයට වැඩි නිදහසක් හා අවස්ථාවත් උදා වුව ද ලංකාව පෘතුගාලයේ යටත් විජිතයක් වීම කණගාටුවට කරුණකි. ඒ අනුව, මෙරට සේවය සඳහා වෙනත් නිකායික ධර්මදූතවරුන් ද ගෙන්වා ගැනීමට එවකට ලක්දිව පාලනය කළ කෝච්නයේ රදගුරුතුමා ක්‍රියා කළේ ය. එහි ප්‍රතිඵලය ලෙස 1602 දී ජේසු නිකායික ධර්මදූතවරු, 1605 දී දොමිනිකාන නිකායික ධර්මදූතවරු, 1606 දී අගොස්තීනු නිකායික ධර්මදූතවරු ලංකාවේ දහම් සේවයට පැමිණියහ. රදගුරුතුමා විසින් ඔවුනට සේවය සඳහා ප්‍රදේශ බෙදා දෙන ලදි.

| | | |
|---|---|---|
| ජේසු නිකාය | → | මහ ඔයෙන් උතුර |
| අගොස්තීනු නිකාය | → | සතරකෝරළ |
| දොමිනිකාන නිකාය | → | සබරගමුව සහ දෙකෝරළය |
| ෆැරැන්සිස්කාන නිකාය | → | සෙසු ප්‍රදේශ |

ධර්මදූතවරු දහම් ප්‍රචාරය පමණක් නොව විවිධ සමාජ සේවාවල නිරත වූහ. ඒ අතර අධ්‍යාපනය විශේෂ විය. දෙව්මැඳුරු අසල කුඩා පාසල් ඉදි කර දරුවනට මූලික අධ්‍යාපනය හා ආගම ධර්මය ඉගැන්වූහ. ඊට අමතර ව ජේසු නිකායික පියවරුන් “කොලීජි” නමින් උසස් පාසල් කිහිපයක් අරඹා උසස් අධ්‍යාපනයට අවස්ථාවක් ලබාදුන්හ.

අධ්‍යාපනයට අමතර ව අනාථ දරුවන් රැකබලා ගැනීම, රෝගීන්ට උපස්ථාන කිරීම, මහලු අය රැකබලා ගැනීම, කාර්මික පාසල් ආරම්භ කිරීම හා පුණ්‍ය ආයතන පවත්වාගෙන යාම වැනි සේවා ද පෘතුගීසි යුගයේ ධර්මදූතවරුන්ගෙන් ඉටු විය.

## 9.2.1.2 පෘතුගීසි යුගයේ මුහුදුබඩ ප්‍රදේශවල කිතු දහම ව්‍යාප්තිය

### ෆැරැන්සිස්කාන ධර්මදූතවරු

1628 වන විට ෆැරැන්සිස්කාන ධර්මදූතයන්ට භාර දෙන ලද ප්‍රදේශවල දෙව්මැඳුරු 54ක් පමණ විය. 1621 වන විට ලංකාවේ සේවය කළ ෆැරැන්සිස්කාන පියවරු සංඛ්‍යාව 45කි. 1631 වන විට ෆැන්සිස්කාන පියවරුන් සේවය කළ දෙව්මැඳුරුවලට අයිති වූ කතෝලිකයන් සංඛ්‍යාව 71,074 කි.

### ජේසු නිකාය

ජේසු නිකායික පියවරු, තමන්ට භාර වූ ප්‍රදේශයේ විවිධ ස්ථානවල පැවිදි නිවාස (ආරාම) පිහිටුවාගෙන, ඒ ස්ථානවල හා අවට පෙදෙස්වල ජනතාවට සේවය කළෝ ය. ආරාමයක එක් පූජකවරයෙක් හෝ නැවතී සිටියේ ය. එක් එක් ආරාමයට යාබද ව දෙව්මැඳුරක් ද විය. ඇතැම් විට අසල ගම්වල තවත් දෙව්මැඳුරු ද ඉදි කරනු ලැබී ය. එක් එක් ආරාමය, මීසමක කේන්ද්‍රස්ථානය වූයේ ය. 1644 වසරේ වාර්ෂික වාර්තාව අනුව මැටියගම, කම්මල, මාදම්පේ, හලාවත, මුන්නේශ්වරම, කල්පිටිය සහ ඒක්කාලේ යන ස්ථානවල ජේසු නිකායික ආරාම හෙවත් මීසම් තිබුණු බව හෙළි වේ.

### අගොස්තීනු නිකාය

අගොස්තීනු නිකායයට භාර දෙන ලද සතර කෝරළේ තැනින් තැන මීසම් පිහිටුවන ලදි. දූනගහ, රඹුක්කන, බෙන්තොට, හලුගම, අත්තනගල්ල, වැලිවේරිය, මාපිටිගම, කල්එළිය, අම්පේ, පිටිගල්දෙණිය, හොරණ, නාරාහේන්පිට සහ හඳුනාගෙන නැති තවත් තැනක ද දෙව්මැඳුරු තිබිණි. එක් එක් මීසම ආරම්භ කළ පියතුමාගේ නම ද මීසමේ දෙව්මැඳුරු කැප කරන ලද්දේ කිනම් මුනිවරයාට, මුනිවරියට ද යන්න ද මීසමට අයත් වැඩිහිටියන් සංඛ්‍යාව ද ජේසු නිකායික ලේඛනවල සඳහන් වේ.

### දොමිනිකාන නිකාය

දොමිනිකාන පියවරුන්ගේ ලංකා සේවය පිළිබඳ ව වැඩි තොරතුරු ලැබී නැත. 1605 දොමිනිකාන පියවරුන් දෙදෙනකු කොළඹට පැමිණ, ජපමාල දේව මාතාවන් නමින් දෙව්මැඳුරක් ඉදිකොට, ජපමාල සමාගමක් ද ආරම්භ කළ බව කියවේ. මේ දෙව්මැඳුරේ තිබුණු අකුරු කෙටූ ගල් පුවරුවක් දැන් කොළඹ කෞතුකාගාරයේ ඇත.

කොළඹ ශු. සෙබස්තියන් මුනිඳුන්ට කැප කළ දෙව්මැඳුරක් දොමිනිකාන පියවරුනට භාර වී තිබිණි. ඔවුන්ට වෙන් කරන ලද සබරගමුව (රත්නපුරය) සහ දෙ කෝරළය ප්‍රදේශයන්හි ඔවුන්ගේ සේවාව ලද දෙව්මැඳුරු 12ක් විය. ඒ හැර ගාල්ලේ ද දොමිනිකාන දෙව්මැඳුරු දෙකක් තිබිණි. එකක් නගරයේ ද අනික නුදුරු ගමක ද පිහිටියේ ය.

## 9.2.1.3 පෘතුගීසි ධර්මදූතවරුන්ගේ ප්‍රයත්නය සාර්ථක වීමට බලපෑ හේතු

- **ධර්මදූතවරුන්ගේ දැඩි කැපවීම හා උද්යෝගය**

නොදන්නා දේශයක නාඳුනන සෙනඟකට සේවය කිරීමේ දී භාෂාව, සංස්කෘතිය හා දේශගුණය නුහුරු නුපුරුදු වුව ද ඒවාට හැඩ ගැසෙමින් තම සේවාවට දක්වූ කැපවීම හා උද්යෝගය පුර්තුගීසි ධර්මදූත ව්‍යාපාරයේ සාර්ථකත්වයට හේතුවක් විය.

- **ධර්මය ප්‍රචාරය කිරීමට ධර්මදූතවරුන් අනුගමනය කළ ධර්ම ප්‍රචාර ක්‍රම**

  ★ දේශීය භාෂා ඉගෙන ගෙන එම භාෂාවලින් ම ධර්මය ප්‍රචාරය කිරීම.

  ★ ආගමික පතපොත දේශීය භාෂාවන්ගෙන් ලිවීම.

  ★ කුඩා දරුවන්ට දහම ඉගැන්වීමට ප්‍රාථමික පාසල් ඇරඹීම.

  ★ විවිධ දයා සේවාවන්හි නිරත වීම.

  ★ නාට්‍ය, පෙරහැර යාම, සුරුවම් භාවිතය වැනි ක්‍රම මගින් ආගමික ප්‍රබෝධයක් ඇති කිරීම.

- **ධර්මදූතයන්ගේ සරල, චාම් ජීවිත රටා හා ආදර්ශවත් දිවි පැවැත්ම (අල්පේච්ඡ ජීවිතය)**

කතෝලික ධර්මදූතවරුන් සතු ව පැවති සරල ජීවිත ක්‍රමය ලාංකේය ජන ජීවිතයට සමීප වූ නිසා ධර්මදානීය කටයුතු පහසුවෙන් කරගත හැකි වීම.

- **කුල භේදය නොතැකීම**

එවකට ලංකාවේ පැවති වැඩවසම් ක්‍රමය යටතේ ජනතාව අතර කුල භේදය පැවතුණි. කුලය නිසා උස් පහත් භේද පැවතිණි. එහෙත් පෘතුගීසි ධර්මදූතවරු සැමට සමාන ලෙස සලකා හා සේවය සැලසූහ. ජනතාව ආකර්ශනය ලැබීමට හේත විය.

- **කිතුනු ධර්මය ධීවර ජනතාවට ඉතා සමීප වීම.**

ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රාවකයෝ ධීවරයෝ වූහ. මෙරට වෙරළබඩ ජීවත් වූ ජනයා අතර කිතු දහම ප්‍රචලිත වීමට එය ද හේතුවක් විය.

- **ධර්මදූතවරුන්ට පෘතුගීසි පාලකයන්ගෙන් ලැබුණු අනුග්‍රහය**

පෘතුගීසි පාලන ප්‍රදේශවල දහම් ප්‍රචාරය පූර්ණ නිදහස හා අනුග්‍රහය පෘතුගීසි රජයෙන් ලබා දෙන ලදී.

## 9.2.1.4 පෘතුගීසි ධර්මදූත ප්‍රචාරයේ ඌනතාව

පෘතුගීසි යුගයේ දී අවුරුදු සියයකටත් අධික කාලයක් යුරෝපීය ධර්මදූතවරු මෙරට සේවය කළ ද ඔවුහු දේශීය පූජකවරුන් ව පුහුණු කිරීමට හෝ සුදානම් කිරීමට හෝ ක්‍රියා නොකළහ. එහි අනිටු ප්‍රතිඵලය දිස්වූයේ ලන්දේසි යුගයේ ය. ලන්දේසීන් ලක්දිව සේවය කළ විදේශීය ධර්මදූතවරුන් මෙරටින් පන්නා දැමීම නිසා දේශීය කතෝලික ජනතාවට සේවය කිරීමට ලක්දිව කතෝලික පූජකයෝ නොමැති වූහ.

## 9.2.1.5 ප්‍රථම ශ්‍රී ලාංකික ප්‍රාණපරිත්‍යාගිවරු

1542 දකුණු ඉන්දියාවේ සේවයට පැමිණි ප්‍රැන්සිස් සාවියර් තුමා ඉන්දියාවේ ගිණිකොණදිග මුහුදුකරයේ විසූ සෙනඟට සේවය කළේ ය. එහි විසූ පරවර, කරෙයියාර් වැනි කුලවල ජනයාව කිතු දහම පිළිබඳ පැහැදී බෞතීස්මය ලබා ගත්තෝ ය. ඒ පිළිබඳ ව අසන්නට ලැබුණු ලංකාවේ මන්නාරම් දූපතේ විසූ කරෙයියාර් කුලයේ ජනයා ද ෆ්‍රැන්සිස් සාවියර් තුමාට ලංකාවට පැමිණීමට ආරාධනා කළේ ය. එතුමා කාර්ය බහුල වූ බැවින් එතුමාගේ නියෝජිතයකු මන්නාරමට එවී ය. එවිට සිය ගණන් හින්දු භක්තිකයෝ ක්‍රිස්තියානි ධර්මය වැලඳ ගත්හ. ඒ පිළිබඳ ව උරණ වූ හින්දු පූජකයන් විසින් මේ බව යාපනයේ සංකිලි රජුට දන්වා යවන ලදි.

එයින් කුපිත වූ සංකිලි රජ හමුදාවක් යවා කිතුනුවන් 600 පමණ දෙනා මරා දැමූහ. එම කිතුනුවන් පිරිස "මන්නාරමේ ප්‍රාණපරිත්‍යාගිවරුන්" ලෙස හැඳින්වෙති.

### 9.2.1.6 කිතු දහම වැලඳගත් රජ දරුවෝ

#### 1. ධර්මපාල කුමාරයා

7වන බුවනෙකබාහු රජුගේ මුනුපුරා වූ ධර්මපාල කුමාරයා දොන් ජුවන් ධර්මපාල නමින් බෞතිස්මය ලැබී ය. පෘතුගීසින්ගෙන් උපකාර අවශ්‍ය වූයෙන් ද රටවැසියන්ගෙන් විශාල ප්‍රමාණයක් කතෝලික දහම වැලඳ ගත් නිසා ද ධර්මදූතවරුන්ගේ උත්සාහය නිසා ද කතෝලික ධර්මය වැලඳ ගත්තේ ය.

#### 2. ජයවීර බණ්ඩාර

මහනුවර රජකම් කළ වික්‍රමබාහු රජුගේ පුත්‍රයා ය. පෘතුගීසි උදව් පතා කිතු දහම වැලඳ ගත්ත ද සීතාවක රාජසිංහ රජුගේ ආක්‍රමණ නැවතුණ පසු කතෝලික ධර්මය ප්‍රතික්ෂේප කළේ ය.

#### 3. කරලියද්දේ බණ්ඩාර

මොහු ජයවීර බණ්ඩාරගේ පුතා ය. මහනුවර ධර්මය ප්‍රචාරය කිරීමට නිදහස ලබා දිනි. 1 රාජසිංහ මහනුවර ආක්‍රමණය කළ විට පෘතුගීසින්ගේ ආරක්ෂාව පතා ත්‍රිකුණාමලයට පලා ගිය අතර රජ පවුලේ සියලු දෙනා ම කිතු දහම වැලඳ ගත්තෝ ය.

#### 4. වීර සුන්දර බණ්ඩාර

උඩරට කුමාරයකු වූ මොහු පෘතුගීසින් විසින් ගෝවට යවනු ලදුව "වික්ටර් ලෙපානෝ" නමින් බවුතිස්මය ලැබී ය.

#### 5. දෝන කතිරිනා (කුසුමාසන දේවි)

කරලියද්දේ බණ්ඩාරගේ දියණිය ය. මහනුවර රජකම ලබා දීමට පෘතුගීසි හමුදා විසින් මහනුවරට ගෙනයනු ලැබුවාය. පෘතුගීසින් පරාජය වීම නිසා දෝන කතරිනා කුමරිය විමලධර්මසූරිය රජු අතට පත්විය. ඇය විමලධර්මසූරිය රජුගේ හා පසු ව සෙනරත් රජුගේ බිසව බවට පත් විය. ආගම ඇදහීමට බාධා ඇති විය.

#### 6. දොන් ජුවම් යමසිංහ

මහනුවර පිලිප් යමසිංහ රජුගේ පුත්‍රයා ය. ඉන්දියාවේ ගෝව නගරයෙන් අධ්‍යාපනය ලැබ පෘතුගාලයේ කොයිම්බ්‍රා විශ්වවිද්‍යාලයේ දේව ධර්මය හදාරා පූජකවරය ලැබී ය. ලිස්බනයේ 'ටෙල්හෙරාස්' නම් ස්ථානයේ දෙව්මැඳුරක් ද එතුමා විසින් තනන ලදි.

#### යාපන රජ පවුලේ කුමර-කුමරියෝ

පරරාජසේකරන්ගේ දරුවෝ පෘතුගීසින් විසින් කොළඹට ගෙන්වා කුමරු 'කොන්ස්තන්තීනු' නමින් ද කුමරියෝ දෙදෙනා 'ඉසබෙල්' හා 'මරියා' නමින් ද බවුතිස්ම ලැබූහ. කුමරු ගෝවට යැවූ අතර ෆැරැන්සිස්කාන නිකායේ පූජකවරයෙක් විය. කුමරියෝ දෙදෙනා ගෝවේ අගුස්තීනු නිකායේ කන්‍යා සොහොයුරියෝ වූහ.

### 9.2.1.7 පෘතුගීසි පාලනයේ ප්‍රතිඵල

- පෘතුගීසින් ලංකාවට පැමිණීමත් සමඟ හිමි වූ විශේෂිත ම දායාදය වූයේ කතෝලික දහම යි.

- අපරදිග භාෂා හා අපරදිග අධ්‍යාපන ක්‍රම මෙරට ව්‍යාප්ත වීම.

- විධිමත් පාසල් අධ්‍යාපනය ලබා දීමේ ක්‍රමවේදය ආරම්භ වීම.

- පෘතුගීසි සංස්කෘතියේ ආභාසය නිසා මෙරට සංස්කෘතියට හා ජන ජීවිතයට නව අංග ලෙස පෘතුගීසි ගායනා, සංගීතය, නැටුම් ආදිය (බයිලා, කපිරිඤ්ඤා) එක් වීම.

- පෘතුගීසි භාෂාව ජනයා අතර ව්‍යාප්ත වීම සිංහල භාෂාවේ පෝෂණයට රුකුලක් වීම උදා:- කොන්ත, කුරුස, සුරුවම, කොකිස්, අල්මාරි, පෙට්ටගම, ආරුක්කු, පාන් ආදි වචන එක් වීම.

- විවාහයේ ස්ථාවරත්වය තහවුරු වීම හා මෙරට පැවති එකගෙයි කෑම වැනි බහු විවාහ ක්‍රම අහෝසි වීම. එකගෙයි කෑම උඩරට විවාහ නීතියෙන් අදත් පිළිගන්නා විවාහ ක්‍රමයකි. එය තවමත් සිදු වේ.

- අධ්‍යාපනයට ආගම සම්බන්ධ කිරීම (අධ්‍යාපනයෙහි දී ආගම විෂයයට අද පවා වැදගත් තැනක් හිමි වීම එහි බලපෑමකි.

- "පෘතුගීසි දයා සංගමය" මඟින් දිළින්දන්ට, රෝගීන්ට, මහලු අයට හා අසරණයන්ට පිහිට වීමට සමාජ සේවා කටයුතු ක්‍රියාත්මක කිරීම.

- බටහිර වෛද්‍ය ක්‍රමය ආරම්භ වීම හා රෝහල් පිහිටුවීම.

- ප්‍රථම සිංහල හටන් කාව්‍ය වන 'කුස්තන්තීනු හටන' මෙම යුගයේ රචනා වීම. කර්තෘ :- අලගියවත්ත මුකවැටි පඬිතුමා

- උපත් හා මරණ ලියාපදිංචිය ආරම්භ වීම නිසා විධිමත් තෝම්බු ක්‍රමයක් බිහි වීම.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :**

1. "පද්‍රොආඩෝ" යනුවෙන් හඳුන්වනු ලබන්නේ කුමක් ද? යන්න විස්තර කරන්න.
2. මායාදුන්නේ රජු පෘතුගාලයෙන් කළ ඉල්ලීම් 04 ලියන්න.
3. පෘතුගීසි ධර්මදූතවරුනගේ ප්‍රයත්නය සාර්ථක වීමට බල පෑ හේතු 06 ක් ලියන්න.
4. පෘතුගීසි පාලනය තුළින් ලංකාවට අත් වූ යහපත් ප්‍රතිඵල 10 ක් ලියන්න.

**ආශ්‍රිත ග්‍රන්ථ**


- දොන් පීටර්, ඩබ්.එල්.ඒ. (පියතුමා), ලක්දිව කතෝලික උදාව - **දේව ධර්ම නිකේතන ප්‍රකාශන,** අංක 10, පුබුදු මුද්‍රණාලය, තේවත්ත, රාගම (1995)

**නිපුණතාව 9.0 : ශ්‍රී ලංකාවේ කිතුනු අනන්‍යතාවෙහි ලා සුබ අස්නේ පණිවිඩකරුවන් ලෙස සාක්ෂි දරයි.**

**නිපුණතා මට්ටම 9.3 :** බාධක හමුවේ විශ්වාසයට සාක්ෂ්‍ය දරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 20

**ඉගෙනුම් පල**

- ලන්දේසි යුගයේ ශ්‍රී ලංකාවේ කිතු දහම පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- ශුද්ධ වූ ජුසේ වාස් පියතුමන් ප්‍රමුඛ ඔරතෝරියානු නිකායික පියවරුන්ගෙන් මෙරට කිතුනු සභාවට වූ සේවය අගය කරයි.
- ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- සැබෑ ධර්මදූතයකු ලෙස කටයුතු කරයි.
- කිතුනු සාහිත්‍යය පෝෂණය කිරීමට අන් අයට සහයෝගය දක්වයි.

## 9.3.1 ලන්දේසි යුගයේ ශ්‍රී ලංකාවේ කිතු දහම

### ලන්දේසීන් ශ්‍රී ලංකාවට පැමිණීම

- කෝට්ටේ රාජ්‍යය හා යාපනයේ රාජ්‍යය පෘතුගීසි පාලනයට යටත් ව තිබුණ නමුත් කන්ද උඩරට රාජ්‍යය ස්වාධීන ව සිංහල රජ කෙනෙකු යටතේ විය. සිංහල රජුටත්, රට වැසියන්ටත් පෘතුගීසි පාලනය නීරස වීමට බලපෑ හේතු රැසකි.
    - තම රට විදේශිකයනට යටත් ව තිබීම.
    - ඇතැම් පුර්තුගීසි පාලකයන්ගේ හා නිලධාරීන්ගේ කෲරකම් හා අකටයුතුකම්.
    - යුද්ධවලින් ලේ සෙලවීමත්, ජීවිත විනාශයත් සිදු වීම.
    - පෘතුගීසීන් තම ආගමය මුවාවෙන් මෙරට බෞද්ධයන්ට නොයෙකුත් හිරිහැර කිරීම.
- ක්‍රි.ව. 1638 දී කන්ද උඩරට පාලකයා වූ 2 වන රාජසිංහ රජතුමා විසින් ලන්දේසී ඇඩම් වෙස්ටර්වෝල්ඩ් නමැති ඕලන්ද නියෝජිතයා සමඟ පෘතුගීසින් මෙරටින් නෙරපා දැමීමට ගිවිසුමක් අස්සන් කරන ලදි. ක්‍රි.ව. 1638 අස්සන් කරන ලද මෙම ගිවිසුමට අනුව ලන්දේසීහු මුහුදුබඩ පළාත්වල පිහිටි පෘතුගීසි බලකොටුවලට පහර දීමට පටන් ගත්හ. ක්‍රි.ව. 1658 දී ලන්දේසීන් යාපනය කොටුව අල්ලා ගැනීමත් සමඟ ඔවුන්ට ලංකාවේ මුහුදුබඩ පළාත්වල පාලනය හිමි විය.

### පෘතුගීසීන් හා ලන්දේසීන් අතර පැවති භේදය

- 16 වන ශතවර්ෂයේ දී ඇතිවූ රෙපරමාදු ආගමික ප්‍රතිසංස්කරණයේ දී ඕලන්දය ජෝන් කැල්වින්ගේ රෙපරමාදු දහමට යොමු වු නමුත් කතෝලික දහම අනුව පෘතුගාලය කටයුතු කිරීම.
- ආගමය හා වෙළඳාම මුල් කර ගෙන පෘතුගීසින් හා ලන්දේසින් අතර වෛර සහගත හැඟීමක් ඇති වීම.
- 16 වන ශතවර්ෂය අග භාගයේ දී ඕලන්දය ස්පාඤ්ඤ ආධිපත්‍යයෙන් මිදී යුරෝපයේ ප්‍රබල රටක් බවට පත් වීම.
- ඕලන්දය ප්‍රබල බලසම්පන්න රටක් වීමට හේතු වූයේ වෙළෙඳ සමාගම් කීපයක් එකට සම්බන්ධ කිරීමෙන් සංවිධාන කරන ලද" පෙරදිග ඉන්දීය වෙළඳ සමාගම" පිහිටුවා ගැනීම.
- මෙම සමාගමේ පරමාර්ථය වෙළඳාම දියුණු කිරීම.
- මෙම සමාගමේ පොදු විධිවිධාන අතරේ කතෝලිකයන්ට විරුද්ධ වූ නියෝග ඇතුළත් වීම.

## ලන්දේසීන්ගේ කතෝලික විරෝධ ප්‍රතිපත්ති

### 1682 ජූලි 01 දරන ආඥා පනතින් කතෝලිකයන්ට විරුද්ධ ව පනවා තිබූ නියෝග

- ප්‍රසිද්ධියේ හෝ අප්‍රසිද්ධියේ හෝ රැස්වීම් පැවැත්වීම තහනම් ය.
- කතෝලික වත්පිළිවෙත් පැවැත්වීම හා ඒවාට සහභාගි වීම තහනම් ය.
- පූජකවරයකු නැති ව ධර්ම දේශනාවලට සවන් දීම හා ගී ගැයීම තහනම් ය.
- තමන්ගේ නිවෙස්වල කිතුනු ප්‍රතිමා හා චිත්‍ර තබා ගැනීම තහනම් ය.
- කිසි ම පූජකවරයකු විසින් වත්පිළිවෙත් පැවැත්වීම තහනම් ය.
- පූජකවරුන් විසින් කිසිවකුට බව්තීස්මය ලබාදීම තහනම් ය.
- මෙලෙස තහනම් කර ඇති කිසිවක් කරන අයටත්, ඒවාට හවුල් වන අයටත් තම නිවෙස්වල ඒවා පැවැත්වීමට අනුබල දෙන පුද්ගලයන්ටත් දඩ ගැසීමට, සිර දඬුවම් ලැබීමට හෝ අන් දරුණු දඬුවම්වලට හෝ යටත් වීමට සිදු විි.
- විදේශිය පූජකවරුන් එවැනි වරදකට අසු වුවහොත් දඬගැසීම හෝ රටින් පිටුවල් කිරීම හෝ සිදු කෙරේ.

## ලන්දේසීන් මෙරට කතෝලිකයන්ට පීඩා කිරීමට හේතු

- කතෝලික ආගමය රෙපරමාදු ලන්දේසින් නොරිස්සූ ආගමයක් වීම. කතෝලික භක්තිකයන් ප්‍රතිමා වන්දනාව, සාන්තුවරයන් පිදීම, දිව්‍ය පූජාව පැවැත්වීම වැනි වත්පිළිවෙත් සිදු කළ ද ලන්දේසින් ඒවා මිථ්‍යාදෘෂ්ටික ඇදහිලි ලෙස සැලකීම.
- කතෝලික දහම මෙරට කතෝලිකයන් හා පුර්තුගීසින් අතර ප්‍රබල පුරුකක් වනු ඇතැයි සිතීම.
- කතෝලිකයන් හා පුර්තුගීසින් අතර පැවති සම්බන්ධතාව නිසා මෙරට කතෝලික ජනතාව ලන්දේසින්ට පක්ෂපාත නොවනු ඇතැයි සිතීම.
- දේශීය ජනතාව කතෝලික දහම සමග සමීප සම්බන්ධතාවක් දිගින් දිගට ම පවත්වාගෙන යාම ලන්දේසි පරිපාලනයට හිතකර නොවීම.

## ලන්දේසි පීඩන හමුවේ මෙරට කතෝලිකයන්ගේ ප්‍රතිචාර

- මීගමුව හා හලාවත ප්‍රදේශවල විසූ කතෝලිකයන් තමන් රෙපරමාදු ධර්මය වැලඳ ගැනීමට අකැමැති බව ප්‍රසිද්ධියේ කියා සිටීම.
- මීගමුවේ කතෝලික පිරිස අතර නායකත්වය දැරූ දොන් අපොන්සු පෙරෙයිරා නම් ප්‍රභුවරයාට කතෝලික ධර්මය වෙනුවෙන් තමා සතු සියල්ල පරිත්‍යාග කිරීමට සිදු වීම සහ බොහෝ දුක් කරදර කිරීමෙන් ඔහු පසු රටින් පිටුවහල් කිරීම.
- කතෝලික පූජාප්‍රසාදිවරයකු සිටි නැවක් කොළඹ වරායට පැමිණි හැම විට ම කොළඹ නගරයේ කතෝලිකයන් තමනට සිදු විය හැකි කරදර නොතකා, නැවට ගොස් දේව ප්‍රසාද නිධාන ලබා ගැනීම.
- ඉරුදින එක් ව දේව වන්දනාව පැවැත්වීමට නොහැකි වූ නිසා කතෝලිකයන් තම නිවසේ දී තමන්ට හැකි ආකාරයෙන් යාච්ඤා කිරීම.
- දරුවන්ට යාච්ඤා ඉගැන්වීම.
- තමන් කතෝලිකයන් වීමේ බාහිර ලකුණක් වශයෙන් ජපමාල සහ කුරුස පැලැඳීම.

## ලන්දේසි යුගයේ අධ්‍යාපනය

- පෘතුගීසීන්ට වඩා ක්‍රමානුකූල හා සංවිධානාත්මක බවකින් යුතු අධ්‍යාපනයක් මෙරට ක්‍රියාත්මක කිරීම.
- ලන්දේසි යුගයේ දී සෑම දේවස්ථානයක් අසල ම පාසලක් පිහිටුවීම.
- ලන්දේසි යුගයේ දී අධ්‍යාපනය අනිවාර්ය වූ අතර, සියලු ම ළමයින් පාසල්වලට යැවීම අනිවාර්ය වීම.
- ළමයි පාසල් නොයවන දෙමවුපියන්ට දඩ ගැසීම.
- පාසල් නොපැමිණෙන දරුවන් පිළිබඳ ව තොරතුරු රැස් කිරීමට දඩ මුදල් එකතු කිරීමට කතිකිස්තවරුන් පත් කිරීම.
- වයස අවුරුදු 15ක් තෙක් අනිවාර්ය වූ අධ්‍යපනය අවසන් වූ විට පාසලෙහි විභාගයක් පවත්වා ලාගීර්ඩන් නමැති සහතික ප්‍රදානය කිරීම.
- ඉන් නොනැවතී ළමයින්ට වයස අවුරුදු 19 තෙක් අධ්‍යාපනය ලැබීමට අවකාශ සලසා තිබීම.
- වඩා දක්ෂ ළමයින්ට උසස් අධ්‍යාපනයට, ගුරු පුහුණුවට හා සමහර විට උසස් අධ්‍යාපනය සඳහා විදේශගත වීමට ඉඩ සැලසීම.
- අධ්‍යාපනය පිළිබඳ සෘජු වගකීම ලන්දේසී රජය විසින් බාර ගැනීම.
- ස්කොලාකල් කොමිසම නමැති විශේෂ ආයතනයක් මඟින් පාසල්වලට ගුරුවරුන් පත් කිරීම, පාලනය කිරීම, පරීක්ෂකවරුන් මඟින් පාසල් නිරීක්ෂණය.

## ලන්දේසි පාලන සමයේ හිතකර ලක්ෂණ

- වෙළඳාම දියුණු කිරීම හා ආර්ථික භෝග වගාවට යොමු වීම නිසා මෙරට ආර්ථිකයේ පණ ගැන්වීමක් සිදු වීම.
- වෙළඳ කටයුතු සඳහා මංමාවත් සෑදීම, ඇළදොළ පිළිසකර කිරීම හා ප්‍රවාහණය සඳහා ජල මාර්ග යොදා ගැනීම.
- රෝම ලන්දේසී නීතිය මෙරටට හඳුන්වාදීම, අධිකරණ මඟින් නඩු ඇසීම හා නීත්‍යනුකූල ව දඬුවම් පැමිණවීම.
- පරිපාලන කටයුතු මනා ලෙස සංවිධානය කරමින් කච්චේරි ආරම්භ කිරීම, පුරවැසියන්ගේ උපත, විවාහ, මරණය වැනි දේවල් ලියාපදිංචි කිරීම ( තෝම්බු ) සැකසීම ඇරඹීම.
- අධ්‍යාපන කටයුතු මනා ලෙස සංවිධානය කිරීම.
- ඕලන්ද රෙපරමාදු දහම මෙරට පැතිරියාමෙන් එම දහමේ හරය මෙරට ජන සමාජයට මුසු වීම.
- මුද්‍රණ යන්ත්‍ර මෙරටට හඳුන්වාදීම, ශුද්ධ බයිබලය සිංහලයට පරිවර්තනය හා ජනයා අතර ව්‍යාප්ත කිරීම ආරම්භ වීම.
- වයස අවුරුදු 15 තෙක් අනිවාර්ය අධ්‍යාපනය.

## ශුද්ධ වූ ජුසේ වාස් මුනිතුමාගෙන් ලක් සසුනට වූ සේවය

- ශ්‍රී ලංකාවේ ලන්දේසි පාලන සමයේ අවුරුදු 30 පමණ එක ම කතෝලික පූජකයකවත් නොමැති සමයක ඉන්දියාවේ සිට ශුද්ධවර ජුසේ වාස් මුනිතුමා 1687 දී මන්නාරම් මුහුදු වෙරළට කුලීකරුවකු සේ පැමිණීම.
- මෙතුමා හිඟන්නකු ලෙස වෙස් වළාගෙන ජෝන් සමඟ මන්නාරම් මුහුදු තීරයේ කතෝලිකයන් සොයා යාම.
- මන්නාරමේ සිට යාපනය තෙක් ශු. ජපමාලය ගෙලෙහි පැලඳගෙන කිතුනුවන් සොයා යාම.

- පුංචි රෝමය වශයෙන් හැඳින්වුණු සිල්ලාලේ යන බැතිමත් කතෝලික ග්‍රාමය කේන්ද්‍රස්ථානය කරගත් ශුද්ධවර ජුසේ වාස් මුනිතුමා එතැනින් අන් ගම්වලට ද යමින් අවුරුදු දෙකහමාරක් පමණ උතුරේ සේවය කිරීම.
- රාත්‍රි කාලයේ දී රහසින් නිවෙස්වල දිව්‍ය පූජාව ඔප්පු කිරීම / දේව ප්‍රසාද නිධාන දානය කිරීම.
- සිඟන්නකු ලෙස වෙස් වළාගෙන ගෙයින් ගෙට ගොස් කතෝලිකයන් සොයා ගැනීම හේතුවෙන් කිතුනුවන්ට පියතුමකු මුණගැසීමේ අවස්ථාව උදා වීම.
- ඉතා ම රහසිගත ව කිතුනුවන් හමු වීම.
- රාත්‍රි කාලයේ දී ඉතා රහසිගත ව දිව්‍ය පූජාව ඔප්පු කිරීම හා දේව ප්‍රසාද නිධාන දානය කිරීමෙන් කිතුනුවනට දේව ආශිර්වාදය ලබා ගැනීමට හැකි වීම.
- ජුසේ වාස් පියතුමා දෙමළ හා සිංහල භාෂා ඉගෙන ගැනීම නිසා ජනයා සමඟ අදහස් කිරීමටත් , ඔවුනට සමීප වීමටත් හැකි වීම.
- උතුරේ පමණක් නොව රටේ සෙසු පළාත්වලට ද එතුමාගේ සේවය රහසින් දීමට එඩිතර වීම.
- මහනුවර රාජධානියේ වැසියන් වසූරිය වසංගතයට ගොදුරු වූ අවස්ථාවේ ඇප උපස්ථාන කිරීම.
- 1696 දී කන්ද උඩරට රාජ්‍යයේ දරුණු නියඟයක් පැවති විට. විමලධර්මසූරිය රජතුමාගේඉල්ලීම පරිදි ශුද්ධවර ජුසේවාස් මුනිතුමා විසින් යාච්ඤා මහනුවර රාජධානියට වැස්ස ලැබීම.
- එතුමා 1711 ජනවාරි 16 වන දින ස්වර්ගස්ථ වීම.
- "කිසියම් කෙනෙකු තම මුළු ජීවිත කාලය තුළ නොසලකා හැරිය දෙයක් ඔහුගේ රණ මොහොතේ දී ඉටු කරගත නොහැකි ය" යන්න එතුමා තම මරණ මොහොතේ දී ලබා දුන් අවවාදය.
- "ශ්‍රී ලංකාවේ අපොස්තුලුවරයා" ලෙස විරුදාවලිය ලැබූ ජුසේ වාස් පියතුමා ව 1995 ජනවාරි 21 වන දින අතිඋතුම් දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියාණන් විසින් භාග්‍යවරයට ඔසවනු ලැබීම.
- 2015 ජනවාරි 14 දින අති උතුම් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියාණන් විසින් කොළඹ ගාලු මුවදොර පිටියේ දී ජුසේ වාස් පියතුමා ව ශුද්ධවරයට එසවීම.

**ශුද්ධවූ ජුසේවාස් මුනිතුමාගේ ධර්මදූත ප්‍රතිපත්ති**

- දේශපාලන සම්බන්ධයක් හෝ රාජ්‍ය අනුග්‍රහයක් හෝ නොමැති ව ධර්මදූත ප්‍රචාරය සාර්ථක ව ඉටු කළ හැකි බව තහවුරු කිරීම.
- ධර්මදූත කාර්ය සඳහා ගිහි නායකත්වය යොදා ගැනීම.
- සිංහල හා දෙමළ යන භාෂා දෙක ම ඉගෙන ගැනීම සඳහා ධර්මදූතවරුන් යොමු කිරීම. උදා ඃ ගෞරවානවිත ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා.
- දිව්‍ය පූජාව ලතින් භාෂාවෙන් සිදු වුව ද දේශීය භාෂාවලින් යාච්ඤා කිරීමට මඟ පෙන්වීම.
- පුර්තුගීසි යුගයේ සිට කිතුනු දහම අදහා ගත් අයට තමන්ගේ දහම ඇදහීමට මඟ සැලසීම.
- ලන්දේසීන්ගේ පැමිණීම හා බලපෑම නිසා රෙපරමාදු දහම වැලඳගත් කතෝලිකයන්ට සත්‍ය සභාව කුමක් දැයි කියා තේරුම් කර දී ඔවුන්ව යළි කතෝලික සභාවට ඇතුළු කර ගැනීම.
- සංචාරක ධර්මදූත සේවය නිසා විශාල ප්‍රදේශකයකට / විශාල ජනකායකට සේවාව සැලසීම.
- පියතුමන්ලා හිඟ බැවින් සංසවලට ගිහි නායකයන් පත් කර ඔවුන්ගේ සේවාව ලබාගැනීම. උදා ඃ අන්නවි, සන්ක්‍රිස්තියන් , මුහුප්පු
- යාච්ඤාවේ ජීවිතය තම ජීවිතයට ආභරණයක් කොට ගෙන සියල්ල දෙවියන් වහන්සේ තුළ සිදු කිරීම.

## ගෞරවාන්විත ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමාගෙන් ලක් සසුනට වූ සේවය

- ලක්දිව කතෝලික සාහිත්‍යයේ පියා වීම.
- ඔරතෝරියානු නිකායික පියතුමකු වීම.
- සිංහල භාෂාවෙන් පොත් 22ක් ද, දෙමළ භාෂාවෙන් පොත් 15ක් ද, පුර්තුගිසී භාෂාවෙන් පොත් 04ක් ද ලන්දේසී භාෂාවෙන් පොතක් ද ලිවීම.
- මෙතුමා විසින් රචිත සිංහල ගද්‍ය සාහිත්‍ය කෘති :- දේව වේද සංක්ෂේපය, දේව වේද පුරාණය, අඥාන ඖෂධය, දුක්ප්‍රාප්ති ප්‍රසංගය, සුවිශේෂ විසර්ජනය, දේව නීති විසර්ජනය, ක්‍රිස්තියානි පල්ලිය, ප්‍රාතිහාර්යාවලිය, මාතර ප්‍රත්‍යක්ෂය, ධර්මෝධ්‍යානය, භේදකාරයන්ගේ තර්කය, බුදු මුල, දේව පරිහාරය, ඥානාංජනය, සුකෘත දර්පණය, ධර්ම සංඥාව.
- පද්‍ය කෘති හා ගීත ප්‍රබන්ධ :-
  වේද කාව්‍යය, පසන් පොත, ආනන්ද කලිප්පුව, මංගල ගීතය, ලතෝනි පොත
- දේවධර්ම ශාස්ත්‍රීය කරුණු ඉතා සරල ලෙස පැහැදිලි කිරීම
- සංගීත කුසලතාවකින් ද යුක්ත වූ ගෞරවාන්විත ගොන්සාල්වෙස් පියතුමා විසින් බැති ගී රැසක් නිර්මාණය කිරීම. උදා :- දෙවිඳු උපන්නේ ය සතුනි, ත්‍රි ඒක සුර ජේසුනේ.
- පසන් ගී, ලතෝනි ගී, නාට්‍ය ගී සහ සාමාන්‍ය ගීතිකා සඳහා පද නිර්මාණය සහ තනු නිර්මාණය කරමින් කතෝලික සිංහල සංගීතයට ආරම්භයක් ලබා දීම

## ඔරතෝරියානු නිකායික ධර්මදූතවරුන්ගෙන් වූ සේවය

- ලන්දේසි පීඩන සමයේ ලක්දිව කතෝලික සසුන ආරක්ෂා කිරීම.
- කිසි ම ධර්මදූතවරයකු නොමැති සමයක ධර්මය ප්‍රචාරයට ඉදිරිපත් වීම.
- හෙළ කිතුනු සාහිත්‍යයක් හා සංගීතයක් ආරම්භ කිරීම.
- මඩු පල්ලිය, පුත්තලම, කොච්චිකඩේ, ගල්ගමුව, ගුරුබැවිල (හංවැල්ල) ඇතුළු විවිධ ප්‍රදේශවල දහම් සේවාවේ නියැළීම.

## ගරු පිලිප්පුස් බල්දේවුස් දේවගැතිතුමාගෙන් ලක් සසුනට වූ සේවය

- ක්‍රි.ව. 1658 දී ලන්දේසි හමුදාව භාර ව කටයුතු කිරීමට ලංකාවට පැමිණ ගාල්ලේ ඕලන්ද සේනාංකයේ පූජක සේවාව භාර ව ක්‍රියා කිරීම.
- 1658 - 1665 දක්වා ගාල්ලේ හා යාපනයේ රෙපරමාදු දේවගැතිවරයකු ලෙස සේවය කිරීම.
- ආගමික පොතපත - දේශිය භාෂාවලට පරිවර්තනය කර මුද්‍රණය කිරීමට පියවර ගැනීම.
- ආගමික උපදේශකවරුන් (කතිකිස්තවරුන්) පුහුණු කිරීම.
- සැම දේවස්ථානයක් ආශ්‍රිත ව ම පැරිෂ් පාසල් ආරම්භ කර රාජ්‍ය අනුග්‍රහය ඇති ව ඒ මඟින් ධර්ම ප්‍රචාර කටයුතු සංවිධානය කිරීම.
- පසු කලෙක ලන්දේසි පාලකයන් සමඟ ඇති වූ මත ගැටුම් හේතු කොට ගෙන මෙරට සේවය නිමා කර ආපසු ඕලන්දයට යාම.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :**

1. ලන්දේසී පීඩනවලට මෙරට කතෝලිකයින් දැක් වූ ප්‍රතිචාර 06 ක් ලියන්න.

2. ශුද්ධ වූ ජුසේවාස් මුනිතුමන්ගේ සේවක හා ධර්මදූත ප්‍රතිපත්ති දෙබසක ආකාරයට ඉදිරිපත් කරන්න.

3. පහත සඳහන් ධර්මදූතවරුන් ලක් සසුනට කළ සේවාවන් 04 බැගින් ලියන්න.

    1. ජාකොමේ ගොන්සාල්වේස් පියතුමා
    2. ඔරතෝරියානු නිකායික ධර්මදූතවරු
    3. ගරු පිලිප්පුසු බල්දෙවුස් දේවගැතිතුමා

**ආශ්‍රිත ග්‍රන්ථ**


- දොන් පීටර්, ඩබ්.එල්.ඒ.(පියතුමා), **ලක්දිව කතෝලික පීඩන සමය,** දේව ධර්ම නිකේතනය, කොළඹ 8, 1996.
- කොළමුන්නේ, තිමති (පියතුමා), **සිරිලක් කිතු සසුන, පළමු කාණ්ඩය,** ප්‍රැන්සිස්කන් නිවාසය, බෝලවලාන, 1985.
- දොන් පීටර්, ඩබ්.එල්.ඒ.(පියතුමා), ගොන්සාල්වෙස් පඬිවරයාණෝ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 675, පී ද ඇස් කුලරත්න මාවත, කොළඹ 10, 1991
- බලගල්ල, ජයලත් (පියතුමා), **සඟ ලොව කරා,** කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, 2015.

**නිපුණතාව 9.0** : **ශ්‍රී ලංකාවේ කිතුනු අනන්‍යතාවෙහි ලා සුබ අස්නේ පණිවිඩකරුවකු ලෙස සාක්ෂ්‍ය දරයි.**

**නිපුණතා මට්ටම 9.4** : කිතුනු ධර්මදූත ව්‍යාපාර මඟින් විවිධ ක්ෂේත්‍රයන්හි සිදු කළ සේවා ඉදිරියට ගෙන යාමට පියවර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 25

**ඉගෙනුම් පල**

- බ්‍රිතාන්‍ය යුගයේ ශ්‍රී ලංකාවේ කිතු දහම පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- කිතුනු ධර්මදූත ව්‍යාපාරය මඟින් ශ්‍රී ලංකාවේ ආගමික, අධ්‍යාපනක හා සාමාජීය ක්ෂේත්‍රයන්ට ලැබුණු දායකත්වය අගය කරයි.
- ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- සැබෑ කිතුනුවන් ලෙස කටයුතු කරයි.
- ආගමික නිදහස සුරැකීමට දායක වෙයි.

## 9.4.1 බ්‍රිතාන්‍ය යුගයේ ශ්‍රී ලංකාවේ කිතු දහම

**ආගමික නිදහස**

- බ්‍රිතාන්‍ය හමුදාවේ කර්නල්වරයකු වූ ජේම්ස් ස්ටුවර්ට් මහතා 1796 අගෝස්තු මස 03 වන දින කොළඹ දී සිදු කළ විශේෂ ප්‍රකාශනයේ අඩංගු කරුණු,
  - ලංකාවේ ආගමික කටයුතු නිදහසේ කරගෙන යාමට කතෝලික පියවරුන්ට අවසර ලැබීම.
  - කතෝලිකයන්ගේ ආගමික නිදහසට බාධා නොකළ යුතු බව
  - කතෝලිකයන්ට තම දේවස්ථානවල විවාහ වීමට අවසර ලැබෙන බව
- පළමුවන බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයා වූ, ෆෙඩ්රික් නෝර්ත් මහතා 1798 සැප්තැම්බර් මස 23 වන දින සිදු කළ ප්‍රකාශනයෙන් හෘදය සාක්ෂ්‍යය අනුව, තමන් කැමති ආගමයක් ඇදහීමට අවසර ලැබීම.
- ලාංකිකයන්ට ලැබුණු ආගමික නිදහස පූර්ණ වූයේ, බ්‍රිතාන්‍ය දෙවන ආණ්ඩුකාරයා වූ තෝමස් මේට්ලන්ඩ් මහතා නිකුත් කළ මැග්නා කාටර් පනත ප්‍රකාශයට පත් කිරීමෙනි.
- මැග්නා කාටර් පනත ලංකාව තුළ ක්‍රියාත්මක වූයේ බ්‍රිතාන්‍ය එවකට පාලකයා වූ තෙවන ජෝර්ජ් රජතුමාගේ උපන් දිනය යෙදුණු 1806 ජූනි මස 06 වන දින සිට ය.
- ඉන් අනතුරු ව කතෝලිකයන්ට ආගමය ඇදහීමේ පූර්ණ නිදහස හිමි විය.

**විදේශීය ධර්මදූත කණ්ඩායම් මෙරටට පැමිණීම හා සේවය**

බ්‍රිතාන්‍යය විසින් ලාංකිකයන්ට ආගමික නිදහස ලබා දීමත් සමඟ විවිධ කිතුනු ආගමික කණ්ඩායම් ලංකාවට පැමිණ ධර්මදූත සේවා ආරම්භ කළහ.

## ලන්ඩන් ධර්මදූත කණ්ඩායම

- එංගලන්ත සභාව නියෝජනය කරමින් ක්‍රි.ව. 1805 දී මෙරටට පැමිණි පළමු ධර්මදූත කණ්ඩායම වේ. මෙරට ඔවුන්ගේ සභාව ලංකා සභාව ලෙස හැඳින්වේ. දේවස්ථාන හා පාසල් ගොඩනඟා ගෙන ධර්මදූත සේවයේ යෙදුණු අතර ක්‍රි.ව. 1840 දී දේශීය පූජකයන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් ද අරඹන ලදි. ලංකා සභාව කොළඹ හා කුරුණෑගල යන දියෝකීසි හෙවත් රාජගුරු පදවි දෙකක් යටතේ අද සේවාවේ නිරත වේ. ඒ ඒ දියෝකීසි ස්වාධීන ව ක්‍රියාත්මක වේ. අදාළ දියෝකීසියේ රදගුරු හිමි, පැවිදි පක්ෂය හා තෝරා ගත් ගිහි සැදැවතුන්ගෙන් සමන්විත දියෝකීසි මන්ත්‍රණ සභාව මඟින් එම දියෝකීසියේ සේවාවලට අදාළ තීන්දු, ප්‍රතිපත්ති ආදිය සකස් කෙරේ.

## බැප්ටිස්ට් ධර්ම දූත කණ්ඩායම

- ගරු ජේම්ස් කාටර් දේවගැතිවරයා ක්‍රි.ව. 1812 දී ලන්ඩනයේ සිට ශ්‍රී ලංකාවට පැමිණ එවකට පැවති බ්‍රිතාන්‍ය යටත් විජිතයේ ආණ්ඩුකාරවරයාගේ සහයෝගයෙන් මත බැප්ටිස්ට් සභාව ආරම්භ කළේ ය. එතුමාගේ ආගමික සේවාව ආරම්භ වුයේ ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශයෙන් වූ අතර ආරම්භයේ සිට ම සභාවේ සේවාව බස්නාහිර, වයඹ හා මධ්‍යම පළාත් දක්වා විහිදී ගියේ ය.

## වෙස්ලියන් ධර්ම දූත කණ්ඩායම

- මෙම සභාවට අයත් පස් දෙනෙකුගෙන් යුත් මුල් ම ධර්මදූත කණ්ඩායම ක්‍රි.ව. 1815 දී ගාල්ලට පැමිණීමත් සමඟ ලංකාවේ දූත සේවාව ආරම්භ විය. ඔවුහු විශේෂයෙන් ම බටහිර මුහුදුකරයේ සේවය කළහ. ධර්ම ප්‍රචාරය, අධ්‍යාපනය හා සෞඛ්‍ය සේවා කෙරෙහි ඔවුන්ගේ විශේෂ අවධානය යොමු විය.

## ඇමෙරිකන් ධර්ම දූත කණ්ඩායම

- ක්‍රි.ව. 1816 දී ලංකාවට පැමිණි අතර අධ්‍යාපනයට විශේෂ ස්ථානයක් දුන් කණ්ඩායමකි. උතුරේ යාපනය ආශ්‍රිත ව ධර්මදූත ව්‍යාපෘති ගණනාවක් ආරම්භ කරන ලදි. නේවාසික, ප්‍රාථමික, උසස්, ගම්බද, මධ්‍යම, දිවා, බාලිකා වශයෙන් විවිධ පාසල් වර්ග ආරම්භ කරන ලද අතර ගුරුවරුන් පුහුණු කිරීම ද කළේ ය. මෙම ධර්මදූත කණ්ඩායමට අයත් කාන්තා ධර්මදූතවරියන් විසින් මෙරට කාන්තා අධ්‍යාපනය ජනප්‍රිය කිරීමට ද වෙහෙස දරන ලදි.

## සභා ධර්මදූත සංගමය

- ක්‍රි.ව. 1818 දී පැමිණ ධර්ම ප්‍රචාරය හා අධ්‍යාපනය සඳහා බොහෝ සේ වෙහෙසී කටයුතු කළේ ය. කොළඹ කාන්තා විද්‍යාලයය, මහනුවර හිල්වුඩ් විද්‍යාලයය වැනි විදුහල් සභා ධර්මදූත සංගමය මඟින් අරඹන ලදි.

## ගැලවීමේ හමුදාවේ ධර්ම දූත කණ්ඩායම

- ක්‍රි.ව. 1883 දී කපිතාන් විලියම් ග්ලැඩ්වින් විසින් කොළඹ කොටුව ඔරලෝසු කණුව අසල දී පළමු රැස්වීම පවත්වා ඇත. ගැලවීමේ හමුදාවේ ශාඛා ලංකාව පුරා ම ව්‍යාප්ත ව ඇත. මෙහි හමුදාමය සංවිධාන ව්‍යූහයක් පවතින අතර විවිධ ප්‍රජා සේවාවල නිරත වේ.

## බයිබල් සමාගම

- 1812 අගෝස්තු 01 වන දින කොළඹ, "රජ මැඳුරේ දී" කොළඹ ශාඛාව ලෙස ආරම්භ කරන ලදි.

- 1812 අගෝස්තු මස 05 වන දින නිකුත් කළ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ අංක 568 යටතේ බයිබල් ප්‍රකාශ කරන ලදි.

- පළමු වන සභාපති වශයෙන් ශ්‍රීමත් රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරතුමා පත් විය.

- පළමු වන මහ ලේකම් වශයෙන් ගරු ජෝර්ජ් බිසට් දේවගැතිතුමා පත්විය.

- ශ්‍රී ලංකා බයිබල් සංගමයේ අනුශාසක ලෙස ලංකා සභාවේ කොළඹ දියෝකීසියේ රදගුරුතුමා පත් වේ.

- බයිබල් පිටපත් 5000ක් නිපදවීමට බයිබල් කඩදාසි ශ්‍රීමත් ඇලෙක්සැන්ඩර් ජොන්ස්ටන් විසින් 1812 දී කොළඹ ශාඛාවට භාර දෙන ලදි. මොහු ශ්‍රී ලංකාවේ පළමු අග්‍ර විනිශ්චයකාරතුමා විය.

- 1812 දී බ්‍රිතාන්‍ය සිවිල් සේවකයකු වූ විලියම් ටොල්ෆ්‍රීගේ මඟ පෙන්වීම යටතේ ශුද්ධ බයිබලය සිංහල භාෂාවට පරිවර්තනය කිරීම ආරම්භ කරන ලදි.

- 1907 දී නව ව්‍යවස්ථාවක් යටතේ බ්‍රිතාන්‍ය හා විදේශීය බයිබල් සංගමයේ "සිලොන්" ශාඛාව නමින් නිල වශයෙන් මෙය ස්ථාපිත විය.

- 1819 දී සිංහල ශුද්ධ බයිබලයේ කොටස් වශයෙන් මුද්‍රණය කිරීමට ආරම්භ කෙරිණි.

- 1830 දී බයිබල් සමාගම මඟින් සම්පූර්ණ සිංහල බයිබලය එළිදැක්විණි.

- 1938 දී සිංහල ශුද්ධ බයිබලය පැරණි අනුවාදය  මුද්‍රණය කෙරිණි.

- 1946 දී දෙමළ ශුද්ධ බයිබලය - පැරණි අනුවාදයේ පූර්ණ ප්‍රකාශන අයිතිය ශ්‍රී ලංකා බයිබල් සංගමය වෙත ලැබිණි.

- 1982 දී  සිංහල ශුද්ධ බයිබලයේ නව අනුවාදය මුද්‍රණය කර එළිදැක්විණි.

- 1990 දී  සිංහල නව අනුවාදයේ දෙවන සංස්කරණය

- 2006 දී සිංහල ශුද්ධ බයිබලයේ තෙවන සංස්කරණය

- 1995-2002: බයිබල් අධ්‍යයන පිටපත කාණ්ඩ 6කින් නිකුත් කිරීම.

- සෑම වසරක ම දෙසැම්බර් මස පළමු ඉරුදින දී "බයිබල් ඉරුදින" සමරනු ලබයි.

### 9.4.2 බ්‍රිතාන්‍ය යුගයේ දී ශ්‍රී ලංකාවේ කතෝලික සභාව (අනුපදවි හා රදගුරු පදවි ආරම්භය)

- ලාංකික කතෝලිකයන්ට ආගමය ඇදහීමට ලැබුණු පූර්ණ නිදහස ලැබීම හේතුවෙන් කතෝලික ජනගහනය ක්‍රමයෙන් වර්ධනය විය. මේ නිසා 1834 දී ලංකාව ස්වාධීන අපෝස්තලික අනුපදවියක් බවට අතිඋතුම් සොළොස් වන ග්‍රෙගරි ශුද්ධෝත්තම පියතුමා විසින් ප්‍රකාශ කළේ ය.

- මෙම අපෝස්තලික අනුපදවියේ මූලස්ථානය කොළඹ ලෙස නම් කළ අතර මෙතැන් සිට ලංකාවේ  කතෝලික සභාව ඍජු ව ම ශුද්ධෝත්තම පියතුමා යටතට පත් කරනු ලැබී ය.

- 1847 දී අතිඋතුම් නම වන පියුස් ශුද්ධෝත්තම පියතුමා විසින්  දකුණ හා උතුර  වශයෙන් අපෝස්තලික අනුපදවි දෙකක් දකුනු මත උතුර යැපෙන ආකාරයට අනුපිළිවෙළින්  කොළඹ හා යාපනය යන පෙදෙස්හි කේන්ද්‍රස්ථාන විය.

- 1883 දී ලංකාවේ තෙවන අපෝස්තලික අනුපදවිය ලෙස මහනුවර අනුපදවිය ස්ථාපිත කරන ලදි.

- 1886 දී අතිඋතුම් දහතුන්වන ලියෝ ශුද්ධෝත්තම පියතුමා විසින් කොළඹ යාපනය සහ මහනුවර යන අපෝස්තලික අනුපදවි තුන රදගුරු පදවි තත්ත්වයට උසස් කරනු ලැබු අතර කොළඹ අගරදගුරු පදවියක් බවට පත් විය.

- ගාල්ල රදගුරු පදවිය හා තිරිකුණාමලය රදගුරු පදවිය 1893 දී ද හලාවත රදගුරු පදවිය 1939 දී ද පිහිටවනු ලැබී ය.

### පැවිදි නිකායයන්ගේ පැමිණීම හා සේවය

### සිල්වෙස්ත්‍රීන බෙනදිකාන නිකායය

- සිල්වෙස්ත්‍රීන බෙනදිකාන නිකායයෙන් ලංකාවට පැමිණි ප්‍රථම ධර්මදූතයා ඉතාලි ජාතික ගරු ජොසප් මේරි බ්‍රාවී පියතුමා ය. (ක්‍රි.ව. 1845 දී ගරු ග්‍රාෂියා හා ෆ්‍රොයිලානෝ ඔරුනා යන සිස්ටර්සියන් නිකායේ පියතුමන්ලා සමග.)
- දකුණු අපෝස්තලික විගාරි වසම දියුණු කිරීම සඳහා කටයුතු කිරීම.
- කොටහේනේ සාන්ත ලුසියා ආසන දෙව්මැඳුර ඉදි කිරීමට පුරෝගාමී වීම.
- පාසල් රැසක් ඇති කිරීමට අවශ්‍ය කටයුතු සැලසීම. උදා : කොටහේන ශාන්ත බෙනඩික් විද්‍යාලයය, මහනුවර ශාන්ත අන්තෝනි විද්‍යාලයය
- යහපත් එඬේරාගේ පැවිදි සොහොයුරියන් මෙරට සේවය සඳහා ගෙන ඒම ( ක්‍රි.ව. 1869).
- ද ලා සාල් නිකාය මෙරටට ගෙන්නා ගැනීම.
- කතෝලික සිංහල පුවත්පත වන ඥානාර්ථ ප්‍රදීපය ( ක්‍රි.ව. 1866) මුද්‍රණය ආරම්භ කිරීම.
- කැතලික් මැසෙන්ජර් ( ක්‍රි.ව.1869)) මුද්‍රණය ආරම්භ කිරීම.
- ක්‍රි.ව. 1857 1883 තෙක් කොළඹ අනුපදවිය පාලනය කිරීම.
- මහනුවර රදගුරු පදවිය ආරම්භයේ (ක්‍රි.ව.1883) සිට ක්‍රි.ව. 1959 තෙක් පාලනය කිරීම.

### නිර්මල මරිය නිකාය

- ක්‍රි.ව. 1847 ගරු ජොන් ස්ටීවන් සෙමේරියා පියතුමා සහ තවත් ධර්මදූතවරුන් තිදෙනකු විසින් යාපනය ප්‍රදේශයේ ධර්මදූත කටයුතු ආරම්භ කරන ලදි.
- නිර්මල මරිය නිකායෙන් ශ්‍රී ලංකාවට පත් වූ ප්‍රථම රදගුරු තුමා අතිඋතුම් ජෝන් ස්ටීවන් සෙමේරියා හිමිපාණෝ ය.
- ක්‍රි.ව. 1862 දී ශුද්ධ වූ පවුලේ පැවිදි සොහොයුරියන් ප්‍රංශයේ බොර්ඩෝ නුවර සිට ලංකාවේ යාපනය ප්‍රදේශයට පැමිණියේ මෙතුමාගේ මැදිහත්වීම නිසා ය. මෙතුමා පදවි පැවිදි නිකාය දෙකක් ආරම්භ කළේ ය. ඒවා නම් සාන්ත ජුසේ මුනිඳුන්ගේ සහෝදර තුමන්ලාගේ පැවිදි නිකාය හා සාන්ත පේදුරු තුමාගේ කන්‍යා සොහොයුරියන්ගේ පැවිදි නිකායය. මෙම පැවිදි නිකායන් දෙක ආරම්භ කිරීමේ පරමාර්ථය වූයේ, දේශීය භාෂාවන්ගෙන් පාසල්වල ඉගැන්වීම් කටයුතු පැවරීම ය.
- සාන්ත ජෝසප් සහෝදරතුමන්ලා පුහුණු කිරීම, නිර්මල මරිය නිකායේ පියතුමන්ලාට ද සාන්ත පේදුරු තුමාගේ කන්‍යා සොහොයුරියන් පුහුණු කිරීම, ශුද්ධ වූ පවුලේ නිකායයට ද පැවරිණි.
- ශ්‍රී ලාංකික කතෝලිකයන් අතර ජනප්‍රිය ජූලි මඩු මංගල්‍යය ආරම්භ වන්නේ ද අතිඋතුම් ජෝන් ස්ටීවන් සෙමේරියා හිමිපාණන්ගේ පාලන සමයේ දී ය.
- රදගුරු පදවිවලට නායකත්වය ලබාදීම, මෙම නිකායයෙන් සිදු වූ සුවිශේෂ සේවාවකි. ලංකාවේ ප්‍රථම සිංහල රදගුරුතුමා වන්නෝ, නිර්මල මරිය නිකායේ, අතිඋතුම් එඩ්මන්ඩ් පීරිස් නමැති හලාවත රදගුරු පදවියේ රදගුරු හිමිපාණන් ය. ශ්‍රී ලංකාවේ පළමු ද්‍රවිඩ රදගුරුතුමා වන්නෝ ද, නිර්මල මරිය නිකායේ, අතිඋතුම් එමිලියානුස් පිල්ලේ නමැති යාපනය රදගුරු පදවියේ රදගුරු හිමිපාණෝ ය. ශ්‍රී ලංකාවේ ප්‍රථම සිංහල අගරදගුරුතුමා හා කාදිනල්තුමා වන්නෝ ද නිර්මල මරිය නිකායේ අතිඋතුම් තෝමස් බෙන්ජමින් කාදිනල් කුරේ හිමිපාණෝ ය.

- ලංකාවේ ප්‍රධාන කතෝලික අධ්‍යාපන ආයතන වන යාපනයේ සාන්ත මාටින් දෙව්සත්හල, කොළඹ සාන්ත බර්නාර්ඩ් දෙව්සත්හල, කොළඹ සාන්ත ඇලෝසියස් දෙව්සත්හල, අම්පිටිය ජාතික දෙව්සත්හල, කොළඹ සාන්ත ජොශප් විදුහල, කොළඹ ඇක්වයිනස් ආයතනය, යාපනයේ සාන්ත පැට්‍රික් විදුහල ආදිය මෑතක් වන තුරු ම පාලනය කරන ලද්දේ නිර්මල මරිය නිකායේ පියවරුන් විසිනි.

- තේවත්ත ලංකා අප ස්වාමි දූගේ ජාතික බැසිලිකාව, ඉදිගොල්ල සාන්ත ජුඩ් සිද්ධස්ථානය, මග්ගොන ළමා පුනරුත්ථාපන නිවාසය හා අනත්දරු නිවාසය, නුවරඑළියේ පූජක නිවාඩු නිවාසය (අන්ඩර්බෑන්ක්), තේවත්තේ ඥානකාන්ති මධ්‍යස්ථානය, තම්මිට ධර්මෝපදේශ මධ්‍යස්ථානය ආදිය ආරම්භ කළේ ද නිර්මල මරිය නිකායය යි.

## ශුද්ධ වූ පවුලේ පැවිදි නිකාය

- මෙම පැවිදි නිකායයේ නිර්මාතෘන් වන්නේ, අතිගරු පීටර් බියෙන්වෙනු නොආයි පියතුමා.

- ශුද්ධවූ පවුලේ කන්‍යා සොහොයුරියෝ යාපනයේ කාන්තා පාසල, බෝඩිම හා අනත්දරු නිවාසය භාරගෙන ශ්‍රී ලංකාවේ දූත සේවාව ඇරඹූහ.

- වර්තමානයේ දී යාපනයේ ශු. පවුලේ ජාතික පාසල නමින් හඳුන්වන එවකට කාන්තා ඉංග්‍රීසි පාසල මෙම පැවිදි සොහොයුරියන්ගේ පාලනයට නතු වූ ශ්‍රී ලංකාවේ පළමු කන්‍යාරාම පාසල.

- ශ්‍රී ලංකාවට පැමිණි, පළමු කාන්තා පැවිදි නිකාය වන්නේ ද මෙම නිකාය වන අතර ලංකාවේ ඉංග්‍රීසි අධ්‍යාපනය දියුණු කිරීම සඳහා ඔවුන් ව මෙරටට ගෙන්වා ගැනීම.

- මෙරට තුළ පාසල් ගණනාවක් ආරම්භ කරමින් අධ්‍යාපනයට යොමු වුවා පමණක් නොව රෝහල් සේවයට ද ප්‍රවිෂ්ට වූහ. (ක්‍රි.ව. 1892 සිට කුරුණෑගල මහ රෝහලේ හෙද සේවාවේ නිරත වූහ. පසු ව නාවලපිටිය රෝහලේ ද සේවය)

## ද ලා සාල් නිකාය

- ශාන්ත ජෝන් බැප්ටිස්ට් ද ලා සාල් මුනිතුමා, මෙම නිකායයේ නිර්මාතෘවරයා ය. ප්‍රංශයේ රේයිම්ස් නගරයේ පිහිටි ආසන දෙව්මැඳුරේ මීසම් සේවක පියතුමා ලෙස කටයුතු කරන සමයේ දී එතුමා ප්‍රංශයෙහි දිළිඳු පිරිමි ළමයින්ට අධ්‍යාපනය ලබාදීමේ අරමුණින්, 1680 දී පූජක නොවන අයගෙන් සමන්විත ද ලා සාල් නිකාය අරම්භ කළේ ය.

- අරමුණු - දිළිඳු දරුවන්ට නොමිලයේ අධ්‍යාපනය ලබා දීම, නව ඉගැන්වීම් ක්‍රම හඳුන්වා දීම.

- "කිතුනු ගුරුවරුන්ගේ නාම සාන්තුවරයා" වන්නේ මෙතුමා.

- 1868 දී ලංකාවට පැමිණ මෙරට සේවය ආරම්භ කිරීම. කොටහේන ශාන්ත බෙනඩික්ට්, මීගමුව ශාන්ත මරියා, මෝදර ද ලා සාල්, ග්‍රෑන්ඩ්පාස් සාන්ත ජෝසප්, කදාන ද මැසනඩ් වැනි පාසල් ගණනාවක් ආරම්භ කරන ලදි.

- 1963 දී දියගල ළමා නිවාසය ආරම්භ කරන ලදි.

## යහපත් එඬේරාගේ පැවිදි නිකාය

- ආරම්භකයා ශු. මේරි යුප්‍රේෂියා මුනිතුමිය (1835)
- 1869 දී ලංකාවට පැමිණ කොටහේනෙන් තම සේවාව ආරම්භ කිරීම.
- ලංකාවේ කතෝලික ඉංග්‍රිසි අධ්‍යාපනය නැංවීමට ඇපකැප වී ක්‍රියා කිරීම.

## මරිය තුමියගේ ප්‍රැන්සිස්කාන පැවිදි නිකාය

- 1886 දී ලංකාවට පැමිණ මොරටුවේ ජයලත් අප ස්වාමි දූගේ කන්‍යාරාම පාසල ආරම්භ කිරීම.
- 1886 දී කොළඹ මහ රෝහලේ සේවය.
- 1914 දී හැඳල ලාදුරු රෝහලේ සේවය.

### දිළිඳුන්ගේ කුඩා සොහොයුරියෝ

- 1888 දී ලංකාවේ සේවය සඳහා පැමිණීම.
- මහලු අසරණ වැඩිහිටියන් රැකබලා ගැනීම ප්‍රධාන දූත සේවය.

### දයාවේ පැවිදි සොහොයුරියෝ

- 1896 ලංකාවට පැමිණ ඔවුන් තම සේවාව ගාල්ලෙන් ආරම්භ කිරීම.
- අනතුරු ව මාතර, කෑගල්ල, රත්නපුරය ආදිය ප්‍රදේශවල තම දහම් සේවය ව්‍යාප්ත කිරීම.

### සුරදූතික පැවිදි නිකාය

- ගාල්ල රදගුරු පදවියේ පළමු රදගුරු අතිඋතුම් ජෝශප් වෑන් රීත් හිමිපාණන් විසින් 1903 දී ගාල්ලේ දී දේශීය පැවිදි නිකායයක් වශයෙන් ආරම්භ කිරීම.
- ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන පැරණි ම දේශීය පැවිදි නිකාය.
- මෙම පැවිදි නිකායයේ නාම සාන්තුවරයා මිකායෙල් අග්‍ර දේවදූතයා.
- මෙම පැවිදි නිකාය විසින් කුලියාපිටි සුරදූත විදුහල, දංකොටුව බාලිකා විදුහල ඇතුළු පාසල් ගණනාවක් පාලනය ආරම්භ කිරීම.

### මාරිස්ට් සහෝදරතුමන්ලා

- 1911 දී ලංකාවට පැමිණ මඩකලපුවේ සාන්ත මයිකල් විදුහල භාර ගැනීම.
- පළමු වන ලෝක යුද්ධය හේතු කොට ගෙන ආර්ථික වශයෙන් දුර්වල වීම නිසා , 1917 මාරිස්ට් සහෝදරවරුන් මඩකලපුවේ සාන්ත මයිකල් විදුහලෙන් සමුගෙන මීගමුව සාන්ත මරියා විදුහලේ සේවයට පැමිණීම .
- 1922 දී මීගමුව මාරිස්ටෙලා විදුහල ආරම්භ කිරීම.
- කොළඹ අදරදගුරු පදවියට අයත් කළුතර සිරි කුරුස විදුහල (1978) හා නුගේගොඩ ශාන්ත ජෝශප් විදුහල (1985) මෙම නිකායයේ පාලනයට භාර දෙන ලද නමුත් , 2009 වසරේ දී නැවතත් කළුතර සිරි කුරුස විදුහල කොළඹ අගරදගුරු පදවියට භාර දීම.

### අපෝස්තලික කාර්මෙල් නිකාය

- 1922 දී ලංකාවට පැමිණ තිරිකුණාමලයේ තම ප්‍රථම කන්‍යාරාමය ආරම්භ කිරීම.
- අධ්‍යාපනය ප්‍රමුඛ දූත සේවාව වන අතර නේවාසිකාගාර හා ළමා නිවාස ආරම්භ කරමින්, ඒවා පවත්වාගෙන යාම.

### බ්‍රිතාන්‍ය යුගයේ දී ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය

බ්‍රිතාන්‍ය යුගයේ දී ශ්‍රී ලාංකාවේ අධ්‍යාපනය වෙනුවෙන් බිහි වූ මධ්‍යම පාසල් කොමිසම (1841) මඟින් සේවා රාශියක් ඉටු විය

- කොළඹ ඇකඩමිය සමෘද්ධිමත් කිරීම.
- ගුරු පුහුණුව සඳහා "නෝමල් පාසල්" ආරම්භ කිරීම.
- අධ්‍යාපනයට ප්‍රායෝගික නැඹුරුවක් ලබාදීම සඳහා මධ්‍යම පාසල් තුනක් ආරම්භ කිරීම. (ගාල්ල, මහනුවර, කොළඹ)
- මහනුවර සහ කොළඹ උසස් බාලිකා පාසල් ඇරඹීම.

### ගරු ක්‍රිස්ටෝපර් බොන්ජන් පියතුමා

- ආධාර ලබන පාසල් ආරම්භ කිරීමේ පුරෝගාමියා
- දේශීය පූජකයන් පුහුණු කිරීම සඳහා ලංකාවේ ප්‍රථම දෙව්සත්හල ලෙස යාපනය ශාන්ත මාටින් දෙව්සත්හල ආරම්භ කිරීම. (1869)
- බොරැල්ල ශාන්ත බර්නාඩ් දෙව්සත්හල ආරම්භ කිරීම. (1883)
- කොළඹ මහ රෝහලේ සේවය කිරීම සඳහා පළමු වරට මරියතුමියගේ ප්‍රැන්සිස්කාන ධර්මදූත නිකායය යොමු කිරීම. (1886 ජුනි 22)

## උපකෘත පාසල් ක්‍රමය

- ලංකාවේ අධ්‍යාපනය පිළිබඳ ව විමර්ශනය කොට වාර්තාවක් ඉදිරිපත් කිරීමට 1865 දී “ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාව” පත් කළ කමිටුව ඉදිරියේ අදහස් දක්වීමට ගරු ක්‍රිස්ටෝපර් බොන්ජන් පියතුමා කැඳවන ලදුව අතර එතුමා විසින් අංග සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන ලදි. එම වාර්තාව පිටු 96ක පොතක් ලෙස 1867 දී ප්‍රකාශයට පත් විය. එහි යෝජනා 4කි,

  1 නිවසේ දී මෙන් ම පාසලේ දී ද දරුවාගේ අධ්‍යාපනයට ආගමය සම්බන්ධ විය යුතු ය.

  2 එවැනි අධ්‍යාපනයක් දීම ඒ ඒ ආගම විසින් කළ යුතුය .

  3 සැම ආගමයකට ම පාසල් ආරම්භ කර පවත්වා ගෙන යාමට අවසර තිබිය යුතු ය.

  4 රජය එවැනි පාසල්වලට ආධාර කළ යුතු ය.

  රජය විසින් එම යෝජනා පිළිගැනීමේ ප්‍රතිඵලයක් ලෙස පහත සඳහන් ප්‍රතිපත්ති ද්විත්වය ක්‍රියාත්මක කළේය .

  1 සැම ආගමයකටම පාසල් ආරම්භ කිරීමට අවසර ලබා දීම.

  2 සතුටුදායක අධ්‍යාපනයක් ලබා දෙන පාසල්වලට රජය මුදලින් ආධාර දීම.

මෙමගින් කිතුනු පාසල්වලට පමණක් නොව මේ වන තෙක් ම රජයෙන් කිසි ම සැලකිල්ලක් නොලැබුණු බෞද්ධ, හින්දු හා ඉස්ලාම් පාසල්වලට පවා විශාල සෙතක් සිදු විය. මේ අනුව ආගම භේදයකින් තොර ව සැම ආගමයක ම දරුවන්ට සෙත සැලසෙන ආකාරයෙන් උපකෘත හෙවත් ආධාර ලබන පාසල් ක්‍රමය හඳුන්වා දෙන ලද්දේ ගරු ක්‍රිස්ටෝපර් බොන්ජන් පියතුමාගේ යෝජනාවල ප්‍රතිඵලයක් ලෙස ය. බහු ආගමික සමාජයකට මෙවැනි ක්‍රමයක් ඉතා ප්‍රායෝගික හා ප්‍රයෝජනවත් වන්නේ ය.

## ශ්‍රී ලංකාවේ නිදහස වෙනුවෙන් කිතුනු දායකත්වය

- මෙරට විජාතික ආණ්ඩුකාරයාට විරුද්ධ ව පිළියෙළ කරන ලද පෙත්සම තම පාවහනේ සඟවාගෙන බ්‍රිතාන්‍යයට ගෙන යන ලද්දේ ඊ. ඩබ්. පෙරේරා නමැති ක්‍රිස්තු භක්තිකයාය.

- 1915 සිංහල - මුස්ලිම් කෝලාහලය අවස්ථාවේ යුක්ත සැමට ම ඉටු කිරීම සඳහා කැගලු කොමිසම ලබා ගන්නට පුරෝගාමී ව කටයුතු කළේ කතෝලිකයකු වූ ඇල්බට් ඒ. වික්‍රමසිංහ මහතාය.

- ලංකා ජාතික සංගමයේ 22 වන සැසි වාරයේ දී “ශ්‍රී ලංකාව ස්වෛරී රාජ්‍යයක් බවට පත් කළ යුතු ය” යන යෝජනාව ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ඉදිරිපත් කරද් දී එම යෝජනාව ස්ථිර කළේ බැතිමත් කතෝලිකයකු වූ ජේ.එ.එල්. කුරේ මහතාය.

- ශ්‍රීමත් ජේම්ස් පීරිස් නමැති කතෝලිකයා බ්‍රිතාන්‍ය රජයට විරෝධය පළ කරමින් පවත්වන ලද ප්‍රසිද්ධ රැස්වීමක මුලසුන දැරීය.

- මෙකී කාරණ බුද්ධිමත් ව විමසන කවර හෝ අයකුට පෙනී යන්නේ ශ්‍රී ලංකාවට නිදහස ලබා දීම සඳහා වූ අරගලයේ දී කිතුනුවන් ද ක්‍රියාකාරී ව දායකත්වය සැපයූ බව ය.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :**

1. බ්‍රිතාන්‍ය යුගයේ පැමිණි විවිධ කිතුනු ආගමික කණ්ඩායම් 06 නම් කරන්න.
2. "බ්‍රිතාන්‍ය යුගයේ ශ්‍රී ලංකාවේ කතෝලික සභාව" යන මැයෙන් වචන 100ක රචනාවක් ලියන්න.
3. බ්‍රිතාන්‍ය යුගයේ දී ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය වෙනුවෙන් බිහි වූ මධ්‍යම පාසල් කොමිසම (1841) මිගින් ඉටු වූ සේවාවන් 3ක් ලියන්න.
4. ශ්‍රී ලංකාවේ නිදහස වෙනුවෙන් කිතුනුවන් දැක් වූ දායකත්වය කරුණු 5කින් ලියන්න.

**ආශ්‍රිත ග්‍රන්ථ**


- කොලමුන්නේ, තිමති (පියතුමා), **සිරිලක් කිතු සසුන, දෙවන කාණ්ඩය,** ප්‍රැන්සිස්කන් නිවාසය, බෝලවලාන, 2006.
- ගෝමිස්, ඔස්වල්ඩ් (අගරදගුරුතුමා), **කතෝලික යටගියාව (ශ්‍රී ලංකාව),** අගරදගුරු නිවස, කොළඹ 8, 2012.
- දෝන් පීටර්, ඩබ්.එල්.ඒ. (පියතුමා), **ලක්දිව කතෝලික ව්‍යාප්ති සමය, දේව ධර්ම නිකේතනය,** කොළඹ 8, 1995.
- වෙල්ගම්පල, රීටා, ලක්දිව කිතුනු පුරාණය, **කතෝලික ප්‍රකාශන කේන්ද්‍රය,** අගරදගුරු නිවස, කොළඹ 8, 2003
- දසනායක, ජුඩ් (පියතුමා), **ශ්‍රී ලංකා කතෝලික සභා ඉතිහාසය හා බැදුණු රදගුරු පදවි හා පැවිදි** *නිකායන්,* කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, 2013.

නිපුණතාව 9.0 : **ශ්‍රී ලංකාවේ කිතුනු අනන්‍යතාවෙහි ලා සුබ අස්නේ පණිවිඩකරුවන් ලෙස සාක්ෂ්‍ය දරයි.**

**නිපුණතා මට්ටම 9.5 :** දේශීය ශුද්ධ වූ සභාවක් ගොඩනැඟීමට දායක වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 20

**ඉගෙනුම් පල**

- නිදහසින් පසු යුගයේ ශ්‍රී ලංකාවේ කිතු දහම පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- නිදහසින් පසු දේශීයකරණය සඳහා සභාව විසින් දරන ලද ප්‍රයත්න අගය කරයි.
- ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- ශ්‍රී ලාංකේය ශුද්ධ වූ සභාව දේශීයකරණය සඳහා ඇපකැප වෙයි.
- දේශීය ශුද්ධ වූ සභාව පෝෂණය කිරීමට දායක වෙයි.

## 9.5.1 නිදහස් යුගයේ ශ්‍රී ලංකාවේ කිතු දහම

නිදහස් ශ්‍රී ලංකාවේ ගෙවී ගිය වසර 60කට අධික වූ කාලපරිච්ඡේදය තුළ විවිධ ගැටලු, අභියෝග හා දුෂ්කරතා පසු කර කිතුනු සභාව, වර්තමානය තෙක් පැමිණි ගමන් මඟ පිළිබඳ ආවර්ජනය කරන විට එය කිසි සේත් පහසු සතුටුදායක ගමනක් නොවන බව පැහැදිලි ය. විවිධ වකවනුවල පැවැති දේශපාලන, සමාජීය, ආර්ථික හා ආගමික පසුබිමෙහි දී තුළ අභියෝග, ගැටලු හා ගැරහුම් ආදියට මුහුණදෙමින් ඉන් වඩ වඩා ශක්තිමත් වී, පවතින සමාජ යථාර්ථය හමුවේ නොසැලී නොබිය ව ක්‍රිස්තුන් වහන්සේගේ ශුභාරංචියට සාක්ෂ්‍යදරමින් පැමිණි මෙම ගමන සමස්ත කිතුනු සභාවේ භාග්‍යයක් ලෙස සැලකිය හැකි ය. මෙහිලා කන්ද උඩ දේශනයේ කිතු සමිදාණන් පවසන "මිනිසුන් මා නිසා ඔබට නින්දා පීඩා කොට නානාවිධ අයුතු චෝදනා නඟන කල ඔබ භාග්‍යවන්ත ය" යන වචන කිතුනු සභාවේ සාමාජිකත්වයට මහත් ශක්තියකි, ධෛර්යයකි.

වත්මන් සමාජය තුළ ලාංකේය කිතුනු සභාව ගැන විමසා බැලීමේ දී කතෝලික සභාව සහ පිළිගත් සෙසු ක්‍රිස්තියානි සභා හත මඟින් සිදු වන දූත සේවාව සහ කිතුනු සාක්ෂ්‍ය දැරීම ගැන සැලැකීම ඉතා වැදගත් ය.

මෙම සභා නිල වශයෙන් ද සභා සාමාජිකත්වය පෞද්ගලික ව ද සිය කිතුනු කැඳවීමෙහිලා කටයුතු කරමින් මෙරට උපන් ස්වදේශිකයන් ලෙස තම මවු රටට ආදරයෙන් ද රට පිළිබඳ හැඟිමකින් ද කටයුතු කර ඇති බව පැහැදිලි ය. මෙරට කිතුනුවන් වනාහි විදේශී ගති පැවතුම්වලින් හෙබි පිරිසක් නොව මෙරට බිහි වී, මෙරට සමාජය තුළ හැදී වැඩෙමින් සිය හැකියා දක්ෂතා රටේ වර්ධනය හා උන්නතිය උදෙසා යොදවන පිරිසකි. නිදහස් සටන වෙනුවෙන් උරදුන්, ඇපකැප වුණු විවිධ පරිත්‍යාග සිදු කළ පුරෝගාමින් අතර කිතුනුවන් රාශියක් ද සිටි බව නොරහසකි. එමෙන් ම, මෙරට ඒකීය භාවය, භෞමික අඛණ්ඩතාව හා සාමය වෙනුවෙන් පසුගිය තිස් වසරක පමණ කාලයක් පැවැති ගැටුම්වල දී හා යුද්ධයේ දී රට වෙනුවෙන් දිවි කැප කළවුන් අතර කිතුනුවෝ ද බොහෝ වූහ.

එසේ ම මෙරට අධ්‍යාපනය, සංස්කෘතිය, කලාව, නාට්‍ය, ලේඛන කලාව, නාඩගම් කලාව, සමාජ සුභසාධනය, දයා සේවාව යන විවිධ ක්ෂේත්‍රවලට දායක වෙමින් කිතුනු සභාව සිදු කළ සේවා ද එහිලා විවිධ හැකියා-දක්ෂතාවලින් පිරිපුන් කිතුනුවන් දැක්වූ දායකත්වය ද අතිවිශිෂ්ට බැවි මැදිහත් විචාරකයන්ගේ ඇගැයුමට ද ලක් වී ඇත. මින් ඇතැම් ක්ෂේත්‍රවල පුරෝගාමීත්වය කිතුනුවන්ගේ වූ බව ඉතිහාසය තහවුරු කරයි.

නිදහසින් පසු ගෙවී ගිය කාල පරිච්ඡේදයේ ශ්‍රී. සභාවට මුහුණපෑමට සිදුවූ ගැටලු අභියෝග කෙතෙක් වුව ද, කුමන ස්වරූපයක් දැරුව ද ඒවාට මුහුණ දෙමින් අඩුලුහුඬුකම් මඟහරවා ගෙන කිතුනු සභාව අද විවිධ ක්ෂේත්‍රවලට තම දායකත්වය දක්වයි. ලැබී ඇති සීමිත අවස්ථා තුළ, අධ්‍යාපනයෙහි කිතුනු සභාවේ දායකත්වය ඉතා වැදගත් ය. කිතුනු දරු-දැරියන් කිතුනු වටිනාකම්හිලා හැඩගස්වමින් චරිත වර්ධනය හා පෞරුෂය ගොඩනැංවීමේ අරමුණින් කිතුනු සභාව මූලික වී පවත්වාගෙන යන පාසල්වලට හා අධ්‍යාපන ආයතනවලට අන්‍යාගමිකයින්ගේ ද ඇත්තේ දැඩි කැමැත්තකි. අධ්‍යාපනය, ජනසන්නිවේදනය, සංස්කෘතිය, සමාජ සුභසාධනය, දයා සේවාව යන කුමන ක්ෂේත්‍රයක වුව ද කිතුනු සාක්ෂ්‍ය පෙරදැරි කරගෙන කිතුනු වටිනාකම් තුළ ඒවා මෙහෙයවමින් සමාජයේ මුහුන් වෙමින් සෙසු අයට ද ආදර්ශයක් වෙමින් කිතු සමිඳාණන්ගේ සුබාරංචියට සාක්ෂ්‍ය දරන්නට වර්තමාන සමාජ පසුබිම තුළ ලාංකේය කිතුනු සභාව කටයුතු කරන අයුරු ප්‍රශංසනීය ය. ක්‍රිස්තුන් වහන්සේ වනාහි ආසියාවේ ජනිත වූ ආසියාතික සංස්කෘතියට අයත් වූ මාංශගත වූ දේව පුත්‍රයාණෝ ය. එහෙයින් උන් වහන්සේගේ ඉගැන්වීම්වල ඇති අපට සමීප බව ඉස්මතු කරන්නට විශේෂයෙන් ජනවන්දනාවල හා දේවනමස්කාරයේ වත්පිළිවෙත්වල දී දේශාරූපකරණය මඟින් මෙරට පොදු ජනතාවගේ හදගැස්මට සමීප වන්නට කිතුනු සභාව මහත් ප්‍රයත්නයක් දරනු පෙනේ.

අතීතයේ මෙන් නොව, අද මෙරට කිතුනු සභාවේ ශ්‍රේෂ්ඨයන්, පැවිදිවරුන් හා වරියන්, ගිහි නායක-නායිකාවන් සියලු දෙනා ම වාගේ ස්වදේශිකයන් ය. එහෙයින් විදේශීය මිශනාරිවරුන් මෙරට සභාව මෙහෙයවූ කලට වඩා දේශීය සංස්කෘතික වටිනාකමේ දේශිය සිරිත් විරිත්, ගති පැවතුම් හා හද ගැස්ම මඟින් දේශීය අනන්‍යතාවෙන් පිරි කිතුනු සභාවක් ගොඩනගන්නට ඇති ඉඩකඩ පෙරට වඩා වැඩි බැව් පැහැදිලි ය. එවන් දේශීය අනන්‍යතාවක් ගොඩනැංවීම යුගයේ කාර්යයක් මෙන් ම අභියෝගයක් ද බැව් වටහා ගත යුතු ය.

වර්තමානයේ දී ද ලාංකේය කිතුනු සභාවට මුහුණපෑමට සිදු වී ඇති අභියෝග බොහෝ ය. සේවාවන් සිදු කිරීමේ දී මුහුණදෙන ප්‍රතික්ෂෙප කිරීම්, වැරදි වැටහීම්, ගැරහීම් හා අන්තවාදීන්ගේ අසාධාරණ විවේචන හමුවේ මෙරට සමාජයේ සැබෑ කිතුනු වගකීම් ඉටු කරන්නට හා කිතුනු පුරවැසියන් සේ රට වෙනුවෙන් තම යුතුකම් ඉටු කරන්නට කිතුනු සභාව කිසි සේත් පසුබට නොවේ. එමෙන් ම, කිතුනුවන් මෙරට පවතින බෞද්ධ, හින්දු, ඉස්ලාම් යන අන්‍යාගම්වල නායකයන් හා සාමාජිකත්වය සමඟ සහජීවනයෙන් කටයුතු කරමින් ඔවුනොවුන් අතර ද අන්‍යෝන්‍ය ප්‍රේමයෙන් කටයුතු කරමින් කිතු සමිඳුන්ගේ සුබාරංචියට සාක්ෂි දැරීම වර්තමාන ලාංකේය කිතුනු සභාවේ ලක්ෂණයකි.

එක ම කිතුනු සභාවක් ලෙස එක ම ක්‍රිස්තුන් වහන්සේට සාක්ෂ්‍ය දැරීමට ද එමගින් ශ්‍රී ලාංකේය ජන සමාජයට ක්‍රිස්තුන් වහන්සේගේ ජීවමාන සලකුණක් වන්නට ද මෙරට කිතුනු සභාව ද සභා සාමාජිකයන් ද කටයුතු කළ යුතු ය. ඒ සඳහා දෙවන වතිකාන මන්ත්‍රණ සභා ඉගැන්වීම්වල ඇති මඟ පෙන්වීම් සහ ඉඩ ප්‍රස්තාව උපරිමයෙන් යොදා ගැනීමට කටයුතු කළ යුතු ය.

## 9.5.2 නිදහසින් පසු ශ්‍රී ලාංකේය ශ්‍රී. සභාව මුහුණ දුන් ගැටලු

ලංකාව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට යටත් ව ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයෙකු යටතේ පාලනය වී, පසු ව දේශපාලන නිදහස ලැබුවේ 1948 පෙබරවාරි 04 ය. එවක් පටන් රට තුළ පැවති, දේශපාලන, සමාජීය, සංස්කෘතික හා ආර්ථික පසුබිමේ මාංසගත වී ක්‍රිස්තුන් වහන්සේගේ ගැලවීමදායක ශුභාරංචිය මෙරට පතළ කරමින් දූත සේවාවේ නිරත වීමේ දී කිතුනු සභාවට මුහුණපෑමට සිදුවූ ගැටලු බොහෝ ය. ඒ අතරින් ප්‍රධාන ගැටලු කිහිපයක් පමණක් මෙහි ලා විස්තර කෙරේ.

### අධ්‍යාපනය හා පාසල් රජයට පවරා ගැනීම

1960 දී පැවති මහා මැතිවරණයෙන් බලයට පැමිණි රජය, ආධාර ලබන ආගමික පාසල් රජයට පවරා ගැනීම හා ඉන් ඇති වූ ප්‍රතිඵල මෑත ඉතිහාසයේ මෙරට කිතුනු සභාවට මුහුණපෑමට සිදු වූ ගැටලු අතර ප්‍රධාන තැනක් ගනී. එදා එම තීරණය ගැනීමට රජය පෙලඹුණු කරුණු කුමක් වුව ද, එතැන් සිට ගත වූ අඩ

සියවසක් පමණ වූ කාලය තුළ මෙරට අධ්‍යාපනයේ ප්‍රගතිය හා විනය පිළිබඳ කතා කරන මධ්‍යස්ථ විචාරකයන් එම තීරණයේ අනිටු පල විපාක සමස්ත රටට ම බලපෑ ආකාරය හෙළි කරනු විටින් විට දැකිය හැකිය.

පසු කාලීන ව 1886 දී කොළඹ අග්‍රරාජගුරුප්‍රසාදීන් වහන්සේ ලෙස පත් වූ ගරු ක්‍රිස්ටෝපර් බොන්ජන් පියතුමා මෙරට කතෝලික අධ්‍යාපනය හා පාසල් ක්‍රමයේ උන්නතිය සඳහා පූජාප්‍රසාදිවරයෙකු ව සිටි කාලයේ සිට ම ඇප කැපවූ උදාර චරිතයකි. ආධාර ලබන පාසල් ක්‍රමය වෙනුවෙන් සටන් කිරීමෙන්, ඉංග්‍රීසි භාෂාව මෙන් ම ජාතික භාෂාව ද අධ්‍යාපනයට එක් කළ යුතු යැයි අවධාරණය කළේ ද මෙතුමා ය. එතුමා පිළියෙළ කළ ආධාර ලබන පාසල් සැලැස්ම 1867 දී රජයේ අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබ ආගමික උපකෘත පාඨශාලා ක්‍රමය නමින් භාවිතයට පැමිණියේ ය. මෙම ක්‍රමය යටතේ සැම පුරවැසියකුගේ ම තම ආගමික අධ්‍යාපනය ලැබීමේ නිදහස සහතික කළ අතර තම දරුවන්ගේ අධ්‍යාපනය සඳහා තමන්ට කැමති පාසලක් තෝරා ගැනීමට දෙමාපියන්ට ඇති අයිතිවාසිකම පිළිගැනිණ. අධ්‍යාපනය සම්බන්ධයෙන් භේද නොසලකා ආධාර දීම රජයේ යුතුකමක් බවට ද පිළිගැනිණි.

මෙම ක්‍රමය යටතේ සැම ආගමයකට ම තමන්ගේ පාසල් ඉදි කිරීමට ද පාසල් පරිපාලනය, නඩත්තුව, කළමනාකාරීත්වය සඳහා සම්පූර්ණ නිදහස ද පැවරිණි. කතෝලික සභාව මඟින් පාලනය වුණු පාසල්වල පැවැති විනය, පිළිවෙළ හා අධ්‍යාපන ක්‍රමවේදය නිසා එම පාසල් අන්‍යාගමිකයන් අතර පවා ජනප්‍රිය විය. අන්‍යාගමිකයන් පවා තම දරුවන් කතෝලික පාසල්වලට ඇතුළු කිරීමට උත්සුක විය. කතෝලික නොවන සිසු-සිසුවියන් ද මෙම පාසල්වලට ඇතුළු වීමේ ප්‍රවණතාවක් ඇති වූයේ මෙම කතෝලික පාසල් පිහිටුවීමේ අරමුණ කතෝලික දරු - දැරියන්ට අධ්‍යාපනය හා චරිත හැඩ ගැස්වීම ලබාදීම ප්‍රමුඛතාව වී තිබිය දී ය.

එහෙත් 1956 බෞද්ධ කොමිෂන් සභා වාර්තාවේ නිර්දේශයක් ලෙස ආධාර ලබන ආගමික පාසල් රජයට පවරා ගැනීමට 1960 දී කතෝලික සභා කළ නිර්දේශය නිසා ශ්‍රේෂ්ඨයන්ගේ හා ජනතාවගේ දැඩි විරෝධය මධ්‍යයේ ආගමික පාසල් රජයට පවරා ගැනිණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස පාසල්වල අධ්‍යාපනය විනයට හා ආචාර ධර්ම, චරිත හැඩ ගැස්වීමට බිඳ වැටුණි.

පාසල් පමණක් නොව ගුරුවිද්‍යාලය ද, රජයට පවරා ගන්නා ලදි. කතෝලික පාසල් 40ක් පමණ රජයේ ආධාර නොලබා සිසුන්ගේ ද කිසිදු උපකාරයක් බලාපොරොත්තු නොවී පවත්වාගෙන යාමට අනුමතිය ලබා ගත්තත් කාලයාගේ ඇවෑමෙන් ආර්ථික අපහසුතා නිසා ඒවායින් සමහරක් ක්‍රමයෙන් රජයට භාරදෙන ලදි.

1980 දී එවකට එක්සත් ජාතික පක්ෂය රජය විසින් ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ අනුමතිය ඇති ව රජයට පවරා නොදුන් පාසල්වල ගුරුවරුන්ට රජයෙන් වැටුප් ගෙවීම ආරම්භ විය.

මේ ගැටලු ශු. සභාවට විශාල බලපෑමක් ඇති කළේ ය. කතෝලික පාසල්වල සිසු සිසුවියන්ට ආගමික අධ්‍යාපනය ලැබී ම අහිමි කළ අතර බොහෝ පාසල්වල කතෝලික ගුරුවරුන් කතෝලික විදුහල්පතිවරුන් නොමැති තත්ත්වයක් උදා විය.

මීසම් මට්ටමින් දහම් පාසල් දිනෙන් දින දියුණු විය.

කතෝලික සභාව තුළ ගිහියන් අතර පිබිදීමක් ඇති වූ පමණක් නොව මීසම් පාලක පියතුමා, දෙමාපියන් හා සිසුන් අතර සමීප සුහදතාවක් ඇති විය.

### පැවිදි සොහොයුරියන් රජයේ රෝහල් සේවයෙන් ඉවත් කිරීම

1956 දී නිකුත් වූ බෞද්ධ කොමිසමේ වාර්තාව අනුව, ශ්‍රී ලාංකේය රජය විසින් පැවිදි සොහොයුරියන්ට රජයේ රෝහල්වල සේවයෙන් 1958 ඔක්තෝබර් මස 01 වන දිනට ප්‍රථම ඉවත වන ලෙස අණ කරන ලදි. එසේ වුවත් ඔවුන්ගෙන් සිදු වූ සේවාව ඉටු කිරීමට ප්‍රමාණවත් හා පළපුරුදු හෙදියන් රෝහල්වල නොසිටි බැවින් එම දිනය කල් දැමීමට සිදු විය.

1964 වන විට මරිය තුමියගේ ෆ්රැන්සිස්කාන පැවිදි සොහොයුරියෝ 64 දෙනෙක් කොළඹ මහ රෝහලේත්, 11 දෙනෙක් හැඳල ළාදුරු රෝහලේත්, 07 දෙනෙක් මාන්තිව් ළාදුරු රෝහලේත්, 06 දෙනෙක් මන්නාරම රෝහලේත් සේවය කළෝය. රජය මෙම පැවිදි නිකාය සමඟ පැවති කොන්ත්‍රාත්තුව, 1964 වර්ෂයේ දී අලුත් නොකළේ ය. මොවුන්ට 1964 මාර්තු මස 15 වන දිනට පෙර, එම රෝහල්වලින් ඉවත් වන ලෙස නියම කෙරිණි. ඒ අනුව ඔවුන් එම රෝහල්වලින් ඉවත් වූයේ, රෝගීන්ගේ හා සෙසු කාර්ය මණ්ඩලවල සෝ සුසුම් හා විරෝධතාව මධ්‍යයේ ය. ඔවුන්ගේ කන්‍යාරාම රෝහල්වලින් ඉවත් කර ගන්නා ලද නමුත් ඒවායේ පැවති දේවස්ථාන අඛණ්ඩ ව පවතින අතර, ඒවායේ දිව්‍ය පූජාව රෝහල් උපාධ්‍ය පියවරුන් විසින් එදා සිට අද දක්වා ම පවත්වනු ලැබෙයි. ශ්‍රී ලාංකිකයන්ට සේවය අහිමි වුවත්, තවත් කණ්ඩායමකට සුබසෙත උදා විය. මෙලෙස හෙද සේවයෙන් ඉවත් කළ පැවිදි සොහොයුරියෝ වෙනත් රටවල් විසින් සාදරයෙන් පිළිගනු ලැබූහ. 1927 මාර්තු මස 01 වන දින සිට, නාවලපිටිය මහ රෝහලේ සේවය කළ ශු.පවුලේ පැවිදි සොහොයුරියෝ, 1964 මාර්තු මස 11වන දින ඉන් ඉවත් කරන ලදහ.

1929 ජනවාරි මස 22 වන දින සිට, රාගම ලය රෝහලේ සේවය කළ සදාසරණ දේවමාතාවන්ගේ පැවිදි සොහොයුරියෝ, 1963 ජනවාරි මස 22 වන දින, ඉන් ඉවත් කරන ලදහ.

1936 ජුනි 01 වන දින සිට, කයිට්ස් රෝහලේ සේවය කළ මෙන්සිගන්හි සිරි කුරුසියේ පැවිදි සොහොයුරියෝ, 1963 ජුනි මස 01වන දින ද, 1938 නොවැම්බර් මස 30 වන දින සිට, යාපනය රෝහලේ සේවය කළ, මෙන්සිගන්හි සිරි කුරුසියේ පැවිදි සොහොයුරියෝ, 1963 නොවැම්බර් මස 30 වන දින ද, ඉන් ඉවත් කරන ලදහ.

1948 ඔක්තෝබර් මස 01 වන දින සිට, වැලිසර ලය රෝහලේ සේවය කළ, දිව්‍ය සංරක්ෂණයේ පැවිදි සොහොයුරියෝ, 1963 ඔක්තෝබර් මස 01 වන දින, ඉන් ඉවත් කරන ලදහ.

1949 අගෝස්තු මස 31 වන දින සිට, මහනුවර මහ රෝහලේ සේවය කළ, මෙරිනෝල් පැවිදි නිකායේ පැවිදි සොහොයුරියෝ 1962 දී ඉන් ඉවත් කරන ලදහ.

1954 මාර්තු මස 01 වන දින සිට, කුරුණෑගල මහ රෝහලේ සේවය කළ, දිව්‍ය ගැලවුම්කාරයාණන්ගේ (සැල්වටෝරියන්) පැවිදි සොයුරියන් ව, 1959 පෙබරවාරි මස 28 වන දින, ඉන් ඉවත් කරන ලදහ.

### පැවිදි අයගේ වීසා අවලංගු කිරීම

ශ්‍රී ලාංකික නොවන පැවිදි අයගේ වීසා අවලංගු කරනු ලැබීම නිසා, විදේශීය ධර්මදූතයන් 300 දෙනෙකුකට පමණ, මෙරටින් පිටත් ව යාමට සිදු විණි.

### ක්‍රිස්තියානි ආගමිකයන් කෙරෙහි නිර්දය විවේචන

පුර්තුගීසි යුගයේ දී ඇතැම් පුර්තුගීසි සෙන්පතියන් හා සොල්දාදුවන්ගේ කෲර ක්‍රියා ඉස්මතු කරමින් එහි වරද වර්තමාන කතෝලිකයන් මත පටවමින් නිර්දය ලෙස විවේචනය කිරීම ද කතෝලිකයන් වනාහි පුර්තුගීසින්ගෙන් පැවත එන ජන කොටසක් ලෙස ඇතැමුන් විසින් විවිධ අවස්ථාවල දී ගැරහීමට ලක් කිරීම ද මෙහි ලා අවධානයට ලක් කිරීම වටී. දේශීය සිරිත් විරිත්වලට ආගන්තුක ව සිටි ඉහළ සමාජ ස්තරයේ කිතුනුවන් විවේචනය කරමින් කිතුනුවන් වනාහි පරගැති, දේශීය සංස්කෘතිය, නොසලකන සිරිත් විරිත් ගරු නොකරන පිරිසකැයි වරින් වර එල්ල වූ පදනම් විරහිත, අභූත චෝදනා ද ශුභාරංචිය පතළ කිරීමේ දූත කාර්යයට සක්‍රිය දායක වන කිතුනු වගකීම "කතෝලික ආක්‍රමණය" ලෙස වපරැසින් බලා නිර්දය විවේචනයට ලක් වීම ද නිදහසින් පසු කිතුනු සභාව මුහුණුදීමට සිදුවූ අභියෝගකාරී ගැටලු වේ.

## ජනවාර්ගික ගැටලුව සහ සාම ක්‍රියාදාමය

1970 දශකය අග භාගයේ දී ශ්‍රී ලාංකික සමාජයේ හටගත් සිංහල-දමිළ ගැටුම් මෙරට මෑත ඉතිහාසයේ සිදු කළ ව්‍යවසනය සුළු පටු නොවේ. ඇතැමුන් ජනවාර්ගික අර්බුදයක් ලෙසින් ද ත්‍රස්තවාදයක් ලෙසින් ද අර්ථ දැක් වූ මෙම ගැටුම් හා හිංසාකාරී ක්‍රියා හමුවේ ක්‍රිස්තු සුභාරංචියට අනුව කටයුතු කරන්නට මෙරට කිතුනු සභාව දැරූ උත්සාහය හා ස්ථාවරය බාහිර සමජයේ වැරදි වැටහීමකට හේතු වූ බැව් කිතුනු සභාවට එල්ල වූ චෝදනාවලින් පෙනී යයි. ශුද්ධ බයිබලීය චින්තනය හා කිතුනු දැක්ම හිංසාව හා යුද්ධ ගැටුම් එකහෙළා ප්‍රතික්ෂේප කරයි. මානව ගරුත්වය කෙලෙසන හා මානව හිමිකම් උල්ලංඝනය වන හිංසාවාදී පිළිවෙතකට ආශීර්වාද කිරීමට ක්‍රිස්තුන් වහන්සේ අනුයන කිතුනුවන්ට හෝ කිතුනු සභාවට හෝ නුපුළුවන. එසේ ම, මේ අරගලයට මුල් වූ සිංහල දමිළ ජාතීන් දෙක ම උතුර හා දකුණ යා කරමින් එක ම සභාවක එක ම දරුකැලක් සේ සිටීම ද කිතුනුවන් ලෙස එක ම දෙවියන් වහන්සේට වන්දනා කරන එක ම දරු කැලක් වීම ද හේතු කොට ජනවාර්ගික අර්බුදය හිංසාවෙන් තොර ව, සාකච්ඡාවෙන් හා සාම ක්‍රියාදාමයකින් විසඳාගෙන දේශපාලන විසඳුමකට යන්නැයි නිතර අදාළ පාර්ශ්වවලට දැන්වීමට ද බල කිරීමට ද එම ස්ථාවරය වෙනුවෙන් නොබිය ව පෙනී සිටිමට ද සභාවට සිදු විය. මෙම ස්ථාවරය නිසා ම, කිතුනුවන් මෙරටට හිතැති නොවන, ත්‍රස්තවාදයට උඩගෙඩි දෙන පිරිසක් ලෙස ජනමාධ්‍යය ඔස්සේ අසාධාරණ විවේචනවලට ලක් වීම ද ශු. සභාව මුහුණපෑ ගැටලුවකි. කරුණු කෙසේ වුව ද, "සාමය ඇති කරන්නෝ භාග්‍යවන්තයෝ ය" යන කිතු සමිඳාණන්ගේ වදන අනුව යමින් සාමකාමී දේශපාලන විසඳුමක් වෙනුවෙන් පෙනීසිටීමින් හිංසාව හා ගැටුම් ප්‍රතික්ෂේප කිරීමෙන් කිතුනු සාක්ෂ්‍යයක නිරත වීම හා සාධාරණ අයිතීන් ගරු කරමින් සැමට යුක්තිය ඉටු විය යුතු ය යන සභා ඉගැන්වීම වෙනුවෙන් පෙනී සිටීමත් සමාජ අභියෝගයක් වූ බැව් පැහැදිලි ය.

## බෙදීගිය කිතුනු ආගමික ව්‍යපාර

මෑත ඉතිහාසයේ මෙරට කිතුනු සභාවට මුහුණදීමට සිදු වූ බරපතළ ගැටලුවක් වුයේ ඇතැමුන් විසින් මූලධර්මවාදීන් ලෙස හඳුන්වනු ලබන බෙදීගිය කිතුනු ආගමික ව්‍යාපාර හා එම අනුගාමිකයන් හා ඔවුන් අනුගමනය කළ ධර්මප්‍රචාරණය ක්‍රමවේදය යි. සදාචාර විරෝධී ක්‍රියා මඟින් අන්‍යාගමිකයන් සිය ආගම ට හරවා ගනිති යි චෝදනා කොට එය බලහත්කාරයෙන් ආගමය වෙනස් කරවීමක් ලෙස අර්ථකථනයක් ද ඇති විය. සාම්ප්‍රදායික පිළිගත් කිතුනු සභා හා මෙම කිතුනු ආගමික ව්‍යාපාර අතර ඇති පැහැදිලි වෙනස දැන හෝ නොදැන හෝ මේ පිළිබඳ අන්‍යාගමික නායකයන්ගේ හා සංවිධානවල විවේචන එල්ල වූයේ කතෝලික සභාවට හා පිළිගත් සම්ප්‍රදායික ප්‍රධාන කිතුනු සභාවලට ය. මෙම විවේචන හා මූලධර්මවාදී ආගමික ව්‍යාපාරවල සදාචාර නොවන ලෙස හඳුන්වන ක්‍රියා මෙරට සභාවට ගැටලුවක් විය. මේ පිළිබඳ ව සමාජයේ පැවැති කතිකාව කොතරම් උග්‍රවී ද යත් බලහත්කාරයෙන් අන්‍යාගම්වලට හරවා ගැනීම තහනම් කිරීමේ පනත් කෙටුම්පතක් ද 2004 දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් වී ඒ පිළිබඳ නොයෙකුත් සංවාද ඇති වී තිබේ. මූලධර්මවාදී ක්‍රියා හේතුකොට ගෙන මෙරට කතෝලික සභාවට ද අනපේක්ෂිත ප්‍රතිඵලවලට මුහුණ දීමට සිදු වීම බරපතළ ගැටලුවක් ලෙස දිස්වේ.

## දේශීයකරණය සඳහා දරන ලද ප්‍රයත්න

ජනවන්දනාවේ ප්‍රධාන නිල භාෂාව වුයේ ලතින් භාෂාව යි. එහෙත් දෙවන වතිකාන කතිකාවට පසු ව ස්වභාෂාවලින් වත්පිළිවෙත් සිදු කරන්නට අවසරය ලැබීමත් සමඟ ශ්‍රී ලංකාවේ ද සිංහල - දෙමළ භාෂාවලින් ජනවන්දනා පිළිවෙත් සිදු කරන්නට සිදු විය.

ජනවන්දනා පිළිවෙත් සඳහා ක්‍රියාකාරී ව දායක වීම මුල් තැන්ගත් හෙයින් ජනතාවගේ ක්‍රියාකාරී දායකත්වය වැඩි වර්ධනය විය.

ජනවන්දනා පිළිවෙත්වල නියමිත කාර්යයන් සඳහා ඒ ඒ සේවා ධුරවලට අදාළ කටයුතු අර්ථාන්විත ව සිදු කිරීමට මඟ සැලසීම.

දේශීය භාෂාවලින් ගීතිකා සකසා ගැනීමට ලද අවසරයෙන් දේශීය සංගීතයට, අනුව ස්වදේශීය ගායනයට හා නිර්මාණවලට ඉඩකඩ ලැබිණි.

ජනවන්දනාවේ භාවිත පූජා භාණ්ඩ හා පූජා ඇඳුම් දේශීය සිරිතට හා ලක්ෂණවලට අනුකූල ව නිර්මාණයට අවසර ලැබිණි.

දේවස්ථාන ගොඩනැගීමේ දී දේශීය කලාවට හා ගෘහ නිර්මාණ ශිල්පයට අනුකූලව සිදුවීම ඇරඹිණි.

විවාහ මංගල්‍ය හා වෙනත් උත්සව ආදියේ දී දේශීය සම්ප්‍රදායානුකූල සැරසිලි හා කලා අංග එකතු කිරීමට අවසර ලැබිණි.

දේව වචනයට ප්‍රධාන තැනක් ලැබීම හා ඒ කෙරෙහි ජීවමාන ප්‍රේමයක් හා ගෞරවයක් ඇති විය.

රෝමානු පිළිවෙතේ අනන්‍යතාව සුරැකෙන සේ ජනවන්දනා පොත් දේශිය භාෂාවලට පරිවර්තනය කිරීමට ලද අවසරය ප්‍රයෝජනයට ගැනිති.

### නිදහස් යුගයේ රදගුරු පදවි විකාශය

1972 දී බදුල්ල රදගුරු පදවිය ද, 1981 දී මන්නාරම රදගුරු පදවිය ද, 1982 දී අනුරාධපුර රදගුරු පදවිය ද, 1987 දී කුරුණෑගල රදගුරු පදවිය ද, 1995 දී රත්නපුර රදගුරු පදවිය ද, 2012 දී මඩකලපුව රදගුරු පදවිය ද ඇරඹිණි.

### ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

1. නිදහසින් පසු ශ්‍රී ලංකේය ශු. සභාව මුහුණ දුන් ගැටළු 03ක් ලියන්න.
2. නිදහස් යුගයේ ශ්‍රී ලංකාවේ කිතු දහම පිළිබඳ කරුණු 10ක් ලියන්න.
3. ශ්‍රී ලංකාවේ ශු. සභාව දේශීයකරණය වීම පිළිබඳ කරුණු 05ක් ලියන්න.

### ආශ්‍රිත ග්‍රන්ථ


- කොලමුන්නේ, තිමති (පියතුමා), **සිරිලක් කිතු සසුන, දෙවන කාණ්ඩය,** ප්‍රැන්සිස්කන් නිවාසය, බෝලවලාන, 2006.
- දසනායක, ජුඩ් (පියතුමා), **ශ්‍රී ලංකා කතෝලික සභා ඉතිහාසය හා බැඳුණු රදගුරු පදවි හා පැවිදි නිකායන්,** කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, 2013.
- ගෝමිස්, ඔස්වල්ඩ් (අගරදගුරුතුමා), **කතෝලික යටගියාව (ශ්‍රී ලංකාව),** අගරදගුරු නිවස, කොළඹ 8, 2012.

නිපුණතාව 10.0 : මානව වටිනාකම් සුරකිමින් විවිධත්වය තුළ ඒකත්වය ගොඩ නැගීමට කැප වෙයි.

නිපුණතා මට්ටම 10.1 : වත්මන් සමාජය තුළ කිතුනු වගකීම් නොපිරිහෙළා ඉටු කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 15

ඉගෙනුම් පල :

- මිනිස් බවේ ගරුත්වය සුරැකීම සඳහා කිතුනුවා ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- අන් අයට ගරු කළ යුතු බව පිළිගනියි.
- මිනිස් බවේ ගරුත්වය සුරැකීම සඳහා කිතුනුවා ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- මානව සංවර්ධනය සඳහා කටයුතු කරයි.
- ගැටුම් නිරාකරණය කර ගනිමින් සාමකාමී ව දිවි ගෙවයි.

## 10.1.1 මිනිස් බවේ ගරුත්වය

සැම මනුෂ්‍යයකු ම මෙලොව බිහි වීම හේතු කොට ගෙන ස්වභාවයෙන් ම විශේෂිත ගරුත්වයක් හා උත්තරීතර බවක් හිමි වේ. මනුෂ්‍යයාගේ පැවැත්ම, වර්ධනය හා සමාජ ක්‍රියාකාරීත්වය ගැන බලන විට අපට පෙනෙනුයේ සියලු සත්ත්වයන් අතර බුද්ධියෙන් හා ප්‍රඥාවෙන් යුක්ත තියුණු කල්පනා ශක්තියකින් හා සන්නිවේදන රටාවකින් පිරිපුන් උසස් ම සත්ත්වයා මනුෂ්‍යයා බව යි. සැම ආගමයක් ම මිනිසත් බව ලැබීම ඉතා උතුම් තත්ත්වයක් ලෙස සලකයි.

### මිනිස් බවේ ගරුත්වය පිළිබඳ ශුද්ධ බයිබලීය චින්තනය

- දෙවියන් වහන්සේ විසින් සියලු දේ මවනු ලැබුව ද ඒවා පිට නම් තැබීම භාර කරන ලද්දේ මනුෂ්‍යයාට ය. එසේ කිරීම මඟින් මැවිල්ල මත ආධිපත්‍යය මිනිසාට හිමි කර දී ඇත.
(උත් 2:19)
- දේව පුත්‍රයාණන් වූ ක්‍රිස්තුන් වහන්සේ මනුෂ්‍යය ස්වරූපයක් ගෙන මාංසගත වූ සේක. උන්වහන්සේ මනුෂ්‍ය ස්වරූපයක් ගත්තේ මිනිසා පාපයේ වහල් බැම්මෙන් මුදවා ගැනීමටයි.
(ජොහාන් 1:14, මතෙව් 1:20, ලූක් 1:35)
- මිනිස් ස්වරූපයක් ගත් ක්‍රිස්තුන් වහන්සේ මනුෂ්‍යයා පාපයේ වහල් බැම්මෙන් ගලවා ගැනීමට කුරුසයේ මරණය තෙක් දෙවියන් වහන්සේට කීකරු වෙමින් දේව පොරොන්දුව ඉටු කළ සේක.
(පිලිප් 2:6-8, හෙබ්‍රෙව් 9:12, 2 කොරෙන්ති 6:16)
- අනෙක් මැවිලිවලට නොදෙන ලද විශේෂ තිළිණයක් උන් වහන්සේ මනුෂ්‍යයාට දානය කර ඇත. එනම් මිනිසාට පමණක් අමරණීය ආත්මයක් හිමි ය.
- බුද්ධිය හා ප්‍රඥාව මනුෂ්‍යයා වෙත ගලා එන්නේ සියලු ප්‍රඥාවේ උල්පත හා පූර්ණත්වය වන දෙවියන් වහන්සේගෙන් ය. වෙනත් මැවිලිවලට නොමැති නමුත් මනුෂ්‍යයාට පමණක් ලබා දී ඇති මෙම බුද්ධිය හා ප්‍රඥාව දේව සමානකමේ හා මනුෂත්වයේ උදාරත්වයේ ලක්ෂණයකි. මිනිසා සන්නිවේදන කුසලතාව අතින් ද සිටිනුයේ ඉහළ තලයක ය.

- මනුෂ්‍යයා ලද නිදහස් කැමැත්ත ද මිනිසා දෙවියන් වහන්සේගෙන් ලද තිළිණයකි. නිදහසේ තීරණ ගැනීමේ හැකියාව ද මිනිසාට පමණක් හිමි භාගයකි. එහෙත් සතුන්ට එසේ තීරණ ගැනීමේ හැකියාවක් නැත. සතුන්ට ඇත්තේ ඉව මත ක්‍රියා කිරීමේ හැකියාව පමණි.

- මනුෂ්‍යයාගේ උතුම්කම රඳා පවතින්නේ ඔහුට ම විශේෂිත හෘදය සාක්ෂ්‍ය නිසා ය. හෘදය සාක්ෂ්‍ය නිදහස් කැමැත්ත ඔස්සේ කටයුතු කිරීමට මිනිසාට මඟ පෙන්වයි.

## කාන්තාව පිළිබඳ කිතුනු චින්තනය

- සමකාලීන ජුදා සමාජය තුළ කාන්තාවට ලැබුණේ ඉතා ම පහත් තැනකි. එහෙත් ශුද්ධ බයිබලීය චින්තනයෙහිලා කාන්තාව ඉතා උසස් කෙනෙකු ලෙස ඉදිරිපත් කරයි.

- මැවීමේ පළමු කථාව අනුව ස්ත්‍රිය හා පුරුෂයා යන දෙදෙනාම මවනු ලැබුවේ දේව සමානකමට ය (උත් 1:27). එහෙයින් පුරුෂයා ද ස්ත්‍රිය ද අතර ඇත්තේ සමානාත්මතාවකී. එක් කෙනෙක් අනෙක් කෙනාට වඩා උසස් හෝ පහත් හෝ නොවෙති.

- දෙවි පියාණන් වහන්සේ ආශිර්වාද කර, දරු සම්පත් ලබා, වඩා වර්ධනය කර, පොළොව යටත් කර ගෙන, මැවිල්ල මත බලය පවත්වන්නැ යි වදාළේ ද පුරුෂයා හා ස්ත්‍රිය යන දෙදෙනාට ම ය. (උත් 1:28)

- උත් 2:18ට අනුව, තනි ව සිටින මනුෂ්‍යයාගේ තනිකම මැකෙන්නේත්, සම්පූර්ණත්වය ඇති වන්නේත්, සතුන්ගෙන්, ගස්කොළන්වලින් නොව සහකාරිය වන ස්ත්‍රියගෙනි. සහකාරිය යනුවෙන් අදහස් කරනුයේ සහය වන්නියකිඃ සහජීවනය දෙන්නියකි.

- උත් 2:21-22 ට අනුව "උන් වහන්සේ මනුෂ්‍යයාගෙන් ගත් ඉළ ඇටයෙන් ස්ත්‍රිය මවා ඔහු වෙත ගෙන ආ සේක. ඉළ ඇටය හදවතට සමීප තැනකින් ගත්තකි.

හිසින් ⟶ පාලිකාවක්

පාදයෙන් ⟶ වහලියක්

එම නිසා පාලිකාවක් හෝ වහලියක් හෝ නොවේ. පුරුෂයාගේ ඉළ ඇටයක් අඩු යි. එම නිසා පූර්ණත්වයට පත් කිරීමට දෙදෙනා ම අවශ්‍ය බවත්, අසම්පූර්ණ මනුෂ්‍යයා ස්ත්‍රිය මඟින් සම්පූර්ණත්වයට පත් වන බවත් දැක්වේ. ඉළ ඇටය මඟින් ලේ නෑදෑකමක්, බිඳිය නොහැකි සබඳතාවක් හා අනොන්‍ය වශයෙන් සමානාත්මතාවක් පෙන්නුම් කරයි. ශුද්ධ බයිබලයට අනුව ස්ත්‍රිය හා පුරුෂයා සම්පූර්ණත්වයට පත් කරගනියි.

- ගැලවීමේ ඉතිහාසය පුරා ම ගැලවීමේ කාර්යයට විවිධාකාරයෙන් දායක වූ කාන්තාවන් රාශියකගේ උදාර චරිත පිළිබඳ ව ශුද්ධ බයිබලය අධ්‍යයනයේ දී අපට දැක ගත හැකි ය.

- දෙවියන් වහන්සේගේ පව්කාර මනුෂ්‍ය සංහතිය පාපයෙන් මුදා ගැලවීම ගෙන දීමට ක්‍රිස්තුන් වහන්සේගේ මව වීම සඳහා තෝරා ගනු ලැබුවේ ද කන්‍යා මරිය තුමියයි. (ගලාති 4:4)
  මරිය තුමිය කාන්තාවන් අතර සුවිශේෂ කාන්තාවකි. ක්‍රිස්තුන් වහන්සේ කුරුස ගසේ දී දේව මෑණියන් ව සිය ප්‍රේම කළ ශ්‍රාවකයාට භාර දීම මඟින් ඇය ශුද්ධ වූ සභාවේ ද මාතාව වන්නී ය. (ජොහාන් 19:25-26)

- ක්‍රිස්තුන් වහන්සේගේ දූත සේවාවේ දී අනුගාමික වූ, සහාය වූ ඇප උපස්ථාන කළ කාන්තාවන් අතර ලාසරස්ගේ සහෝදරියන් වූ මාර්තා සහ මරියා විශේෂ තැනක් ගනි. ක්‍රිස්තුන් වහන්සේ සමඟ ඇති කර ගත් සමීප සම්බන්ධතාව නිසා ඔවුන්ගේ ජීවිත අර්ථවත් වූ බව සුවිශේෂයෙහි පහදා දෙයි.

- සමාජයෙන් කොන් කරන ලද අසරණ කාන්තාවන් පිළිබඳ ව දයානුකම්පාවෙන් ක්‍රියා කළ ජේසුස් වහන්සේ ඔවුන් කෙරෙහි දැක් වූ ආදරය හා ගෞරවය නායිම් නුවර වැන්දඹුවගේ පුතා මරණයෙන් නැගිට වීමේ සිද්ධිය මගින් පැහැදිලි වන අතර කුදු ස්ත්‍රිය සුව කිරීමේ සිද්ධිය මගින් ද කාන්තාවන් කෙරෙහි උන් වහන්සේ තුළ පැවැති අනුකම්පාව පිළිබිඹු වේ.

- සමාජයේ අපහාසයට හා උපහාසයට ලක් වු සමරිතානු ස්ත්‍රිය වැනි කාන්තාවන් ක්‍රිස්තුන් වහන්සේ හමු වීම මගින් ජීවිතය වෙනස් කර ගත්තා පමණක් නොව ඇය ධර්ම දූතිකාවක බවට ද පත් වූවා ය.

- ක්‍රිස්තුන් වහන්සේ ඉතා ළඟින් ඇසුරු කළ අපෝස්තුලුවරුන් උන් වහන්සේ ව අතහැර පලා ගිය ද ක්‍රිස්තුන් වහන්සේගේ මෑණියෝ ද එතුමියගේ සහෝදරිය වූ ක්ලෝපාස්ගේ භාර්යාව වූ මරියා ද මග්දලාහි මරියා ද යන කාන්තාවෝ උන් වහන්සේ හැර දමා නොගිය. හ.

- ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානයේ සුපුවතෙහි පළමු සාක්ෂ්‍යකාරිය වූයේ ද මග්දලාවේ මරියා වන අතර අපෝස්තුලුවරුන් වෙත එම සුපුවත රැගෙන යාමේ ගෞරවය ද හිමිවූයේ ඇයට ය.

**මනුෂයයාගේ සමාජ ජීවිතය පිළිබඳ කිතුනු චින්තනය :**

දෙවියන් වහන්සේ ගේ උත්තරීතර මැවිල්ලක් වූ මිනිසා සමාජීය සත්ත්වයකු බව ශුද්ධ ලියවිල්ල පැහැදිලි කර දෙයි. උත් 2:18 මැවීමේ ක්‍රියාවලියේ දී දෙවියන් වහන්සේගේ අභිමතය වූයේ මිනිසා තනි ව හුදෙකලා ව ජීවත් වීම නොව ස්ත්‍රිය හා පුරුෂයා ලෙස සබඳතා ගොඩා නගමින් පවුලක් ලෙස ජීවත් වීම ය.

කවර මිනිස් සමාජයක කුඩා ම ඒකකය වනුයේ පවුල යි. මිනිසකු හා ස්ත්‍රිය අතර සිදු වන විවාහය පවුල් සංස්ථාවේ පදනම වේ. ශුද්ධ බයිබලීය න්තනයට අනුව ආදම් හා ඒව යන ආදි මවුපියන් පළමු මිනිස් හා ස්ත්‍රිය සමාජීය වශයෙන් පවුලක් ලෙස ජීවත් වීම දේව අභිමතය ය. තනි ව සිටි (ආදම්) සම්පූර්ණත්වයට ලැබුවේ තමන් හා සමාන වූ ස්ත්‍රිය (ඒව) නිසා ය.

ආදි මවුපියන්ගේ සිට අඛණ්ඩ ව පැවත එන ස්ත්‍රි පුරුෂ සබඳතාව ය දේව ආදරයට සාක්ෂ්‍ය දරයි. විවාහයේ පාරිශුද්ධත්වය පිළිබඳ ව ක්‍රිස්තුන් වහන්සේගේ අභිමතය එය සක්‍රමේන්තු ජීවිතය දක්වා උසස් කිරීම තුළින් පැහැදිලි වේ.

ප්‍රේමය, විශ්වාසය හා එකිනෙකා කෙරෙහි ගරුත්වය යන පොරොන්දු ඔස්සේ විවාහපත් යුවළක් එකිනෙකාට ත්‍යාජ වෙමින් පරිත්‍යාගශීලි ජීවිතයකට ඇතුළත් වෙති. විවාහය නමති සක්‍රමේන්තු ජීවිතය තුළ ඔවුනොවුන්ට පැවරෙන වගකීම් හා යුතුකම් මනා ව ඉටු කරමින් ජීවත් වීමට විශේෂ කැඳවීමක් ලබ යි. විවාහ ජීවිතයට පා තබන ස්ත්‍රිය හා පුරුෂයා දරුවන් ජනනය කිරීම. ඇති දැඩි කිරීම හා ඔවුන්ට නිසි අධ්‍යාපනයක් ලබා දීම මගින් සමාජයේ කුඩා ම ඒකය වන පවුල් සංස්ථාව ගොඩනගයි.

විවාහ දිවියේ පරිශුද්ධත්වය පිළිබඳ ව කථා කරන ශුද්ධ වූ පාවුලු තුමා අඹුසැමියන් අතර තිබිය යුතු සබඳතාව ය.

ස්වාමි පුරුෂයා හා භාර්යාව අතර තිබිය යුතු සම්බන්ධතාව පිළිබඳ කරුණු උපතින් ඉතා උසස්, පිරිසිදු එකක් වෙයි. පාවුලු තුමා ස්වාමි පුරුෂයා හා භාර්යාව අතර තිබිය යුතු සම්බන්ධතාව ක්‍රිස්තුන් වහන්සේ හා සභාව අතර ඇති සම්බන්ධතාවට සමාන කරයි. මෙම සම්බන්ධතාවේ පදනම ආදරයයි. ක්‍රිස්තුන් වහන්සේ ශු. සභාවට ප්‍රේම කළාක් මෙන් ස්වාමි පුරුෂයා තම භාර්යාවට ප්‍රේම කළ යුතු ය. කිසිවිටක එය ස්වආලයේ

ආදරයක් නොවිය යුතුය. ක්‍රිස්තුන් වහන්සේ සභාවට හිස වන්නාක් මෙන් ස්වාමි පුරුෂයා භාර්යාවගේ හිස ය. එය බලය පෙන්වීමේ නායකත්වයක් නොව ප්‍රේම කිරීමේ නායකත්වයක් වේ. (එපිස 5:22-30)

ස්වාමි පුරුෂයා හා භාර්යාව අතර ඇති අන්‍යෝන්‍ය ප්‍රේමය, සේවය ලැබීමට වඩා සේවය කිරීමට නැඹුරු වන උත්තරීතර හා පරිශුද්ධ බැඳීමක් විය යුතු ය.

දෙමාපිය ආදරය තුළ වැඩෙන දරුවන් දෙමාපියන් වෙත දැක්විය යුතු වගකීම් හා යුතුකම් පෙළ ගස්වෙයි. දෙමාපියන්ට කීකරු වීම, මවටත් පියාටත් ගෞරව කිරීම හා ඔවුන්ගේ අවවාද අනුශාසනා තුළ ජීවිතය හැඩගස්වා ගැනීම අත්‍යවශ්‍ය ය.

දෙමාපියන් විසින් දරුවනට දැක්විය යුතු යුතුකම් පෙළ ගස්වන ශුද්ධ වූ පාවුලු තුමා කියා සිටිනුයේ දරුවන් කෝප නොකිරීමටත් සැම විටම ආදරයෙන් හා කරුණාවෙන් මෙන් ම ක්‍රිස්තියානි ලීලාවෙන් ඔවුන් ව ගොඩනැන්විය යුතු බව ය. (එපිස 6:4)

## මානව සංවර්ධනය සඳහා කිතුනු සහභාගිත්වය

දෙවියන් වහන්සේගේ සමානකමට හා ස්වරූපයට මවන ලද මිනිසා මානව සංවර්ධනය සඳහා දායක විය යුතු බව උන් වහන්සේගේ අභිමතය විය. (උත් 1:28)

ශුද්ධ බයිබලය පුරා දිව යන්නේ දෙවියන් වහන්සේ මනුෂ්‍යයාට දක්වන ප්‍රේමයේ කතාන්දරයයි. මිනිස්කමට ගරු කිරීම, මානව සංවර්ධනය සඳහා දායක වීම යනාදිය මිනිසාගේ සතු යුතුකම් වේ.

ක්‍රිස්තුන් වහන්සේ වදාළ යහපත් සමරිතානුවරයා පිළිබඳ උපමාව (ලූක් 10:25-37) මඟින් මිනිසත්කම උදෙසා කාලය, ශ්‍රමය හා ධනය වැය කළ යුතු බව පැහැදිලි කරයි. ඒ සඳහා ජාතිය, ආගමය, තරාතිරම බාධා නොවිය යුතු ය. තම සහෝදරයාට කෙසේ සංවේදී විය යුතු ද යන්න උන් වහන්සේ වදාළ ධනපතියා හා ලාසරස් පිළිබඳ උපමාවෙන් (ලූක් 16:19-31) පැහැදිලි වේ.

ක්‍රිස්තුන් වහන්සේ කන්ද උඩ දේශනාවේ දී දන්දීම පිළිබඳ ව කරන ඉගැන්වීම් මඟින් ද මානව සංවර්ධනය සඳහා එහි ඇති වැදගත්කම තහවුරු කරමින් ක්‍රිස්තුන් වහන්සේ අපට ආරාධනා කරන්නේ එහි අරමුණෙහි පිහිටා මිස තමන්ගේ ජනප්‍රියත්වය සඳහා එය සිදු නොකරන ලෙසට ය (මතෙව් 6:1).

මානව සංවර්ධනය සඳහා ප්‍රේම කිරීමේ අවශ්‍යතාව ජොහන් එතුමාගේ පළමු හසුනෙන් පැහැදිලි කරයි. තම සහෝදරයාට ප්‍රේම නොකරන තැනැත්තාට නොපෙනෙන දෙවිඳුන්ට ප්‍රේම කළ නොහැකි බව එතුමාගේ තර්කය යි (1 ජොහන් 4:20-21).

මානව සංවර්ධනය සඳහා කිතුනුවාගේ දායකත්වය මත ජීවිත අවසානයේ ඔහු ව විනිශ්චයයට ලක් වන බව සුවිශේෂයෙහි පැහැදිලි කරයි (මතෙව් 25:31-46).

මානව සංවර්ධනය සඳහා කිතුනු සහභාගිත්වය කෙතරම් වැදගත් වන්නේ ද යන්න තේරුම් ගත් අති උතුම් XXiii වන ජුවාම් ශුද්ධෝත්තම පියතුමා මනුෂ්‍යයා ස්වභාවයෙන් ම සමාජීය වන හෙයින් අනුන් සමඟ එකතු වී එකිනෙකාගේ ශුභ සිද්ධිය සඳහා වැඩ කිරීම අත්‍යවශ්‍ය බව "ලෝක සාමය" නමැති විශ්ව ලේඛනයෙහි පැහැදිලි කරයි.

මානව සංවර්ධනය සඳහා පොදු යහපත ඇති කිරීමේ අවශ්‍යතාව වර්තමාන ලෝකයේ ශුද්ධ වූ සභාව නම් දෙවන වතිකාන ප්‍රකාශනය පැහැදිලි කරයි. එනම් "පොදු යපහත යනු සමාජයේ සැම ජන කොටසකගේ ම සහ පුද්ගලයකුගේ ම පූර්ණත්වයට ඉඩ සැලසීම යි" (අංක 26).

## ගැටුම් නිරාකරණය හා සාමය නඟාලීම

යම් කිසි පුද්ගලයන් දෙදෙනෙකු අතර හෝ කණ්ඩායම් දෙකක් අතර හෝ අන්ත දෙකක් අතර හෝ එකඟතාවක් සිදු නොවීම උග්‍ර වූ විට ගැටුම්කාරී තත්ත්වයක් උදා වේ. තව ද යුක්තිය හා සාධාරණත්වය නඟාලිය යුතු ය. සමස්ත මැවිල්ල දේව තිළිණයක් ලෙස මිනිසාට බාර කළ දෙවියන් වහන්සේගේ අභිමතය වනුයේ මිනිසා මැවිලි සමඟ සාමයෙන් හා සංහිඳියාවෙන් ජීවත් වීම යි. ප්‍රචණ්ඩත්වය, ගැටුම්, හිංසාව හා යුද්ධය කිසි සේත් දේව අභිමතය නොවේ.

සාමය යනු ඉබේ පහළ වන්නක් නොවේ. අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමේ දී, පීඩිතයන් සූරා කෑමේ දී, නිර්දය හෙළා දැකීම්වල දී සාමය කඩ වේ.

සාමය යන සංකල්පය සැම විට ම සාධාරණ ඉල්ලීම් යුක්ති සහගත අපේක්ෂාවන් මෙන් ම අයිතිවාසිකම් හා එකට බැඳී පවතී. ඒවා ඉෂ්ට වන විට සාමය උදා වීම හෙවත් පූර්ණත්වය ලබා ගැනීමේ අවස්ථාව උදා වේ.

සාමය සඳහා භාවිත වන හෙබ්‍රෙව් වචනය "ෂාලොම්" වේ. එහි අර්ථය යමෙකුගේ සාධාරණ අපේක්ෂා හා සිතුම් පැතුම්, ඉටු වීම හේතුවෙන් ඔහු හෝ ඇය හෝ තුළ හෝ ඇති වන සැහීමකට පත් වීම නැතහොත් තෘප්තිමත් බව නිසා ජනිත වන සන්තුෂ්ටිය යි. එය පුද්ගලයා තුළ ඇති වන පූර්ණත්වය අත්දැකීමක් ලෙස ද හැඳින්විය හැකි ය.

සාමය යනු යුද්ධයෙන් තොරවීමක් පමණක් නොවේ. ජනතාව සතු සම්පත් සුරැකීමෙන් ද එකිනෙකා අතර නිදහස් සබඳතාවන් පැවතීමෙන් පෞද්ගලික හා පොදු ගරුත්වය සැලසීමෙන් ද සහෝදරත්වයෙන් කටයුතු කිරීමෙන් ද තොරව මිහිපිට "සාමය" බිහිකළ නොහැකි ය. සාමය මානව පැවැත්ම තුළ පවතින නිසල බව හා සාධාරණත්වය ක්‍රියාත්මක වීම හා දයා කරුණාවේ ප්‍රතිඵලයක් බව ක.ස.ධ 2034 හි ඉදිරිපත් කර ඇත.

අති උතුම් XXIII වන ජුවාම් ශුද්ධෝත්තම පියතුමා විසින් ලියන ලද "ලෝක සාමය" නමැති විශ්ව ලේඛනයෙන් ද (1963) වතිකානු ප්‍රකාශනයක් වන වර්තමාන ලෝකයේ ශුද්ධ වූ සභාව නමැති ලේඛනයෙන් ද (1965) සාමය නඟාලීම සම්බන්ධ සභාවේ ස්ථාවරය තහවුරු කරයි.

## පරිසරය සුරැකීමේ කිතුනු වගකීම.

උත්පත්ති පොතේ සඳහන් මැවීමේ කථාවල මූලික පරමාර්ථ වූයේ විශ්වයේ සියලු මැවිලිවලට වඩා ඉහළින් දෙවියන් වහන්සේගේ පරමාධිපත්‍යය හා බලය තහවුරු කිරීම යි. සමස්ත මැවිල්ල, ස්වභාව ධර්මය හෙවත් පරිසරය ඇති වන්නේ දෙවියන් වහන්සේගේ ක්‍රියාකාරීත්වයෙනි.එමෙන් ම දෙවියන් වහන්සේගේ සමානාත්වයට හා ස්වරූපයට මවන ලද මිනිසා පරිසරයේ භාරකරු හා නියමුවා බවට ද පත් වේ. පරිසරය සුරැකීමට මිනිසා දේව නියමයෙන් ම බැඳී සිටියි. (උත්පත්ති 1:28)

ක්‍රිස්තුන් වහන්සේ දූත සේවාව පලස්තීනයේ පාරිසරික සෞන්දර්යය හා සම්බන්ධ වන අයුරු ශුභාරංචිවල මනා ව නිරූපණය වේ. ක්‍රිස්තුන් වහන්සේ සොබා දහමට හා පරිසරයට අධිපතියාණෝ ය. එම නිසා ම ස්වභාව ධර්මය උන් වහන්සේට කීකරු ය (මාක් 4:39). උන් වහන්සේගේ ඉගැන්වීම්වල දි සොබා දහමට අනුගත සිද්ධීන් උපයෝගී කරගත් සේක (මතෙව් 6:25-30). තව ද පලස්තීනයෙහි කාන්තාර, කඳු වැටි, ගස් කොළන්, ගොයම, සත්තු, පක්ෂී, ගංගා, මූහුදු, අහස, සුළඟ උන් වහන්සේට කිසිසේත් ආගන්තුක නොවූහ.පරිසරයට ආදරය කළ උන් වහන්සේ සිය ඉගැන්වීම්වල දී ඒවා උපයෝගි කර ගැනීමෙන් පැහැදිලි වන්නේ එහි අගය වටහා ගත් බව ය.

දෙවියන් වහන්සේ විසින් මැවූ සියල්ල යහපත හා මනහර බව දුටු ස්වභාව ධර්මය ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතයට ඉතා සමීප පරිසරය මිනිසාගේ කෑදරකම හා ආත්මාර්ථකාමී බව නිසා දිනෙන් දින විනාශයට පත් වෙමින් පවතී. වර්තමානයේ මිනිසාට මුහුණපෑමට සිදු වී ඇති බිහිසුණු ව්‍යසනවලට හේතුව ද පරිසරය විනාශ කිරීමයි. වර්තමාන මිනිසා මුහුණදෙන බලවත් ප්‍රශ්නයක් ලෙස පරිසරය විනාශ කිරීම හැඳින්විය හැකිය.

ස්වභාව සෞන්දර්ය විනාශ වීම වළක්වා, එය දූෂණය වීමේ අවස්ථා මඟ හැර එය සුරැකීමට හා ආරක්ෂා කිරීමට අවැසි ක්‍රියා මාර්ග ගනිමින් එයට කැප වීම මිනිසා සතු වගකීම මෙන් ම පරම යුතුකම ද වන්නේ ය.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :**

1. මිනිස් බවේ ගරුත්වය සුරැකීම සඳහා කිතුනුවා ක්‍රියා කළයුතු ආකාරය 05ක් ලියන්න.
2. 'කාන්තාව පිළිබඳ කිතුනු චින්තනය' යන මැයෙන් පුවත්පතකට ලිපියක් ලියන්න.
3. කිතුනුවකු ලෙස පරිසරය සුරැකීමේ වගකීම ඉටුකරන ආකාරය ලියන්න.

**ආශ්‍රිත ග්‍රන්ථ**

- ශුද්ධ බයිබලය
- වර්තමාන ලෝකයේ ශු. සභාව - දෙවන වතිකා ප්‍රකාශන

**නිපුණතාව 10.0 : මානව වටිනාකම් සුරකිමින් විවිධත්වය තුළ ඒකත්වය ගොඩ නැඟීමට කැප වෙයි.**

**නිපුණතා මට්ටම 10.2 :** එකම ශුද්ධවූ සභාවක් ගොඩනැගීමට සහජීවනයෙන් කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 15

**ඉගෙනුම් පල :**

- කිතුනු සභා සමඟිය පිළිබඳ තොරතුරු ගොනු කරයි
- සභා එකමුතුකම උදෙසා ක්‍රියා කළ යුතු බව පිළිගනියි
- කිතුනු සභා සමඟිය පිළිබඳ තොරතුරු නිර්මාණාත්මකව ඉදිරිපත් කරයි
- සභා ඒකත්වය වෙනුවෙන් කටයුතු කරයි
- සෙසු සභාවට ගරු කරයි

## 10.2.1 කිතුනු සභා සමඟිය

ගැලවීමේ සැලස්ම මානව සංහතිය පුරා යුගාන්තය දක්වා මිහිපිට සිදු වීමට ක්‍රිස්තුන් වහන්සේ විසින් ශුද්ධ වු පේදුරු අපෝස්තුලුතුමන්ගේ නායකත්වයෙන් වූ ශුද්ධ වු සභාව ස්ථාපනය කළ සේක.

එක ම දෙවියන් විසින් කැඳවන ලද්දා වූ එක ම ස්වාමීන් වහන්සේට අයිති වූ එක ම ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පූර්ණ වූ එක ම ශුද්ධ වූ සභාවේ ඒකත්වයට බාහිර ව විද්‍යමාන විය යුතු ය. ක්‍රිස්තුන් වහන්සේ ස්ථාපනය කළේ එක් ශුද්ධ වූ සභාවකි. සභා කීපයක් නොවේ.

ශුද්ධ වූ සභාවේ අනිවාර්යයෙන් පැවැතිය යුතු හා එකකින් එකක් වෙන් කළ නොහැකි ආකාරයට බද්ධ වී ඇති ලක්‍ෂණ හතරක් ගෙන හැර දැක්වෙයි.

ශුද්ධ වූ සභාවේ අනිවාර්ය ලක්‍ෂණ 4කි.

1. ඒකත්වය
2. ශුද්ධත්වය
3. කතෝලිකත්වය
4. අපෝස්තලිකත්වය

ඒකත්වය යනුවෙන් අදහස් කරන්නේ ශුද්ධ වු සභාවේ එකමුතුකම යි. ශුද්ධ වූ සභාවේ එකමුතුකමේ පදනම ශුද්ධ වූ ත්‍රිත්වය යි. සියලු විශ්වාසිකයන් කැඳවා ඇත්තේ පියාණන් වහන්සේ ය. සියලු විශ්වාසකයන් ශුද්ධාත්මයාණන්ගෙන් පරිපූර්ණ කර ඇත. ආත්මයාණන් වහන්සේ සියලු විශ්වාසිකයන් තුළ වාසය කරමින් ඔවුන් සහෝදරත්වයෙන් බඳිනු ලබන සේක. (L.C.C 813) එබැවින් ශුද්ධ වූ සභාව එකමුතු කරන්නෝ ශුද්ධාත්මයාණෝ ය. ඒකත්වය ශුද්ධාත්මයාණන් වහන්සේගේ ක්‍රියාකාරිත්වයක් වන බැවින් එය කිසි විටෙක හීන වී යාමට හෝ නැති වී යාමට හෝ ඉඩක් නැත.

එබැවින් පවතින්නේ එක ම සභාවකි. ක්‍රිස්තුන් වහන්සේ අනාවරණය කර ඇති ආකාර 7කින් ඒකත්වය ශුද්ධ වූ සභාව තුළ විද්‍යමාන වේ. (එපිස 4:4-6)

ඒ අනුව සභාවට ඇත්තේ එක ම බලාපොරොත්තුවකි, එකම ශරීරයකි, එකම ආත්මයාණන් වහන්සේ කෙනෙකී, එකම සමිඳාණන් වහන්සේ කෙනෙකි, එකම ඇදහිල්ලකි, එක ම බෞතිස්ම - ස්නාපනයකි, එකම දෙව් පියාණන් වහන්සේ කෙනෙකි.එහෙයින් ශු. සභාව ස්වභාවයෙන් එක ම සභාවක් විය යුතු ය.

ශුද්ධ වු සභාවේ භේද ඇති වන විට ඒකත්වයට හානි සිදු විය. එක ම ශුද්ධ වු කතෝලික හා අපෝස්තලික සභාව ක්‍රි.ව. 1504 සිදු වූ මහා සභා භේදය නිසා පෙරදිග හා අපරදිග වශයෙනුත් 15 වන ශතවර්ෂයේ සිදු වු ප්‍රතිසංස්කරණ නිසා කතෝලික හා රෙපරමාදු වශයෙනුත් ඉන් පසු නැවත ප්‍රධාන සභා හා මූලධර්මවාදී සභා වශයෙනුත් බෙදීම් වෙන් වී ඇත. එමගින් ශු. සභාවේ ඒකත්වයට පමණක් නොව ශුද්ධත්වයට, කතෝලිකත්වයට හා අපෝස්තලිකත්වයට පවා තුවාල සිදු වී ඇත. මෙම බෙදීම හේතු කොට ගෙන සභාව තුළ තවත් ගැටලු ගණනාවක් පැන නැඟී ඇත. එනම් : බෙදීම් සිටින සභාවක් එක ම දූත කාර්යයක් බෙදීම් සිදු කරන්නේ කෙසේ ද? එක ම ක්‍රිස්තුන් වහන්සේ ගැන බෙදී දේශනා කරන්නේ කෙසේ ද? ඒ අනුව සභාවේ මෙම බෙදීම් සභාවේ දූත කාර්යයට බාධාවකි. අන්‍ය ආගමිකයන්ට අනාදර්ශයකි.

වාසනාවකට මෙන් බෙදී වෙන් වී ගිය කිතුනු සභා හැකි අයුරින් පොදු ක්‍රියාමාර්ග හා සංවාද මඟින් එකමුතු කිරීමේ ප්‍රයත්න 20 වන ශතවර්ෂයේ ආරම්භයේ සිට ම සිදු විය. එහි ලා පෙරමුණ ගත්තේ රෙපරමාදු සභා ය.

ශ්‍රී ලංකාවේ කිතුනු සභා 08ක් ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය යටතේ ලියා පදිංචි වී ඇත. ඒවා නම්,

1. කතෝලික සභාව
2. ලංකා සභාව (එංගලන්ත සභාව)
3. මෙතෝදිස්ත සභාව
4. බැප්ටිස්ට් සභාව
5. ඕලන්ද රෙපරමාදු සභාව (ක්‍රිස්තියානි රෙපරමාදු සභාව)
6. ප්‍රෙස්බිටේරියානු සභාව
7. දකුණු ඉන්දියානු සභාව
8. ගැලවීමේ හමුදාව යනුයි.

(මෙම සභාවලින් ලංකා සභාව, මෙතෝදිස්ත සභාව, බැප්ටිස්ට් සභාව, ගැලවීමේ හමුදාව ආදිය පිළිබඳ ව 9 වන නිපුණතාවේ අධ්‍යයනය කර ඇත.)

**කතෝලික සභාව**

- සාමාන්‍ය වහරේදී රෝමානු කතෝලික සභාව යනුවෙන් හැඳින්වෙන මෙම සභාව ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ විසින් ම ස්ථාපිත කළ සභාවයි.

  " මම ඔබට කියමි, ඔබ පේදුරුය. මෙම පර්වතය පිට මාගේ සභාව ගොඩනගන්නෙමි. ස්වර්ගරාජ්‍යයේ යතුර ඔබට දෙන්නෙමි. ඔබ පොළවෙහි දී යමක් බඳින්නෙහිද එය ස්වර්ගයෙහිදී බඳිනු ලබන්නේය. ඔබ පොළවෙහිදී යමක් මුදන්නෙහි ද එය ස්වර්ගයෙහිදී මුදනු ලබන්නේය"

  (මතෙව් 16/19 -20)

- ශුද්ධ වූ පේදුරු අපෝස්තුළු තුමන්ගේ අනුප්‍රාප්තිකයින් ලෙස රෝමයේ රාජගුරු ප්‍රසාදි තනතුරට පත්වන ශුද්ධොත්තම පාප්වහන්සේ මෙම සභාවේ විශ්ව නායක එඬේරාය. ශුද්ධොත්තම පියතුමාගේ නායකත්වය යටතේ විවිධ රදගුරු පදවි වල රාජගුරුප්‍රසාදීන් වහන්සේලා සාමුහික බැදීමකින් සේවයේ නිරත වෙති.

- ශ්‍රී ලංකාවේ අති බහුතර කිතුනු ජනතාවක් අයත් වන කතෝලික සභාවට රදගුරු පදවි දොළහක් අයත් වේ. රාජගුරුප්‍රසාදීන් වහන්සේගේ නායකත්වය යටතේ දූත සේවාවේ නිරත වෙයි.

**ඕලන්ද රෙපරමාදු සභාව (ක්‍රිස්තියානි රෙපරමාදු සභාව)**

- මෑතක් වන තුරු (2007) ඕලන්ද රෙපරමාදු වශයෙන් හැඳින්වුණු මෙම සභාව මෙරට දූත සේවාව ආරම්භ කළේ 1647 දී ය.

- ආරම්භයේ දී ඕලන්ද ජාතිකයන්ට සීමා වූව ද පසු ව සිංහල ජනතාව අතර ද පැතිරිණි. ලන්දේසී ආගමනයත් සමඟ ඇරඹි මෙම සභාව ශ්‍රී ලංකාවේ පැරණිතම ප්‍රොතෙස්තන්ත සභාව වේ.

**ප්‍රෙස්බිටේරියානු සභාව**

- 1742 දී ගාල්ල නගරයේ දී ආරම්භ කරන ලදි.
- එවකට ඕලන්ද සභාවේ සහයෝගය හා පිළිසරණ ලැබ මෙය ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වූ අතරමෙහි ධර්මදූත සේවාව කොළඹ හා මහනුවර ප්‍රදේශවල සිදු විය.

**දකුණු ඉන්දියානු සභාව**

- ඇංග්ලිකාන, මෙතෝදිස්ත, ප්‍රෙස්බිටේරියානු, කොන්ග්‍රිගේෂනල් යන විවිධ ආගමික සම්ප්‍රදායයන්ගෙන් හෙබි සභා කිහිපයක එකමුතුවක ප්‍රතිඵලයක් ලෙස 1947 සැප්තැම්බර් 27 වන දින මෙම සභාව ඉන්දියාවේ දී බිහි විය.

- රදගුරු හිමියන්ගේ ආධ්‍යාත්මික මඟ පෙන්වීම යටතේ ක්‍රියාත්මක වන අතර රදගුරු පදවිය පාලනය වන්නේ සංසදයකිනි. (SYNOD) එම සංසදය මඟින් රදගුරු හිමි පත් කෙරේ.

**කිතුනු සභා එකමුතුව සඳහා බයිබලීය පදනම ;**

ක්‍රිස්තියානි එකමුතුව සභා ධර්මදූත මෙහෙයට අත්‍යවශ්‍ය අංගයක් වන අතර සභා සමඟිය සඳහා ද අත්‍යවශ්‍ය සාධකයකි.

විවිධ සභා සම්ප්‍රදායවලට අයත් ක්‍රිස්තු භක්තිකයන් ඔවුනොවුන් අතර කිට්ටු සම්බන්ධයක් ඇති කර ගැනීම හා තේරුම් ගැනීම සඳහා එක් ව කටයුතු කිරීමට උත්සාහ ගැනීම කිතුනු සභා එකමුතුකම නම් වේ.සභාවේ ධර්ම දානීය කාර්යයට එකමුතුකම අත්‍යවශ්‍ය අංගයකි.
ක්‍රිස්තුන් වහන්සේ තමන් වහන්සේගේ උත්තම පූජක යාච්ඤාවේ දී අනාගත සභාවේ සමඟිය උදෙසා යාච්ඤා කළ සේක. "මොවුන් (ශ්‍රාවකයන්) ගැන පමණක් නොව මොවුන්ගේ වචනය කරණ කොට ගෙන මා අදහා ගන්නා අය (අනාගත සභාව) ගැනත් යාච්ඤා කරමි.පියාණනි, මා මෙසේ යාච්ඤා කරන්නේ ඔබ මා තුළ ද මා ඔබ තුළ ද සිටින්නාක් මෙන් ඔවුන් ද අප තුළ ඒකත්වය වන පිණිස ය......" (ජොහාන් 17:20-23

ශුද්ධ වූ පාවුලු තුමා ද ශුද්ධ වූ සභාවේ ඒකත්වයේ අවශ්‍යතාව 1 කොරෙන්ති 1:10-13හි අවධාරණය කරයි.

මේ සෑම සභාවක් ම එක් ව සිතීමට, සාකච්ඡා කිරීමට, ක්‍රියා කිරීමට, වන්දනා කිරීමට එකිනෙකාට සහය වීමට පමණක් නොව එකිනෙකාට අභියෝග කිරීමට, එකිනෙකා නිවැරදි කිරීමට, තර්ක විතර්ක කිරීම තුළින් වර්ධනය වීමට ක්‍රියා කරයි.

එහෙයින් ඔවුහු,

- එක ම විශ්වාසයක හා දිව්‍ය සත්ප්‍රසාදයෙහිලා එකමුතු වෙති.
- ධර්මදානය සඳහා පොදු සාක්ෂ්‍යකරුවෝ වෙති.
- මිනිස් අවශ්‍යතාවන් සඳහා සේවාවට අසාධාරණය පිටු දැකීමට සාමය හා ස්වභාව ධර්මය ආරක්ෂා කිරීමට බැඳී සිටිති.
- නවෝදයකලා තුළ එකමුතුව, වන්දනාව, සේවාව මෙන් ම ධර්මදූත සේවාව සඳහා ද කැපවෙති.

**බෞතිස්මය, දිව්‍ය යාගය හා දේවගැති ධුරය (ලීමා ලේඛන) - BEM**

**Baptism, Eucharist and Ministry ( Lima Text)**

- ලෝක සභා මන්ත්‍රණ සභාව ( WCC ) විසින් 1982 ජනවාරි 15 දින පීරූ රාජ්‍යයේ ලීමා නුවර දී ප්‍රකාශයට පත් කරන ලද ලියවිල්ලකි.
- ලීමා ලේඛනය ලෙස ද හඳුන්වනු ලබන මෙම ලියවිල්ල සභා ජීවිතය හා විශ්වාසය සම්බන්ධ ව එකඟ වීම් මෙන් ම වෙනස්කම් ද සැලකිල්ලට ගනිමින් සකස් කරන ලද්දකි.
- ජගත් ක්‍රිස්තියානි ලේඛණයක් ලෙස පිළිගැනීමට ද තොරතුරු ලබා ගැනීමට ද අදටත් භාවිත කෙරේ.
- BEM යන කෙටි නාමයෙන් හඳුන්වනු ලබන මෙම ලියවිල්ලෙහි බෞතිස්මය, දිව්‍ය යාගය හා දේවගැති ධුරය පිළිබඳ ව විස්තර වනුයේ ඒ සඳහා ගොඩනැඟෙන එකමුතුකම පෙන්වා දීමට ය. බෞතිස්මය - ක්‍රිස්තුන් වහන්සේ තුළ නව ජීවිතයකට පිවිසීමකි.

  - උන් වහන්සේගේ මරණයට හා උත්ථානයට පංගුකාර වීම මඟින් නව ජීවිතයකට අඩිතාලම දැමීමක් මෙහි දී සිදු වේ.

  දිව්‍ය යාගය - ස්තුති කිරීමක්, සිහි කිරීමක්, සහභාගීකමක් හෝ දිව්‍ය භෝජනයක් හෝ ලෙස දක්වති.

  - ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිත පරිත්‍යාගය මඟින් හෙළි කරන සාමාජීය හා මානුෂික හැඟීම දිව්‍ය යාගයේ දී ඉස්මතු වේ.

  දේවගැති ධුරය - දේවගැති ධුරය සභාවේ අපෝස්තලිකත්වය විදහාපායි.

  - සේවාව සඳහා දෙනු ලබන බලයකි.
  - ක්‍රිස්තුන් වහන්සේගෙන් ම ලබා ගන්නා වූ මෙම ධුරය පෞද්ගලික ව මෙන් ම සාමුහික ව ද පුහුණු කළ යුතු ය.

රදගුරු භූමිකාව ප්‍රදේශීය සභාවල ඉගැන්වීමට නායකත්වයට මෙන් ම වන්දි ගෙවීමට හා පාලනයට ඉවහල් වන බව ලීමා ලේඛනය දක්වයි. එහෙයින් BEM හි දේවගැති ධුර කාර්ය භාරය එඬේරිය මෙන් ම ප්‍රායෝගික යන අංශ දෙකටම ඒකාබද්ධ විය යුතු බව ද දක්වයි.

රෙපරමාදු විප්ලවයෙන් පසු ඇති වූ රෙපරමාදු සභාවෙහි බහුනිකායික ස්වභාවය නිසා ස්වාධීන සභා බිහි වීම වැළැක්විය නොහැකි කරුණක් විය. එහෙයින් ක්‍රිස්තියානි නිකායයන් අතර යම් තාක් දුරට පොදු එකඟතාවක් ගෙන ඒමට 20 වන සියවස තුළ අන්තර් නිකායික සමඟි පසුබිමක් හෙවත් එකමුතු ව්‍යාපාරයක් (Ecumenical Movement) බිහි විය.

මෙම ව්‍යාපාරය අද මෙහෙයවනු ලබන්නේ ඉතා ම ත් ප්‍රායෝගික අරමුණු දෙකක් මුල් කර ගෙන ය.

1. පොදු කටයුතුවල දී එක්තරා සහයෝගිතාවක් විවිධ නිකායයන් අතර ඇති කිරීම.

2. හැකි සැම තැනක ම විවිධ සභා එකිනෙකට ඒකාබද්ධ කිරීම.

පළමු අරමුණ සම්බන්ධයෙන් ඉතා ම ත් විශිෂ්ට ජයග්‍රහණයක් අත් වූයේ 1948 දී ලෝක සභා සමුළුව (World Council of Churches) යන නමින් අන්තර් නිකායික සහයෝගිතා සම්බන්ධයෙන් සංවිධානයක් ලැබූ අවස්ථාවේ දී ය.

**ලෝක සභා සමුළුව (World Council of Churches)**

**(අන්තර් නිකායික සහයෝගිතා සංවිධානය)**

- ලෝක සභා සමුළුව (W.C.C) යනු ශුද්ධ ලියවිල්ලට අනුව ක්‍රිස්තුන් වහන්සේ දෙවියන් වහන්සේ ලෙසත් ගැලවුම්කරුවාණන් ලෙසත් විශ්වාසය ප්‍රකාශ කරන මිත්‍රශිලී ව්‍යාපාරයකි.

- එහෙයින් ඔවුන් පියාණන් වහන්සේ, පුත්‍රයාණන් වහන්සේ හා ශුද්ධාත්මයාණන් වහන්සේ මහිමයට පත් කිරීමකට පොදු කැඳවීම ලෙස එය සපල කර ගැනීමට මිත්‍රත්වයෙන් බැඳෙන්නාවූ කණ්ඩායමකි.

- ජොහන් 17:21 අනුව "ලෝකයා විශ්වාස කරන පිණිස" ඔවුන් ඒකරාශි වන්නේ එක ම විශ්වාසයක් ප්‍රකාශ කරන, එක ම දිව්‍ය සත්ප්‍රසාදයෙහිලා දේව වන්දනාව හා පොදු ජීවිතය එකමුතුවක් මඟිනි.

- W.C.C. ප්‍රබල අන්තර් නිකායික සමඟි ව්‍යාපාරයකි. (එකමුතු ව්‍යාපාරයකි.) (Ecumenical Movement)

- ඔවුන්ගේ මූලික අරමුණ ක්‍රිස්තියානි එකමුතුව යි.

- ලෝක ප්‍රසිද්ධ අන්තර් සභා සංවිධානයක් වන W.C.C. රටවල් 110කට වඩා වැඩි සංඛ්‍යාවක ප්‍රචලිත, කෝටි 50ක් පමණ සමාජික සංඛ්‍යාවක් අයත් වන සංවිධානයකි.

- මෙහි සාමාජිකත්වය දරන සභා අතර සාධාර්මික සභා ඕර්තොඩොක්ස් සභා එංගලන්ත සභාව, බැප්ටිස්ට්, ලුතරානු, මෙතෝදිස්ත හා ප්‍රතිසංස්කරණවාදී සභා (Reformed Churches) වේ.

- මේ ආකාරයට ඒකරාශි වන්නා වූ සභා ගණන 348ක් පමණ වේ.

- කෙසේ වුව ද රෝමානු කතෝලික සභාව මෙහි සාමාජිකත්වය දරන්නේ නැත.

**එංගලන්ත - රෝමානු කතෝලික අන්තර් ජාතික කොමිසම**
**(ARCIC - Anglican Roman Catholic International Commission)**

- කැන්ටබරියේ අගරදගුරු අතිඋතුම් මයිකල් රම්සි (Michael Ramsey) හා අතිඋතුම් සවන පාවුලු ශුද්ධෝත්තම පියතුමන් විසින් 1967 දී ආරම්භ කරන ලද්දකි.

- මෙහි අරමුණ වී ඇත්තේ රෝමානු කතෝලික සභා ව හා එංගලන්ත සභා ව අන්‍යෝන්‍ය අවබෝධය මඟින් ධර්මදානයෙහි සාක්ෂ්‍යකරුවන් වීමත් ක්‍රිස්තියානි කැඳවීමට පරිපූර්ණ ලෙස ජීවත් වීමත් ය.

- ARCIC ආචාර ධර්ම පිළිබඳ ඉගැන්වීම් සම්බන්ධ ව ද සලකා බලයි.

- එංගලන්ත හා රෝමානු කතෝලික අන්තර් ජාතික කොමිසම (ARCIC) අවස්ථා දෙකක දී ප්‍රකාශන දෙකක් නිකුත් කරන ලදි.

  මෙය කිතුනු සභා සමඟිය සඳහා හොඳ දේව ධාර්මික පසුබිමක් සලසයි.

  ARCIC – I මඟින් නිකුත් කරන ලද 1970 - 1981 තෙක් වූ වාර්තාවෙහි දිව්‍ය යාගය, දේව ගැති ධූරය හා සභාවේ අධිකාරී බලය සම්බන්ධ මාතෘකා පිළිබඳ ව පුළුල් ලෙස විග්‍රහ කර ඇති බව දක්නට ලැබේ.

ARCIC – II මගින් 1983 - 2005 තෙක් කාලය තුළ ගැලවීම හා සභාව (1986) සාංඝිකත්වයේ සභාව (1991) ක්‍රිස්තු ජීවිතය, සදාචාරය, සාංඝිකත්වය හා සභාව (1993) අධිකාරී බලය තිළිණයක් ලෙස (1999) මරියතුමිය, ක්‍රිස්තුන් වහන්සේ තුළ වරප්‍රසාද හා බලාපොරොත්තුව (2005) ආදී පුළුල් තේමාවන් රාශියක් ඔස්සේ සාකච්ඡා සිදු කරනු ලැබ ඇති බව වාර්තාවන් මගින් අපට පෙන්වා දෙනු ලැබේ.

## වතිකාන ප්‍රකාශන

කතෝලික සභාව විසින් නිල වශයෙන් සභා සමගිය උදෙසා දැමූ ප්‍රථම හා ප්‍රබල අඩිතාලම ලෙස දෙවන වතිකාන මන්ත්‍රණ සභාව හැඳින්විය හැකිය. ක්‍රිස්තුන් වහන්සේ සභා කිහිපයක් ස්ථාපිත නොකළ අතර එකම ශුද්ධ වූ සභාවක් පමණක් පිහිට වූ ජොහන් 10:16 කොටසින් තහවුරු වේ. "මෙසේ එක රැළ ද එක එඬේරෙක් ද වන්නාහ" යන ඒකත්වයේ සභාවක් සිදහා පියවර නගන්නට දෙවන වතිකාන මන්ත්‍රණ සභාව මහත් පිටිවහලක් විය. මෙම මන්ත්‍රණ සභාවේ සංවාදය සහ සභා සමගිය පිළිබඳ කතෝලික සභාවේ ඉගැන්වීම් ප්‍රකාශ කිරීම ය.

- පෙරදිග කතෝලික සභා පිළිබඳ නියෝගය
- කිතුනු සභා ඒකත්වය නගාලීමේ නියෝගය

දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ක්‍රිස්තුන් වහන්සේගේ සභාව පිළිබඳ ජාතීන්ගේ ආලෝකය නම් ව්‍යවස්ථාවේ අංක 15 වෙනත් කිතුනු සභා තුළ ඇති සාධනීය යහපත් ලක්ෂණ පෙන්වා දෙමින් කිතුනු සභා සමගිය එක සිතින් ප්‍රාර්ථනා කරයි.

දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමාගේ "ඒකත්වය වන පිණිස" (Utunum sinct) ක්‍රිස්තු ශ්‍රාවකයාගේ මනුෂ්‍ය දුබලතකම නිසා අතීතයේ සිදු වූ වැරදි හා අනවබෝධය මත සභා බෙදීම්, වෙන්වීම් සිදුවුව ද ඒවා තව තවත් බෙදී වෙන්වීමකට හේතු නොකොට පශ්චත්තාපයෙන් ද සහෝදර හැඟීමෙන් ද දේව අභිමතයට සභා ශුද්ධාත්ම ක්‍රියාකාරීත්වයට විවෘත වී කටයුතු කලහොත් දෙවියන් වහන්සේ තමන් වහන්සේගේ අභිමතය අනුව සුදුසු අවස්ථාවේදී කිතුනු සභා සමගිය හා ඒකත්වය නැමති ලෝකෝත්තර තිළිණය අපට දානය කරයි. එමනිසා කිතුනු සභා අතර දේව ධාර්මික වශයෙන් ද සාමාජිකයන් අත් දකින එකඟතා මුල්කර ගෙන සභා සමගිය උදෙසා යාච්ඤා කිරීමත් ඒ වෙනුවෙන් වෙහෙසීමත් කිතුනු අප සැමගේ යුතුකමකි. මන්දයත් එකම එඬේරෙක් යටතේ එකම රැළක් වීමට සමිඳාණෝ අප සැම කැඳවා ඇත.

## ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

1. ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය යටතේ ලියාපදිංචි වී ඇති කිතුනු සභා 08 නම් කරන්න.
2. ලීමා ලේඛන පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.
3. ශු. සභාවේ අනිවාර්යය ලක්ෂණ 04 ලියා, ඒවා කෙටියෙන් විස්තර කරන්න.

## ආශ්‍රිත ග්‍රන්ථ


- **ශුද්ධ බයිබලය -සිංහල නව අනුවාදය තෙවන සංස්කරණය 2006,** ශ්‍රී ලංකා බයිබල් සමාගම
- කිතුනු නොවූ ආගම් කෙරෙහි ශුද්ධ වූ සභාවේ සම්බන්ධතාව පිළිබඳ ප්‍රකාශනය (NA)
- ආගමික නිදහස පිළිබඳ ප්‍රකාශය (DHC)
- වර්තමාන ලෝකයේ ශු. සභාව (GS)
- කිතුනු සභා ඒකත්වය නගාලීමේ නියෝග (UR)
- දසනායක ජුඩ් (පියතුමා), "අපෝස්තුළුවරුන්ගෙන් පැවතෙන එකම ශුද්ධ වූ කතෝලික සභාව", පහන් ටැඹ, සුමිත් ලක්ෂමන් ප්‍රින්ටර්ස්, 2009 ජනවාරි – මාර්තු, 21- 26
- දහම් දියඹ තෙවන කලාපය 2004 සමයාන්තර සංවාදය